# ආපදාවන් අතරින් ශක්තිමත්ව

**ශ්‍රීලංකන් එයාර්ලයින්ස්**
**වාර්ෂික වාර්තාව 2021-2022**




SriLankan Airlines

oneworld



# ආපදාවන් අතරින් ශක්තිමත්ව

බොහෝ දෙනා ප්‍රගතිය ගමනාන්තයකට පැමිණීමක් ලෙස සලකන නමුදු, ශ්‍රීලංකන් ගුවන් සේවයේ අපි, පියාසැරිය සහ උගත් පාඩම් තුළින් ප්‍රගතිය සලකනු ලබන්නෙමු. පසුගිය වසර කිහිපය තුළ අපගේ ගමන් මග තුළ “නිල්වන් අහසක්” දැක ඇත්තේ ඉතාමත් අඩුවෙනි. කෙසේ වෙතත්, අප බොහෝ බාධක හරහා ගමන් කර ඇති බැවින්, අපි දුෂ්කර කාලවලදී ඔරොත්තු දීමේ හැකියාව ගොඩනඟා ගෙන ඇති අතර, අනාගතය සඳහා අපගේ යෝග්‍යතාවය “ඔපනංවා” ඇත.

සංචාරක ප්‍රතිලාභ සහ ස්ථාවර ආර්ථිකයක් දක්නට ලැබෙන පැහැදිලි ක්ෂිතිජයන් වෙනුවෙන් අපි දැන් බලා සිටින්නෙමු. නව “ඇරඹුමකින්” සහ පසුගිය වසරවල ලද ඉගෙනීම් තුලින් සන්නද්ධව, ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සහ අභිලාෂයන්ට වඩා යහපත් සහයෝග යක් දක්වන ශක්තිමත් පන්නරයක් සහ ලාභයන් එක් කරන අනාගතයක් අපි බලාපොරොත්තු වන්නෙමු.

# පටුන

**දළ විශ්ලේෂණය**


| | |
|---|---|
| අපගේ දැක්ම සහ මෙහෙවර | 4 |
| මූල්‍ය විශේෂ තොරතුරු | 6 |


**කළමනාකරණ වාර්තා**


| | |
|---|---|
| සභාපතිතුමාගේ වාර්තාව | 8 |
| ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය | 10 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 14 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 16 |
| ව්‍යාපාර අවදානම් කළමනාකරණය | 20 |
| ආයතනික පාලන වාර්තාව | 21 |
| කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය | 24 |


**මූල්‍ය ප්‍රකාශ**


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 44 |
| අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව | 48 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 49 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 50 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 54 |
| ලාභ අලාභ ප්‍රකාශය | 55 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 56 |
| ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය | 57 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 58 |
| මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | 59 |


**ඇමුණුම්**


| | |
|---|---|
| පාරිභාෂික ශබ්ද මාලාව | 108 |
| දස අවුරුදු සමාලෝචනය | 110 |
| ගුවන් මාර්ග සිතියම | 112 |
| විශේෂ කඩඉම් | 114 |
| සාංගමික තොරතුරු | 116 |
| මහා සභා රැස්වීම් නිවේදනය | 117 |
| සටහන් | 118 |
| පෙරකලාසි පත්‍රය | 119 |


**සටහන:**

**මෙම සිංහල වාර්තාව ඉංග්‍රීසි වාර්තාවේ පරිවර්තනයක් වන අතර, පරිවර්තන ගැටළු පවතින සෑමවිටම ඉංග්‍රීසි වාර්තාව පරිශීලනය කරන්න.**



# අපගේ දැක්ම

ආසියාවේ වඩාත්ම පාරිභෝගික කේන්ද්‍රීයගත ගුවන් සේවය බවට පත්වීම.

# අපගේ මෙහෙවර

ශ්‍රී ලාංකීය ක්‍රමයට උණුසුම් ආගන්තුක සත්කාරයෙන් සපිරි විශ්වාසනීය වූත් ප්‍රසන්න වූත් ගුවන් ගමන් අත්දැකීමක් තුළින් අපගේ පාරිභෝගිකයන් සංතෘප්තියට පත් කිරීම.

අපි මූල්‍යමය වශයෙන් ස්ථාවර වූ දක්ෂ, දූරදර්ශී සහ කැපවීමෙන් ක්‍රියාකරන සමාගමක් වශයෙන් අපගේ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම පිණිස කැපවී සිටින්නෙමු.




SriLankan
A330-300

# මූල්‍ය විශේෂ තොරතුරු

| | | සමූහය 2022 | සමූහය 2021 | සමාගම 2022 | සමාගම 2021 |
|---|---|---|---|---|---|
| **මූල්‍යමය** | | | | | |
| ආදායම | රු. මිලියන | 134,301.36 | 50,928.92 | 132,936.23 | 50,693.85 |
| මෙහෙයුම් වියදම | රු. මිලියන | 133,222.10 | 76,111.28 | 132,397.86 | 74,511.39 |
| විනිමය අලාභයට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය) | රු. මිලියන | 1,692.66 | (8,120.21) | 1,237.33 | (3,188.89) |
| වසර සඳහා ශුද්ධ අලාභය | රු. මිලියන | (163,583.08) | (49,704.51) | (166,369.68) | (45,231.46) |
| මුළු වත්කම් | රු. මිලියන | 182,263.33 | 157,882.80 | 178,144.17 | 154,381.41 |
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල් | රු. මිලියන | (426,423.83) | (281,490.88) | (437,036.93) | (289,265.27) |
| **ගමනාගමනය** | | | | | |
| මගී ධාරිතාව | ASK මිලියන | | | 10,144.12 | 3,816.40 |
| ප්‍රවාහනය කරන ලද මගීන් | RPK මිලියන | | | 4,968.59 | 748.13 |
| මගී පැටවුම් සාධකය | % | | | 48.98 | 19.60 |
| සමස්ත ධාරිතාව | ATK මිලියන | | | 1,531.28 | 794.52 |
| සමස්ත පැටවුම | RTK මිලියන | | | 847.33 | 312.26 |
| සමස්ත පැටවුම් සාධකය | % | | | 55.33 | 39.30 |
| **කාර්ය මණ්ඩල ඵලදායීතාවය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 6,849 | 6,981 | 5,833 | 5,965 |
| එක් සේවකයෙකුගේ ආදායම | රු. මිලියන | 19.61 | 7.30 | 22.79 | 8.50 |
| **ගුවන් යානා** | | | | | |
| පටු බඳ සහිත | සංඛ්‍යාව | | | 12 | 12 |
| පුළුල් බඳ සහිත | සංඛ්‍යාව | | | 12 | 12 |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | | | 24 | 24 |




# ආපදාවන්
# අතරින්
# ශක්තිමත්ව

# සභාපතිතුමාගේ වාර්තාව

**"මූල්‍ය වර්ෂය සඳහා සමූහය මූල්‍ය ගාස්තු සහ විනිමය අලාභයන්ට පෙර රුපියල් බිලියන 1.69 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කළේය (2019/20 - මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 8.12 කි). සංචාරක ඉල්ලුමට සමගාමීව අපගේ නව ව්‍යාපාරික උපායමාර්ගය සාර්ථකව ක්‍රියාත්මක කිරීමත් සමඟ මූල්‍ය වර්ෂයට අදාළව සමූහයේ සිව්වන කාර්තුව සඳහා ලාභයක් වාර්තා කරන ලදි..."**

කොවිඩ්-19 වසංගතය බොහෝ දෙනෙකුගේ ජීවිතවලට අඛණ්ඩ බලපෑමක් එල්ල කිරීමත් ආර්ථිකයන් බිඳ දමමින් සැලකිය යුතු ජනගහනයකට ආදායම් මාර්ග අහිමි කිරීමත් හේතුවෙන් එහි දුෂ්කරතා ලොව පුරා ජනතාවට දැනෙන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසංගත තත්වයය විසින් ඇති කරන ලද අර්බුදයේ ගොදුරක් බවට පත්වූ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ද විශාල ගැටලුවලට මුහුණ පානු මෙකී මූල්‍ය වර්ෂය තුළ දැක ගත හැකි වුවද (ඇතැම් විට මෙය ගුවන් සේවා කර්මාන්තය එහි ආරම්භයේ සිට මුහුණ දුන් වඩාත්ම අභියෝගාත්මක කාල පරිච්ඡේදය විය හැක) අනාගතය සඳහා ශක්තිමත් පදනමක් සහිතව නැවත නැගී සිටිනු දැකගත හැකිය.

රට වසා දැමීම් සහ දේශසීමා සීමා ලිහිල් කිරීම හේතුවෙන් ගුවන් සේවා කර්මාන්තය සුබවාදීව වසර ආරම්භ කළද, අලුතින් ඇති වූ වසංගත තත්වයේ අවධි කිහිපයක් හේතුවෙන් කෙටි දැනුම් දීමකින් දේශසීමා නැවත වසා දමන ලදි. මෙය බොහෝ වෙළඳපොළවල්හි නැවතුම්-ආරම්භක ප්‍රතිසාධන රටාවකට මග පෑදුවේ මෙහෙයුම් ආස්ථානයෙන් දැවැන්ත අභියෝග නිර්මාණය කරමිනි. එබැවින්, මෙකී සංකීර්ණ මෙහෙයුම් ගැටලුවලට මුහුණ දෙමින් මගී මෙහෙයුම් නැවත ආරම්භ කිරීම සහ මූල්‍ය ගැටලු සමතුලිත කිරීම මෙම කාල සීමාව තුළ අභියෝගාත්මක කාර්යයක් විය.

මෙවැනි පසුබිමක් තුළ, අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල තිරසාර ප්‍රතිසාධනයක් වෙනුවෙන් අඩිතාලම දමමින් අභියෝගවලට හැකි උපරිම ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීමට අපි නොසැලී සිටිමු. පසුගිය වසර දෙක තුළ, අපි ගුවන් යානා හිමිකාරිත්වයේ සිට සැපයුම්කරුවන්ගේ පිරිවැය සහ වැඩි සේවක කාර්යක්ෂමතාව දක්වා වූ අපගේ පිරිවැය පදනමෙහි සැලකිය යුතු ව්‍යුහාත්මක සංවර්ධනයන් අත්කර ගෙන ඇත. ඒ හැරුණු විට, ශ්‍රී ලාංකීය රසයන් අනූන සහ උසස් ඩිජිටල් හැකියාවන් යොදා ගනිමින් මගීන් වෙනුවෙන් වූ නව මෙනුවක් හඳුන්වාදීම ඇතුළුව, අපගේ සේවා පිරිනැමීම් වැඩිදියුණු කිරීම සඳහා නව ශක්‍යතාවන් ද අපි ගවේෂණය කළෙමු.

වසරේ දෙවන භාගයේදී මගී ඉල්ලුම පෙර තත්ත්වයට පත්වීමට පටන් ගත් හෙයින්, මෙහෙයුම් අඛණ්ඩතාව ප්‍රතිෂ්ඨාපනය කරමින් මාස දොළහක කාලසීමාවක් තුළ ගුවන් සමාගම ලාභදායි තත්ත්වයට පත්කිරීමේ අරමුණින් අපි නව ව්‍යාපාරික උපායමාර්ගයක් ක්‍රියාත්මක කළෙමු. මෙම මුලපිරීමේ කොටසක් ලෙස, අපි අපගේ ධාරිතා නියුක්තිය වඩාත් ලාභදායි වෙළඳපොළවල් වෙත යොමු කළ අතර නව ඉහළ-විභවතාවක් සහිත වෙළඳපොළ වෙත සේවාවන් එක් කළෙමු. ඒ අතරම, ප්‍රධාන අභ්‍යන්තර සංචාරක ප්‍රභවයන් සහිත වෙළඳපොළ වෙත අඛණ්ඩ සම්බන්ධතාවක් පවත්වා ගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය සඳහා අපගේ යුතුකම අපි අඛණ්ඩව ඉටු කළෙමු. මෙම කාලය තුළ දියත් කරන ලද නව මගී ගමනාන්ත අතරට ජර්මනියේ ෆ්‍රෑන්ක්ෆර්ට්, නේපාලයේ කත්මන්ඩු, ප්‍රංශයේ පැරිස්, දකුණු කොරියාවේ සෝල් සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි ඇතුළත් වේ. මෙම නව මගී ගමනාන්ත සියල්ල අපගේ සංචාරකයින්ගේ ජනප්‍රියත්වයට සහ ඉල්ලුමට පාත්‍ර වී ඇති අතර එය ශ්‍රී ලංකාව වෙත සංචාරක පැමිණීම් ඉහළ නැංවීම සඳහා දායක වී තිබේ.

ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම අපගේ ලාභ ආන්තිකය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළේය. 2022 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම, මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 142.61 ක විනිමය අලාභයක් වාර්තා කරමින් අපගේ ශුද්ධ වගකීම් රුපියල් වලින් නැවත ප්‍රකාශ කිරීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමූහය වසර සඳහා රුපියල් බිලියන 163.58 ක ශුද්ධ අලාභයක් වාර්තා කළේය (2019/20 -ශුද්ධ අලාභය රුපියල් බිලියන 49.70 කි). කෙසේ වෙතත්, මූල්‍ය වර්ෂය සඳහා සමූහය මූල්‍ය ගාස්තු සහ විනිමය අලාභයන්ට පෙර රුපියල් බිලියන 1.69 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කළේය (2019/20 - මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 8.12 කි). සංචාරක ඉල්ලුමට සමගාමීව අපගේ නව ව්‍යාපාරික උපායමාර්ගය සාර්ථකව ක්‍රියාත්මක කිරීමත් සමඟ මූල්‍ය වර්ෂයට අදාළව සමූහයේ සිව්වන කාර්තුව සඳහා ලාභයක් වාර්තා කරන ලදි (එක්සත් ජනපද ඩොලරයෙන් වාර්තා කරන විට, සමූහයේ ආදායමෙන් 75% කට වඩා වැඩි ප්‍රමාණයක් විදේශ මුදල්වලින් ජනනය වන බැවින්).

බොහෝ දුරට අතීතයේ සිදු කරන ලද ද්‍රවශීලතා මූලාශ්‍රවලට අදාළව සමාගමේ ණය බර, වෙනත් ආකාරයකින් වැඩිදියුණු වූ මූල්‍ය කාර්යසාධනය සඳහා අඩුපාඩුවක් ලෙස පවතින බව ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

"...අපි ලොව පුරා සිටින පුද්ගලයින් සහ පවුල් සමඟ නැවත සම්බන්ධ වීමට සහ අපගේ සුන්දර දිවයින වෙත සංචාරකයින් නැවත ගෙන ඒමට බලාපොරොත්තු වෙමු. වසර දෙකකට ආසන්න කාලයක් පැවති සීමිත මෙහෙයුම්වලින් පසු මෙහෙයුම් නැවත ගොඩ නැගීමේදී විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වේ. කෙසේ වෙතත්, මෙම අභියෝගවලට මුහුණ දීමට සහ සංවිධානය තුළ ශක්තිමත් මූල්‍ය පෙරළියක් ඇති කිරීමට අපගේ කණ්ඩායම හොඳින් ස්ථානගත වී ඇති බව මට විශ්වාසයි."

විසින් හඳුනාගෙන ඇත. එබැවින්, මෙම ණයවලින් සමහරක් බහුතර කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය සමඟ ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව සමාගම ගවේෂණය කළේය. ඉන් අනතුරුව ශ්‍රී ලංකා රජය විසින් රටේ ප්‍රතිපත්ති මුලපිරීම්වලට අනුකූලව සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන සිය අභිප්‍රාය ප්‍රකාශයට පත් කරන ලදී.

මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසු, ශ්‍රී ලංකාව උග්‍ර ආර්ථික අර්බුදයක් සමඟ තවත් කැළඹිලි සහගත කාල පරිච්ඡේදයක් පසු කළේය. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි ආරම්භයේ සිට මුහුණ දුන් විශාලතම අභියෝගය වන කොවිඩ්-19 වසංගතයෙන් පසු යළි යථා තත්ත්වයට පත්වීමට පටන් ගත් විගසම ඇතිවූ මෙම තත්ත්වය සමාගමට විශාල අභියෝගයක් විය. මෙම තත්ත්වය නැවත වරක් රට තුළට පැමිණෙන සංචාරකයින්ගේ ඉල්ලුම පහත වැටීමට මෙන්ම ගුවන් යානා ඉන්ධන හිඟය ඇතුළු සැපයුම් ගැටලුවලට හේතු විය. මෙම බාධාවන් මධ්‍යයේ වුවද, වසංගත අවධියේදී අප විසින් සිදු කරන ලද පුළුල් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාකාරකම් හේතුවෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමට ප්‍රශංසනීය කාර්යසාධනයක් වාර්තා කිරීමටත්, සමාලෝචිත වසරේ අවසන් කාර්තුවේදී එහි මෙහෙයුම් ලාභය අඛණ්ඩව පවත්වා ගැනීමටත් හැකි වූ බව මම සතුටින් සඳහන් කරමි.

මේ ගමනේදී අපගේ සේවකයන්ගේ ධෛර්යය සහ කැපවීම ප්‍රශංසනීය වේ. අපගේ සේවක කණ්ඩායමේ අප්‍රතිහත ධෛර්යය සහ නොසැලෙන කැපවීම නොමැතිව අපට මෙම සන්ධිස්ථානයන් කිසිවක් ළඟා කර ගත නොහැකි වනවාට සැක නැත. මෙම කාල සීමාව තුළ අපගේ සියලුම සේවකයින් සැලකිය යුතු වැටුප් කප්පාදුවකට ලක් වී ඇති අතර, වසංගතය විසින් එල්ල කරන ලද අභියෝග මධ්‍යයේ වුවද, ඔවුන් කැපවීම අපේක්ෂාවන්ට වඩා ඉතා ඉහළ මට්ටමකින් පැවතුණි. සමූහය යථා තත්ත්වයට පත් කිරීමට පමණක් නොව අනාගත වර්ධනය සඳහා අඩිතාලම දැමීමට ද අපගේ කණ්ඩායම ලබා දෙන දැවැන්ත සහයෝගය ගැන මම ආඩම්බර වෙමි.

වර්ෂය තුළ ගන්නා ලද විශේෂ පියවරක් වූයේ නව ප්‍රධාන විධායක නිලධාරී රිචඩ් නට්ල් මහතා ගුවන් සමාගමට පිළිගැනීමයි. නට්ල් මහතා ආසියාවේ, යුරෝපයේ, මැදපෙරදිග සහ ඇමරිකා එක්සත් ජනපදයේ බොහෝ ගුවන් සමාගම්හි සේවය කර ඇති ගුවන් සේවා කර්මාන්තය තුළ දශක හතරක පමණ අත්දැකීම් ඇති පළපුරුදු ජාත්‍යන්තර ගුවන් සේවා විධායකයෙකි. එතුමාගේ නායකත්වයෙන් සහ අප කණ්ඩායමේ උත්සාහයෙන් ගුවන් සමාගම කෙටි කාලයක් තුළ සාර්ථක ප්‍රතිඵල ලබා දීමට සමත් වූ අතර ඉදිරි වසර කිහිපය තුළදීත් ඔහුගේ දායකත්වය ආයතනයට සැලකිය යුතු වටිනාකමක් එක් කරනු ඇති බව මට විශ්වාසයි. ඉතා අභියෝගාත්මක කාල පරිච්ඡේදයකදී ගුවන් සමාගම වෙනුවෙන් කළ කැපවීම සහ සේවය වෙනුවෙන් සේවයෙන් ඉවත්ව යන ප්‍රධාන විධායක නිලධාරී විපුල ගුණතිලක මහතාට ස්තූති කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

එමෙන්ම ශ්‍රී ලංකා රජය, අතිගරු ජනාධිපතිතුමන්, වරාය, නාවික සහ ගුවන්සේවා භාර අමාත්‍යවරයා, හිටපු ගුවන්සේවා රාජ්‍ය අමාත්‍යවරයා, භාණ්ඩාගාර ලේකම්වරයා, වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අදාළ ආයතනවල නිලධාරීන් වෙනුවෙන් ඔවුන් සංවිධානය වෙත ලබා දුන් අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් මම මාගේ ස්තූතිය පළ කර සිටිමි. අර්බුදකාරී අවධියක සමූහයට මඟපෙන්වීමට ලබා දුන් කළමනාකාරීත්වය වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් වෙත මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

ලොව පුරා දේශසීමා නැවත විවෘත වන විට, අපි ගුවන් සමාගමක් ලෙස ලොව පුරා සිටින පුද්ගලයින් සහ පවුල් සමඟ නැවත සම්බන්ධ වීමට සහ අපගේ සුන්දර දිවයින වෙත සංචාරකයින් නැවත ගෙන ඒමට බලාපොරොත්තු වෙමු. වසර දෙකකට ආසන්න කාලයක් පැවති සීමිත මෙහෙයුම්වලින් පසු මෙහෙයුම් නැවත ගොඩ නැගීමේදී විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වේ. කෙසේ වෙතත්, මෙම අභියෝගවලට මුහුණ දීමට සහ සංවිධානය තුළ ශක්තිමත් මූල්‍ය පෙරළියක් ඇති කිරීමට අපගේ කණ්ඩායම හොඳින් ස්ථානගත වී ඇති බව මට විශ්වාසයි. නිවැරදි උපාය මාර්ගයක් සමඟින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි ශක්තිමත් පදනම මත විශ්වාසයෙන් යුතුව අනාගතය වෙත පියනැගීමට දැන් සූදානමින් සිටී.

**අසෝක පතිරගේ**
*සභාපති*

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

> "...වසරේ සිව්වන කාර්තුව සඳහා අතිරික්තයක් වාර්තා කිරීමට සමාගමට හැකි විය. ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරී මුදල් ඒකකය වන එක්සත් ජනපද ඩොලර්වලිනි."

2021/2022 මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ මම ඔබ වෙත ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. වසංගත තත්ත්වයේ බරපතල බව මධ්‍යයේ සංචාරක ඉල්ලුම යථා තත්ත්වයට පත් වීමක් සමාලෝචිත වර්ෂය තුළදී දැක ගත හැකි විය. වසරේ මුල් භාගය අප සතු අභියෝගවලට මුහුණ දීමට ඇති හැකියාව මෙන්ම පසුබෑම සමඟ සාර්ථකව කටයුතු කිරීමට කර්මාන්තයට ඇති හැකියාව තහවුරු කළ අතර, දෙවන භාගය සංචාරක ඉල්ලුමේ ක්‍රමික වැඩි දියුණු වීමේ සලකුණු පැහැදිලිව පෙන්නුම් කළේය.

### කර්මාන්තයේ ඉදිරි දැක්ම

COVID-19 වසංගතය හේතුවෙන් කර්මාන්තය එහි ආරම්භයේ සිට දැවැන්තම බාධාවකට මුහුණ දුන් අතිශය අභියෝගාත්මක වසරකින් පසු, ගෝලීය ගුවන් සේවා කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම සඳහා 2021 වසරේදී ධනාත්මක හැරවුමක් ලබා ගත්තේය. සිව්වැනි කාර්තුවේදී දේශසීමා සීමා ලිහිල් කිරීමත් සමඟ, 2020 වසරට වඩා 26% කින් ගෝලීය මගී ආදායමේ වර්ධනයකට තුඩු දුන් ඉල්ලුමේ ක්‍රමානුකූල ප්‍රතිසාධනයක් වෙළඳපොළ රැසක දක්නට ලැබිණි. මෙය 2021 දී ඩොලර් බිලියන 239 දක්වා ළඟා විය. කෙසේ වෙතත්, මගී ආදායම පූර්ව කොවිඩ් මට්ටම්වලින් 40% කට වඩා අඩු මට්ටමක පැවති බැවින් මෙම වර්ධනය වසංගතයට පෙර ආදායම් මට්ටම් පිළිබිඹු කළේ නැත. ඇමරිකානු ඩොලර් බිලියන 42 ක ඇස්තමේන්තුගත ශුද්ධ අලාභයක් වාර්තා කර තිබියදීත්, ශුද්ධ අලාභ ඇමරිකානු ඩොලර් බිලියන 135 ඉක්මවූ කර්මාන්තයේ ප්‍රතිසාධනය 2020 වසරට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමක පැවතුණි.

තවද, ඉල්ලුම සහ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමත් සමඟ 2021 වසර මැද භාගයේ සිට ගෝලීය ඉන්ධන මිල ද ක්‍රමයෙන් ඉහළ ගියේය. යුක්රේනයේ යුද්ධය බොරතෙල් මිල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ අතර, සමාලෝචිත වසර අවසානයේ ගුවන් යානා ඉන්ධන මිල විශාල ලෙස ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) පුරෝකථනය කළේ 2022 වසරේදී ගුවන් සේවා කර්මාන්තයේ ආදායම පූර්ව වසංගත මට්ටම්වලින් 90% කට වඩා ළඟා වනු ඇති බවයි. එසේ වුවද, කලාපීය ප්‍රතිසාධනයේ අසමානතා ඇති විය හැකි වුවද ගෝලීය මට්ටමින් ගුවන් ගමන් යථා තත්ත්වයට පත්වීමක් අපේක්ෂා කෙරේ.

### ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි කාර්යසාධනය

2021/22 මූල්‍ය වර්ෂයේදී, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කොවිඩ්-19 වසංගතයේ අහිතකර ප්‍රතිඵල ජය ගැනීමේදී සඳහා සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ගෝලීය සංචරණ සීමා කිරීම් හමුවේ අපගේ ව්‍යාපාරය ශක්තිමත්ව තබා ගන්නා බව සහතික කිරීම සඳහා අපි සූක්ෂමව කටයුතු කළෙමු. ඊට අමතරව, ආර්ථිකයට සහය වීම සඳහා ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සහ නව සංචාරක මාර්ග එක් කර ගනිමින් වසංගත අවධියේදී ජාතික ඉල්ලුම සපුරාලීමට අපි වෙහෙස නොබලා කටයුතු කළෙමු. මෙම වාතාවරණය තුළ, වසංගත තත්වයට එරෙහිව සටන් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ අපගේ සාර්ථකත්වය සනිටුහන් කරමින් සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා වන ඇපෙක්ස් දියමන්ති සම්මානය ලැබූ පළමු ගුවන් සමාගම්වලින් එකක් බවට පත්වීමු. ශ්‍රී ලාංකේය සුහදත්වය සහ ආගන්තුක සත්කාරය යන සංකල්පය වටා ගොඩනැගුණු මතකයේ රැඳෙන ආගන්තුක අත්දැකීමක් ලබා දීමට අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙමු.

බාධක රැසක් මගහරිමින් වසර තුළ අපගේ සාමාන්‍ය මගී කාලසටහනෙහි ශූන්‍යයේ සිට ආසන්න වශයෙන් 60% ක් දක්වා ළඟා වීම සැලකිය යුතු කරුණකි. සියලු කටයුතු ඇණහිටි කාල පරිච්ඡේදයකින් පසු මෙහෙයුම් නැවත ආරම්භ කිරීම තරමක් බැරෑරුම් කටයුත්තක් වූයේ ගුවන් යානා නැවත සක්‍රිය කිරීම, පුහුණුව සහ නියාමන අනුකූලතාවය සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රයත්න අවශ්‍ය වූ බැවිනි. වසර පුරා අප දුටු දේශසීමා නීතිවල වේගවත් වෙනස්කම් හේතුවෙන් මෙම තත්ත්වය වඩාත් සංකීර්ණ විය. කෙසේ වෙතත්, අප සේවකයින්ගේ අසීමිත සහයෝගය මත නැවත සිදු වූ මෙම ආරම්භයට හොඳින් ප්‍රතිචාර දැක්වීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමත් විය.

එම කාලපරිච්ඡේදය සඳහා වූ අපගේ මූල්‍ය ප්‍රතිඵලවලින් පැහැදිලිවම පෙන්නුම් කෙරෙන්නේ, වසරේ බොහෝ කාලයක් සඳහා සංචාරය වැළැක්වූ වසංගතය මත පදනම් වූ දේශසීමා සීමාවන්ගේ

> "අපි තීරණ ගැනීමේදී අප පාරිභෝගිකයා ප්‍රමුඛස්ථානයේ තබා කටයුතු කරන අතර, එබැවින්, වඩාත් සංවර්ධිත පාරිභෝගික අත්දැකීමක් ලබා දීම සඳහා අපගේ සේවාවන් වැඩිදියුණු කිරීමට නිරන්තරයෙන් උත්සාහ කරමු."

බලපෑමයි. කෙසේ වෙතත්, අභියෝගාත්මක තත්ත්වයක් සාර්ථක මෙහෙයුම් ප්‍රතිඵලයක් බවට පත් කළ අපගේ කණ්ඩායමේ කැපවීම සහ නොපසුබට වීර්යය ද එමඟින් පෙන්නුම් කළේය. වසර තුළ අපගේ ධාරිතාව පූර්ව-කොවිඩ් මට්ටම්වලින් 56% ක් පමණ වුවත්, ආදායම් ප්‍රශස්ත කිරීම සඳහා අප දරන ලද අඛණ්ඩ ප්‍රයත්නය නිසා අපගේ පූර්ව-කොවිඩ් ආදායමෙන් 74% දක්වා ළඟා වීමට අපට හැකි විය. මෙය, වසංගතය තුළ අත්පත් කරගත් සැලකිය යුතු ලෙස පිරිවැය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ, වසරේ සිව්වන කාර්තුව සඳහා අතිරික්තයක් වාර්තා කිරීමට සමාගමට හැකි විය. ඒ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරී මුදල් ඒකකය වන එක්සත් ජනපද ඩොලර්වලිනි. වසර තුළ රුපියල් බිලියන 1.69 ක මෙහෙයුම් ලාභයක් (විනිමය අලාභයට පෙර) ඉපැයූ අතර එය පෙර වර්ෂයෙහි මෙහෙයුම් අලාභය වූ රුපියල් බිලියන 8.12 සිට සැලකියයුතු වර්ධනයකි. කෙසේ වෙතත්, 2022 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් වසර සඳහා රුපියල් බිලියන 143 ක විනිමය පාඩුවක් සිදු වූ අතර, විනිමය අලාභය සහ මූල්‍ය ගාස්තුවලින් පසු සමූහයේ සමස්ත වසරක ශුද්ධ අලාභය රුපියල් බිලියන 164 ක් ලෙස වාර්තා විය.

කෙසේ වෙතත්, අපගේ භාණ්ඩ ප්‍රවාහන සේවා ඉල්ලුමේ වැඩිවීමක් වසර තුළ දැකගත හැකි වූ අතර ගුවන් සේවා ඉතිහාසයේ උත්පාදනය කරන ලද ඉහළම ගුවන් භාණ්ඩ ආදායම වන රුපියල් බිලියන 44 ක් වූ එය වසරින් වසර 48% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා ලොජිස්ටික් ප්‍රජාව විසින් වසංගතය ආරම්භයේ සිටම නව්‍ය විසඳුම් ලබා දෙමින් ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ අංශය විසින් දක්වන ලද දැවැන්ත දායකත්වය ඇගයුමට ශ්‍රී ලංකා ලොජිස්ටික් සහ භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ගේ සංගමය (SLFFA) විසින් පළමු වරට පවත්වන ලද ජාතික ලොජිස්ටික් සම්මාන උළෙලේදී ගුවන් සේවා අංශයේ "රන් සම්මානය" ("Gold Award") සහ "පිළිගැනීමේ සම්මානය" ("Award of Recognition") එම අංශය වෙත පිරිනමන ලදී.

ජාතික ගුවන් සේවය ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ද අර්බුදකාරී කාලවලදී ජාතියට සහය දැක්වීමේ සිය කාර්යභාරය පිළිබඳව ආඩම්බර වේ. අපි වසංගත කාලය පුරාම පුද්ගලයින් සිය නිවෙස් වෙත රැගෙන ඒම සඳහා නැවත ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් මාලාවක් ක්‍රියාත්මක කළෙමු. වෙළඳ ප්‍රවාහයන් වෙත වැදගත් සම්බන්ධතාවක් සැපයීම සඳහා අපගේ ගුවන්යානා ඇණිය භාවිත කරමින් අපි පුළුල් භාණ්ඩ ප්‍රවාහන මාර්ග ජාලයක් ක්‍රියාත්මක කළෙමු. මේ වසරේ දේශසීමා නැවත විවෘත කිරීමට පටන් ගත් විට, අපි සංචාරක ව්‍යාපාරය වෙත අපගේ අවධානය කඩිනමින් යොමු කළ අතර, වැදගත් අභ්‍යන්තර සංචාරක ප්‍රභවයන් සහිත වෙළඳපළ වෙත මාර්ග කිහිපයක් ආරම්භ කළෙමු. එමෙන්ම අපි සුප්‍රකට ප්‍රංශ ත්‍රාසජනක ගමන්මඟ, රේඩ් ඇමසෝන්ස් 2022 සඳහා ශ්‍රී ලංකාව තුළ සත්කාරකත්වය සැපයීම ඇතුළුව ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් මාලාවක් සිදු කිරීමේ වගකීමද අපි භාර ගත්තෙමු.

අපි තීරණ ගැනීමේදී අප පාරිභෝගිකයා ප්‍රමුඛස්ථානයේ තබා කටයුතු කරන අතර, එබැවින්, වඩාත් සංවර්ධිත පාරිභෝගික අත්දැකීමක් ලබා දීම සඳහා අපගේ සේවාවන් වැඩිදියුණු කිරීමට නිරන්තරයෙන් උත්සාහ කරමු. මෙයට සමගාමීව, අපගේ මගීන්ට බාධාවකින් තොරව සංචාරක අත්දැකීමක් ලබා දීම සඳහා අපි අපගේ ඩිජිටල් හැකියාවන් වැඩිදියුණු කළෙමු. මීට අමතරව, ගුවන් ගමන අතරතුර අද්විතීය අත්දැකීමක් ලබා දීම සඳහා, අපි "ශ්‍රී ලාංකේය රසයන්" යන තේමාව යටතේ වසර තුළදී අපගේ යානස්ථ මෙනුව සඳහා නව ශ්‍රී ලාංකික ආහාර වර්ග රැසක් එළිදැක්වූවෙමු - එය එතැන් පටන් ඉතා ජනප්‍රිය වී ඇත.

අතිරේක ආදායම් මාර්ග සංවර්ධනය කිරීම සඳහා වන අප අභිප්‍රායේදී, අපගේ අනුබද්ධ ව්‍යාපාර පුළුල් කිරීමට ද අපි පියවර ගත්තෙමු. අපගේ අභ්‍යන්තර නඩත්තු, අලුත්වැඩියා සහ මෙහෙයුම් අංශය වන ශ්‍රීලංකන් ඉංජිනියරින්, නව පාරිභෝගික ගුවන් සේවා කිහිපයක් ඇතුළත් කිරීමත් සමඟ වසර තුළ එහි තෙවන පාර්ශ්වීය නඩත්තු සේවාලාභීන් සැලකිය යුතු ලෙස පුළුල් කෙරුණි. මීට අමතරව, අපගේ භූමි හැසිරවීමේ ව්‍යාපාරය ඉහළ සේවා ප්‍රමිතීන් සහ නියමිත වේලාවට අත්කර ගන්නා කාර්යසාධනය අඛණ්ඩව පවත්වා ගෙන ගිය අතර, වඩාත් අභියෝගාත්මක තත්ත්වයන් යටතේ ජාත්‍යන්තර ගුවන් සමාගම් රැසකට සිය සේවා සපයයි. අපගේ පුහුණු අංශය වන ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලයද එහි පුහුණු වැඩසටහන් කළඹ වැඩිදියුණු කර ඇති අතර ගුවන් සේවා පිළිබඳ විශේෂඥ උපාධි පිරිනමන ආයතනයක් බවට පත්වීමට කටයුතු කරමින් සිටී.

වසර තුළ ළඟා වූ තවත් ප්‍රධාන සන්ධිස්ථානයක් වූයේ මෙහෙයුම්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට සහ සන්නාම ප්‍රතිරූපය නංවාලීමට අප දරන උත්සාහය සම්මාන රැසක් හරහා ඇගයීමට ලක්වීමයි. "ලෝක සංචාරක සම්මාන උළෙල" දී 'ඉන්දියන් සාගර කලාපයේ ලොව ප්‍රමුඛතම ගුවන් සේවය - 2021' ලෙසත් "APEX Passenger Choice සම්මානය" වෙතින් මධ්‍යම/දකුණු

# ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය තවදුරටත්.

## "ඉදිරි වසරවලදී තිරසාර සහ ශක්‍ය ව්‍යාපාර වර්ධනයක් අත්කර ගැනීමට අප දැන් හොඳින් සූදානම්ව සිටින බව අපි තරයේ විශ්වාස කරමු."

ආසියාවේ "විශිෂ්ට කාර්ය මණ්ඩල සේවාව" ලෙසත් අපගේ අලෙවිකරණ ප්‍රයත්නයන් වෙනුවෙන් පැසිෆික් ඒෂියා සංචාරක සංගමයේ රන් සම්මානයෙන්ද අපි පිදුම් ලැබුවෙමු.

දේශගුණික විපර්යාස ලෝකයට බලපාන ප්‍රධාන අර්බුදයක් බව අපි වටහාගෙන සිටිමු. එබැවින් වගකිවයුතු ගුවන් සමාගමක් ලෙස අපගේ පියාසර කිරීම වඩාත් තිරසාර කිරීමේ මං සෙවීමට අපි අඛණ්ඩව කැපවී සිටිමු. මේ සම්බන්ධයෙන්, අපි කාබන්හරණය සඳහා වූ අපගේ ඉලක්ක වැඩිදියුණු කිරීම සඳහා 'Planet Friendly SriLankan' වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කර ඇති අතර ICAO CORSIA වැඩසටහන කැපවීමෙන් ක්‍රියාත්මක කරමු. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා අප දරන උත්සාහය අගයමින්, පසුගියදා නිමාවට පත් වූ 'ශීක් මොහොමඩ් බින් රෂීඩ් අල් මක්ටොයුම්' ගෝලීය ගුවන් උළෙලේදී ඉදිරිපත් කිරීම් 118 ක් අභිබවා අපගේ 'මතක' නම් වූ නවෝත්පාදක ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය සඳහා 'විශිෂ්ටතම ගුවන් සේවා තිරසාර සම්මානය' පිරිනැමුණි. මෙම ව්‍යාපෘතිය මගින් ගුවන් සමාගම විසින් ඉවතලන ද්‍රව්‍ය විවිධ පාරිභෝගික නිෂ්පාදන බවට ප්‍රතිනිර්මාණය කිරීම හරහා ගොඩකිරීමේ අපද්‍රව්‍ය සහ පාරිසරික පියසටහන් සඳහා ගුවන් සමාගමේ දායකත්වය අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

අභියෝගාත්මක දේශීය ආර්ථික තත්ත්වය, ඉහළ පොලී අනුපාත මෙන්ම ගුවන් යානා ඉන්ධන සැපයුමේ හිඟය හේතුවෙන් 2022/23 මූල්‍ය වර්ෂයේ පළමු භාගයේදී ගුවන් සමාගම විශාල අභියෝගවලට මුහුණ දුන්නේය. එහෙත් අඩු පිරිවැය පදනමක් සහ වාණිජ සහ මෙහෙයුම් යන දෙඅංශයේම ශීඝ්‍ර වර්ධනය හේතුවෙන්, එම කාලපරිච්ඡේදය සඳහා ධනාත්මක මෙහෙයුම් කාර්යසාධනයක් සමඟ අපගේ මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීමට අපි සමත් විය.

අවසාන වශයෙන්, සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, ව්‍යාපාරික හවුල්කරුවන්, ශ්‍රී ලංකා රජය සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ නොසැලෙන සහයෝගය වෙනුවෙන් මගේ අව්‍යාජ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අඛණ්ඩ විශ්වාසය සහ කැපවීම වෙනුවෙන් කළමනාකරණ කණ්ඩායමට සහ අපගේ සේවකයින්ට මම ස්තූති කිරීමට කැමැත්තෙමි. දූපත් රාජ්‍යයක් වශයෙන්, රටේ ආර්ථික සමෘද්ධිය සඳහා ගුවන් සම්බන්ධතාව අත්‍යවශ්‍ය අංගයක් ලෙස පවතින අතර, එබැවින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අපි, රටේ ආර්ථික ප්‍රතිසාධන ඉලක්කවලට අඛණ්ඩව සහය දෙමින් ජාතික ගුවන් සේවය ලෙස අපගේ වගකීම ඉටු කිරීමට අධිෂ්ඨාන කරගෙන සිටිමු. ඉදිරි වසරවලදී තිරසාර සහ ශක්‍ය ව්‍යාපාර වර්ධනයක් අත්කර ගැනීමට අප දැන් හොඳින් සූදානම්ව සිටින බව අපි තරයේ විශ්වාස කරමු.

**රිචඩ් නටොල්**
*ප්‍රධාන විධායක නිලධාරී*



# අධ්‍යක්ෂ මණ්ඩලය

## අසෝක පතිරගේ මහතා

2019 දෙසැම්බර් 16 වන දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු අසෝක පතිරගේ මහතා, පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වන ලදී. හෙතෙම සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආසිරි සර්ජිකල් හොස්පිට්ල්ස් පීඑල්සී සහ ඔඩෙල් පීඑල්සී හි සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂවරයා වේ. පතිරගේ මහතා සමූහයේ සෙසු සමාගම්වලට අමතරව, සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී සහ සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි සභාපතිවරයා වශයෙන් සේවය කරයි. ඒ මහතා සීමාසහිත එන්.ඩී.බී කැපිටල් හෝල්ඩින්ග්ස් හි සභාපතිරවරයාද වේ.

ශ්‍රී ලංකාවේ ආයතනික ක්ෂේත්‍රය තුළ පැහැදිලි දර්ශනයක් සහිත ව්‍යාපාරික නියමුවකු වශයෙන් ඇගයුමට පාත්‍ර වන ඒ මහතා, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමූහ ව්‍යාපාරයක් වන සොෆ්ට්ලොජික් සමූහයේ නිර්මාතෘවරයා ද වේ. ඔහු සතු මනා ප්‍රායෝගික දැනුම් සම්භාරය තුළින්, 10,000 කට අධික සේවක පිරිසකට රැකියා අවස්ථා උදාකරමින්, සමාගම් 50 කට අධික සංඛ්‍යාවක් කළමනාකරණය කරනු ලබයි. ප්‍රධාන වෙළඳපොළකට හිමිකම් කියන, සිල්ලර වෙළඳ සහ විදුලි සංදේශ, සෞඛ්‍යාරක්ෂණ සේවා, මූල්‍ය සේවා සහ තොරතුරු තාක්ෂණය, සහ සංචාරක සමූහයට සහ මෝටර් රථවාහන යන සමගාමී ක්ෂේත්‍රයන් හතරක පතිරගේ මහතා විසින් ක්‍රමෝපායික මඟපෙන්වීමක් ලබා දෙයි.

## මලික් ජේ. ප්‍රනාන්දු මහතා

2020 ජනවාරි 08 වැනි දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුණු මලික් ජේ. ප්‍රනාන්දු මහතා පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරිණ. හෙතෙම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ සහ එහි පරිපාලිතයේ විගණන කමිටුවෙහි, මානව සම්පත් කමිටුවෙහි සහ ව්‍යවසාය අවදානම් කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයෙකි.

ප්‍රනාන්දු මහතා ඩිල්මා තේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රථම සුඛෝපභෝගී නිකේතන සන්නාමය වන 'රෙස්ප්ලෙන්ඩන්ට් සිලෝන්' හි කළමනාකරණ අධ්‍යක්ෂවරයෙකි. එමඟින් සංචාරකයින් වෙත නියම දේශීය අත්දැකීමක් ලබාදෙමින් MJF පදනම සහ "ඩිල්මා කන්සවේෂන්" ඔස්සේ දේශීය ප්‍රජාවන් සහ පරිසරය වෙත දායකත්වය සපයයි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු, ඒ මහතා 'ලව් ශ්‍රී ලංකා' "Love Sri Lanka" තේමාව යටතේ පෞද්ගලික සංචාරක ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කළේය.

ප්‍රනාන්දු මහතා ඇමරිකා එක්සත් ජනපදයේ බැබ්සන් විද්‍යාලයේ (Babson College) ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරියෙකි.

## ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා

ආචාර්ය හංස විජයසූරිය මහතා, 2020 ජනවාරි 23 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කරන ලදී. හෙතෙම මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සේවය කරන අතර විගණන කමිටුවේ සහ ව්‍යවසාය අවදානම් කළමනාකරණ කමිටුවේ ද සාමාජිකයෙකි.

ඒ මහතා දැනට ආසියාටා සමූහයේ විදුලි සංදේශ ව්‍යාපාරයෙහි ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් කටයුතු කරන අතර මැලේසියාව, ඉන්දුනීසියාව, බංග්ලාදේශය, නේපාලය, ශ්‍රී ලංකාව සහ කාම්බෝජය යන රටවල වෙළඳපොළ පුරා පැතිරුණු සමූහයේ කලාපීය විදුලි සංදේශ මෙහෙයුම්වල ප්‍රධානත්වය උසුලයි. ආසියාටා, ආසියාවේ දෙවන විශාලතම විදුලි සංදේශ සමූහය වේ.

ආසියාටා සමූහයේ කලාපීය පරිපාලිතයන් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට අමතරව, ආචාර්ය විජයසූරිය ඩයලොග් ආසියාටා පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි. 2016 වර්ෂය දක්වා, ආචාර්ය විජයසූරිය මහතා, ඩයලොග් ආසියාටා පීඑල්සී සමූහයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළේය. එමෙන්ම ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ජෝන්කීල්ස් හෝල්ඩින්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කරයි.

2016 වර්ෂයේදී, "ආසියානු ජංගම සන්නිවේදන ක්ෂේත්‍රයට විශිෂ්ඨ දායකත්වය" සම්මානයෙන් පිදුම් ලද ප්‍රථමයා වශයෙන් ආචාර්ය විජයසූරිය GSM සංගමයෙහි ගෞරවයට පාත්‍රවිය. ආචාර්ය විජයසූරිය මහතා GSM සංගමයෙහි කලාපීය කණ්ඩායම වන GSM ඒෂියා පැසිෆික් හි හිටපු සභාපතිවරයෙකු වේ. ආචාර්ය විජයසූරිය මහතා 2008 වර්ෂයේදී 'ප්‍රිමියර් බිස්නස් ජර්නල්, LMD' සඟරාව මඟින් "වසරේ ශ්‍රී ලාංකිකයා" වශයෙන් නම් කෙරිණි. ආචාර්ය විජයසූරිය මහතා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ව්‍යාපාරික මණ්ඩලය වන ලංකා වාණිජ මණ්ඩලයේ ආසන්නතම හිටපු සභාපතිවරයා විය.

## ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා

ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතා 2021 මාර්තු 27 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කෙරුණු අතර ඉන් අනතුරුව 2021 මැයි 21 දින සිට බලපැවැත්වෙන පරිදි සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කෙරිණි. හෙතෙම ව්‍යවසාය අවදානම් කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා වන අතර සමාගමේ සහ එහි පරිපාලිතයෙහි විගණන කමිටු සාමාජිකයෙකුද වේ.

පෙරේරා මහතාට මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 40කට අධික පළපුරුද්දක් ඇති අතර එයින් වැඩි කොටසක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ අධ්‍යක්ෂ මණ්ඩලවල සේවාවන්ය. පෙරේරා මහතා ලන්ඩනයේ වරලත් බැංකුකරණ ආයතනයෙහි සාමාජිකයෙකු වන අතර ලන්ඩන්, නිව් යෝර්ක්, සැන් ෆ්‍රැන්සිස්කෝ, හොන්ග් කොන්ග් සහ සිංගප්පූරුවෙහි පිහිටි ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන්ගෙන් හසළ පුහුණුවක් ලබා ඇත.

දැනට පෙරේරා මහතා, මැක්ලරන්ස් සමූහ ආයතනයන් සහ ඉන්ටර් ඕෂන් එනර්ජි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයෙහි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස, සහ ප්‍රිමියර් ෆිසිෂන්ස් මෙඩිකල් සමූහ ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කරයි. එමෙන්ම ඔහු සින්ගර් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයේ අවදානම් කළමනාකරණ කමිටු සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂක ධුරයද, විගණන කමිටු සාමාජික ධුරයක්ද දරයි. ඔහු යුරෝපයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ නැව් සමාගම් සහ සංචාරක ආයතන නියෝජනය කරන සංචාරක ක්ෂේත්‍රයේ ඉහළ පිළිගැනීමක් ඇති ක්වෙස්ට් ඩෙස්ටිනේෂන්ස් ආයතනයේ අධ්‍යක්ෂවරයාය.

පෙරේරා මහතා සිය කීර්තිමත් වෘත්තීය ජීවිත තුළ හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී (HNB) - ජාත්‍යන්තර, ව්‍යාපාර ප්‍රවර්ධන සහ ආයතනික ණය ඇතුළු භාණ්ඩාගාරික කටයුතු අංශයෙහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කළේය. එමෙන්ම ඔහු HNB ඇෂුවරන්ස් පීඑල්සී නිර්මාතෘ අධ්‍යක්ෂකවරයෙකුද වේ. ඔහු ඇකියුට් ස්ටොක්බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, HNB සහ DFCC බැංකු හවුල් හිමිකාරීත්වයෙන් යුත් ඇකියුට් සෙකියුරිටි සහ ඇකියුට් පාට්නර්ස් යන ආයතනවල කළමනාකරණ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේය. මෙම ධුරයන් දැරීමෙන් ව්‍යාපාර වර්ධනය සඳහා අතිමහත් දායකත්වයක් සපයන ලදී. එතුමා ලංකා වෙන්චර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එල්. වී. එල්. එනර්ජි ආයතනවල අධ්‍යක්ෂ ධුර දැරීය. පෙරේරා මහතා HNB හි සේවා කාලය තුළදී, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලීය සාමාජිකයෙක් ලෙස ශ්‍රී ලංකා මහා බැංකුව සමඟ සම්බන්ධීකරණයෙන්ද ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරන ලදී.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

### රිචඩ් නටොල් මහතා
*ප්‍රධාන විධායක නිලධාරී*

රිචඩ් නටොල් මහතා 2021 නොවැම්බර් මස ආරම්භයේ සිට ප්‍රධාන වාණිජ නිලධාරීතුමා ලෙස ගුවන් සේවයට සම්බන්ධ වූ අතර, 2022 ජනවාරි 1 වන දින සිට වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරීතුමා බවට පත් විය. පසුව ඔහු 2022 අප්‍රේල් 29 දින සිට ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් වන ලදී.

ගුවන් සේවා ක්ෂේත්‍රයේ වසර 30ක පළපුරුද්දක් ඇති ඔහු ලොව පුරා විවිධ මෙහෙයුම් අංගයන් ආවරණය වන පරිදි බොහෝ ගුවන් සේවාහි විවිධ ජ්‍යෙෂ්ඨ භූමිකාවන් දරා ඇත. මේ සඳහා ඇතුළත් වන්නේ:

- සවුදි එයාර්ලයින්ස්හි විවිධ භූමිකාවන්. ආරම්භයේදී වෙළඳ පරිවර්තනයේ උප සභාපතිතුමා ලෙස පත් කරන ලදුව, පසුව විකුණුම් අංශයෙහි උප සභාපතිතුමා ලෙස කටයුතු කළ අතර, ඔහු විසින් නිෂ්පාදන සහ අලෙවිකරණය සඳහා අමතර වගකීම්ද දරන ලදී. ඔහු වාර්ෂික ආදායමෙන් ඩොලර් බිලියන 6ක් සමඟ ගුවන් සමාගමක් සඳහා වන වාණිජ උපාය මාර්ගයේ හිමිකාරිත්වයෙහි කොටස්කරුවෙකු වූ අතර ගෝලීය වශයෙන් 2,700ක කාර්ය මණ්ඩලයක් මෙහෙයවීය. වසර 3ක් පුරාවට 30% ක ජාත්‍යන්තර මඟී වර්ධනයක් ලබාදී, කලාපීය සාමාන්‍යයට වඩා බෙහෙවින් වැඩි, බෙදාහැරීමේ පිරිවැයෙහි 25% ක අඩුවීමක් අත්කර ගත් අතර, ක්ෂේත්‍රයේ හොඳම දෑට අනුකූලව ගුවන් සමාගමේ NPS ලකුණු ඉහළ නංවන සේවාවක් ආරම්භ කිරීමෙහි ලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය.
- රෝයල් ජෝර්ඩානියන්හි ප්‍රධාන වාණිජ සහ උපාය මාර්ගික නිලධාරීතුමා ලෙස ඔහු මුලපිරීම් 70ක් හඳුනාගනිමින්ද කාර්යසාධනය නිරීක්ෂණය කිරීමට සහ මැනීමට රාමුවක් නිර්මාණය කරමින්ද උපායමාර්ගික කාර්ය පිළිබඳ දැනුම ලබා දෙනු පිණිස ව්‍යාපාරික නායකයින් සහ ජාත්‍යන්තර වශයෙන් කීර්තිමත් උපදේශකයින් කණ්ඩායමකට නායකත්වය ලබා දුන්නේය. ඔහු ඩොලර් මිලියන 80ක ප්‍රගතියක් සහ 12%ක ආන්තික වර්ධනයක් සමඟින් ගුවන් සමාගම ලාභදායී තත්ත්වයට පත් කළේය.
- ස්කයිටීම් (Skyteam) අධීක්ෂණ මණ්ඩලයේ සවුදි එයාර්ලයින්ස්හි නියෝජිතයෙකු වූ අතර, පසුව ඔහු එහි නව පාලන ආකෘතියක් යටතේ විධායක මණ්ඩලයට සම්බන්ධ විය.
- අනෙකුත් තනතුරු අතර, බහරේන් එයාර්හි ප්‍රධාන විධායක නිලධාරීතුමා, කෙන්යා එයාර්වේස්හි වාණිජ අධ්‍යක්ෂකතුමා, පිලිපීන ගුවන් සේවය සමඟ ජ්‍යෙෂ්ඨ වාණිජ උපදේශකතුමා, ධුරවීය ගුවන් භාණ්ඩ සඳහා ඇමරිකා සමාගමෙහි විකුණුම් සහ අලෙවිකරණ අංශයන්හි උප සභාපතිතුමා සහ කැතේ පැසිෆික් එයාර්වේස්හි කළමනාකරණ භූමිකාවන් ඇතුළත් වේ.

නටොල් මහතා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙන් ගණිත උපාධියක් සහ ලන්ඩන් ව්‍යාපාරික අධ්‍යයනායතනයෙන් ස්ලෝන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

### යසන්ත දිසානායක මහතා
*මූල්‍ය කළමනාකරණ ප්‍රධානී*

යසන්ත දිසානායක මහතා 2004 දී සමාග මට සම්බන්ධ වූ අතර, වර්තමානයේ ඔහු මූල්‍ය කළමනාකරණ ප්‍රධානී තනතුර දරයි. සමාගමේ මූල්‍ය හා වාණිජමය ප්‍රසම්පාදන, ලොජිස්ටික්ස් සහ දේපළ අංශයන් ඔහු වෙත වාර්තා කරයි.

ආසියානු කලාපීය සම්මාන දෙකක් විසින් පිළිගත් ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ ඉස්ලාමීය මූල්‍යකරණ පහසුකම් ඇතුළු සමාගමේ පුරෝගාමී මූල්‍ය ගනුදෙනු රාශියකට ඔහු නායකත්වය දී තිබේ.

A 330- 300 ගුවන් යානා සමූහය සඳහා පූර්ව ලබාදීමේ මූල්‍යකරණ ගනුදෙනු සැකසීමේ දී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරන ලද අතර, එම ගනුදෙනුව " එයාර්ෆයිනෑන්ස්" සඟරා මගින් 2014 දී " වසරේ පූර්ව ලබාදීම් මූල්‍යකරන ගනුදෙනුව" වශයෙන් ඇගයුමට පාත්‍ර විය. සමාගම හා සම්බන්ධ වීමට පෙරාතුව, දිසානායක මහතා ආයෝජන බැංකුකරණ සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයන්හි ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හෙබවිය. හෙතෙම, වෘත්තියෙන් ගණකාධිකාරීවරයකු (එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙහි අධි සාමාජිකයකු) වන අතර, කාර්ඩිෆ් හි වේල්ස් සරසවියේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරියෙකි.

### ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය
*ආයතනික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය 2013 වසරේදී සමාගමේ සේවයට සම්බන්ධ වූවාය. ඇය සමූහයේ සමාගම් ලේකම් සහ ආයතනික ලේකම් සේවා ප්‍රධානී වශයෙන් කටයුතු කරයි. මෙම අංශය මගින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, ශ්‍රීලංකන් කේටරින් ප්‍රයිවට් ලිමිටඩ් වෙත ආයතනික ලේකම් සේවා සපයයි. ඇය මණ්ඩලය පත් කරන ලද සමාගමේ සහ එහි පරිපාලිතයේ අනු කමිටු - විගණන කමිටුව, මානව සම්පත් සහ වේතන කමිටුව සහ ආයතනික අවදානම් කළමනාකරණ කමිටුව සඳහා ලේකම් ලෙස කටයුතු කරනු ලබයි. ඇය "ශ්‍රී ලංකන් ක්‍යාස් ට්‍රස්ට්" භාරයේ භාරකාරිනියකි.

එතුමියට වසර 20 කට වැඩි පළපුරුද්දක් ඇති අතර ලංකාවේ ලැයිස්තුගත විවිධාංගීකරණය වූ සමාගම් හි ඉතා උසස් හා වගකිවයුතු තනතුරු හොබවා ඇත. එතුමිය එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන් සහ පරිපාලකයින්ගේ ආයතනයේ සාමාජිකාවක් වන අතර ඕස්ට්‍රේලියාවේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ (SLID) සාමාජිකාවක් මෙන්ම එම ආයතනය නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරුන්ගේ සංසදයේ ක්‍රියාකාරී කමිටුවේ සක්‍රිය සාමාජිකාවක් වේ.

### චාමර පෙරේරා මහතා
*සමූහයේ තොරතුරු තාක්ෂණ ප්‍රධානී*

ගුවන් සේවා තාක්ෂණය හා ස්වයං ව්‍යාපාරික ක්‍රියාවලි පිළිබඳ හසළ දැනුමක් සහ පළපුරුද්දක් සහිත චාමර පෙරේරා මහතා, ගුවන් සේවා ක්ෂේත්‍රයේ පරිණත වෘත්තිකයෙකි. හෙතෙම සමූහය වෙත තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් පරිවර්තනයන් සම්බන්ධයෙන් ක්‍රමෝපායික නායකත්වය ලබා දෙයි.

1999 වර්ෂයේදී ගුවන් සේවා ක්ෂේත්‍රයට එක්වූ චාමර පෙරේරා මහතා දශක දෙකක කාලයක් පුරා ජාතික ගුවන් සේවය සමඟ කටයුතු කරයි. ඔහු ගුවන් සමාගමේ කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු කිහිපයකම සේවය කර ඇති අතර, 2012 වසරේදී තොරතුරු තාක්ෂණ ප්‍රධානී ලෙස පත් විය. පසුව 2021 වසරේදී ශ්‍රීලංකන් සමූහයෙහි තොරතුරු තාක්ෂණ අංශයේ වගකීම එම මහතා හට පැවරී ඇත.

එතුමා ශ්‍රීලංකන් සමූහයේ ගුවන් සේවා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ඩිජිටල් පරිසර පද්ධති ලෝක ව්‍යාප්ත මෙහෙයුම්වල නිරත තීරණාත්මක ගුවන් සේවා පද්ධතිවල සහ ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ විසඳුම් දක්වා ගුවන් සමාගම් සමූහයේ ඩිජිටල් පරිවර්තන උපායමාර්ග කටයුතු සොයා බලයි. පෙරේරා මහතා ගුවන් සේවාවල තාක්ෂණික භාවිතය ඉහළ නැංවීම සඳහා, ගුවන් ප්‍රවාහන ක්‍රියාවලීන්හි විවිධ ස්පර්ශක ස්ථාන හරහා මඟී කේන්ද්‍රීය ඊ-ව්‍යාපාරික විසඳුම් සහ සේවාවන් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික නවෝත්පාදනයන්හි බොහෝ පුරෝගාමී ක්‍රියාත්මක කිරීම් මෙහෙයවීය. කඩිනම් සංචාරක තාක්ෂණ අනුවර්තනයන් සඳහා වූ IATA ව්‍යාපාරය සරල කිරීමේ වැඩසටහන (StB) ව්‍යාපාර මෙහෙයවීම සඳහා දත්ත පදනම් කරගත් ගුවන් සේවා වේදිකාවක්

ක්‍රියාත්මක කිරීම, ගුවන් ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් සේවා උප පද්ධතිවලට අනුකූල වීම එතුමාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපාර කාර්යයක් වේ. ශ්‍රීලංකන් ගුවන් සමූහය සඳහා තොරතුරු තාක්ෂණ පාලන ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීමට ද එතුමා කටයුතු කළේය. ISO/ IEC 27001:2013 තොරතුරු ආරක්ෂක කළමනාකරණය, ISO/9001: 2015 මෘදුකාංග තත්ත්ව කළමනාකරණය, සහ ISO/ IEC 20000:2018 තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණය සඳහා ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණය සහතික වී ඇත.

ජාතික ගුවන් සේවයේ සමස්ත තාක්ෂණික පිරිවැය තාර්කික කිරීම සඳහා මිල අධික පැරණි ගුවන් සේවා පද්ධති පිරිවැය ඵලදායී හා නවෝත්පාදන කට්ටලයක් සමඟ වෙනස් කිරීමට හා ප්‍රතිස්ථාපනය කිරීමට පෙරේරා මහතා නායකත්වය ලබා දී ඇත. තවද, ගුවන් සේවා ප්‍රජාව සඳහා අලෙවි කළ හැකි සේවා හා විසඳුම් සකස් කරමින්, එතුමාගේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ වැඩි දියුණු කිරීම සහ විසඳුම් සඳහා ජාතික හා ජාත්‍යන්තර සම්මාන දිනාගෙන ඇත.

පෙරේරා මහතා ලයිස්ටර් විශ්ව විද්‍යාලයේ (එක්සත් රාජධානියේ) තොරතුරු තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලන (MBA) උපාධියක් ලබා ඇත. මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා ඇති එතුමා වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකි. එමෙන්ම එතුමා තොරතුරු තාක්ෂණ විශේෂීකරණයන්ට අදාළ වෘත්තීය සුදුසුකම්, සහතිකපත් සහ ජාත්‍යන්තර ආයතනවල පිළිගැනීම ලබා ඇත.

## බුද්ධිකා මානගේ මහත්මිය

*සමූහයේ මානව සම්පත් හා ගුවන් මැදිරි සේවා ප්‍රධානී*

බුද්ධිකා මානගේ මහත්මිය 2003 වසරේදී කළමනාකරණ පුහුණුකරුවෙකු ලෙස ගුවන් සේවයට බැඳුණු අතර 2004 දී වාණිජ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරිනියක ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළාය. ඇයට ගුවන් සේවයේ වසර 19 ක පළපුරුද්දක් ඇති අතර, වාණිජ ප්‍රසම්පාදන විධායක (ව්‍යාපෘති), ජ්‍යෙෂ්ඨ ගුවන් යානාස්ථ විධායක නිලධාරී (පරිපාලක සහ කාර්ය මණ්ඩල සේවා), ගුවන් ගමන් සේවා කළමනාකාරිනී (පරිපාලක හා කාර්ය මණ්ඩල උපලේඛනගත කිරීම), කළමනාකාරිනී මානව සම්පත් සංවර්ධන හා හවුල් ව්‍යාපාර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී මානව සම්පත් සංවර්ධන හා හවුල් ව්‍යාපාර, සහ කැබින් සේවා ප්‍රධානී ලෙස කටයුතු කරනු ලබයි. ගුවන් මැදිරි සේවා ප්‍රධානී තනතුරට අමතරව, 2020 ජනවාරි සිට වැඩබලන මානව සම්පත් ප්‍රධානීතුමිය ලෙස ද එතුමිය පත් කෙරිණි. 2020 ජූලි සිට බලපැවැත්වෙන පරිදි එතුමිය මානව සම්පත් හා ගුවන් මැදිරි සේවා යන අංශ දෙකේම "මානව සම්පත් සහ ගුවන් මැදිරි සේවා ප්‍රධානී" ලෙස ස්ථිරව පත් විය.

2020 සැප්තැම්බර් මාසයේදී එතුමිය ගුවන් සේවයේ රාජකාරිවලට අමතරව, ශ්‍රීලංකන් කේටරින්හි මානව සම්පත් කාර්යය අධීක්ෂණය සඳහා මැදිරි සේවා ප්‍රධානී තනතුර මෙන්ම මානව සම්පත් මැදිරි සේවා සමූහ ප්‍රධානී ලෙස පත් කරන ලදී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි සහ ශ්‍රීලංකන් කේටරින්හි සමස්ත මානව සම්පත් ක්‍රියාකාරිත්වය සහ එයාර්ලයින්ස්හි කැබින් කාර්යය මණ්ඩලය පරිපාලනය සහ ගුවන් යානාස්ථ සේවා මෙහෙයුම් ඇයගේ විෂය පථය යටතේ පවතී.

එතුමිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංඛ්‍යානය පිළිබඳ (ගෞරව) විශේෂ BSc උපාධියක් ද, මොරටුව විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ MSc උපාධියක් සහ වරලත් පිරිස් කළමනාකරණය ආයතනයේ (CIPM) වරලත් සාමාජිකාවක ද වේ. ඇය කම්කරු නීතිය, සැපයුම් දාම කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි ද සුදුසුකම් සපුරා ඇත. ඇය මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමයෙහි (AHRP) වෘත්තීය සාමාජිකාවකි.

## දිමුතු තෙන්නකෝන් මහතා

*ලෝක ව්‍යාප්ත විකුණුම් සහ බෙදාහැරීමේ ප්‍රධානී*

දිමුතු තෙන්නකෝන් මහතා දැනට ගුවන් සමාගමේ ලෝක ව්‍යාප්ත මගී අලෙවිය, අලෙවි නාලිකා ජාල කළමනාකරණය සහ විකුණුම් මෙහෙයුම් පිළිබඳ මූලිකත්වය ගෙන කටයුතු කරයි. 2017 අප්‍රේල් මාසයේ සිට වර්තමාන භූමිකාව සඳහා තේරී පත් වූ ඔහු ගුවන් සේවා විකුණුම්, මූල්‍ය කළමනාකරණය, ආදායම් කළමනාකරණය සහ වාණිජ සැලසුම් පිළිබඳ වසර 25කට වැඩි පළපුරුද්දක් දරයි.

1992 වසරේ දී ශ්‍රීලංකන් පවුලට සම්බන්ධ වූ තෙන්නකෝන් මහතා, සිය වෘත්තීය ජීවිතයේ මුල් වසරවලදී මූල්‍ය ආදායම් සැලසුම්කරණය, ජාල සැලසුම්කරණය, මාර්ග සැලසුම්කරණය සහ මිල ගණන් ආදී විවිධ දෙපාර්තමේන්තු හි සේවය කර ඇත. ඔහුගේ විදේශීය කාර්යභාරයන් අතරට ඩුබායි, කැනඩාව හි විකුණුම් කළමනාකරු, මුම්බායි පිහිටි මහාරාෂ්ට්‍ර සහ ගුජරාට් ප්‍රදේශ හි කළමනාකරු සහ චීනයේ බෙයිජින් හි පිහිටි ආසියා පැසිෆික් සහ ඕස්ට්‍රේලියානු කලාපීය කළමනාකරු යන භූමිකාවන් ඇතුළත් වේ.

තවද, ඔහු උතුරු ඉන්දීය ඕමාන් එයාර් හි දේශීය කළමනාකරු ලෙස ඕමාන් එයාර් හි උතුරු ඉන්දීය මෙහෙයුම් අධීක්ෂණ වගකීම් ඉටුකර ඇත.

තෙන්නකෝන් මහතා ලෝක ව්‍යාප්ත විකුණුම් සහ බෙදාහැරීම් ප්‍රධානියා ලෙස පත්වීමට පෙර, සාමාන්‍යාධිකාරී වාණිජ මෙහෙයුම් ලෙස දායක වූ අතර එහිදී ඔහු ප්‍රාදේශීය විකුණුම්, විකුණුම් සංවර්ධන, නිෂ්පාදන සංවර්ධන, පාරිභෝගික කටයුතු, කර්මාන්ත කටයුතු, ශ්‍රීලංකන් හි නිවාඩු කටයුතු, ඊ-වාණිජ්‍යය, ගෝලීය ඇමතුම් මධ්‍යස්ථානය මෙහෙයවීම්, නාලිකා කළමනාකරණය සහ පාරිභෝගික ලැදියා කළමනාකරණය වැනි විවිධ දෙපාර්තමේන්තු හි සිය ජාත්‍යන්තර ගුවන් සේවාව පිළිබඳ ඔහුගේ දැනුම සහ ප්‍රවීණත්වය පිළිබිඹු කර ඇත. මෙම කාලය තුළ ඔහු මැදපෙරදිග කලාපය භාර ප්‍රාදේශීය කළමණාකරු ලෙස අමතර වගකීමක් හොබවා ඇත.

තෙන්නකෝන් මහතා, දැඩි කර්මාන්ත තරඟකාරීත්වය සහ සමකාලීන අභියෝග සාර්ථකව ජය ගැනීම සඳහා ඔහුගේ සුවිශේෂී විකුණුම් වර්ධන උපාය මාර්ග සඳහා පැසසුමක් ලබයි. නව්‍ය සහ ඵලදායී වාණිජ භාවිතයන් වෙනුවෙන් පෙනී සිටින තෙන්නකෝන් මහතා, ගුවන් සේවයේ වාණිජ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම පිළිබඳ ඔහුගේ දැක්ම සම්බන්ධව ප්‍රසිද්ධියක් ලබා ඇත. ඔහු තම කණ්ඩායම ප්‍රබෝධමත් කිරීම සහ බලගැන්වීම තුළින් ආයතනික වර්ධනය අපේක්ෂා කරන කැපවූ නායකයෙකි.

තෙන්නකෝන් මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධිධාරියෙකු මෙන්ම, බකිංහැම්ෂයර් නව විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ජාත්‍යන්තර ශාස්ත්‍රපති උපාධියක් හිමිකම් කියමින් ශ්‍රී ලංකා ගුවන් සේවා නියෝජිත මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරනු ලබයි.

## කැප්ටන් පැට්රික් ප්‍රනාන්දු මහතා

*ගුවන් මෙහෙයුම් ප්‍රධානී (ගුවන් නියමු කණ්ඩායම)*

ශ්‍රීලංකන් සමාගම, එයාර් ලංකා ලෙස හැඳින්වූ 1992 වසරේදී එතුමා L1011 කණ්ඩායමේ කැඩෙට් නියමුවරයෙකු ලෙස එහි සේවයට බැඳුනේය. එතුමා L1011, A320, 330 සහ A340 ගුවන් යානා පියාසර කර ඇත. වසර 20 කටත් වැඩි කාලයක් කපිතාන්වරයෙකු ලෙසත්, වසර 15 කටත් වැඩි කාලයක් උපදේශකවරයෙකු ලෙසත්

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම තවදුරටත්.

කටයුතු කර ඇත. ප්‍රනාන්දු මහතා 2011 වසරේ දී නියෝජ්‍ය ප්‍රධාන නියමු පුහුණුව හා ප්‍රමිති සහ පසුව ප්‍රධාන නියමු පුහුණුව හා ප්‍රමිති වශයෙන් කළමනාකාරිත්වයට සම්බන්ධ විය.

A320/330 කණ්ඩායමේ වත්මන් අණ දෙන නිලධාරීතුමන්, සිමියුලේටර් සහ රේඛා උපදේශක මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා ආයතනය (CAASL) සඳහා නියම කළ පිරික්සුම් නියමුවරයෙකු ද වේ.

## සමින්ද පෙරේරා මහතා
*අලෙවිකරණ ප්‍රධානී*

සමින්ද පෙරේරා මහතා විසින් 2015 ජූනි මස සිට ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අලෙවිකරණ සහ ආයතනික සන්නිවේදන උපායමාර්ගය මෙහෙයවනු ලැබේ. ඔහු දශක දෙකකට වැඩි කාලයක් උපායමාර්ගික අලෙවිකරණය සහ ගෝලීය විකුණුම් පිළිබඳ විශේෂඥයෙකු ලෙස ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ සේවය කරනු ලබයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම එමිරේට්ස් යටතේ පැවති කාලයේ එහි වාණිජ විධායකයෙකු ලෙස සම්බන්ධ වූ පෙරේරා මහතා, ආයතනික සන්නිවේදන වැඩබලන ප්‍රධානී, ප්‍රංශයේ වාණිජ කළමනාකරු, ශ්‍රී ලංකාව සහ මාලදිවයින කලාපීය කළමනාකරු සහ ලෝක ව්‍යාප්ත විකුණුම් පිළිබඳ සාමාන්‍යාධිකාරී වැනි ගුවන් සේවයේ ප්‍රමුඛ තනතුරු රැසක් දරන්නට විය. අලුතින් ස්ථාපිත වෙළඳපොළ/ගමනාන්තයන්හි වෙළඳ සන්නාමය ප්‍රතිෂ්ඨාපනය, අලෙවිකරණ නවෝත්පාදන සහ පාරිභෝගික කේන්ද්‍රීය, සාකල්‍ය සන්නිවේදනය යන ක්ෂේත්‍රහි ඔහු ප්‍රවීණත්වයක් දරයි. ඔහු ජාත්‍යන්තර සංසදවලදී පිළිගන්නා ලද ගෝලීය ගෞරවයට පත් වූ අලෙවිකරණ සන්නිවේදන ප්‍රයත්නයන් රැසකට එයාර්ලයින්ස් අලෙවිකරණ කණ්ඩායම සඳහා මඟ පෙන්වා ඇත.

ඔහු මුම්බායි සරසවියෙන් මූල්‍ය ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ වාණිජවේදී උපාධියක් ලබා ගෙන ඇති අතර ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයෙන් (IATA) ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාවක් (ගුවන්සේවා අලෙවිකරණය, ගුවන්සේවා මූල්‍ය, ගිණුම්කරණය, නැවතුම් කළමනාකරණය) ලබා ගෙන ඇත.

## කේ. අර්ජුන කපුගීකියන මහතා
*ජ්‍යෙෂ්ඨ කළමනාකරු ගුවන් යානා නඩත්තු කටයුතු*

අර්ජුන කපුගීකියන මහතා, එවකට එයාර්ලන්කා ලෙස හැඳින්වූ ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්හි ඉංජිනේරු අංශය සමග 1984 වසරේදී ආධුනිකයෙකු ලෙස සම්බන්ධව, 2018 මැයි මස ගුවන් යානා නඩත්තු කිරීමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණතුමා ලෙස පත් වූ අතර 2023 මාර්තු මස ඉංජිනේරු අංශයේ ප්‍රධානියා ලෙස උසස්වීමක් ලබන ලදි. ඔහු ඉංජිනේරු හා ගුවන් යානා නඩත්තු අංශයේ ප්‍රධානියා වේ.

එතුමා, එයාර්බස් A320/330/340 ගුවන් යානා සඳහා සහතික ලත් වරප්‍රසාද සහිත බලපත්‍රලාභී ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවරයෙකි. ඔහු ඉංජිනේරු සහ නඩත්තු අංශයේ බොහෝ කළමනාකරණ තනතුරු දැරීය. බහු සංස්කෘතික පරිසරයක් තුළ 1988 වසර සිට 1991 වසර දක්වා ඔහු ගල්ෆ් ගුවන් යානා නඩත්තු සමාගමෙහි කෙටි කාලයක් සේවය කළේය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් ගුවන් යානා නඩත්තු බලපත්‍රයක් හිමි කපුගීකියන මහතා, කේම්බ්‍රිජ් (එංගලන්තය) විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

## ප්‍රීමාල් ද සිල්වා මහතා
*සාමාන්‍යාධිකාරී ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය*

1988 දී සමාගමේ ගුවන් කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සේවයට එක් වූ ප්‍රීමාල් ද සිල්වා මහතා, ගුවන් කර්මාන්තයේ වසර 34ක සේවා කාලයක් සඳහා හිමිකම් කියනු ලබයි. ගුවන් මැදිරි ආරක්ෂක, මෙහෙයුම් සහ පුහුණු කටයුතු කළමනාකරණය ඇතුළු ගුවන් යානාස්ථ සේවා කළමනාකරණය කිරීමෙන් ප්‍රගතියක් ලබා ඇති ඔහු 2014 වසරේදී ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය සඳහා විශිෂ්ට මඟ පෙන්වීමක් ලබා දුන් අතර දැනට සාමාන්‍යාධිකාරී තනතුර දරනු ලබයි. වත්මන් භූමිකාවේදී ගුවන්යානා නඩත්තු සහ ඉංජිනේරු පුහුණු ආයතනයට අදාළ වගකීම් භාර කළමනාකරු (147 කොටස) තනතුරු දරයි.

ප්‍රීමාල් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙන් කම්කරු සබඳතා හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් දරයි. එතුමා ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනයෙන් පුහුණු හා සංවර්ධන පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හිමිකරගෙන ඇත.

## ලුතිනන් කර්නල් බන්දුල වේරගම මහතා
*සාමාන්‍යාධිකාරී සමූහ ආරක්ෂණය*

ශ්‍රී ලංකා යුද හමුදාවේ වසර 23 ක සේවා කාලයකින් පසුව වර්ෂ 2012 දී ලුතිනන් කර්නල් බන්දුල වේරගම මහතා සමාග මේ සේවයට එක් විය. ත්‍රිවිධ හමුදා පරිසරය ආශ්‍රිත අණදීම හා පුහුණුවට අමතරව ඒ මහතා එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහිද සේවය කර ඇත. සමාගමේ මානව සම්පත්, ගුවන් යානාස්ථ හා ආරක්ෂක අංශවලට සේවා සැපයූ වේරගම මහතා ගුවන්තොටුපළ හා ගොඩබිම් සේවා අංශයේ ප්‍රධානියා ලෙස 2016 වසරේ පෙබරවාරි මාසයේදී පත් කරන ලදී. බන්දුල මහතා, 2020 අප්‍රේල් මාසයේදී භාරගත් පත්වීමක් වශයෙන් කණ්ඩායම් ආරක්ෂක අංශයේ කටයුතු මෙහෙයවයි.

කැලණිය විශ්වවිද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් හිමි එතුමා පාකිස්තානයේ ක්වෙට්ටා විශ්වවිද්‍යාලයේ විද්‍යාපති උපාධියක් ද ලබාගෙන ඇත.

## චමින්ද පෙරේරා මහතා
*සාමාන්‍යාධිකාරී - ගුවන් භාණ්ඩ*

චමින්ද පෙරේරා මහතා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමඟ 2022 ජනවාරි මස සාමාන්‍යාධිකාරී - ගුවන් භාණ්ඩ ලෙස සම්බන්ධ වූවේය. එතුමා වාණිජ ගුවන් භාණ්ඩ සහ ගොඩබිම් සේවා මෙහෙයුම් හැසිරවීම සම්බන්ධයෙන් ගුවන්සේවා කර්මාන්තයේ වසර 30 කට අධික පළපුරුද්දක් දරයි. පෙරේරා මහතා ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි සිය වෘත්තීය කටයුතු ගොඩබිම් සේවා මෙහෙයුම් හැසිරවීම් අංශයෙන් ආරම්භ කළ අතර භාණ්ඩ ප්‍රවාහනයේ වාණිජ අංශයේ කටයුතු හැසිරවීම සම්බන්ධයෙන් ඇති අභිලාෂය හේතුවෙන් ලුෆ්තාන්සා වෙත ගමන් කළේය. ඊළඟ පියවර ලෙස චයිනා එයාර්ලයින්ස් වෙත ගුවන් භාණ්ඩ අලෙවි සහ පාරිභෝගික සේවා කළමනාකරු ලෙස වාණිජ සහ ගොඩබිම් සේවා මෙහෙයුම් කටයුතු මෙහෙයවන කණ්ඩායමක් කළමනාකරණය කළ අතර ඉන්පසු එමිරේට්ස්හි වසර 16 ක කාලයක් පුරා සේවය කළේය. එතුමා එහි සේවය අවසන් කරන විට ශ්‍රී ලංකා ගුවන් භාණ්ඩ කළමනාකරු ලෙස කටයුතු කරමින් සිටියේය.

පෙරේරා මහතා එංගලන්තයේ ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ඩිජිටල් යුගයේ ගුවන් සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද මැලේසියාවේ ආසියා ඊ යුනිවර්සිටි වෙතින් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද, එංගලන්තයේ ගමනාගමනය පිළිබඳ වරලත් ආයතනයේ ගමනාගමනය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා ගෙන ඇත. එමෙන්ම ඔහු ලොජිස්ටික්ස් සහ ප්‍රවාහනය පිළිබඳ වරලත් ආයතනයේ වරලත් සාමාජිකයෙකි.

## සංජීව ජයතිලක මහතා

*ජ්‍යෙෂ්ඨ කළමනාකරු ගුවන්තොටුපළ සහ ගොඩබිම් සේවා*

2020 දෙසැම්බරයේදී ගුවන්තොටුපළ සහ ගොඩබිම් සේවා අංශයේ නායකත්වය සඳහා රවි සංජීව ජයතිලක මහතා පත් කරන ලද අතර පසුගිය වසර 16 පුරාවටම එතුමා ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සේවය කළේය. එතුමා ශ්‍රීලංකන්හි මානව සම්පත් සංවර්ධන කළමනාකරතුමන් ලෙසත් සේවය ආරම්භ කළ අතර ඉන්පසුව ලෝක ව්‍යාප්ත විකුණුම් අංශයට සම්බන්ධ වීමට ප්‍රථම නිෂ්පාදන සංවර්ධන දෙපාර්තමේන්තුව කළමනාකරණ කටයුතු සිදු කළ අතර එහිදී ඔහු පළමුව ශ්‍රී ලංකාවේ කලාපීය කළමනාකරු ලෙසත් ඉන්පසුව ඕස්ට්‍රේලියාවේ කලාපීය කළමනාකරු ලෙසත්  කටයුතු කරන ලදී.

එතුමා ශ්‍රීලංකන් ආයතනයට බැඳීමට පෙර, ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තයේ මාස් ස්ලිම්ලයින්, ලෙෂර්ලයින් සහ ආශ්‍රිත අංශයේ මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලනය සහ මානව සම්පත් සංවර්ධන කළමනාකරණ ලෙස මෙන්ම අර්ධ රාජ්‍ය අංශයන්හි සේවය කර ඇත.

ඔහු දකුණු ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇති අතර ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත.

## ක්ෂානක සපරමාදු මහතා

*ආදායම් කළමනාකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකරු*

ක්ෂානක සපරමාදු මහතා කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස 2000 වසරේ ගුවන් සේවයට එක් වූ අතර, වාණිජ අංශයට අදාළව සිය වෘත්තීය ජීවිතය පුරාවට විවිධ වූ කාර්යභාරයන් ඉටු කර ඇත. ඔහු වසර 15 කට වැඩි කළමනාකරණ හැකියාවන් සහිත වසර 20 කට වැඩි කාලයක් ක්ෂේත්‍රය තුළ පළපුරුද්දක් ලබා ඇත.

සපරමාදු මහතා 2001 වසරේ ආදායම් සැලසුම් දෙපාර්තමේන්තුවට බැඳුණු අතර, ආදායම් සැලසුම් කළමණාකරු ලෙස කණ්ඩායමේ නායකත්වය දැරුවේය. ඉන් පසුව ඔහු ආදායම් සැලසුම් සහ ජාල සැලසුම් කණ්ඩායම් දෙකෙහිම අධීක්ෂණ කටයුතු සිදු කරමින්, 2010 වසරේදී සැලසුම්කරණ කළමනාකරු භූමිකාව භාර ගත්තේය. ඔහු යුරෝපීය කලාපය සඳහා ආදායම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාණිජ කළමනාකරු ලෙස පත් කරන ලද අතර, ඉන් අනතුරුව යුරෝපයේ සහ ඈත පෙරදිග කලාප සඳහා බඩු තොග සහ මිල ගණන් අධීක්ෂණය කරනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරු ආදායම් කළමනාකරණය ලෙස කටයුතු කරන ලදී. වර්තමානයේ ඔහු ආදායම් කළමනාකරණය, ජාල සැලසුම්කරණය සහ පර්යේෂණ මෙන්ම ගුවන් සමාගමේ ජාත්‍යන්තර සබඳතා යන වාණිජ කටයුතු සඳහා නායකත්වය ලබා දෙයි. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජ විද්‍යාව පිළිබඳ විශේෂඥ උපාධියක් සහ ගුවන් සේවා අධ්‍යයනය පිළිබඳ (IATA) ඩිප්ලෝමාව (මොන්ට්‍රියල්) ලබා ඇත. ඔහු වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙන් (එක්සත් රාජධානිය) ඉගෙනුම් සම්පූර්ණ කළ අයෙකි.

## තුෂාරි පෙරේරා මහත්මිය

*ජ්‍යෙෂ්ඨ කළමනාකරු සමූහයේ නෛතික කටයුතු*

තුෂාරි පෙරේරා මහත්මිය ශ්‍රීලංකන් සමූහයේ නෛතික කටයුතු කළමනාකාරතුමිය ලෙස කටයුතු කරයි. සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි මානව සම්පත් අංශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය, මානව සම්පත් කළමනාකරණයේ විවිධ අංශවල සේවයේ නිරත වූවාය. ඇය කාර්මික සහ කම්කරු සබඳතා සහ සේවකයින් සම්බන්ධ කාරණාවන්හි නඩු පැවරීම් ආදී පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා ඇත. 2013 වසරේදී සමූහයේ නෛතික කටයුතු දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ දින සිට, ආයතනික සහ නියාමන කටයුතු, මතභේද විසඳීම, විදේශයන්හි බහු අධිකරණ සහ දේශීය නඩු, බුද්ධිමය දේපළ, කාර්මික සහ කම්කරු සබඳතා සහ නොතාරිස් කටයුතු ඇතුළු සමූහයේ වාණිජ සහ ගුවන් සේවා කොන්ත්‍රාත්තු සෑම අංශයක්ම ඇය විසින් කළමනාකරණය කරනු ලබයි.

පෙරේරා මහත්මිය වෘත්තියෙන් නීතිඥවරියෙකි. ඉංග්‍රීසි සහ සිංහල භාෂා සඳහා නොතාරිස් බලපත්‍ර හිමි අයෙකි. ඇය සිය නීති අධ්‍යාපනයට අමතරව ශ්‍රී ලංකා සේවා පිරිස් කළමණකරණ ආයතනයේ (IPM) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවද කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ සංවර්ධන වැඩසටහනද සාර්ථකව සම්පූර්ණ කර ඇත.

## සුදත් මඩපාත මහතා

*ජ්‍යෙෂ්ඨ කළමනාකරු සමූහයේ ආරක්ෂක කටයුතු*

1995 වසරේදී ගොඩබිම් සේවා පාලන අංශයෙහි පැටවුම් පාලකවරයෙකු ලෙස සමාගමට ප්‍රථම වරට සම්බන්ධ වූ කපිතාන් සුදත් මඩපාත මහතා ගුවන් සේවා ක්ෂේත්‍රයේ වසර 27 ක පමණ සිට සේවය කරනු ලබන අතර 1998 වසරේදී ඔහු බලපත්‍රලාභී පියාසර හසුරුවන්නෙකු ලෙස ගුවන් ගමන් මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි සේවයට බැඳුණි. ඔහු 2001 වසරේදී ගුවන් නියමු කෙඩෙට් නිලධාරී ලෙස තේරී පත් වූ පසු එයාර්බස් A330 හි සෘජු ඇතුළත් කිරීම්හි පළමු නිලධාරියකු ලෙස පත්වීමක් ලද්දේය.

2006 වසරේදී ඔහු එතිහාඩ් එයාර්වේයිස් සමඟ සම්බන්ධ වූ අතර A320, A330, A340 මෙන්ම A380 එයාර්බස් බලඇණියේ ඔහු පියාසර කර ඇත.

එමෙන්ම ඔහු එතිහාඩ් ආරක්ෂක කටයුතු සහ තත්ත්ව දෙපාර්තමේන්තුව සඳහා මඟ පෙන්වන විගණකවරයා ලෙස කටයුතු කළ අතර බොහොමයක් මෙහෙයුම් විෂය ක්ෂේත්‍රයන් හි තත්ත්ව සහතිකකරණ විගණකවරයා ලෙස අභ්‍යන්තර සහ බාහිර විගණන කටයුතු සිදු කරන ලදි. 2019 දී ඔහු නැවතත් ශ්‍රීලංකන් හි කපිතාන්වරයෙකු ලෙස සම්බන්ධ වූ අතර, 2020 වසරේ IOSA සහතික කිරීමේ විගණන සැකසීම සඳහා IOSA විගණන උපදේශකවරයෙකු ලෙස ගිවිස ගන්නා ලදි. ඊළඟට ඔහු 2021 වසරේ සමූහයේ ආරක්ෂක කටයුතු සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු ලෙස උසස් වීමක් ලැබීමට පෙර ගුවන්යානා ආරක්ෂක කටයුතු කළමනාකරු ලෙස පත්විය. දැනට ඔහු ආයතනික ආරක්ෂක කටයුතුවලට අමතරව මෙහෙයුම් හි තත්ත්වය අධීක්ෂණය කරයි.

කපිතාන් මඩපාත මහතා එයාර්ලයින්ස්හි අභ්‍යන්තර පුහුණුව ඇතුළු EASA, IATA, එයාර්බස් සහ බොයිං වෙතින් ආරක්ෂක කළමනාකරණ පද්ධතිය සහ තත්ත්ව කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා ඇත. ඔහු කලාපීය ගුවන් සේවා ආරක්ෂක කටයුතු සැලසුම් සඳහා වන තත්කාර්ය ක්‍රියාකාරකම් කණ්ඩායමේ සේවය කරන අතර වන්වර්ල්ඩ් සේෆ්ටි බෙස්ට් ප්‍රැක්ටිස් කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. එසේම ඔහු ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබන ජාතික ගුවන් ගමන් ආරක්ෂක කටයුතු සැලසුම් හි සංවර්ධනය සඳහා ගුවන් සේවය නියෝජනය කරයි.

# ව්‍යාපාර අවදානම් කළමනාකරණය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් එහි එදිනෙදා මෙහෙයුම් කටයුතු සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අවදානම් කළමනාකරණය වැදගත් කොට සලකනු ලබයි.

අවදානම් කළමනාකරණය ප්‍රමිති සහ ක්ෂේත්‍රයේ අවශ්‍යතා මත පදනම්ව සමාගම අවදානම් කළමනාකරණ රාමුවක් අනුගමනය කරනු ලබයි. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සියලු අංශයන් පුරා එකම ස්වරූපයකින් අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ සමඟ ආයතනික අවදානම් කළමනාකරණ රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.

### අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අවදානම් අධීක්ෂණය මෙන්ම, සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව අනුමත කිරීම සඳහා ද වගකියනු ලබයි.

ව්‍යාපාර අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණය සඳහා කළමනාකරණ මට්ටමින් පිහිටුවා ඇති ක්‍රියාපටිපාටි පරීක්ෂා කරමින් විගණක කමිටුව අධීක්ෂණ වගකීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය ලබාදෙයි.

ප්‍රධාන විධායක නිලධාරියා අවදානම් කළමනාකරණය සඳහා උපායමාර්ගික උපදේශයන් ලබා දෙන අතර අවදානම් පිළිබඳ මනාව සොයා බැලීම සහ අවදානම් මූලධර්ම යෙදවීම සම්බන්ධයෙන් ආයතනය තුළ තීරණ ගැනීම සහතික කරනු ලබයි.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව මඟින් අවදානම් පිළිබඳ විස්තර විශ්ලේෂණය සහ ඵලදායීව කළමනාකරණය කිරීම සඳහා උපායමාර්ග සකස් කරනු ලබයි. දෙපාර්තමේන්තු/ අංශ කළමනාකරුවන් මඟින් ඔවුන් වගකියනු ලබන ක්ෂේත්‍රයේ අවදානම් හඳුනා ගැනීමට සහ එය කළමනාකරණයට ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳ වගකියනු ලබයි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ව්‍යාපාරික අවදානම් කළමනාකරණය ක්‍රියාවට නැංවීම සඳහා සමූහ තහවුරුකරණය සහ උපදේශන සේවා පහසුකම් සපයයි.




### අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් හඳුනාගැනීම, අවදානම් විශ්ලේෂණය, අවදානම් නිරාකරණය, සහ අවදානම් වාර්තාකරණය සහ අධීක්ෂණය ආදියෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමන්විත වේ.




හඳුනා ගත් අවදානම් එහි සම්භාවිතාව සහ බලපෑම මත පදනම්ව විශ්ලේෂණය කරනු ලබන අතර සැලකිය යුතු, ඉහළ, මධ්‍යම, හෝ පහළ යනුවෙන් ශ්‍රේණිගත කරනු ලබයි. අවදානම් අගය ගණනය කරනු ලබන්නේ සම්භාවිතා ශ්‍රේණිගත කිරීමේ බලපෑම් ශ්‍රේණිගත කිරීම සමඟ ගුණ කිරීමෙනි.

ක්‍රියාකාරී සැලැසුම්, අවදානම් ශ්‍රේණිගත කිරීමේ සහ අවදානම් ලකුණු මත පදනම්ව ගණනය කරනු ලබයි. සැලකිය යුතු අවදානම් නිරාකරණය, ප්‍රධාන විධායක නිලධාරී/අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විසින් සමාලෝචනය කරනු ලබයි.

සියලු අවදානම් දත්ත ගබඩා කිරීමේ පද්ධතියක් තුළ පවත්වා ගෙන යන අතර, අවදානම් හි යාවත්කාලීන බව තහවුරු කිරීමට සහ වත්මන් මෙහෙයුම් පරිසරය පිළිබිඹු කිරීමට අවදානම් පිළිබඳ කටයුතු කරන්නන් හට සෘජුවම ව්‍යාපාරික අවදානම් කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කළ හැකිය.

### අවදානම් වපසරිය

වෙනස්වන සුළු ව්‍යාපාර පසුබිමක කටයුතු කරනු ලබන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අභ්‍යන්තර සහ බාහිර සාධක හේතුවෙන් විවිධාකාර අවදානම්වලට මුහුණ දෙනු ලබයි. සමාගම අදාළ අභ්‍යන්තර සහ බාහිර සාධක පූර්වාපේක්ෂා කරන අතර, ක්‍රියාකාරී සහ ආයතනික අරමුණු ළඟා කර ගැනීමට බාධාවක් වනු ලබන පවතින අවදානම් හඳුනා ගනු ලබයි.

ගෝලීය වසංගත තත්ත්වය සහ ගෝලීය ගුවන් සේවයේ සාර්ව ආර්ථික සාධක, අඩු පිරිවැය ගුවන්යානා මෙහෙයුම් සහ දිගු කාලීන පූර්ණ පිරිවැය ගුවන්යානා වෙත වැඩි වන ඉල්ලුම යන දෑ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අවදානම් වපසරිය සඳහා බලපෑම් එල්ල කරන ලදී.

තවද, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට සෘණාත්මකව බලපාන ලද මූල්‍ය සහ සංචාරක උපදේශන සඳහා සීමා පැනවීම වැනි රටේ ආර්ථික තත්ත්වය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සඳහා බලපාන ලදී.

# ආයතනික පාලන වාර්තාව

සමාගමේ කාර්යසාධනයේ තිරසාරත්වය සඳහා මනා ආයතනික පාලනයක් අත්‍යවශ්‍ය වන බවත්, කළමනාකාරිත්වයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වන හෙයින් රජය සතු ව්‍යාපාරයන්හි යහපාලන භාවිතයන්ටද එය ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය බවත්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් විශ්වාස කරනු ලබයි.

යුතුකම්, වගකීම, විනිවිදභාවය සහ වගවීම යන අංශයන්හි හිතකර සමතුලිතතාව වැඩිදියුණු කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ආයතනික පාලන මූලධර්ම සහ භාවිතයන්හි ප්‍රමිතීන් අඛණ්ඩව ඉහළ නැංවීමට සමාගම කැපවී සිටී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සිය ආයතනික පාලනයේ කොටසක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද පහත සඳහන් නීති සම්පාදන, කේත සහ ස්වේච්ඡා ප්‍රතිපත්ති රාමුවලට අනුකූල වේ.

- 2007 අංක 7 දරන සමාගම් පනත
- සමාගමේ සාංගමික ලේඛන
- 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ යටතේ නිකුත් කරන ලද, රජය සතු ව්‍යාපාරයන් සඳහා ආයතනික පාලනය සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශ
- අභ්‍යන්තර සමාගම් නීති සහ ක්‍රියාවලි සහ කර්මාන්ත විශේෂිත නීති සහ රෙගුලාසි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

### මණ්ඩලයේ සංයුතිය

සමාගමේ සාංගමික ලේඛනයන් ප්‍රකාරව, භාණ්ඩාගාර ලේකම්තුමා හරහා ක්‍රියාකරනු ලබන ශ්‍රී ලංකා රජය විසින්, සමාගමේ කොටස්වලින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් රජය සතු වන තාක් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබයි. රජය සතු ව්‍යාපාර සාර්ථක ව්‍යාපාර බවට පත් කිරීමට හැකියාව ඇති සුදුසුකම් ලත්, දක්ෂ පුද්ගලයින්ගෙන් මණ්ඩලය සමන්විත බව තහවුරු කිරීම සඳහා තේරීම් කමිටුවක් හරහා රජය විසින් අධ්‍යක්ෂවරුන් මණ්ඩලයට පත් කරයි. ව්‍යාපාරයන්හි පොදු අයිතිය රජයට පැවරී ඇති බැවින්, අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුවම රජයට වගකියනු ලබයි.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

සමාගමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම උදෙසා සහය වීමට අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික මගපෙන්වීමක් සපයන අතර, උපායමාර්ගික සැලැස්ම මඟින් ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවලට අනුකූල වන බව තහවුරු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමතුලිතතාවය සහ බලය සහ අධිකාරිය සඳහා පහසුකම් සලසනු ලබන කළමනාකරණය අතර පැහැදිලි වගකීම් බෙදීමක් සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම් වනුයේ;

- විශේෂයෙන්ම උපායමාර්ගික නියෝග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසෙන මෙහෙයුම් තීරණ ගැනීමේදී, කළමනාකරණයට ප්‍රමාණවත් බලයක් පැවරීම තහවුරු කිරීම.
- තීරණ ගැනීම සහ වගවීම සඳහා පහසුකම් සපයන ස්ථිර සහ විශ්වසනීය කළමනාකරණ තොරතුරු පද්ධතියක් සමාගම සතු බව තහවුරු කිරීම
- ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතිවල සම්පූර්ණත්වය සහතික කිරීම, අවදානම් කළමනාකරණ සහ මෙහෙයුම් පාලනය වැනි පාලන පද්ධති, නීති, රෙගුලාසි සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූල වීම තහවුරු කිරීම
- මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය ක්‍රියාවලි ඇතුළු ප්‍රධාන ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි නිසි ලෙස ලේඛනගත කර ඇති බවට සහ කාලානුරූපීව යාවත්කාලීන කරන බවට තහවුරු කිරීම.
- සමාගමේ වෙබ් අඩවිය හරහා කිසිදු ව්‍යවස්ථාපිත හෝ මෙහෙයුම් අවශ්‍යතාවකට හානියක් නොවන පරිදි, මූල්‍ය සහ මූල්‍ය නොවන ආකාරයේ උපරිම තොරතුරු එහි පාර්ශ්වකරුවන්ට හෙළිදරවු කිරීම තහවුරු කිරීම

අධ්‍යක්ෂවරුන්ට සිය වගකීම් ඉටු කිරීමට, කාලීන සහ නිවරද්‍ය තොරතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කරනු ලබයි.

- සියලුම අධ්‍යක්ෂවරුන් සඳහා නිවරද්‍ය, අදාළ, කාලෝචිත, පැහැදිලි සහ සමබර තොරතුරු ලැබේ.
- කමිටු, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් ප්‍රධාන කළමනාකාරිත්වය අතර තොරතුරු ලබා දීම සඳහා සමාගම් ලේකම්තුමිය සම්බන්ධක ලෙස කටයුතු කරනු ලබයි.
- ප්‍රධාන විධායක නිලධාරීතුමා ඇතුළු අදාළ අංශ ප්‍රධානීන් ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා සිටින අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දෙනු ලබයි.
- ඊට අමතරව, සමාගමේ තිරසාර මූලපිරීම්වලට අනුකූලව, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන, විද්‍යුත් ලේඛන ලෙස ලබා ගත හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාකාරකම් සඳහා සවිමත් තොරතුරු තාක්ෂණයෙන් සහය ලබා ගන්නා අතර, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ආරක්ෂිත සම්බන්ධතාවයක් හරහා ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන වෙත ප්‍රවේශ වීමට සහ දුරස්ථ රැස්වීම් සඳහා සහභාගී වීමට හැකියාව ලබා දෙනු ලබයි.

### අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත බලය පැවරීම

මනා පාලනයක් සහ හොඳම භාවිතයන් සපුරාලීම සඳහා එයාර්ලයින්ස් විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවා ඇත. පවරන ලද කමිටු වෙත තම විශේෂඥතාවය සහ පළපුරුද්ද දායාද කිරීමට හැකි අධ්‍යක්ෂවරුන්ගෙන් මෙම කමිටු සමන්විත වේ. වගකීම්, යොමු කිරීමේ අනුදේශයන්හි විධිමත්ව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ලේකම්තුමා, සමාගම් ලේකම්තුමිය වේ.

සලකා බැලියයුතු ක්‍රියා පටිපාටියන්හි නිශ්චිතව දක්වා ඇති, ඔවුන්ගේ අධිකාරිය සහ වගවීම සම්බන්ධ කරුණු සලකා බැලීමට සහ සාකච්ඡා කිරීමට කමිටු නිතිපතා රැස්වේ. ඔවුන්ගේ නිරීක්ෂණ සහ නිර්දේශ නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

### අධ්‍යක්ෂවරුන්ට වන්දි පූරණය

සමාගමේ සාංගමික ලේඛනයන්ට අනුකූලව, අධ්‍යක්ෂවරුන්ට, සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ඔවුන්ගේ තනතුරු අනුව වගකීම් ඉටුකිරීම සඳහා, දරනු ලබන වගකීම් සම්බන්ධයෙන් නීතියෙන් අවසර දී ඇති ප්‍රමාණයට සමාගමෙන් වන්දි පූර්ණයක් ලබා දෙනු ලැබේ. අධ්‍යක්ෂතුමා විසින් වංචනික ලෙස හෝ වංක ලෙස ක්‍රියා කර

# ආයතනික පාලන වාර්තාව තවදුරටත්.

ඇති බව ඔප්පු වුවහොත්, වන්දිය මඟින් කිසිදු ආවරණයක් සපයන්නේ නැත. සමාගම වසර පුරාවට අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ වගකීම් රක්ෂණ ආවරණයක් පවත්වාගෙන යනු ලැබ ඇත.

### සභාපතිතුමාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ කාර්යභාරය

උපායමාර්ගික සහ මෙහෙයුම් කරුණු අතර වෙනස, සභාපතිතුමාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ වගකීම් බෙදීම අනුව පැහැදිලිව දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිතුමා, විධායක නොවන පත්වීමක් වන අතර, උපායමාර්ගික ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම, ව්‍යාපාර සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම අධීක්ෂණය සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කිරීම සහ සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් රැස්වීම් සඳහා ඵලදායී ලෙස සහභාගී වීම ඔහු විසින් තහවුරු කරනු ලබයි.

ප්‍රධාන විධායක නිලධාරීතුමා, එදිනෙදා ව්‍යාපාර කළමනාකරණය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ නායකත්වය සහ සමූහයේ උපායමාර්ගික සහ මෙහෙයුම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය. සමාගමේ කාර්යසාධනය, මෙහෙයුම් කටයුතු සහ මානව සම්පත් සම්බන්ධ ඕනෑම ගැටලුවක් සාකච්ඡා කිරීමට සභාපතිතුමා සහ ප්‍රධාන විධායක නිලධාරීතුමා නිරන්තරයෙන් රැස් වනු ලබයි.

### අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය

දැනට පවතින අභ්‍යන්තර පාලන රාමුව සකසා ඇත්තේ, අවදානම් කළමනාකරණය රාමුව, මූල්‍ය පාලනය, අභ්‍යන්තර විගණනය සහ ආධාරක ප්‍රතිපත්ති මගිනි. සමාගමේ අභ්‍යන්තර පාලන රාමුවේ පරමාර්ථය වනුයේ, මෙහෙයුම්හි ඵලදායීත්වය සහ උපායමාර්ගික ඉලක්ක සමඟ මනාව ගැලපීම සහතික කිරීමයි. අභ්‍යන්තර පාලන රාමුව මඟින් නිවැරදි, විශ්වසනීය සම්පූර්ණත්වය සහ කාලෝචිත මූල්‍ය වාර්තාකරණය සහ කළමනාකරණ තොරතුරු සහතික කිරීමට අදහස් කරනු ලබයි. මෙම රාමුව මඟින් සදාචාරාත්මක වටිනාකම්, යහපත් ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන් අනුමත කරනු ලබයි.

### ව්‍යවස්ථාපිත අනුකූලතාවය

අධ්‍යක්ෂකවරුන්, ඔවුන්ගේ පරම දැනුම සහ විශ්වාසය අනුව, එයාර්ලයින්ස් සේවකයන්ට අදාළ ගෙවීම් නිසි කලට සිදු කරනු ලැබ ඇති බවට සෑහීමකට පත් වේ.



# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය



**සමූහය 2021/22 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් මිලියන 163.58 ක ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර, එයින් 87% ක් විනිමය අලාභවලින් සමන්විත විය (2020/21 - අලාභයෙන් 40% ක් විනිමය නිසා විය).**

ශ්‍රී ලංකා රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 90.45 කට සමාන නැවත ප්‍රාග්ධනීකරණයේ දෙවන වාරිකය 2021 අප්‍රේල් 07 දින ලබා දුන් අතර (පසුගිය වසරේ ඇමරිකානු ඩොලර් මිලියන 150 කට සමාන රුපියල් බිලියන 27.73 ක් වන පළමු වාරිකය) එමඟින් සමාලෝචිත වසර තුළ මූල්‍ය බර තරමක් දුරට ලිහිල් කරන ලදි.



**2021 වසර අවසානයේ සිට ලොව පුරා දේශසීමා සඳහා පනවන ලද සීමා කිරීම් ලිහිල් කිරීම හේතුවෙන් ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම වර්ධනය වීමත් සමඟ, ජෙට් ඉන්ධන මිල ඉහළ යාම, රට තුළ ජෙට් ඉන්ධන හිඟය, පොලී අනුපාත ඉහළ යාම, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම, උද්ධමනය සහ ඉහළ ගිය භූදේශපාලනික අවදානම් සමඟ රටේ ආර්ථිකය පිළිබඳ උත්සුකයන් ඉහළ යාම ඇතුළු අභියෝග කිහිපයකට ගුවන් සමාගම අඛණ්ඩව මුහුණ දුන්නේය.**

ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සමාගම වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් අභියෝගවලට මුහුණ දීමට ඇති හැකියාව පෙන්නුම් කර තිබෙනු පමණක් නොව, තිරසාර ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීමේදී නව්‍යශීලී බවක්ද පෙන්නුම් කොට තිබේ. පසුගිය දෙවසරක කාලය පුරාවට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින්, කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ නව අවස්ථාවන්ට ප්‍රතිචාර වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ගුවන් භාණ්ඩ ව්‍යාපාරයේ සැලකිය යුතු පරිවර්තනයක් සිදු වී ඇත.

2021 වසර අවසානයේ සිට ලොව පුරා දේශසීමා සඳහා පනවන ලද සීමා කිරීම් ලිහිල් කිරීම හේතුවෙන් ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම වර්ධනය වීමත් සමඟ, ජෙට් ඉන්ධන මිල ඉහළ යාම, රට තුළ ජෙට් ඉන්ධන හිඟය, පොලී අනුපාත ඉහළ යාම, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම, උද්ධමනය සහ ඉහළ ගිය භූදේශපාලනික අවදානම් සමඟ රටේ ආර්ථිකය පිළිබඳ උත්සුකයන් ඉහළ යාම ඇතුළු අභියෝග කිහිපයකට ගුවන් සමාගම අඛණ්ඩව මුහුණ දුන්නේය.

# මූල්‍ය විමර්ශනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම (SLA) දකුණු ආසියානු උප මහාද්වීපයේ වසර ගණනාවක පටන් පැවත එන ප්‍රමුඛතම ගුවන් සමාගමක් වශයෙන් සිය ස්ථාවරය පවත්වාගෙන යන අතරම, රට තුළ ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ක්‍රමානුකූලව සිය ජාලය ගොඩනගමින් සිටී. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ, අභියෝග හමුවේ නොසැලී සිටීම සහ කාර්යක්ෂමතාව යන ගුණාංග වැඩි දියුණු කරන සහ පිරිවැය අඩු කිරීම සහතික කරන දූරදර්ශී කළමනාකරණ මුලපිරීම් හරහා කොවිඩ්-19 හි බලපෑම අඩු කිරීමට ගුවන් සමාගමට හැකි විය. එය වඩාත් කාර්යශීලි පශ්චාත් වසංගත කාලපරිච්ඡේදයක් සඳහා මග පෑදීය.

පශ්චාත් වසංගත අවධියේදී ගෝලීය දේශසීමා සඳහා පනවන ලද සීමා කිරීම් ලිහිල් කිරීමෙන් පසු 2022 ආරම්භයේදී ගුවන් ගමන් කර්මාන්තය ඉල්ලුමෙහි ශක්තිමත් ප්‍රතිසාධනයක් අත්කර ගනිමින් සිටියේය. ඉල්ලුමේ ඇති වූ මෙකී ප්‍රතිසාධනයේද සහය ඇතිව පසුගිය දෙවසරක කාලය තුළ ලබා ගත් ව්‍යුහාත්මක පිරිවැය කාර්යක්ෂමතාවන්ද සමඟින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 2022 ජනවාරි සිට මාර්තු දක්වා වන කාර්තුව සඳහා (Q4) ඇමරිකානු ඩොලර්වලින් ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදි.

පසුව, සමාලෝචිත වර්ෂයේදී, සමූහය 2021/22 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් මිලියන 163.58 ක ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර, එයින් 87% ක් විනිමය අලාභවලින් සමන්විත විය (2020/21 - අලාභයෙන් 40% ක් විනිමය නිසා විය).

සමූහයේ වැඩි වූ අලාභයට දායක වූ ප්‍රධාන මෙහෙයුම් නොවන අයිතම පහත පරිදි වේ:

| | 2020/21 | 2021/22 | වැඩිවීම % |
|---|---|---|---|
| මූල්‍ය පිරිවැය | 22.53 | 22.90 | 2% |
| මුළු විනිමය අලාභය | 19.67 | 142.61 | 625% |

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

## විනිමය අනුපාත සංචලනයේ බලපෑම

**විනිමය අනුපාත සංචලනය - ශ්‍රී ලංකා රුපියල්/ඇමරිකානු ඩොලර්**




**සංචලනය:** 2021/22 මූල්‍ය වර්ෂය තුළ, ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව අඛණ්ඩව අවප්‍රමාණය වූ අතර, 2022 මාර්තු මාසයේදී තියුණු අවප්‍රමාණය වීමක් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස වසරේ අවසන් මාසයේදී ශ්‍රී ලංකා රුපියලේ අවප්‍රමාණය 47% ක් වූ අතර, පෙර වසර තුළ 6% ක අවප්‍රමාණය වීමක් වාර්තා විය. තවද, ශ්‍රී ලංකා රුපියල ආදායම් උපයන අනෙකුත් ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂවද දිගින් දිගටම අවප්‍රමාණය විය.

**බලපෑම:** සමාගමේ මෙහෙයුම් පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විදේශ මුදල්වලින් (ප්‍රධාන වශයෙන් ඇමරිකානු ඩොලර්) දරනු ලබන අතර ණයවලින් වැඩි ප්‍රමාණයක්ද ඇමරිකානු ඩොලර් ලෙස දැක්වේ. අහිතකර මුදල් සංචලනය සමාගමේ අවසන් ඵලය වෙත අහිතකර ලෙස බලපෑම් එල්ල කිරීමට මූලික වශයෙන් හේතු වූයේ ශුද්ධ විදේශ ව්‍යවහාර මුදල් වගකීම් ප්‍රත්‍යාගණනයයි. එය 2021/22 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 142.61 ක (2020/21 - රුපියල් බිලියන 19.67) සම්පූර්ණ විනිමය අලාභයක් (මෙහෙයුම් සහ මූල්‍ය) සඳහා හේතු විය.

## ජෙට් ඉන්ධන මිල සංචලනයෙහි බලපෑම

**ජෙට් ඉන්ධන - USC**




**සංචලනය:** 2021 කාලය තුළ ජෙට් ඉන්ධන මිල ක්‍රමානුකූලව වැඩි වූ අතර, 2022 වසරේ මුල් භාගයේදී නව ඉහළ මට්ටම් කරා ළඟා විය. ගෝලීය ඉන්ධන මිල ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රුසියාව සහ යුක්‍රේනය අතර ඇති වූ ගැටුමයි. 2021 අප්‍රේල් මාසයේදී ජෙට් ඉන්ධන මිල ගැලුමකට ඇමරිකානු ඩොලර් 1.79 ක් ලෙස වාර්තා වූ අතර 2021/22 මූල්‍ය වර්ෂය අවසානය වන විට එය ගැලුමකට ඇමරිකානු ඩොලර් 2.97 ක් දක්වා ශීඝ්‍ර වැඩි වීමක් පෙන්නුම් කළේය. මෙවන් පසුබිමක් තුළ 2022 දී IATA විසින් සිදුකරන ලද පුරෝකථනය කළ ඉන්ධන මිළ ගණන් ගුවන් සමාගමේ ලාභදායිතාවයට ඉන්ධන මිල ප්‍රබල අභියෝගයක් වනු ඇතැයි IATA විසින් පුරෝකථනය කරන ලදි.

**බලපෑම:** වසර අවසානයේදී ජෙට් ඉන්ධන මිල ගණන් ඉහළ යාම ගුවන් සමාගමේ අලාභයෙන් පිළිබිඹු වන අතර, ජෙට් ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් පමණක් රුපියල් මිලියන 17,565 ක අලාභයක් වාර්තා විය.

## සමූහයේ ඉපැයුම්

ඒ අනුව, සමූහය වාර්ෂිකව 164% ක ඉහළ වර්ධනයක් නිරූපණය කරමින්, රුපියල් මිලියන 134,301 ක ආදායමක් වාර්තා කරන ලදි.

**ආදායම් ප්‍රවණතාව රු. මිලියනවලින්**




**ආදායම් සංයුතිය**



**ආදායමේ වෙනස් වීම රුපියල් මිලියන වලින්**




**ප්‍රවාහනය කරන ලද මගී සංඛ්‍යාව '000.**




**රැගෙන යන ලද භාණ්ඩ ප්‍රමාණය ටොන්වලින්**




රටවල් මඟින් සංචරණ සීමා ලිහිල් කිරීම හේතුවෙන්, 2021 වසරට සාපේක්ෂව ප්‍රවාහනය කරන ලද සමස්ත මගී සංඛ්‍යාව 779% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් ලදී. එබැවින් පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වසර තුළ ගුවන් සමාගමේ වෙළඳපොළ ධාරිතාවය 166% කින් වර්ධනය වූ අතර, සමස්ත මගී මැදිරි සාධකය 20% සිට 49% දක්වා වර්ධනය විය.

කෙසේ වෙතත් ගුවන් භාණ්ඩ ආදායම නිරූපණය කරනු ලබන ප්‍රතිශතය සමාලෝචිත වසර තුළ පහත වැටුණද, නැවත ආරම්භ කරන ලද කාර්ය ලැයිස්තු සමඟින් වැඩි කරන ලද ධාරිතාව හේතු කොට 73% ක වර්ධනයක් ගෙන යන ලද භාණ්ඩ ටොන්වලින් පිළිබිඹු විය. පසුගිය මූල්‍ය වර්ෂයේ 78% ක ප්‍රතිශතයට සාපේක්ෂව, රැගෙන යන ලද මුළු ගෙවීම් සඳහා ගුවන් භාණ්ඩ දායකත්වය 47% ක් ලෙස දැක්වේ.

### වියදම

2021 වසරේදී, සමූහයේ වියදම් රුපියල් මිලියන 298,736 ක් වූ අතර, මෙහෙයුම්වල වර්ධනය හේතුවෙන්, 2021 වසරේ සමූහයේ වියදම් වන රුපියල් මිලියන 118,316 ට සාපේක්ෂව 153%ක සැලකිය යුතු වර්ධනයක් දැක්විණ. සමූහයේ මුළු වියදම්වල සංයුතිය පහත දැක්වේ.

| | 2022 | | 2021 | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | වටිනාකම (රු. මිලියන) | දායකත්වය % | වටිනාකම (රු. මිලියන) | දායකත්වය % | වටිනාකම (රු. මිලියන) | % |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | 42,759 | 14% | 10,569 | 9% | 32,190 | 305% |
| ගුවන් යානා නඩත්තු හා අලුත්වැඩියා පිරිවැය | 23,088 | 8% | 13,695 | 12% | 9,393 | 69% |
| සේවක පිරිවැය | 17,416 | 6% | 17,112 | 14% | 304 | 2% |
| ගුවන්තොටුපළ, අතරමැදි සහ මගී වියදම් | 17,753 | 6% | 7,308 | 6% | 10,445 | 143% |
| විකිණුම්, අලෙවි හා ප්‍රචාරණ වියදම් | 7,250 | 2% | 2,065 | 2% | 5,185 | 251% |
| ගුවන් සේවක වියදම් | 3,231 | 1% | 1,680 | 1% | 1,551 | 92% |
| ක්ෂය/ක්‍රමක්ෂය | 14,656 | 5% | 16,745 | 14% | (2,089) | (12%) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 7,070 | 2% | 6,936 | 6% | 134 | 2% |
| විනිමය අලාභය | 34,730 | 12% | 6,339 | 5% | 28,391 | 448% |
| **මෙහෙයුම් වියදම්** | **167,953** | **56%** | **82,449** | **70%** | **85,504** | **103%** |
| මූල්‍ය පිරිවැය | 22,904 | 8% | 22,529 | 19% | 173 | 1% |
| පොලී දරන වගකීම් මත විනිමය අලාභය | 107,881 | 36% | 13,334 | 11% | 89,994 | 675% |
| **මූල්‍ය වියදම්** | **130,785** | **44%** | **35,864** | **30%** | **90,167** | **251%** |
| **මුළු වියදම්** | **298,736** | **100%** | **118,314** | **100%** | **180,223** | **152%** |

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

පසුගිය මූල්‍ය වර්ෂයේ 9%ට සාපේක්ෂව ගුවන් යානා ඉන්ධන පිරිවැය සමූහයේ මුළු වියදමෙන් 14%ක් ලෙස පැවතුණි. ගෝලීය ඉන්ධන මිල හේතු කොට සමස්ත ඉන්ධන පිරිවැය ඉහළ ගිය අතර, වැඩි කරන ලද මෙහෙයුම් හේතු කොට මුළු ඉන්ධන පරිමාවද ඉහළ ගියේය. සාමාන්‍ය ඉන්ධන මිල ගණන් පසුගිය වසරේ ගැලුමකට ඇමරිකානු ඩොලර් 1.310 සාපේක්ෂව සමාලෝචිත වසරේදී ගැලුමකට ඇමරිකානු ඩොලර් 2.25 ක් දක්වා වැඩි විය. ඉන්ධන පිරිවැය වැඩි වීමට අදාළ විශ්ලේෂණය පහත පරිදි වේ.

| 2020/21 වසරට සාපේක්ෂව ඉන්ධන පිරිවැයේ වැඩි වීම | රුපියල් මිලියන | දායකත්වය |
|---|---|---|
| ඉන්ධන පිරිවැයේ වැඩි වීම | (17,565) | 55% |
| පරිමාවේ වැඩි වීම | (11,872) | 37% |
| ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම | (2,753) | 9% |

වැඩි කරන ලද ගුවන් යානා සංඛ්‍යාව සහ මඟී සංඛ්‍යාවට සමගාමීව, ගුවන්තොටුපළ අතරමැදි සහ මඟී වියදම් 143% කින් වර්ධනය වූ අතර, විකිණුම්, අලෙවි හා ප්‍රචාරණ වියදම් 251% කින් වර්ධනය විය. ගුවන් සේවක වියදම්, ගුවන් යානා නඩත්තු හා අලුත්වැඩියා පිරිවැය වැනි වෙනත් වියදම්, වැඩි කරන ලද මෙහෙයුම්වලට සමගාමීව වර්ධනය විය.

පූර්ව කොවිඩ්-19 මට්ටමට සාපේක්ෂව අඩු වූ ගුවන් ගමන් ආදායම මඟින් ඇති වූ අලාභය අවම කිරීමට, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් කල්බදුකරුවන් සමඟ පුළුල් සාකච්ඡා හරහා කල්බදු ගිවිසුම් ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගෙන ඇත. එබැවින් 2021/22 මූල්‍ය වර්ෂය සඳහා සම්ප්‍රයුක්ත ඉතිරිය රුපියල් මිලියන 5,841 ක් වූ අතර (ඇමරිකානු ඩොලර් මිලියන 28.4), අදාළ කල්බදු ගිවිසුමේ ඉතිරි කාලය සඳහා ගුවන් යානා කල්බදු දෙන්නන් වෙතින් කල්බදු දීමේදී ඇමරිකානු ඩොලර් මිලියන 160 ක මුළු අඩු කිරීමක් ලැබුණි.

මීට අමතරව තොරතුරු තාක්ෂණය, නිෂ්පාදන සංවර්ධනය, දේපළ සහ සැපයුම්, ගුවන් මෙහෙයුම් සහ අදායම් කළමනාකරණ ක්ෂේත්‍රවලට අදාළ තෙවන පාර්ශ්ව ගිවිසුම් නැවත සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2021/22 මූල්‍ය වර්ෂය තුළ රුපියල් මිලියන 2,715 (ඇමරිකානු ඩොලර් 13.2) ඉතිරි කර ගන්නා ලදි.

සේවකයින්ගේ වැටුප්/දීමනා අඩු කිරීමත්, කොන්ත්‍රාත් සේවකයන්ගේ වැටුප් රහිත නිවාඩු සහ විදේශගත සේවකයින්ගේ සේවාව අත්හිටුවීම වැනි මුලපිරීම් කිහිපයක් මඟින් පසුගිය වසරේ කාර්ය මණ්ඩල පිරිවැය මට්ටම සමාලෝචිත වසර තුළද පවත්වා ගැනීමට හැකි විය.

## මුදල් තත්ත්වය

සමූහය මූල්‍ය වසර පුරා ධනාත්මක මූල්‍ය තත්ත්වයක් පවත්වා ගෙන යන ලද අතර, පසුගිය වසර තුළ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මූල්‍ය ප්‍රවාහය ඍණාත්මක තත්ත්වයක පැවති රුපියල් මිලියන 30,779 සිට රුපියල් මිලියන 14,542 ක ධනාත්මක අගයක් දක්වා ප්‍රවර්තන වර්ෂ තුළදී වර්ධනය විය.

ගුවන් යානා කල්බදු සමාගම් සමග සාකච්ඡා කිරීමෙන් ඇමරිකානු ඩොලර් 23.4 ක් වටිනා කල් බදු සහ නඩත්තු සංචිත ගෙවීම් කල් දැමීම හරහා මූල්‍ය තත්ත්වය සඳහා සහන ලැබුණි.

එයාර්ලයින්ස් හි මූල්‍ය ප්‍රවාහය කළමනාකරණ උපායමාර්ග යටතේ වැඩිදුර විභවයන් ගවේෂණය කරමින් වසර තුළදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ඇමරිකානු ඩොලර් 5.26 ක සහ රුපියල් මිලියන 460 ක වටිනාකමකින් යුතු රාජ්‍ය බැංකු වෙතින් ලබා ගත් ණය සඳහා පොලී විලම්භයක් ලබා ගත් අතර, නැවත ගෙවීම් මාස 12 සිට 6 දක්වා කාල සීමාවකින් යුතු විය.

ශ්‍රී ලංකා රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 90.45 කට සමාන නැවත ප්‍රාග්ධනීකරණයේ දෙවන වාරිකය 2021 අප්‍රේල් 07 දින ලබා දුන් අතර, සමාලෝචිත වසර තුළ මූල්‍ය බර තරමක් දුරට ලිහිල් කරන ලදි (පසුගිය වසරේ ඇමරිකානු ඩොලර් මිලියන 150 කට සමාන රුපියල් බිලියන 27.73 ක් වන පළමු වාරිකය).

# මෙහෙයුම් විමර්ශනය

## ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි කාර්යසාධනය සහ වෙළඳපොළ විභවය

2021/22 මූල්‍ය වර්ෂය තුළ මෙහෙයුම් කලාපය හරහා ගමන් සීමා වරින් වර ලිහිල් කිරීමට සමගාමීව සිය ජාලය හරහා පවතින ගුවන් යානා ධාරිතාව ඵලදායී ලෙස යෙදවීමට අදාළව පෙර නොවූ අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය. වර්ධනය වන වෙළඳපොළ අවස්ථාවන්ගෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයක දැඩි අවශ්‍යතාවක්ද ගුවන් ගමන් පිළිබඳ විශ්වාසය මත මඟී ඉල්ලුම නැවත ඉහළ යාම හරහා නිර්මාණය විය. එබැවින්, 2021/22 අවසානය වන විට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි මුළු මඟී ප්‍රවාහනය 2020/21 මූල්‍ය වර්ෂයේ 167,0000 පමණක් සාපේක්ෂව මිලියන 1.46 ක් ලෙස පැවති අතර 2019/20 මූල්‍ය වර්ෂයේ මඟීන් මිලියන 5.5 කට අධික විය. ඒ අනුව, පශ්චාත් වසංගත කාලයේ ඉල්ලුමට සාපේක්ෂව ඉදිරිපත් කළ මඟී ධාරිතාව 55% ක් පමණක් විය.

වසර තුළදී ජාලය හරහා ජාත්‍යන්තර දේශසීමා විවෘත කිරීමත් සමඟ ගුවන් ගමන් සඳහා වැඩිවන ඉල්ලුම සැලකිල්ලට ගනිමින් වෙළඳපොළ තුළ ඇති පරතරයන් හඳුනා ගැනීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් පුළුල් අධ්‍යයනයන් සිදු කරන ලදි. එවන් වෙළඳපොළ සඳහා අතිරේක ගුවන් යානා ධාරිතාවක් යෙදවීම සහ ඉහළ ප්‍රතිඵලයක් සහිත ඉල්ලුමෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සහ එමඟින් ආදායම් විභවය උපරිම කිරීම සඳහා හඳුනාගෙන සැලසුම් කිරීමේ අරමුණින් මෙය සිදු කරන ලදි. මෙකී අධ්‍යයනයන් උපයෝගී කර ගනිමින්, බංගලාදේශයෙන් සහ ඉන්දියානු උප මහාද්වීපයෙන් ආරම්භ කොට සෞදි අරාබියට ගමන් කිරීම සඳහා වන සැලකිය යුතු ඉල්ලුම හඳුනා ගැනීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට හැකි විය. ශ්‍රී ලංකාව සහ මාලදිවයින යන රටවල් දෙකම හරිත රටවල් ලෙස නම් කර තිබීම යන කරුණද ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට ප්‍රයෝජනවත් වූ අතර එමඟින් ඉදිරියේදී ගමන් කිරීම සඳහා සංක්‍රමණ නිරෝධායනයක් අවශ්‍ය මඟීන්ට යෝග්‍ය විකල්පයක් නිර්මාණය කරන ලදි. මීට අමතරව, සංශෝධිත මෙහෙයුම් කාලසටහනක් සමඟ සාම්ප්‍රදායික පියාසැරි මෙහෙයුම් නැවත ආරම්භ කිරීම ඇතුළු අදාළ මෙහෙයුම් සඳහා ධාරිතාව තෝරා ගෙන යොදවන ලදි. ගුවන් භාණ්ඩ ඉල්ලුම මෙන්ම මඟී ඉල්ලුමේ ඕනෑම වැඩිවීමකට සරිලන ලෙස ගුවන් යානා ලබා ගැනීමේ හැකියාව සහ ආදායම් විභවය මත පදනම්ව ස්ථාපිත ගුවන් භාණ්ඩ ප්‍රවාහන මාර්ග පවත්වාගෙන යන ලදි. ප්‍රධාන වශයෙන් ගුවන් ගමන් මෙහෙයුම් පිරිවැය ආවරණය මත රඳා පවතින අතර අවශ්‍ය වූ විට ගුවන් යානා වෙන් කිරීමට අදාළ තීරණය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙත වන නිරපේක්ෂ ආදායම් විභවය මත පදනම් විය.

වර්ෂය තුළ, රටවල් අතර අත්සන් කරන ලද “Air Bubble” ගිවිසුමට අනුව ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ලද අතර, එය ශ්‍රී ලංකාව වෙත/වෙතින් ක්‍රියාත්මක වන එකම ජාත්‍යන්තර ගුවන් සමාගම බවට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පත්කිරීමට සහ අත්‍යවශ්‍ය සම්බන්ධතාවක් සැපයීමට හේතු විය. “VTL (Vaccinated Travel Lane)” යෝජනා ක්‍රමයට සහභාගී වුත්, සිංගප්පූරුව සහ ජාලයේ පවතින අනෙකුත් ස්ථාන අතර සංචාරය කරනු ලබන එන්නත් ලබා ගත් මගීන් සඳහා සම්බන්ධතාව සපයමින් සිංගප්පූරුව වෙත/වෙතින් ගුවන් ගමන් ක්‍රියාත්මක කළාවුත් පළමු ගුවන් සමාගම් අතරට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පත්විය.

මෙකී වාතාවරණයන් යටතේ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 2021/22 මූල්‍ය වර්ෂය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 356.4 ක (ශ්‍රී ලංකා රුපියල් බිලියන 78 ක) මගී ආදායමක් වාර්තා කරන ලදි. මුළු ගුවන් ප්‍රවාහන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 589.1 ක් (ශ්‍රී ලංකා රුපියල් බිලියන 123.6 ක්) ලෙස දැක්වුණි. එය 2020/21 සිට 143% ක සමස්ත වර්ධනයක් වන අතර 2019/20 සිට 36% ක පහත වැටීමකි.

මගී ඉල්ලුමට අදාළ පශ්චාත් කොවිඩ් වසංගත තත්ත්වයේ ප්‍රතිසාධනය සඳහා වන වෙළඳපොළ ඉදිරි දැක්ම අඛණ්ඩව ධනාත්මක වේ. කෙසේ වෙතත්, විශ්වසනීය වෙළඳපොළ පුරෝකථන නොමැති විට, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් තත්ත්වයේ යථාර්ථයන් සමීපව නිරීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරනු ලබනු ඇති අතර, 2022/23 වසර තුළ අත්විඳි ධනාත්මක ආදායම් වර්ධන ප්‍රවණතාව දිගින් දිගටම පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) සහ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) වැනි වෙළඳ ආයතන විසින් සිදු කරන ලද ස්වාධීන අධ්‍යයනයන් මඟින් සමාගමට මඟපෙන්වනු ඇත.

## 'වන්වර්ල්ඩ්' එකමුතුව

2014 වසරේ සිට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වන්වර්ල්ඩ් එකමුතුවේ සාමාජිකයෙකු වන අතර ලොව පුරා වන්වර්ල්ඩ් ගමනාන්ත 1,100 කට අධික සංඛ්‍යාවකට ගමන් කිරීමට මගීන්ට අවස්ථාව ලබා දෙයි. ඉන්දියානු උප මහාද්වීපයේ සිට මෙම එකමුතුවට ඇතුළත් වූ පළමු ගුවන් සමාගම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වන අතර අලස්කා එයාර්ලයින්ස්, ඇමරිකන් එයාර්ලයින්ස්, බ්‍රිටිෂ් එයාර්වේස්, කැතේ පැසිෆික්, ෆින්එයාර්, අයිබීරියා එයාර්ලයින්ස්, ජපෑන් එයාර්ලයින්ස්, මැලේෂියා එයාර්ලයින්ස්, ක්වන්ටස්, කටාර් එයාර්වේස්, රෝයල් එයාර් මැරොක් සහ රෝයල් ජෝර්දානියන් වැනි ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රයේ විශාලතම සහ ප්‍රමුඛතම සන්නාමයන් සමඟ සාමාජිකත්වය බෙදා හදා ගනී. 2022 වර්ෂයේදී, ඕමාන් එයාර් වන්වර්ල්ඩ් එකමුතුවට සම්බන්ධ වීම සඳහා ඇතුළත් කරන ලද අතර 2023 වර්ෂය වන විට එකමුතුවේ කොටස් හිමි නොවන සාමාජිකයෙකු බවට පත්වීමට නියමිතව ඇත.

මෙම එකමුතුවෙහි සාමාජිකයෙකු වශයෙන්, සිය හිතෛෂීත්ව වැඩසටහන ගොඩනඟා ගනිමින් දැනුම හුවමාරු කිරීමේ ක්‍රියාවලියෙහි කොටස්කරුවෙකු වෙමින්, කලාපීය ගුවන් සමාගමක් වශයෙන් සිය සන්නාම වටිනාකම වඩාත් ගෝලීය වේදිකාවක් වෙත යොමු කරමින් සිය සේවා ජාලය වර්ධනය කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමත් වී තිබේ. ව්‍යාපාරික පන්තියට ඇතුළු වීමේ ප්‍රවේශය, පොරොත්තු ලේඛනයේ ප්‍රමුඛත්වය, අමතර ගමන් මලු දීමනාව සහ ලොව පුරා විවේකාගාර 550 කට අධික සංඛ්‍යාවක් වෙත පිවිසීමේ අවස්ථාවද ඇතුළු ප්‍රතිලාභ රාශියක් වන්වර්ල්ඩ් හි නිතර ගමන් කරනු ලබන සාමාජිකයන් හට හිමිවේ. මෙම එකමුතුව මඟින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පාරිභෝගිකයින් හට පිරිනමන වඩාත් සුවිශේෂී ප්‍රතිලාභ අතරින් එකක් වන්නේ එහි සියලුම සාමාජික ගුවන් සමාගම් සමඟින් ‘frequent flyer’ සැතපුම් උපයා ගැනීමේ හා වැය කිරීමේ අවස්ථාව සැලසීමයි.

## ලොව පුරා විකිණුම් සහ බෙදාහැරීම්

*සමස්ත විග්‍රහය*

ගෝලීය වසංගතය හේතුවෙන් 43 වසරක සිය සේවා කාලය තුළ මුහුණ දුන් දරුණුම ආර්ථික පසුබෑම හමුවේ නොසැලී සිටි ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම නව ගුවන් සේවා යුගයකට අඛණ්ඩව අනුවර්තනය වීමට සමත් විය. සතුටුදායක නිෂ්පාදන ඵලයක් පිරිනැමීම හරහා ගුවන් සමාගම විසින් සිය අවසන් පාරිභෝගිකයින් සහ කොටස් හිමියන්ට සේවය සැපයිය හැකි වාතාවරණයක් තුළ ධාරිතාව සීමා කරන ලද ක්ෂේත්‍රයේ ඕනෑම අවස්ථාවක් ප්‍රයෝජනයට ගැනීම සඳහා බහුකාර්ය විකිණුම් උපායමාර්ග වැඩිදියුණු කිරීම කෙරෙහි සිය අවධානය යොමු කළේය.

2021 නොවැම්බර් මාසයේදී ඔමික්‍රෝන් වෛරසය හටගැනීමත් සමඟ නැවත ගුවන් සේවා කර්මාන්තය එහි කොටස් හිමියන් සඳහා දුෂ්කරතාවලින් පිරි ක්ෂේත්‍රයක් බවට පත්විය. එපමණක් නොව, අවම වශයෙන් එක් මාත්‍රාවක් ලබා ගත් පුද්ගලයන් ඇතුළත් ගෝලීය එන්නත් අනුපාතය ආසන්න වශයෙන් 60% ක් විය. වඩාත්ම වැදගත් කරුණ වනුයේ, ඉන්දියාවේ පූර්ණ එන්නත් අනුපාතය ආසන්න වශයෙන් 31% ක සම්පූර්ණ කිරීම, ඉන්දියාව ප්‍රමුඛ මූලාශ්‍ර වෙළඳපොළක් වුවද, ඉන්දියාවේ මගී මෙහෙයුම්වලදී පූර්ව වසංගත ගම්‍යතාව නැවත ලබා ගැනීම සඳහා වන ගුවන් සමාගමේ මූලික සැලසුම්වලට දිගින් දිගටම බාධාවක් වීමයි. කෙසේ වෙතත්, ජාතීන් දෙක අතර ‘Bubblea’ ගිවිසුමක් යටතේ දෙරට අතර ගමන් කිරීමට අවකාශය සලසමින් එයාර්ලයින්ස් සිය ඉන්දියානු මගීන්ට අඛණ්ඩව සේවය කළේය. එයාර්ලයින්ස් හි තවත් ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපොළක් වන චීනය එහි මගී ගුවන් ගමන් සීමා කිරීම් සහ රටින් පිටත සංචාර අඛණ්ඩව පවත්වා ගෙන ගියේය. එමඟින් වත්මන් මූල්‍ය වර්ෂය තුළ ආසියා පැසිෆික් කලාපීය ගමනාගමන වර්ධනයට පූර්ව වසංගත මගී මට්ටම් දක්වා අහිතකර බලපෑමක් එල්ල කළේය. කෙසේ වෙතත්, ඉහත සඳහන් අඩුපාඩු අවම කර ගැනීම සඳහා ගුවන් ගමන් සඳහා පවතින ඉල්ලුම සමඟ පවතින වෙළඳපොළ කෙරෙහි අවධානය යොමු කරමින් එහි නව වෙළඳපොළ පුළුල් කිරීම්වලින් ප්‍රතිලාභ ලබා ගැනීමට ගුවන් සමාගමට හැකි විය.

*වෙළඳපොළ පුළුල් කිරීම*

භාණ්ඩ ප්‍රවාහන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉදිරිපත් කර ඇති වෙළඳපොළ අවස්ථාවන්ට අනුකූලව එහි මාර්ග ජාලය ශක්තිමත් කිරීම සඳහා, එයාර්ලයින් සිය ඉතිහාසයේ ප්‍රථම වරට සති දෙකකට වරක් අප්‍රිකානු මහාද්වීපයේ නයිරෝබි හි පියාසැරි මෙහෙයුම් සිදු කළේය. තවද, මූල්‍ය වර්ෂය තුළ, ඇතැම් වෙළඳපළවල මගී ගමනාගමන ප්‍රවණතා වර්ධනය වීමත් සමඟ, මුලින් භාණ්ඩ කේන්ද්‍රීය මෙහෙයුම් ලෙස සිදු වූ සිඩ්නි, ෆ්‍රැන්ක්ෆර්ට්, ඉන්චියොන් සහ නයිරෝබි වෙත මගී මෙහෙයුම් ව්‍යාප්ත කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට හැකි විය. යුරෝපීය සහ ආසියානු කලාප දෙකෙහිම මගී සංචලනය සඳහා ඇති පැහැදිලි ඉල්ලුම මඟින් ඉදිරිපත් කරන ලද නව වෙළඳපොළ අවස්ථා ප්‍රයෝජනයට ගැනීමටද ගුවන් සමාගම යුහුසුළු විය. එබැවින් පැරිස්, මොස්කව් සහ කත්මණ්ඩු වෙත ගුවන් ගමන් හඳුන්වා දීමෙන්, ශ්‍රී ලංකාවට සෘජු සම්බන්ධතා සැපයීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට හැකි විය.

දිවයිනේ ජාතික ගුවන් සේවය ලෙස ශ්‍රී ලංකාව වෙත සිදුවන සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා එයාර්ලයින්ස් විශේෂ

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

අවධානයක් යොමු කළේය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 හි නව ප්‍රභේදය සහ ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපොළවල අඛණ්ඩ සංචරණ සීමා කිරීම් හේතුවෙන් මෙකී අරමුණ සාක්ෂාත් කර ගැනීමේදී ගෝලීය කර්මාන්ත ප්‍රචාරණය අභියෝගවලට මුහුණ පෑවේය. එහෙයින්, එයාර්ලයින්ස් විසින් මූල්‍ය වර්ෂයට අදාළව සිය අවධානය නැවත වෙනස් කරන ලද අතර, මිතුරන් සහ නෑදෑයින් හමුවීම මෙන්ම ශිෂ්‍ය මගී අංශ සඳහා යෝග්‍ය ගුවන් සේවාවක් ලෙස වාසිදායක ස්ථානගත කිරීමක් හඳුන්වා දෙන ලදී. ව්‍යාපාර අඛණ්ඩතාව සහ කොටස් හිමියන්ගේ අපේක්ෂාවන් සපුරාලීම සඳහා ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, අනෙකුත් යුරෝපීය ගමනාන්ත සහ මැදපෙරදිග ඇතුළු එහි සියලුම ප්‍රධාන වෙළඳපළවලින්, වසංගතය අතරතුර, අඩු පියාසර කාලය සහ සම්බන්ධක ස්ථාන සමඟ වැඩිදියුණු කරන ලද ආරක්ෂිත සංචාරක අත්දැකීමක් ලබා දීමෙන් ඔවුන්ට ශ්‍රී ලංකාව හා සෘජු සම්බන්ධතාවක් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාව සහ ආසියානු කලාපය වෙත සිදුවන සංචාර වැඩි දියුණු කිරීමේ සිය කැපවීම තහවුරු කිරීම සඳහා, එයාර්ලයින්ස් විසින් යුරෝපීය මහද්වීපය වෙත සිය ගුවන් ගමන් මෙහෙයුම් පවත්වාගෙන ගිය අතර, සිය වටිනා මගීන්ට සේවය කිරීමේ අරමුණ සහිතව ලන්ඩන්-එක්සත් රාජධානිය සඳහා වන එහි දීර්ඝතම යුරෝපීය ගමනාන්තයට අමතරව පැරිස්-ප්‍රංශය, ෆ්‍රැන්ක්ෆර්ට්-ජර්මනිය සහ මොස්කව්- රුසියාව වෙත ක්‍රියාත්මක කරන සිය මෙහෙයුම් හරහා ශ්‍රී ලංකාවට බාධාවකින් තොරව පිවිසීමේ මං සලසා ඇත.

### ආදායම් උත්පාදනය

කාලෝචිත විකිණුම් උපායමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ, පසුගිය වසරේ ඇමරිකානු ඩොලර් මිලියන 83 ට සාපේක්ෂව, ඇමරිකානු ඩොලර් මිලියන 356 ක මගී ආදායමක් එයාර්ලයින්ස් විසින් අත්කර ගත්තේය. සිය සමස්ත ඉතිහාසය තුළ දුෂ්කරම කාලපරිච්ඡේදයන්ගෙන් එකක් වන මේ කාලය තුළ නොසැලී රැඳෙමින් නැවත යථා තත්ත්වයට පත්වීමට තමන් සතු හැකියාව එමඟින් පෙන්නුම් කෙරේ. මූල්‍ය වර්ෂයේ සිව්වන කාර්තුව තුළ එයාර්ලයින්ස් විසින් ප්‍රශංසනීය විකිණුම් කාර්යසාධනයක් අත්කර ගෙන තිබීම සැලකිය යුතු කරුණකි. එය, එහි පූර්ව වසංගත මට්ටම්වලින් 75% කට වඩා වැඩි ප්‍රතිසාධයක් වූ අතර, 2022 සඳහා IATA පුරෝකථනය පූර්ව වසංගත මට්ටමට 40% ක ප්‍රතිසාධන අනුපාතයක් ලෙස ඇස්තමේන්තු කොට ඇත.

### නිෂ්පාදන සහ සේවා පිරිනැමීම්




සමාගමේ ගුවන් මගී ආදායමේ ප්‍රධාන ප්‍රවාහය කර්මාන්තය විසින් පුරෝකථනය කළ මට්ටම්වලට වඩා වැඩි මට්ටම් කරා ළඟා වෙමින් තිබියදී, ලෝක ව්‍යාප්ත විකිණුම් කණ්ඩායම විසින් සිය වටිනා පාරිභෝගිකයින්ට ඉහළ මට්ටමේ සේවාවක් සපයමින් එහි පිරිනැමීම් වැඩි දියුණු කිරීම සඳහා විද්‍යුත් වාණිජ්‍යය, අනුබද්ධ සහ වෙනත් සේවා පිරිනැමීම් කෙරෙහි අවධානය යොමු කරන ලදී.

එයාර්ලයින්ස් සිය වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කළ අතර එමඟින් වෙබ් අඩවියට පිවිසෙන සිය පාරිභෝගිකයන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා නවමු දැක්මක් සහ පහසු සංචාලන විකල්පයන් සපයනු ලැබේ. එහි විශ්වසනීය පාරිභෝගිකයන් සඳහා පහසු මෙන්ම ඉහළ පන්තියේ ආසන වෙන්කිරීමේ අත්දැකීමක් ලබා දෙමින් ආසන වෙන් කිරීමේ ක්‍රියාවලිය තුළ සංචාරක රක්ෂණය වැනි හරස්-විකිණුම් විකල්පයන්ද එමඟින් හඳුන්වා දෙන ලදී.

සිය පාරිභෝගිකයන් වෙත නිෂ්පාදන පිරිනැමීම් තවදුරටත් වැඩි දියුණු කරමින්, එයාර්ලයින්ස් විසින් සිය පළමු 'Instant UPGRAD' විකල්පය හඳුන්වා දුන් අතර, එමඟින් ආසන වෙන් කිරීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක ආර්ථික පන්තියේ මගීන්ට තමන් විසින්ම වෙබ් ද්වාරයෙහි ව්‍යාපාරික පන්තිය වෙත බාධාවකින් තොරව වෙනස් කිරීමට පහසුකම් සපයනු ලැබේ. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමඟ ගමන් කරන අනෙකුත් ගුවන් ප්‍රවේශපත්‍ර දරන්නන් සඳහාද මෙම පහසුකම ලබා දෙනු ලැබුවේ බහුවිධ ගුවන් සමාගම් සමඟ මගී සංචාරක විකල්පයන් පහසු කරමිනි. ගුවන් ගමන් අතරතුර අමතර සුවපහසුවක් සහතික කරමින් එයාර්ලයින්ස් හි ආරක්ෂක රෙගුලාසිවලට අනුකූලව එහි අනෙකුත් අනුබද්ධ සේවාවන් යළි ස්ථාපිත කිරීමටද ගුවන් සමාගමට හැකි විය.



ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සිය පාරිභෝගිකයින් හට හොඳම සේවාවක් පිරිනමනු ලබන කාර්යභාරය උදෙසා, කීර්තිමත් දේශීය බැංකු සමඟ හවුල් වී බහුවිධ ගෙවීම් විකල්පයන් සමඟ අතිරේක ගෙවීම් දොරටු හඳුන්වා දීමෙන් මාර්ගගත ප්‍රවේශපත්‍ර සහ සේවා මිලදී ගැනීම් තෝරා ගත් අතර, එමඟින් සිය වටිනා පාරිභෝගිකයන්ට 'Diners Club' සහ 'Discover cards' විකල්පය භාවිත කිරීමේ අවස්ථාව ලබා දෙයි. තවද, එයාර්ලයින්ස් වෙත අභියෝගාත්මක කාලපරිච්ඡේදයකදී පවා ගුණාත්මක පාරිභෝගික සේවාවක් සහතික කරමින් පාරිභෝගික තෘප්තිය අඛණ්ඩව පවත්වාගෙන යාමට 'Pay Later'විකල්පය ක්‍රියාත්මක විය.

ඉහත පහසුකම් ලබා ගැනීමේදී, එයාර්ලයින්ස් හි පාරිභෝගිකයන්ට උසස් පරිශීලක අත්දැකීමක් ලබා දීමට ඉඩ සලසන බහු-මුදල් මිලකරණය හේතුවෙන් මුදල් පරිවර්තනවලින් මගීන්ට ගැටලුවක් ඇති නොවීය. මීට අමතරව, එයාර්ලයින්ස් විසින් සිය වටිනා පාරිභොගිකයින් හට සිය වෙබ් ද්වාරයෙන් ගුවන් ප්‍රවේශපත්‍ර සහ අනෙකුත් අගය එකතු කළ සේවාවන් මාර්ගගතව මිලදී ගැනීම් සඳහා වැඩි දියුණු කළ ආරක්ෂාවක් අඛණ්ඩව ලබා දෙන ලදි.

එයාර්ලයින්ස් හි හිතෛෂීත්ව වැඩසටහන වන 'FlySmiLes' මඟින් එයාර්ලයින්ස් සහ එහි ඉතා වටිනා මගීන් අතර බැඳීම ශක්තිමත් කිරීමේදී අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. වසර තුළ අපගේ විශ්වසනීය සාමාජිකයන්ට වැඩි දියුණු කරන ලද 'frequent flyer' අත්දැකීමක් ලබා දීම සඳහා අපි නිරන්තරයෙන් උත්සහ දරමු. 'FlySmiLes' වැඩසටහන ගෝලීය වශයෙන් මිලියන භාගයකට අධික පාරිභෝගික පදනමක් සඳහා සිය සේවය සපයන අතර, එමඟින් සිය සාමාජිකයන්ට උපචිත සහ නිදහස් කිරීමේ පිරිනැමීම් රැසක් ලබා දෙනු ලැබේ.

ලොව පුරා ගමනාන්ත 900 ක් සම්බන්ධ කරමින් අපි අපගේ ප්ලැටිනම් සහ ගෝල්ඩ් සාමාජිකයන්ට ස්ථාන 600 කට අධික ප්‍රමාණයක විවේකාගාර පහසුකම් ලබා දෙන්නෙමු. මෙකී වැඩසටහන මඟින් වසංගතයේ බලපෑම් ලිහිල් කිරීම සඳහා සැතපුම් කල් ඉකුත්වීම සහ දීර්ඝ කිරීම් මට්ටම් ඇතුළුව ප්‍රසාද සැතපුම් සහ මුදල් එකතු කළ සැතපුම් ප්‍රවර්ධන වසර පුරා සිය පාරිභොගිකයන් වෙත පිරිනමන ලදි. මෙමඟින් පශ්චාත් වසංගත අවධියේදී සංචාරයේ නිරත වීම සඳහා පාරිභෝගිකයින්ට ඉඩ සලසන ලදි.

"FlySmiLes" විසින් ශිෂ්‍ය ප්‍රජාවට වැඩි දියුණු කරන ලද පාරිභෝගික අත්දැකීමක් සහතික කරමින් වට්ටම්, අතිරික්ත ගමන් මලු නිදහස් කිරීම් සහ ප්‍රසාද සැතපුම් පිරිනමමින් සිය ප්‍රථම ශිෂ්‍ය සමාජය හඳුන්වා දෙන ලදි.

ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය (GCC) විසින් මෙම අභියෝගාත්මක කාලවලදී නිෂ්පාදන පිරිනැමීමට අත්‍යවශ්‍ය වටිනාකමක් එකතු කරමින් අඩු මිනිස් පැය ගණනක් සමඟ පවා සිය වටිනා පාරිභෝගිකයින් හට පැය 24 පුරාම සේවය ලබා දෙනු ලැබේ. වර්තමානයේදී, මෙම මධ්‍යස්ථානය විසින් ඉංග්‍රීසි, සිංහල, දෙමළ සහ මැන්ඩරින් ඇතුළු භාෂා කිහිපයකින් සේවා සපයන අතර අවශ්‍ය විටෙක වෙනත් භාෂාවලින්ද සේවා සැපයීම සඳහා හැකියාව ඇත. ප්‍රංශය, ජර්මනිය, සිංගප්පූරුව, එක්සත් රාජධානිය, හොංකොං, ඉන්දියාව, ජපානය, කුවේට්, මැලේසියාව, පකිස්ථානය, තායිලන්තය සහ චීනය වැනි රටවලින් ඔවුන්ගේ දේශීය අංක ඔස්සේ සම්බන්ධතා මධ්‍යස්ථානය වෙත ළඟාවීමේ පහසුකම එයාර්ලයින්ස් හි පාරිභෝගිකයින්ට ඇත.

වසර තුළ, සංචාරක සීමාවන් ලිහිල් කිරීමත් සමඟ සංචාර සඳහා ඇති ඉල්ලුමේ වැඩිවීමක් කර්මාන්තයෙහි දක්නට ලැබුණි. කොවිඩ්-19 වෛරසයේ ප්‍රභේදයන් ජාත්‍යන්තර මගී ගමනාග මනය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි නොවැළැක්විය හැකි අභියෝග එල්ල කර තිබූ වකවානුවක, ඉහළ ගිය ඉල්ලුමේ දක්නට ලැබුණු මට්ටම් සහ ගෝලීය ආර්ථිකයේ අපේක්ෂිත සාමාන්‍ය යථා තත්වයට පත්වීම හරහා ශීඝ්‍ර ප්‍රතිසාධනයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. IATA පුරෝකථනයන්ට අනුව, මගී ගමනාගමනය 2023 වන විට අඛණ්ඩව වර්ධනය වී පූර්ව වසංගත මට්ටම් කරා ළඟා වනු ඇත.

නුදුරු කාලීනව ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම සම්බන්ධයෙන් ගෝලීය කර්මාන්ත ප්‍රවණයන්ගේ සුභවාදී අනාවැකි මත පදනම්ව, එයාර්ලයින්ස් හි ලෝක ව්‍යාප්ත විකුණුම් කණ්ඩායම විසින් එහි ආදායම් මාර්ග පුළුල් කරමින්, එහි කොටස් හිමියන්ට, වටිනා පුරවැසියන්ට සහ විශාල වශයෙන් රටට වටිනාකමක් එකතු කිරීම සඳහා වඩාත් අවශ්‍ය කරන ආදායම් උත්පාදනය කරමින් සිය පාරිභෝගිකයින් සඳහා අඛණ්ඩව ගුණාත්මක සේවාවක්ද ලබා දෙයි.

### අලෙවිකරණ සන්නිවේදනය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, පශ්චාත් වසංගත සංචාරයන් සඳහා ප්‍රවේශයක් ගනිමින් තිබූ ප්‍රගතිශීලී උපායමාර්ගික සන්නිවේදනය සහ වෙළඳ නාමයන් රඳවා ගැනීමේ උත්සහයන් සමුදායක් වෙළඳපොළ පුරා ක්‍රියාත්මක කළේය. මීට අමතරව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාලෝචිත කාල සීමාව තුළ සිය ගෝලීය ජාලයට ප්‍රවිෂ්ට කරන ලද නව ගමනාන්තයන් හි එයාර්ලයින්ස් සන්නාමය සහ ගමනාන්ත පිහිටුවාලීමට අවධානය යොමු කළේය.

*රේයිඩ් ඇමසෝන් 2022*

ගමනාන්තයක් ලෙස එයාර්ලයින්ස් සහ ශ්‍රී ලංකාව, ලොව ප්‍රකට ප්‍රංශයේ ත්‍රාසජනක සංචාරයක් වන රේයිඩ් ඇමසෝන් වෙත 2022 සඳහා සත්කාරකත්වය ලබා දෙන ලදි. වාර්ෂික ක්‍රීඩා ඉසව්වක් වන මේ සඳහා, මෙවර ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමඟ පියාසර කළ ප්‍රංශ ක්‍රීඩිකාවන් 500 කට අධික සංඛ්‍යාවක් සහභාගී විය. මෙම හවුල්කාරිත්වය පිළිබඳ ප්‍රංශයේ පැවති එයාර්ලයින්ස් ආයතනික ආරම්භක උත්සවයේදී නිල වශයෙන් ප්‍රකාශයට පත් කළ අතර, කොළඹදී පැවති 2022 ජාත්‍යන්තර කාන්තා දිනයේදී මෙම උත්සවය නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. ප්‍රංශයේ සිට ශ්‍රී ලංකාවට ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැගෙන එන ලද ගුවන්යානයේ දිවයිනේ ත්‍රාසජනක අත්දැකීම් සංකේතවත් කිරීමට විශේෂ සැරසිලි සිදු කොට තිබුණි. මෙය වසංගත තත්ත්වයට පසු උත්සවයකට මෙරටට විදේශිකයින් විශාල ප්‍රමාණයක් පැමිණි අවස්ථාවකි.

***#NamastefromSriLanka***

රටේ සංචාරක ප්‍රතිසාධන ප්‍රයත්නයන්ට සහය දැක්වීමේ අරමුණින්, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ඉන්දියාවේ දක්ෂතම අන්තර්ගත නිර්මාණකරුවන් සහ බ්ලොග් රචකයින් පනස්දෙනෙකු සම්බන්ධ කරගනිමින්, විශාලම වෙළඳපොළක් වන #NamastefromSriLanka බ්ලොගර් මෙගා ෆැම් ටුවස් මෙහෙයවන ලදි. අන්තර්ගත නිර්මාණකරුවෝ ප්‍රධාන කරුණු දෙකක් ඔස්සේ දිවයින පිළිබඳ විස්තර ගෙන හැර දැක්වූ අතර, එයාර්ලයින්ස් හි ගෝලීය වශයෙන් පිළිගැනීමයට ලක් වූ සේවාව පිළිබඳ අදහසක් ලබා ගැනීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ඉංජිනේරු යාත්‍රාංග ණය, ගුවන්යානයේ මුළුතැන්ගෙය, ගුවන් සේවා විද්‍යායතනය සහ සිමියුලේටර් මධ්‍යස්ථානය ආදිය සංචාරය කළහ.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

**#SriLankanPromises**

වසර 6 ක විරාමයකින් පසු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සම්බන්ධ වෙමින් තිබූ වෙළඳපොළවල් දෙකක් වන ප්‍රංශය සහ මොස්කව් හි ශ්‍රී ලංකා සන්නාමය ස්ථාපිත කිරීමේ දැඩි අදහසින් මූලිකව රට ප්‍රවර්ධනය කිරීම සැලකිල්ලට ගෙන සකස් කරන ලද ව්‍යාපාර දෙකක් එයාර්ලයින්ස් විසින් ක්‍රියාත්මක කරන ලදි. මෙම ගමනාන්ත දෙක ආරම්භ කිරීම සඳහා, අදාළ වෙළඳපොළවල වෙළඳ ප්‍රදර්ශන දෙකක්, ගුවන්තොටුපළ මෙහෙයුම් සහ නිල දියත් කිරීමේ උත්සව දෙකක් ඇතුළත් වේ. කර්මානත්යේ විශේෂඥයින් 18 දෙනෙකු විසින් විනිශ්චය කරන ලද, ලොව පුරා ගමනාගමන සහ සංචාරක ආයතන සහ පුද්ගලයින් විසින් ඉදිරිපත් කරන ලද ආයතන 133 ක් අතරින් එයාර්ලයින්ස් විසින් 'අලෙවි-වාහක' කාණ්ඩය යටතේ එහි #SriLankanPromises ව්‍යාපාරය සඳහා සිව්වන පැසිෆික් ආසියා සංචාරක සංගමය (PATA) රන් සම්මානය දිනා ගනු ලැබුණි.

#SriLankanPromises යනු ගුවන් සංචාර ඇතුළත්ව ලොව පුරා සියලු ක්‍රියාකාරකම් දින නියමයක් නොමැතිව විරාමයකට මුහුණ දුන් ගෝලීය කොවිඩ්-19 වසංගත තත්ත්වයේ පළමු රැල්ල කාලය තුළදී එයාර්ලයින්ස් විසින් ආරම්භ කරන ලද සන්නාමය පවත්වා ගැනීමේ ව්‍යාපාරයයි. එබැවින් එහි වටිනා ගනුදෙනුකරුවන්ට සේවය කිරීමට ශක්‍යතාවක් නොමැති අවස්ථාවක, එයාර්ලයින්ස් සන්නාමය සමඟ පාරිභෝගිකයින්ට සහ අනුග්‍රාහකයින්ට සක්‍රියව සම්බන්ධ වීමට එමඟින් අවස්ථාව සපයනු ලැබුණි. මෙම ව්‍යාපාරය හරහා ආරක්ෂාව සහ යහපැවැත්ම යන පණිවුඩය පෙරදැරි කරගනිමින්, ඉදිරි සංචාර කටයුතු සඳහා උද්‍යෝගය සහ අපේක්ෂාව පවත්වා ගනිමින් නිවසේ රැඳී සිටීමේ වැදගත්කම පෙන්වා දෙමින් ධනාත්මක බව පැතිරවීම අරමුණු කොට ඇත. මිලියන දෙකකට අධික සමාජ මාධ්‍ය ප්‍රජාවක අවධානයට ලක් වූ මෙම ව්‍යාපාරය සඳහා ඔවුන්ගේ ඉහළ ප්‍රතිචාරයක් ලැබුණි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, දකුණු ආසියා කලාපය තුළ සිය සම්බන්ධතාව නැවත තහවුරු කරමින් ගෝලීය සංචාරක සම්මාන වැඩසටහනේදී '2021 වසරේ ඉන්දියන් සාගරයේ ආසියාතික ප්‍රමුඛතම ගුවන් සමාගම' සහ 'ඉන්දියන් සාගරයේ ලොව ප්‍රමුඛතම ගුවන් සමාගම' යන ගෞරවනීය සන්නාමයන් ලබා ගැනීමට සමත් විය.

**ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ**

1990 වසර සිට ඉහළම වාර්ෂික කාර්යසාධනයක් සාක්ෂාත් කරගනිමින්, ගෝලීය ගුවන් ධාරිතාව 18.7% ක වාර්ෂික වර්ධනයක් සමඟ IATA විසින් 2021 වසර ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා සුවිශේෂී වසරක් ලෙස වාර්තා විය. 1990 වසර සිට විශාලතම පහත වැටීමක් පෙන්නුම් කළ, 2020 වසරේ ගුවන් භාණ්ඩ ටොන් කිලෝමීටර හි 9ගු9 ක වාර්ෂික පහත වැටීමකින් යථා තත්ත්වයට පත් වීමෙන් පසු, ගුවන් භාණ්ඩ ටොන් කිලෝමීටර 8.5% ක් වූ අතර, එය 2018 වසරේ පූර්ව කොවිඩ්-19 මට්ටමට වඩා ඉහළ අගයක් ගන්නා ලදි. මූල්‍ය වසර අවසානයේ පුද්ගලික ආරක්ෂා උපකරණ (PPE) ඇතුළුව ගෝලීය භාණ්ඩ වෙළඳාම සඳහා දැඩි ඉල්ලුමක් මෙන්ම බඩු තොග නැවත ගබඩා කිරීමේ ක්‍රියාවලිය මඟින් කාල සීමාව තුළ ගුවන් භාණ්ඩ ටොන් කිලෝමීටර හි කැපී පෙනෙන දියුණුවක් ඇති කළේය. ගුවන් භාණ්ඩ ටොන් කිලෝමීටරවලින් මනිනු ලබන පවතින ගුවන් භාණ්ඩ ධාරිතාව මෙම කාල සීමාව තුළ 10.9% කින් පහත වැටුණු අතර, මූල්‍ය වර්ෂය අවසාන භාගයේදී මගී නංවාලීම වැඩිදියුණු කිරීමත් සමඟ සෙමින් වර්ධනයක් ලබා ගනු ලැබිණ. ඉල්ලුමට සාපේක්ෂව ධාරිතාවේ හිඟය හේතුවෙන් අනපේක්ෂිත ඉහළ පැටවුම් සාධක සහ අනුපාත එම වසර තුළ ඇති විය.

වසර තුළ ඇමරිකානු ඩොලර් 215 ක් ලෙස ගුවන් මෙහෙයුම් ඉතිහාසයේ ඉහළම භාණ්ඩ ප්‍රවාහන ආදායමක් උත්පාදනය කරගැනීමටත් මගී ඉල්ලුම මඟින් තහවුරු කරන ලද පුළුල් ජාල මෙහෙයුම් හරහා 4.8% ක වාර්ෂික වර්ධනයක් ලබා ගැනීමටත් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙත ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා වාසිදායක වූ පරිසරය මඟින් අවස්ථාව උදා කරන ලදි. භාණ්ඩ ඉල්ලුම ප්‍රයෝජනයට ගනිමින් පවතින ගුවන් යානා කාලය සහ භාණ්ඩ ධාරිතාව උපරිම කර ගැනීම සඳහා 2020 වසරේදී ආරම්භ කරන ලද ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ ප්‍රවාහන වැඩසටහන මූල්‍ය වසර සඳහා චීනය සහ ඉන්දීය උප මහද්වීපයෙන් පිටත ක්‍රියාත්මක වන කුලී පදනම යටතේ මෙහෙයුම් 46 ක් සහ 'Block Space' ගිවිසුම් 13 ක් මඟින් ඇමරිකානු ඩොලර් මිලියන 4 ක ආදායමක් උත්පාදනය කළේය. ගුවන් ප්‍රවාහන කාණ්ඩය යටතේ "රන්" සම්මානය මෙන්ම ශ්‍රී ලංකා ලොජිස්ටික් සහ භාණ්ඩ ප්‍රවාහකයින්ගේ සංගමය (SLFFA) විසින් සමාරම්භක ජාතික ලොජිස්ටික් සම්මාන උළෙලේදී වසංගත තත්ත්වය ආරම්භයේ පටන් ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ විසින් ශ්‍රී ලාංකේය ලොජිස්ටික් ප්‍රජාව වෙත සපයන ලද නවෝත්පාදන විසඳුම් සඳහා 'Award of Recognition' සම්මානය පිරිනමන ලදී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් භාණ්ඩ විකුණුම්, උත්පාදනය කරන ලද මුළු ආදයමෙන් ඇමරිකානු ඩොලර් 69 ක වටිනාකමක් දක්වමින් 33% ක් සහ, පවතින ඉල්ලුම සපුරාලීමට මාලදිවයින සහ මැදපෙරදිග ප්‍රදේශවලට භාණ්ඩ මත පදනම් වූ ධාරිතාවෙ හි ගතික යෙදවීම මඟින් වාර්ෂික වර්ධනය 49% ක් වාර්තා කළේය. සිංගප්පූරුව, හොංකොං, ජපානය සහ ගුවැන්ෂු වෙළඳපොළෙන් උත්පාදනය කරනු ලබන 69% ක ආදායම සමඟින් ඈත පෙරදිග කලාපයෙන් ඇමරිකානු ඩොලර් 84 ක ආදායමක් උත්පාදනය කරන ලදි.

සිංගප්පූරු ගුවන්තොටුපළ මූල්‍ය වර්ෂය තුළ ඇමරිකානු ඩොලර් 23 ක ආදායමක් උත්පාදනය කරමින් නැවතත් ෂැංගි ගුවන්තොටුපළ සම්මාන උළලේදී වසංගත තත්ත්වය පුරා නොකඩවා ගුවන් සබඳතා පවත්වා ගැනීම උදෙසා 'Resilience Award' සම්මානය ලබා ගන්නා ලදි.

යුරෝපීය කලාපය ඇමරිකානු ඩොලර් 16 ක ආදායමක් උත්පාදනය කළ අතර, එය ලන්ඩන් සහ ෆ්‍රෑන්ක්ෆට් වෙතින් ප්‍රවාහන ධාරිතාව වැඩි කිරීම සඳහා ඕස්ට්‍රේලියාවට වැඩි කරන ලද භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව සමඟ පසුගිය වසරට සාපේක්ෂව 67%ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි.

නයිරෝබි සහ ඩුබායි වෙත ක්‍රියාත්මක කරන ලද භාණ්ඩ පදනම් කර ගත් මෙහෙයුම් සමඟින්, කලාපයෙන් උත්පාදනය කරන ලද මුළු ආදායමේ සැලකිය යුතු දායකත්වයක් දක්වමින් මැදපෙරදිග කලාපයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 11 ක් වාර්තා විය.

භාණ්ඩ ප්‍රවාහනය මූලිකව ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පියාසැරිවල වර්ධනයක් තහවුරු කරමින් පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් 77% සහ 32% වර්ධනයක් දක්වමින් ගුවන් භාණ්ඩ සංචලන 203,239 ක් හසුරුවාලමින් ඇමරිකානු ඩොලර් මිලියන 19.1 ක ආදායමක් ලබා ගන්නා ලදි. ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ මෙහෙයුම් විසින් හසුරුවාලනු ලබන පියාසැරි 157% ක වර්ධනයක් දක්වමින් හසුරුවාලනු ලබන මුළු පියාසැරි 13,104 කි. අංශය මඟින් ගුවන් භාණ්ඩ හසුරුවාලීමේ විශ්වාසනීයත්ව අනුපාතය 99.95% ක මට්ටමෙන් පවත්වා ගෙන යන ලදි.

2023 වසර දෙවන කාර්තුව වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වන, නව ගුවන් භාණ්ඩ ආනයන පර්යන්තයක් සංස්ථාපිත කිරීම වර්තමානයේදී සිදු වෙමින් පවතී. ගුවන් භාණ්ඩ ගොඩබිම මත හැසිරවීමේ මෙහෙයුම් සඳහා නවීන තාක්ෂණික පර්යන්තයක් ඇතුළත් කිරීමෙන් එක් කොට ගත් සංවර්ධිත ධාරිතාව මඟින්, දිරායන දෑ එකතු කරන මධ්‍යස්ථානයක් සමඟ උෂ්ණත්වය පාලනය කරන ලද

හැසිරවීමේ ස්ථානයක්, භාණ්ඩ බෙදාහරින ස්ථානයක් සහ සාමාන්‍ය භාණ්ඩ සඳහා වෙන් වූ පර්යන්තයක් සඳහා පහසුකම් සපයනු ලබන අතර එමඟින් කලාපීය භාණ්ඩ ප්‍රවාහන මධ්‍යස්ථානවලට සමාන වන පරිදි ශ්‍රී ලංකාවේ ගොඩබිම් හැසිරවීමේ මෙහෙයුම් වැඩිදියුණු කිරීමට හැකි වනු ඇත.

වසංගතය ආශ්‍රිත සංචරණ සීමා කිරීම් සහ වර්තමාන ගුවන්තොටුපළ ඉදිකිරීමේ ප්‍රතිඵලයක් ලෙස මුහුණ දෙන සැලකිය යුතු අභියෝග මධ්‍යයේ වුවද, රට වෙත සහ ඉන් පිටතට සිදු වන ගුවන් භාණ්ඩ ප්‍රවාහන ක්‍රියාවලියට පහසුකම් සපයන පරමාදර්ශී මට්ටමේ සේවාවක් සැපයීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමත් විය. සේවා මට්ටම, 2021 වසරේ ප්‍රධාන පාරිභෝගික ගුවන් සමාගම් වෙතින් තවදුරටත් පිළිග ැනීමට ලක් විය.

එයාර්ලයින්ස් සමාගම් ඉතිහාසයේ සැලකිය යුතු සන්ධිස්ථාන අත්පත් කර ගැනීමේදී ලාභදායී ගුවන් භාණ්ඩ සඳහා වන ගෝලීය වෙළඳපොළෙහි අවස්ථා ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමත් විය. ධාරිතාව, විකිණුම් සහ ආදායම් කළමනාකරණ උපක්‍රම අනුව ක්‍රියාත්මක වන ගතික උපායමාර්ග ගුවන් භාණ්ඩවල සාර්ථකත්වය සඳහා විශාල වශයෙන් හේතු වී ඇති අතර, මෙහෙයුම් ජාලයේ ප්‍රමුඛ ලොජිස්ටික් සැපයුම්කරුවෙකු ලෙස ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ සන්නාමය ස්ථාපිත කිරීමට එය හේතු වී තිබේ. එසේම එහි ප්‍රයත්නයන් සඳහා වෙළඳාමේ ස්ථාපිත ආයතන වෙතින් පිළිගැනීම පවා ලැබේ.

මඟී සංචලන සාමාන්‍යකරණය සහ ධාරිතාව සාමාන්‍යකරණය, ඉදිරියේ කැපවූ භාණ්ඩ මෙහෙයුම් පවත්වා ගෙන යාමට බාධාවක් ඇති කරමින් ආදායමේ පහත බැස්මක් සහ තරඟකාරී මට්ටමේ සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීම අපේක්ෂා කරනු ලබයි. කෙසේ වෙතත් මඟීන්ගේ සහ භාණ්ඩ ප්‍රවාහන වාණිජ කණ්ඩායම්වල උපාය මාර්ගික සහයෝගීතාවය මඟින් ඉදිරි වසර තුළ අභියෝග ජයගැනීමේ අඛණ්ඩ සාර්ථකත්වය සහතික කරනු ඇත.

## ගුවන් මෙහෙයුම්

### *ඉන්ධන අධීක්ෂණය*

2021/22 මූල්‍ය වසර පුරා ජෙට් ඉන්ධන මිල අඛණ්ඩව ඉහළ ගිය අතර, ගෝලීය ආර්ථිකය නැඟීම වර්ධන අවස්ථාවන් තීව්‍ර කර ඇත. වසර අවසානයේ ඇති වූ රුසියාව සහ යුක්රේනය අතර ගැටුම හේතුවෙන්ද 2022 පෙබරවාරි මස සිට ජෙට් ඉන්ධන මිල ඉහළ යාමට හේතු විය. ඊට අමතරව කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින පනවන ලද අඛණ්ඩ සංචරණ සීමා හේතුවෙන් 2021/22 මූල්‍ය වර්ෂයේ මුල් භාගයේදී ගුවන් සමාගම අත්විඳි ගුවන් ගමන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අවම මට්ටමක පැවතිණි.

කෙසේ වෙතත් 2021/22 මූල්‍ය වර්ෂයයේ මුල් භාගයට සාපේක්ෂව, දෙවන භාගයේදී අයබරවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, එයින් ආදායම් ටොන් කිලෝමීටර ප්‍රමාණකට ඉන්ධන දහනය (RTK) යටතේ එයාර්ලයින්ස් හි ඉන්ධන කාර්යක්ෂමතාවයේ 27%ක දියුණුවක් ඇති විය. තවද, ඉන්ධන අධීක්ෂණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව, 2021/22 වර්ෂයේදී ලබා ගත් 1.3% ක ඉන්ධන දහන ඉතිරිය මඟින් නිරූපණය කරනු ලබන අතර (ප්‍රකල්පිත සහ සැබෑ ඉන්ධන දහනයේ පරිමාව අනුව), එමඟින් කාබන්ඩයොක්සයිඩ් විමෝචනයේ මෙට්‍රික් ටොන් 10,625 ක අඩු වීමක් පෙන්නුම් කරනු ලබයි.

### *ගුවන් මෙහෙයුම් පාලන මධ්‍යස්ථානය (AOCC)*

ගුවන් මෙහෙයුම් පාලන මධ්‍යස්ථානය කොවිඩ්-19 වසංගත තත්ත්වය පැවති කාලයේ සියලු පාර්ශ්වකරුවන් සමඟ සැලකිලිමත් සම්බන්ධීකරණ ක්‍රියාවලියක් හරහා සැලසුම් විශ්වසනීයත්වය කළමනාකරණය කරමින්, අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදි. දේශීය සහ ගෝලීය වශයෙන් පනවන ලද සීමා කිරීම් නොතකමින් පාරිභෝගිකයින්ට අපහසුතා අවම කරමින් වඩාත් ලාභදායී ආකාරයෙන් මෙහෙයුම් කළමනාකරණ කිරීම සඳහා සියලු රෙගුලාසිවලට සම්පූර්ණයෙන් අනුකූල වන පරිදි ශීඝ්‍ර වෙනස්කම් සමඟ බොහෝ උපායමාර්ග අනුගමනය කරන ලදි.

සමාලෝචනයට භාජනය වන කාලය තුළ ගුවන් මෙහෙයුම් පාලන මධ්‍යස්ථානයට ගුවන්යානා/මැදිරි කාර්ය මණ්ඩලයේ සහ ගොඩබිම කාර්ය මණ්ඩලයේ කොවිඩ් රෝගීන් සංඛ්‍යාව වැඩි වීම හේතුවෙන් මිනිස් ශ්‍රමය අඩු වීම, ප්‍රධාන පදනම ඇතුළු සෑම පියාසැරියක් අවසානයේදීම බොහෝ ගුවන් නැවතුම්පොළවල් හි දී ගුවන්යානා විෂබීජහරණය සහ දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශයන් සමඟ නිරෝධායන නීතිවලට අනුකූල වීම ඇතුළු බොහෝ අභියෝගවලට මුහුණ දෙන ලදි. කොවිඩ්-19 සීමාවන්ට අමතරව, ඇෆ්ග නිස්ථානය, රුසියාව සහ යුක්රේනයේ භූදේශපාලන ගැටලු සමාලෝචනයට ලක්ව ඇති කාල සීමාව තුළ මෙහෙයුම් අභියෝග ඇති කරනු ලැබුණි.

අනෙකුත් සියලුම අභ්‍යන්තර සහ බාහිර මෙහෙයුම් පාර්ශ්වකරුවන් සමඟ එක්ව කටයුතු කරමින් ගුවන් මෙහෙයුම් පාලන මධ්‍යස්ථානය මඟින් ආයතනයේ යහපත වෙනුවෙන් අභියෝග ජය ගැනීමට පෙර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කරමින් 24×7 අධීක්ෂණයක් යටතේ කිරීමට සමත් විය. නියාමකයින්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගනිමින් ඕස්ට්‍රේලියාවට විශේෂ භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් සාර්ථක ලෙස සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ කැපී පෙනෙන අවස්ථාවක් වේ.

### *පියාසැරි මෙහෙයුම් පුහුණු*

වසංගත තත්ත්වය අතරතුර සියලුම ගුවන් කාර්ය මණ්ඩල ඔවුන්ගේ සියලුම නියාමන පුහුණු සඳහා සුදුසුකම් ලබා ඇති බව සහතික කිරීම සඳහා පියාසර මෙහෙයුම් පුහුණු කණ්ඩායම සහ පියාසර උපදේශක ආයතනය වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදි. අභ්‍යන්තර සිමියුලේටර් දෙක මඟින් කාර්ය මණ්ඩලයට සුදුසුකම් ලැබීමට සහ යාවත්කාලීන වීමට ඉඩ සලසමින් වාණිජ අංශයෙන් ඉහළ ඵලදායීතාවයක් සහතික කරනු ලැබුණි. මෙය ගුවන් කාර්ය මණ්ඩල අංශයෙන් පූර්ව වසංගත මෙහෙයුම් කාර්යක්ෂමතාවයට නැවත පැමිණීමට සමාගමට සහය විය.

## ගුවන් ගමන් සේවා

එයාර්ලයින්ස් දැක්ම සාක්ෂාත් කරගැනීමට ප්‍රධාන දායකත්වයක් ලබා දෙනු ලබන යානස්ථ සේවා මඟින් අපගේ මඟීන් තෘප්තිමත් කිරීමට අභ්‍යන්තර සේවාවක් සපයමින් වැදගත් කාර්යභාරයක් සිදු කරනු ලබයි.

'SriLankanising' ව්‍යාපාරය සියලු දිගු දුර ගුවන්යානාවල ව්‍යාපාරික පන්තියේ පිළිග ැනීමේ පානය ලෙස දේශීය පළතුරු බීමක් හඳුන්වා දීම ඇතුළුව සෑම කලාපයකින්ම සුවිශේෂී ශ්‍රී ලාංකේය ආහාර වට්ටෝරුවක් හඳුන්වාදීම මඟින් ආරම්භ කරන ලදි. පශ්චාත් වසංගත අවධියේ ඉහළ සේවයක් තහවුරු කිරීම සඳහා කොවිඩ් අවධියේ භාවිත කරන ලද ඉවත දැමිය හැකි සේවා උපකරණ සම්මත උපකරණ ලෙස නැවත යොදා ගන්නා ලදි.

පුද්ගල පුහුණුව සඳහා ඇති සීමාවන් හේතුවෙන් මාර්ගගත නවක පුහුණුව ආරම්භ විය. තවද වසංගත තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය ගැටලු සැලකිල්ලට ගෙන අභ්‍යන්තර සේවා සැපයීමේදී ශ්‍රී ලංකා සිවිල් සේවා අධිකාරිය (CAASL) විසින් අනුමත කරන ලද ක්‍රියා පටිපාටි යොදා ගන්නා ලදි.

ඊට අමතරව කොවිඩ් 19 ආහාර වේලට වෙනුවට වෙනස් ආකාරයේ ආහාර වේලක් නැවත හඳුන්වා දුන් අතර, ශ්‍රී ලංකා සිවිල් සේවා අධිකාරියේ අවශ්‍ය අනුමැතියන් අනුව මෙය සිදු කරන ලදී.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

***තීරු බදු රහිත සේවා***

සමාලෝචිත වර්ෂය තුළ යානස්ථ තීරු බදු රහිත සේවා විකුණුම් නැවත ආරම්භ කරන ලද අතර, සම්පූර්ණයෙන් නවතා තිබූ අවශ්‍යව තිබූ මුදල් විකුණුම් 2021 වසරේ අවසාන කාර්තුවේදී නැවත ආරම්භ විය. සැපයුම් දාමයේ අනපේක්ෂිත ගැටලු මධ්‍යයේ ක්‍රමානුකූල වර්ධන මට්ටමකින් අභ්‍යන්තර විකුණුම් දිගටම පැවතුණි. වත්මන් විකුණුම් ප්‍රවණතා සැලකිල්ලට ගෙන නව අයිතමයන්ද එක් කරමින් නව “සෙරන්ඩිබ් ටේෂර්” නාමාවලිය නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

## ව්‍යාපාර ඒකක සමාලෝචනය

### ශ්‍රීලංකන් ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා

***දළ විශ්ලේෂණය***

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ (BIA) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ (MRIA) එකම ගොඩබිම් හසුරුවන්නා ලෙස ශ්‍රීලංකන් ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශය විසින් ගුණාත්මක සේවාවක් සැපයීම සහතික කරමින් සියලු ජාත්‍යන්තර ගුවන් සමාගම් සඳහා සියලුම ආකාරයේ ගොඩබිම් මෙහෙයුම් සේවා පිරිනමනු ලැබේ.

2021/22 මූල්‍ය වර්ෂය ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශයෙහි සියලු මෙහෙයුම් සඳහා වඩාත් අභියෝගාත්මක වසරවලින් එකක් වුවද යථා තත්ත්වයට පත් වීමේ ලකුණු පෙන්නුම් කළේය. විශේෂයෙන් මූල්‍ය වර්ෂයේ දෙවන භාගයේදී ලොව පුරා වසංගත ආශ්‍රිත සීමා කිරීම් ඉවත් කරන ලද බැවින් 2021/22 තුළ ගොඩබිම් මෙහෙයුම් ප්‍රතිසාධනය ඉහළ මට්ටමක පැවතුණි. වසර පුරාවට මුහුණ දුන් අභියෝග රාශියක් මධ්‍යයේ ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශය සිය හර වටිනාකම් වන ආරක්ෂාව, නිරවද්‍යතාව, සහ සේවා විශිෂ්ටත්වය තහවුරු කරමින් ගුණාත්මක සේවා සැපයීමක් සහතික කළේය.

***කාර්යසාධනය***

මෙහෙයුම් පරිසරයේ වැඩි දියුණු කිරීම් සලකා බැලීමේදී, දෙවන භාගයේ ව්‍යාපාරයේ වැඩි වීමක් දක්නට ලැබුණු අතර එය 40% ක ගුවන් ගමන් ප්‍රතිසාධන අනුපාතයකට මග පෑදීය. පූර්ව කොවිඩ්-19 මට්ටමට සාපේක්ෂව හසුරුවන ලද මගීන්ගේ ප්‍රතිසාධන අනුපාතය 25% ක් පමණි.

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ තුළ හසුරුවන ලද ගුවන් ගමන් සංඛ්‍යාව**




**මූල්‍ය වර්ෂය 21/22 හසුරුවන ලද මගීන්, මිලියන**




පසුව, මෙම අංශය ඇමරිකානු ඩොලර් මිලියන 28 ක් සඳහා දායක විය. තවද, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ යන දෙකෙහිම එයාර් ෆ්‍රාන්ස්, ගල්ෆ්එයාර්, පිලිපීන් එයාර් වේස් සහ අයිලන්ඩ් ඒවියේෂන් සර්විසස් සමඟ ගිවිසුම් අත්සන් කිරීමෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් නව ව්‍යාපාර ආරම්භ කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ, කාර්ය මණ්ඩල හිඟය, අමතර ලියකියවිලි පරීක්ෂා කිරීම් සහ ක්‍රියාපටිපාටි තිබියදීත් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 98.81% ක නියමිත වේලාවට සිදු වන කාර්යසාධනයක් පවත්වා ගැනීමට සමත් විය. ගොඩබිම් ආධාරක උපකරණයන් හි මෝටර් සහිත ඒකක 200 ක් සහ මෝටර් රහිත ඒකක 550 කට අධික සංඛ්‍යාවකක් උපයෝගී කර ගනිමින් ගුවන් යානා ජංගම සෝපානයේදී below-the-wing කණ්ඩායම විසින් 99.74% ක හැසිරවීමේ විශ්වසනීයත්වයක් පවත්වා ගන්නා ලදී. ගුවන් භාණ්ඩ මෙට්‍රික් ටොන් 203,000 ක සමස්තයක් හසුරුවා ඇති අතර පසුගිය එය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 50% ක වැඩිවීමකි. වැරදි ලෙස හසුරුවන ලද ගමන් මලු අනුපාතය මගීන් 1000 කට 0.72 ක් ලෙස පැවතුණි.

***ගුවන්තොටුපොළ මෙහෙයුම්***

ගුවන් යානා නැවතුම් ස්ථාන 23 කින් සමන්විත නව නැවතුම්පොළ 2022 ජනවාරි මාසයේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ හි විවෘත කිරීමත් සමඟ ගොඩබිම් ආධාරක උපකරණ භාවිතය සහ ගොඩබිම් කාලය දීර්ඝ කරමින් දුරස්ථ මෙහෙයුම් සංඛ්‍යාව වැඩි කරන ලදී. තවද, 2020 දෙසැම්බර් මාසයේදී නව මගී පර්යන්තය ඉදිකිරීම ආරම්භ කිරීමත් සමඟ, පැවති සේවා මාර්ග වසා දමන ලද අතර එය තියුණු වංගු සහිත විකල්ප පටු මාර්ග හඳුන්වා දීම සඳහා මග පෑදීය. මෙම වෙනස 2021 ජූනි මාසයේදී ගොඩබිම් හැසිරවීමේ මෙහෙයුම්වලට දැඩි බාධා ඇති කළේය. මීට අමතරව, පර්යන්තය සහ නව ප්‍රවේශය අතර ඇති දුර නිසා ගමන් මලු සහ ගමන් මලු මාරු කිරීමේ කාලවේලාවන් ගැටලුකාරී විය. එබැවින්, මෙහෙයුම් වෙනස්කම්වලට අනුකූලව ‘නව සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි’ සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

වසංගත කාලපරිච්ඡේදය තුළ මගීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කරමින් ආරක්ෂක පියවර මෙන්ම අනෙකුත් අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. සමාජ දුරස්ථභාවය පවතවා ගැනීම, සෞඛ්‍ය සහ ආරක්ෂක මාර්ගෝපදේශ ප්‍රදර්ශනය කිරීම සහ අවශ්‍ය සියලුම ලියකියවිලි සකස් කිරීම මේ පියවර සඳහා ඇතුළත් විය. ඊට අමතරව, සෘජු සම්බන්ධතා අවම කිරීමට මාර්ගගත ක්‍රම භාවිත කිරීමට මගීන් දිරිමත් කරන ලදී. කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම මෙන්ම පාර්භෝගිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කොවිඩ්-19 එන්නත් මාත්‍රා සියල්ලම සමාගම් වෛද්‍ය මධ්‍යස්ථානයෙන් ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් දිරිමත් කරන ලදී. මෙහෙයුම් කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය කරන පෞද්ගලික ආරක්ෂක උපකරණ සපයන ලද අතර මෙහෙයුම් කටයුතු අතරතුර නිසියාකාරව ඒවා පළඳින්නේද යන්න සහතික කරන ලදී.

වසංගතයෙන් මිදී කර්මාන්තය යථා තත්ත්වයට පත් වීමත් සංචරණ සීමාවන් ලිහිල් කිරීමෙන් පසු සංචාරක ඉල්ලුම නැවත ඇති වීමත් සමඟ, පෙර නොවූ විරූ ශ්‍රම හිඟයකට මුහුණ පෑමට ගුවන්තොටුපොළ සහ ගොඩබිම් මෙහෙයුම් අංශයට සිදු විය. ප්‍රධාන වශයෙන් මෙම හිඟයන් ඇති වීමට හේතු වූයේ ගුවන් සේවා කර්මාන්තය පුරා වසංගත තත්ත්වය හේතුවෙන් සිදු කරන ලද රැකියා අහිමි වීමය. එය මෙහෙයුම් අවහිරතා සහ නව සංචාරක ඉල්ලුමට සඳහා බාධාවලට හේතු විය. එවැනි තත්ත්වයක් තුළ, නැවත බඳවා ගැනීමද කර්මාන්තයට අභියෝගාත්මක විය.

### *වැඩි දියුණු කිරීමේ පියවර*

අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයේ වුවද, ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශය විසින් මානව සම්පත් සහ උපකරණ සඳහා ආයෝජනය කිරීම අඛණ්ඩව සිදු කළ අතර, ගුවන්තොටුපොළ සේවා නියෝජිතයන්, රෝදපුටු හසුරුවන්නන් සහ ගමන්මලු හැසිරවීම සහ ගුවන්තොටුපොළ පිරිසිදු කිරීමේ සේවා සඳහා තෙවන පාර්ශ්ව කොන්ත්‍රාත්කරුවන් පිළිගන්නා ලදි. පිරිසිදු කිරීමේ උපකරණ සහ ගොඩබිම් ආධාරක උපකරණ (GSE) සඳහා ප්‍රාග්ධන ආයෝජන සිදු කරන ලදි. ඊට අමතරව, කාර්යක්ෂම GSE ඇණියක් පවත්වා ගැනීම සඳහා වැඩි වශයෙන් හඳුනා ගන්නා ලද තීරණාත්මක උපකරණ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කරන ලදි.

පාරිභෝගික ගුවන් සේවා පිටත්වීම් පාලන පද්ධති පුහුණු කිරීම් සඳහා සහය දැක්වීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් ස්වකීය අභ්‍යන්තර රේඛීය පුහුණුකරුවන්ගේ සංසදයක් ගොඩනඟා දිගටම පවත්වා ගෙන යනු ලබයි. එබැවින්, මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ කොවිඩ්-19 ක්‍රියාපටිපාටිවලට අනුගත වෙමින් සියලුම නියාමන සහ අනිවාර්ය පුහුණුව සම්පූර්ණ කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හට හැකි විය. එමඟින් මෙහෙයුම් කාර්ය මණ්ඩල කාර්යසාධනයෙහි අඛණ්ඩ සංවර්ධනයට සහය දැක්වීම සහ වටිනාකමක් එක් කිරීම සිදු විය. මීට අමතරව, ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන වැරදි ලෙස හසුරුවන ලද ගමන් මලු එලදායී ලෙස හැසිරවීම සඳහා නව ක්‍රියාපටිපාටි හඳුන්වා දෙන ලදි.

තවද, මගීන්ට වඩාත් සුවපහසු පරිසරයක් පිරිනැමීම සඳහා සෙරන්ඩිවා විවේකාගාරය නවතම සහ හොඳම ගෘහභාණ්ඩ සහිතව නවීකරණය කරන ලදි. කලින් පිරිනමන ලද පහසුකම් ලබා දීම නැවත ආරම්භ කිරීම ඇතුළු සම්පූර්ණ සේවා සහිත බුෆේ, සුපිරි පාන වර්ග සහ බීමහල් සේවාව සහිත මගීන් 50 දෙනෙකු සඳහා ධාරිතාවකින් විවේකාගාරය සමන්විත වේ.

### *ජයග්‍රහණ*

ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා, ෂ්ඕ ගොඩබිම් මෙහෙයුම් අත්පොත :ඨධඑ* අනුව අවශ්‍ය සියලුම නියාමන ප්‍රමිතීන්ට අනුකූල විය. තවද, ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා ගොඩබිම් මෙහෙයුම් සඳහා ෂ්ඕ ආරක්ෂණ විගණනය :ෂ්ඨධ* සහ ෂ්ඕ මෙහෙයුම් ආරක්ෂණ විගණනය :ෂධ්* යටතේ සහතික කොට ඇත. ක්‍රියාත්මක වන අනුකූලතාවත් සමඟ, කණ්ඩායම ඉදිරි මූල්‍ය වර්ෂයේදී මෙම ජාත්‍යන්තර ආයතනවල මීළඟ විගණන චක්‍රයට මුහුණ දීමට සූදානම් වේ.

### *අනාගතය*

ගුවන්තොටුපොළ සහ ගොඩබිම් සේවා අංශය, සිය සේවා විශිෂ්ටත්වය සහතික කිරීම සඳහා සැලකිය යුතු බලයක් සමඟින් සිය කැපවීම අඛණ්ඩව පවත්වාගෙන යමින් සේවා මට්ටම් තවදුරටත් ඉහළ නැංවීම සඳහා මානව සම්පත්, පුහුණුව සහ උපකරණ සඳහා අඛණ්ඩව ආයෝජනය කරනු ඇත.

## ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය (SLE)

### *දළ විශ්ලේෂණය*

වසංගතයෙන් පසු නැවත යථා තත්ත්වයට පත්වීමත් ලොව පුරා සංචාරක සීමාවන් ලිහිල් කිරීමත් සමඟ ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් ව්‍යාපාර සඳහා නව අවස්ථා ගවේෂණය කිරීම ආරම්භ කර ඇති අතර නම් වශයෙන් ගත් කළ පකිස්ථානයේ සෙරීන් එයාර් සහ එයාර්බ්ලූ, ඕමානයේ සලාම් එයාර්, සීෂෙල්ස් හි එයාර් සීෂෙල්ස් සහ ශ්‍රී ලංකාවේ ෆිට්ස් එයාර් ඇතුළු නව පාරිභෝගික ගුවන් සේවා සඳහා තෙවන පාර්ශ්වීය නඩත්තුව පුළුල් කිරීම සිදු කරනු ලබයි. ඉදිරි වසරවලදී ඉහත සඳහන් කරන ලද ගුවන් සමාගම් සමඟ දිගුකාලීන නඩත්තු හවුල්කාරිත්වයන් ලබා ගැනීමට ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය සමත් වී තිබේ. මෙම කාලසීමාව තුළ ශ්‍රීලංකන් ඉංජිනේරු අංශයේ ප්‍රධාන සන්ධිස්ථානයක් වූයේ, සෙරීන් එයාර් සමඟ වසර තුනක කාලයක් සඳහා අත්සන් කරන ලද සුවිශේෂී මූලික නඩත්තු ගිවිසුමයි.

යුරෝපා සංගමයේ ගුවන් සේවා ආරක්ෂණ නියෝජිතායතනය (EASA) / ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) සහ අනෙකුත් ජාත්‍යන්තර ගුවන් සේවා නියාමන අධිකාරීන් විසින් මෑත කාලීනව පවත්වන ලද විගණනවලදී ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විශිෂ්ට කාර්යසාධනයක් පෙන්නුම් කර ඇති අතර රේඛීය/මූලික නඩත්තු යෙදවුම් සඳහා ගුවන් යානා පිළිගැනීමේදී පහසුකමට ඉඩ සැලසීම සහ සහය වීමට නඩත්තු අනුමැතියන් රැසක් ස්ථාපිත කොට සුරක්ෂිත කොට ඇත.

වසංගතය හේතුවෙන් සංචාරක ඉල්ලුම අඩු වීම හේතුවෙන් එයාර්ලයින්ස් හට ගුවන් යානා කිහිපයක් නවතා තැබීමට සිදු විය. අවශ්‍යතා අඩු ප්‍රමාණයක් සපුරාලීම සහතික කිරීම සඳහා වන නිෂ්පාදක මාර්ගෝපදේශවලට අනුකූලව ශ්‍රීලකංන් ඉංජිනේරු අංශය විසින් සිය දිගුකාලීන ගුවන්යානා නැවතුම්පොළේ A320 කාණ්ඩයට අයත් ගුවන් යානා රැසක් බිම් ගැන්වීමේදී සහ නිතිපතා නඩත්තු කටයුතු සිදු කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදි.

පෙර නොවූ විරූ අභියෝග පැවති කාලයක බාධාවකින් තොරව 2021 ශීත ඍතු කාලසටහන ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් කළමනාකරණය කරන ලදි. කොවිඩ්-19 වසංගතයෙන් පසු නැවත යථා තත්ත්වයට පත්වීමත් සමඟ, පුළුල් බඳ සහිත ගුවන් යානා සඳහා වූ හදිසි ඉල්ලුම සහ අදාළ එන්ජන් අලුත්වැඩියා වැඩසටහන මෙහෙයුම් කාලසටහනට සංකීර්ණතා එක් කළේය. එසේ වුවද, අපගේ නඩත්තු කාර්ය මණ්ඩලය මුහුණ දුන් දුෂ්කරතා මධ්‍යයේ වුවද සාර්ථකත්වයට මග පාදමින් නඩත්තුව යටතේ පවතින ගුවන් යානාවල එන්ජින් උපයෝගී කොට ගෙන ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය විසින් කාලසටහන සුබවාදී ප්‍රවේශයක් සහිතව කළමනාකරණය කරන ලදි.

නව ගැලි ප්‍රතිපාදන සමඟින් ඉල්ලුම මත ශ්‍රව්‍ය / දෘශ්‍ය වින්‍යාසය සහිතව 18BC/251EY වින්‍යාසයට පරිවර්තනය කරන ලද A330 සර්ව-ආර්ථික ගුවන් යානයක් ප්‍රතිනිර්මාණය කිරීමට ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය සැලකිය යුතු වගකීමක් ආරම්භ කළේය. අලුතින් හඳුන්වා දුන් EASA-අනුකූල පුවරු මුද්‍රණ පහසුකම සහ ආසන ආවරණ නිෂ්පාදන ආධාරකය සමඟින්, ගුවන් සමාගම MRO (නඩත්තු, අළුත්වැඩියා සහ ප්‍රතිසංස්කරණය) මට්ටමින් තවදුරටත් පිරිවැය ඉතිරිකිරීම් සහ වැඩිදියුණු කිරීමේ හැකියාව වෙත ප්‍රගතියක් ලබා ඇත. තවත් සාර්ථක ජයග්‍රහණයක් වන්නේ මෙම කාලය තුළ පුළුල් බඳ සහිත ගුවන් යානා තුනක පැරණි ඇණිය පින්තාරු කිරීමයි.

ශ්‍රීලංකන් ඉංජිනේරු අංශයේ රේඛීය නඩත්තු කටයුතු කණ්ඩායම ශ්‍රී ලංකාවට සේවය සපයන පාරිභෝගික ගුවන් සමාගම් සඳහා නව නඩත්තු සහයක ගිවිසුම්වලට එළඹ තිබේ. අපගේ මූලස්ථානයෙන් පිටත වෙනත් ගුවන් සමාගම් වෙත අපගේ රේඛීය නඩත්තු කටයුතු ව්‍යාප්ත කිරීමේ පියවරක් ලෙස මාලේ රේඛීය මධ්‍යස්ථානයෙන් පිටත "Euro Wing" ගිවිසුම සැලකිය හැකිය.

## ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය (SLAC)

### *දළ විශ්ලේෂණය*

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගුවන් සේවා පුහුණුව සිදු කිරීම පිළිබඳ වසර 34 කට වැඩි පළපුරුද්දක් ඇති ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය (SLAC), ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි පුහුණු අංශය වන අතර එමඟින් රට මෙන්ම කලාපය සඳහා පුළුල් පරාසයක පුහුණු විකල්ප ඉදිරිපත් කරනු ලැබේ. මෙම විද්‍යායතනය යුරෝපා සංගම්

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

ගුවන්සේවා ආරක්ෂණ නියෝජිතායතනය (EASA), ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සමාගම (IATA), ප්‍රමිතිකරණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (ISO), ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL), පකිස්ථාන සිවිල් ගුවන්සේවා අධිකාරිය සහ මාලදිවයින සිවිල් ගුවන්සේවා අධිකාරිය වැනි ආයතන විසින් සහතික කරනු ලැබ ඇත. එසේම එය රාජකීය ගගන නාවික සමාජයෙහි (RAES) සහ යුරෝපා ගුවන්සේවා නඩත්තු පුහුණු කමිටුවෙහි (EAMTC) සාමාජිකයෙක්ද වෙයි. මෙම විද්‍යායතනය ලෝක ප්‍රකට පුහුණු සහ අධ්‍යයන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර සිසුන්ට මෙන්ම වැඩ කරන වෘත්තිකයන්ටද පුළුල් ගුවන් සේවා සහ ආයතනික පුහුණු විකල්ප පිරිනමයි.

### හවුල්කාරිත්වයන්

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් පිරිනමනු ලබන රැකියා ස්ථානයේ පුහුණු මොඩියුලයකින් සමන්විත බූයිං ෆ්ලයිට් ඩිස්පැච්ර් සහතිකය පිරිනැමීම සඳහා ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය බූයිං සමඟ හවුල්කාරිත්වයක් ගොඩනගා ගත්තේය. මීට අමතරව, ගුවන්සේවා නඩත්තුව පිළිබඳ විද්‍යාපති උපාධිය සහ ගුවන්සේවා පශ්චාත් සුදුසුකම් පිළිබඳ උපාධි සහතිකය පිරිනැමීම සඳහා ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය විසින් එම්බ්‍රි රිඩ්ල් ගගන නාවික විශ්වවිද්‍යාලය සමඟ හවුල්කාරිත්වයක් සහිතව කටයුතු කරනු ලැබේ. මෙම ජයග්‍රහණ හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය ගුවන්සේවා පුහුණු අවස්ථා පිරිනැමීමෙහි පෙරගමන්කරුවෙකු බවට පත් කරමින් පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ප්‍රමුඛස්ථායක පිහිටුවනු ලබයි.

### ඉදිරියේදී සිදුකරන බඳවා ගැනීම්

ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය විසින් නව පුහුණු වැඩසටහන් කිහිපයක් සාර්ථකව දියත් කර ඇත. පෞරුෂය දියුණු කිරීමේ සහ රූපලාවන්‍ය, වයින් සහ චීස් අගය කිරීම, චිත්තවේගී බුද්ධිය පුහුණු කිරීමේ වැඩසටහන, ගුවන් යානා මෙහෙයුම් නිලධාරී/ෆ්ලයිට් ඩිස්පැච්ර් (ICAO 201) වැඩසටහන, IATA ගුවන් භාණ්ඩ හඳුන්වා දීමේ සුදුසුකම, IATA ගුවන් මැදිරි කාර්ය මණ්ඩල සුදුසුකම සහ ශ්‍රී ලාංකික සිසුන් සඳහා EASA ගුවන් යානා නඩත්තු කිරීම පිළිබඳ මූලික පාඨමාලාවේ 66 කොටස වැනි වැඩසටහන් සඳහා බඳවා ගැනීම් දැනට සිදුවෙමින් පවතී.

### රාජ්‍ය නොවන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයක තත්ත්වය ලබා ගැනීම

ජාත්‍යන්තරව පිළිගත් ගුවන්සේවා විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලැබීමේ සුවිශේෂී අවස්ථාව කලාපීය සිසුන්ට පිරිනැමීමේ අරමුණ සහිතව ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය රාජ්‍ය නොවන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයක තත්ත්වය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් සිටී.

### අනුමත පුහුණු සංවිධානයේ තත්ත්වය ලබා ගැනීම

ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය දැනට එහි ගුවන් සේවා පුහුණු අංශය වන ජාත්‍යන්තර ගුවන් සේවා ඇකඩමිය සඳහා අනුමත පුහුණු සංවිධානයේ (ATO) තත්ත්වය බලාපොරොත්තුවෙන් සිටී. ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය ශ්‍රී ලංකාවේ ATO ලෙස සහතික කළ ගුවන් සේවා වෘත්තීය අධ්‍යයන සපයන පළමු ආයතනය වනු ඇති අතර එහි සිසුන්ට ගෝලීය වශයෙන් පිළිගත් අධ්‍යාපන සුදුසුකමක් ලබා ගැනීමට ඉඩ සලසයි.

### මාර්ගගත Train-The-Trainer වැඩසටහන සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනුමැතිය ලබාගැනීම

පන්ති කාමර Train-The-Trainer වැඩසටහන සඳහා දැනටමත් පවතින අනුමැතියට අමතරව, SLAC විසින් එහි මාර්ගගත Train-The-Trainer වැඩසටහන සඳහා CAASL අනුමැතිය ලබා ගන්නා ලදී. මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ එය සිදු කරනුයේ පන්ති කාමරයක වුවද අතථ්‍ය පරිසරයක වුවද, පුහුණුවට අදාළ සෑම අංශයකින්ම පුහුණුකරුවන්ට ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමට උපකාර කිරීම සඳහාය.

### පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් SLAC programmes (NVQ) හි තත්ත්වය ලබා ගැනීම

ගුවන්යානා නඩත්තුව පිළිබඳ මූලික පාඨමාලාව, ෆ්ලයිට් ඩිස්පැච්ර්, IATA ප්‍රවාහන සහ සංචාරක පදනම සහ උපදේශක ඩිප්ලෝමා ඇතුළු ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය විසින් පිරිනමන පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් හි තත්ත්වය ලබා ගැනීම සඳහාද විද්‍යායතනය කටයුතු කරමින් සිටී. මෙමඟින් ශිෂ්‍යයන්ට දේශීය සහ විදේශීය විශ්වවිද්‍යාලවල උපාධි පාඨමාලා සඳහා වෘත්තීය සුදුසුකමක් සහ පාර්ශ්වික ප්‍රවේශයක් ලබා ගැනීමේ අවස්ථාව සැලසෙනු ඇත.

## ශ්‍රීලංකන් කේටරින් සමාගම

### දළ විශ්ලේෂණය

ශ්‍රීලංකන් කේටරින් සමාගම (SLC) යනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන අතර ශ්‍රී ලංකාවේ එකම ගුවන් සේවා ආහාරපාන සැපයුම් සමාගම වේ. යානාස්ථ ආහාරපාන සැපයීමේ සිය ප්‍රධාන කාර්යභාරයට අමතරව, එමඟින් සෙරන්ඩිබ්, එමිරේට්ස්, අරලිය සහ ලෝටස් විවේකාගාර සහ BIA සහ MRIA හි ස්ථාපිත ගුවන්තොටුපොළ අවන්හල් ඇතුළු සියලුම ගුවන්සේවා විවේකාගාර ක්‍රියාත්මක කරනු ලැබේ. එහි අනුබද්ධ ව්‍යාපාර කටයුතුවල කොටසක් ලෙස, ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් සෙරන්ඩිවා ට්‍රාන්සිට් හෝටලය, එරෝක්ලීන් කාර්මික රෙදි සේදීමේ සේවාව සහ Cuisine Gastronome- දේශීය සහ අපනයන වෙළඳපොළ වෙත අනුභව කළ හැකි ශීත කළ ආහාරපාන වර්ග ද ක්‍රියාත්මක කරනු ලැබේ.

### කාර්යසාධනය

වසරේ මුල් භාගයේදී කොවිඩ්-19 වසංගතය ශ්‍රීලංකන් කේටරින් සමාග මේ කාර්යසාධනයට සැලකිය යුතු ලෙස බලපෑවේය. කෙසේ වෙතත්, පසුගිය වසරට සාපේක්ෂව 2021 ශීත ඍතුව වන විට කාර්යසාධනය ක්‍රමයෙන් වැඩි දියුණු විය. පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව පිරිවැටුම රුපියල් මිලියන 3,902 දක්වා 464% කින් වර්ධනය විය. තවද, පරිපාලිත සමාගම රුපියල් මිලියන 474 ක මෙහෙයුම් ලාභයක් (2020/21-මෙහෙයුම් අලාභය රුපියල් මිලියන 1,365) වාර්තා කළ අතර මගීන්ගේ පැමිණීමේ වැඩි වීම සහ වසංගතයෙන් පසු ගුවන් සමාගම් කිහිපයක් විසින් සිය මෙහෙයුම් ආරම්භ කිරීමත් හේතුවෙන් පරිපාලිත සමාගමේ ප්‍රධාන කාර්යසාධක දර්ශක සැලකිය යුතු ලෙස වැඩි විය.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් දැනට පවතින ව්‍යාපාර ඒකක හරහා ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග සක්‍රීයව පරීක්ෂාවට ලක් කරන ලදී. ශ්‍රීලංකන් කේටරින් සමාගම එය සතු වන විශාල නිෂ්පාදන සහ මෙහෙයුම් හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් දේශීය මෙන්ම අපනයන වෙළඳපොළ වෙත අනුභව කළ හැකි ආහාරපාන වර්ග Cuisine Gastronome අංශ පුළුල් කළේය. ශ්‍රීලංකන් කේටරින් සමාගම මේ වන විටත් ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව වෙත මෙම ආහාර වර්ග අපනයනය කිරීමේ නිරත වන අතර ඩුබායි, එක්සත් රාජධානිය සහ යුරෝපා සංගමය වෙත මෙම නිෂ්පාදන අපනයනය කිරීමට අදාළව සාකච්ඡා අවසන් කරමින් සිටී. එපමණක් නොව, මෙම නිෂ්පාදන දේශීයව බෙදා හැරීම ප්‍රවර්ධනය කිරීමට සහ ජපානය සහ සියලුම ගල්ෆ් රටවලට ව්‍යාප්ත කිරීම හරහා අපනයන වෙළඳපොළ තවදුරටත් සංවර්ධනය කිරීමට සැලසුම් කරමින් සිටී.

තවද, මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයන් දරන ලද අතර පිරිවැය කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සම්පත් ප්‍රශස්ත කිරීම

කෙරෙහි අවධානය යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව තවදුරටත් නිවැරදි ප්‍රමාණයට පත් කිරීමට පර්පාලිතයට හැකි විය.

තවද, මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයන් දරන ලද අතර, පිරිවැය කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සම්පත් ප්‍රශස්ථ කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව තවදුරටත් නිවැරදි ප්‍රමාණයක් බවට පත් කිරීම සඳහා පර්පාලිත සමාගමට හැකි විය. මීට අමතරව, මෙහෙයුම් හි අඩු වූ මට්ටමට අනුකූලව අනෙකුත් ඍජු මෙහෙයුම් වියදම් අඩු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදි. වසංගත කාලය තුළ පිරිවැය කළමනාකරණය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් පිළිබඳ නැවත සාකච්ඡා කිරීම සඳහා පියවර ගන්නා ලදි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ගුවන්තොටුපොළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා සමාගම ඇතුළු අපගේ ප්‍රධාන සේවා සැපයුම්කරුවන් කුලී සඳහා සහන ලබා දුන් අතර එය පර්පාලිත සමාගමේ ද්‍රවශීලතාව වැඩි දියුණු කිරීම සඳහා දායක විය. පර්පාලිත සමාගමේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහ පිරිවැය කළමනාකරණ මූලපිරිම් වැඩි දියුණු කිරීම සඳහා වන තීරණාත්මක සහ හදිසි ප්‍රාග්ධන අවශ්‍යතා කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් ප්‍රධාන ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘති කල් දමන ලදි.

***ආදායම***

ගුවන් යානා මුළුතැන්ගෙයි සහ අවන්හල් අංශයෙහි කාර්යසාධනය හේතුවෙන් පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පර්පාලිත සමාගමේ ආදායම් සංයුතියෙහි විශාල වෙනසක් සිදු විය.

## ආදායම




පසුගිය වසරට සාපේක්ෂව යානාස්ථ කේටරින් හි ආදායම 541% කින් (රුපියල් මිලියන 2,556) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ අවන්හලෙ හි ආදායම 455% කින් (රුපියල් මිලියන 396) වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

පසුගිය මූල්‍ය වර්ෂයේ වාර්තා වූ ආහාර වේල් මිලියන 0.25 ට සාපේක්ෂව වර්ෂය තුළ ගුවන්යානා මුළුතැන්ගෙයි සකස් කරන ලද ආහාර වේල් සංඛ්‍යාව වාර්ෂිකව ආහාර වේල් මිලියන 2.2 දක්වා 784% කින් සැලකිය යුතු ලෙස වැඩි විය. යානාස්ථ කේටරින් හි ප්‍රධාන පාරිභෝගිකයා වන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් යානාස්ථ කේටරින් හි මුළු පිරිවැටුමෙන් 67% ක් සහ වර්ෂය තුළ සකස් කරන ලද සමස්ත ආහාර වේල් සංඛ්‍යාවෙන් 73% ක් නියෝජනය කළේය.

සමාගමේ මුළු ආදායමට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ අවන්හලෙහි දායකත්වය (පොදු හා සංක්‍රමණ) 12% ක් වූ අතර පසුගිය මූල්‍ය වර්ෂයට (2020/21 - රුපියල් මිලියන 86) සාපේක්ෂව ආදායම රුපියල් මිලියන 483 ක් දක්වා 455% කින් වැඩි විය. තවද, අනෙකුත් අනුබද්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල පිරිවැටුම 195% කින් වර්ධනය විය.

***වියදම***

වර්ෂය තුළ ව්‍යාපාර අඩු වීමේ ප්‍රමාණයට මෙහෙයුම් වියදම කළමනාකරණය සහ පාලනයට අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදි. ආදායම ඉහළ යාමට සමගාමීව විකුණුම් පිරිවැය 213% කින් වැඩි විය. රුපියල් මිලියන 1,735 සිට රුපියල් මිලියන 2,413 දක්වා සමස්ත පොදු කාර්ය පිරිවැය 39% කින් වර්ධනය විය. තවද, ක්‍රියාකාරකම් මට්ටම් සමග ඍජුවම සම්බන්ධිත වෙනත් මෙහෙයුම් වියදම් වර්ෂය තුළ 33% වර්ධනයක් වාර්තා කරන ලදි.

***ලාභදායීත්වය***

පර්පාලිතයේ මෙහෙයුම් ලාභය වසර තුළ ක්‍රමයෙන් රුපියල් මිලියන 474 දක්වා වැඩි වූ අතර, එය පසුගිය වසරට සාපේක්ෂව (මෙහෙයුම් අලාභය - රුපියල් මිලියන 1,365) 135% ක වැඩි වීමකි. පසුගිය මූල්‍ය වසරට සාපේක්ෂව බදුවලට පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 3,231 ක් දක්වා 436% කින් වැඩි විය. මූල්‍ය වර්ෂය අවසාන භාගයේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් වසර තුළ වාර්තා වූ විනිමය ලාභය (රුපියල් මිලියන 2,823) මීට ප්‍රධාන හේතුව විය.

## මෙහෙයුම් ලාභ ප්‍රවණතාව




## ශුද්ධ ලාභ ප්‍රවණතාව




***ආදයම් බදු***

ආයෝජන මණ්ඩල ගිවිසුමට :ඊඩශ* අනුව 2021 මැයි 30 වැනි දිනෙන් සම්පූර්ණ ආදයම් බදු නිදහස් කිරීම අවසන් කිරීම හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව ශ්‍රීලංකන් කේටරින් හි ආදයම් බදු වියදම් 909% කින් වර්ධනය විය. 2021 මැයි 31 සිට තවත් අවුරුදු 8 ක් සඳහා 15% ක සහනදායී අනුපාතයකට ආදයම් බදු ගෙවීමට පර්පාලිතය වගකීමෙන් බැඳේ.

## උපකාරක සේවා

***ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතිය***

2021/22 මූල්‍ය වර්ෂය තුළ ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති, NextGen තාක්ෂණය සහ නවෝත්පාදන සමඟින් ඩිජිටල් ව්‍යාපාර කිහිපයක් දියත් කරමින් සහ ප්‍රතිසංස්කරණය කරමින් වඩාත් මගී කේන්ද්‍රීය තාක්ෂණය හඳුන්වා දීමෙන් ගුවන් සේවා ව්‍යාපාරයට දායක විය.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති මඟින් එයාර්ලයින්ස් හි ව්‍යාපාර සැලසුමට අනුකූලව ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් උපායමාර්ග පාලනය කරනු ලබයි. එය ඩිජිටල් ව්‍යාපාර වැඩි වශයෙන් පාදක කර ගනිමින් සහ වැඩිදියුණු කරන ලද මඟී අත්දැකීම් සමඟින් ගුවන් සේවා ක්ෂේත්‍රයේ නවීන තාක්ෂණයන් යොදා ගනිමින් ඉතා පහසු මෙහෙයුම් සැපයීම අරමුණු කරනු ලබයි. ඒ අනුව සමාලෝචිත වසර තුළ ව්‍යාපාර මෙහෙයුම් සහ මඟීන් මුල් වූ නවෝත්පාදන සහ නිෂ්පාදන විශේෂාංග රැසක් ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් හඳුන්වා දෙන ලදී.

### ආයතනික වෙබ් අඩවියේ විශේෂාංග දැක ගන්න, අත්විඳින්න

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් වෙබ් අඩවිය පරිශීලනය කරන්නන්ට අලුත් සහ වැඩිදියුණු කරන ලද පරිශීලක අත්දැකීමක් ලබා දීමට නිරන්තර වෙබ් අඩවි දියුණු කිරීම් සහ පරිශීලක අතුරුමුහුණත් වෙනස්කිරීම් සිදු කරනු ලබයි. අවසන් වරට සිදු කරන ලද වැඩිදියුණු කිරීම වනුයේ ලෝකයාට සමීපවීමේ අරමුණින් බහුභාෂා සහය හඳුන්වාදීමයි. ජංගම තාක්ෂණය හරහා පාරිභෝගිකයින් වෙත ළඟාවීමේ හැකියාව වැඩිකරමින් සරල මුල් පිටුවකින් යුතුව, නවතම පරිශීලක හිතකාමී ජංගම දුරකථන ප්‍රතිචාරාත්මක විශේෂාංගවලින් මේ වන විට වෙබ් අඩවිය දියුණු කොට ඇත.

මෑතකදී වැඩිදියුණු කළ විශේෂාංග යුතු ‘Booking Widget’ හරහා යොමු වීමෙන් ආසන වෙන් කරවා ගැනීමට පාරිභෝගිකයින්ට ඉඩ සලස්වන අතර නව ‘Ancillary Ribbon’ මඟින් මඟීන් සඳහා ලබා ගත හැකි සියලුම සහයක සේවා ප්‍රදර්ශනය කරනු ලබයි. ඊට අමතරව ඕනෑම ප්‍රදේශයක පවතින නවතම දීමනා සහ අනුග්‍රහයන් ඇතුළත්ව ‘නවතම ගනුදෙනු’ අංශය මඟින් ඉතා කෙටි කාලයකින් මඟීන්ට තමාට අවශ්‍ය දේ වෙබ් අඩවිය හරහා නිසැකව සොයා ගැනීමට අවස්ථාව සලසයි.

මෙමඟින් වැඩිදියුණු කළ පාරිභෝගික තෘප්තියක් පෙන්නුම් කරන අතර දත්ත ආරක්ෂාවට සහ ගුවන් සේවා රෙගුලාසිවලට අවශ්‍ය කරන අනුකූලතා සහ ප්‍රමිතීන් සපුරාලනු ලබයි.




### අන්තර්ජාල වෙන්කිරීමේ එන්ජිම සඳහා වන Alipay, PoLi, WeChat ගෙවීම් විකල්ප

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති මඟින් අන්තර්ජාල වෙන්කිරීමේ එන්ජිම (IBE) සඳහා Alipay, POLi සහ WeChat ගෙවීම් පහසුකම් සපයනු ලබයි. ඒවා ඇමේඩියස් (Amadeus) ගෙවීම් වේදිකාවේ දෙවන අදියරේ කොටසක් ලෙස, චීන කලාපයේ ප්‍රමුඛ ගෙවීම් විකල්ප ක්‍රමවේදයකි (AMOP). මෑතකදී ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණය මඟින් වීසා සහ මාස්ටර්කාඩ් ගෙවීම් දොරටුව වැඩිදියුණු කළ අතර ඊට ශ්‍රී ලංකා බැංකුකරණයෙහි දැවැන්තයින් වන ලංකා බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව මඟින් අනුග්‍රය දක්වනු ලබයි. පාරිභෝගිකයින්ට උසස් කළමනාකරණ ශක්‍යතා සමඟින් ගෝලීය මුදල් වර්ග 42 ක් යොදා ගෙන ඔවුන්ගේ අවශ්‍යතාව අනුව ගෙවීම් කටයුතු සිදු කිරීමට එමඟින් ඉඩ සලසනු ලබයි. මෙමඟින් අන්තර්ජාල බැංකුකරණ පහසුකම භාවිත කිරීමට සහ සාම්ප්‍රදායික ක්‍රම හා සසඳන විට අඩවි-විශේෂිත ගනුදෙනු, අවම ගමන් ගාස්තු සහතික කරලීම, ශූන්‍ය සේවා ගාස්තු සහ ප්‍රථම දිනය වෙනස් කිරීමේ හැකියාව සහ කිසිදු ගාස්තුවක් නොමැතිව පිටත්වීමට පැය 24 කට පෙර ප්‍රවේශ පත්‍ර අවලංගු කිරීම වැනි වෙනත් සුවිශේෂී වාසි සලසන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනික වෙබ් අඩවියේ අගය එකතු කළ සේවා ලබා ගැනීමට පාරිභෝගිකයින්ව දිරිමත් කරනු ලබයි. ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ආයතනික වෙබ් අඩවියද දැනට පුළුල් පරාසයක ක්‍රෙඩිට් කාඩ්පත් පිළිගනී.

### අන්තර්ජාල ආසන වෙන් කිරීමේ එන්ජිම මඟින් සංචාරක රක්ෂණ විසඳුම් ඒකාබද්ධ කිරීම

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති, IBE සමඟ මඟීන්ට ඔවුන්ගේ රක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා සංචාරක රක්ෂණ ප්‍රතිපත්ති ලබා ගැනීමට සහ එයාර්ලයින්ස් වෙත අමතර අතිරේක ආදායම් ලාභයක් සැපයීමට පහසුකම් සපයන සංචාරක රක්ෂණ විසඳුමක් සපයන ලදි. මෙම නිෂ්පාදනය මඟින් මඟීන්ට රක්ෂණ ප්‍රතිපත්ති, වෛද්‍ය රක්ෂණ ආවරණය ආවරණය කිරීම, සිදු විය හැකි ගමන්මලු අලාභ සඳහා වන ආවරණය සහ ගුවන් ගමන් ප්‍රමාදයන් සහ නැවත මවුබිමට පැමිණීම සඳහා ආවරණය ආදී පහසුකම් සපයනු ලබයි.

### ඩොයිෂර් බාහන් - ජර්මානු දුම්රිය සේවය සමඟින් Rail-Fly ක්‍රියාත්මක කිරීම



ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති මඟින් මෑතකදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ආයතනික වෙබ් අඩවිය හරහා ප්‍රවේශපත්‍ර වෙන්කරවා ගැනීමේදී ජර්මනියේ ඕනෑම තැනක සිට හෝ තැනක් වෙත එක් වෙන් කර ගැනීමක් ඔස්සේ සමස්ත සංචාරය වෙන් කරවා ගැනීමේ පහසුකම මඟින්ට සැලසීම සඳහා Rail-Fly විකල්පය යටතේ ජර්මානු දුම්රිය සේවය වන ඩොයිෂර් බාහන් ක්‍රියාත්මක කරන ලදි.

මෙමඟින් ෆ්‍රැන්ක්ෆර්ට් ගුවන්තොටුපළ සහ ජර්මනියේ බර්ලින්, හැම්බර්ග්, මියුනිච්, ස්ටුට්ගාර්ට් සහ ඩසල්ඩෝෆ් ඇතුළු ප්‍රධාන නගරවල ඩොයිෂ් බාන් දුම්රිය ස්ථාන 5,600 කට වැඩි ප්‍රමාණයක්; ස්විට්සර්ලන්තයේ බාසල්; සහ ඕස්ට්‍රේලියාවේ සල්ස්බර්ග් සමඟ සම්බන්ධ වීමේ අවස්ථාව මඟින්ට ලබා දේ. පුළුල් ජාලයක් සහිත වීමට අමතරව, ගත වන සංක්‍රමණ කාලය අවම වීම සහ නම්‍යශීලීතාව මඟින්ට භුක්ති විඳිය හැකි වරප්‍රසාද වේ.

***මාර්ගගත මඟී පිරික්සුම සහ කවුළු මඟී පිරික්සුම හරහා උපයෝගීතා සක්‍රිය කිරීම***

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති, මඟී පිරික්සුමට පෙර ලබා ගත හැකි අමතර ගමන්මලුවලට අමතරව, මාර්ගගත මඟී පිරික්සුම හරහා උපයෝගීතා සේවාවක් ලබා ගැනීමේ විකල්පයක් හඳුන්වා දෙන ලදි. මෙය ඇමේඩියස් (Amadeus) ගෙවීම් වේදිකාව ක්‍රියාත්මක කිරීමේ කොටසක් ලෙස සක්‍රීය කරන ලදි. එය මඟින්ට ඔවුන්ගේ පෞද්ගලික මනාපයන් අනුව උපයෝගීතා සේවා තෝරා ගැනීමට සහ ලබා ගැනීමට බාධාවකින් තොර ජංගම ප්‍රතිචාරාත්මක ක්‍රමවේදයක් සපයනු ලබයි.

***මෙහෙයුම් ඵලදායීතා සඳහා තාක්ෂණික සේවා මණ්ඩල ගමනාගමන වාර්තාව ඩිජිටල්කරණය***

මෙහෙයුම්වල ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය ළඟා කරගැනීම සඳහා එයාර්ලයින්ස් හි ඩිජිටල් උපායමාර්ග යන්ට අනුකූලව අභ්‍යන්තර තාක්ෂණික සේවා මණ්ඩල ගමනාගමන වාර්තාව ඩිජිටල්කරණය කරමින් දියුණු කළ පරිශීලක සහ මඟී අත්දැකීමක් සඳහා ගොඩබිම් සේවාද විධිමත් කරන ලදි. මීට අමතරව සංකලිත පද්ධති හරහා තත්කාලීන නිවැරදි තොරතුරු මඟින් ගුවන් නියමුවන් සවිබල ගන්වනු ලබයි. 'AeroOps' අභ්‍යන්තර සංවර්ධන විකල්ප මඟින් ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති, එය බාහිරව ලබා ගන්නේ නම් වැය වන ඇමරිකානු ඩොලර් මිලියන 200 ක පිරිවැයක් ඉතිරි කර ගත්තේය.

AeroOps විසින් ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය විසින් සංවිධානය කරන ලද ඩිජිටල් විශිෂ්ටතා සම්මාන උළෙලේදී "ආයතනික තොරතුරු තාක්ෂණ සම්මාන" කාණ්ඩයේ රිදී සම්මානය සහ හොඳම ජාතික තත්ත්ව මෘදුකාංග සම්මාන උළෙලේදී කුසලතා/ලෝකඩ සම්මානය දිනා ගනු ලැබීය.







***නව ඩිජිටල් තාක්ෂණ විසඳුම් සමඟින් පරිශීලකයන් සවිබල ගැන්වීම***

දුරස්ථව වැඩ කිරීම සඳහා පියවර ගැනීමත් සමඟ, ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් සැලකිය යුතු පිරිවැය ඉතිරියක් සමඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ අනුකූලතා අවශ්‍යතා සඳහා ඉක්මන් විසඳුම් සලසනු ලැබුණි. මෙම විසඳුම්වලට ජංගම දුරකථන සඳහා තාක්ෂණික කාර්ය මණ්ඩලය ගොඩබෑම සහ ගුවන්ගත කිරීමේ තොරතුරු සැපයීම, මාර්ගගත පුහුණුව සහ තක්සේරුව, ප්‍රතිපෝෂණ ලබාගැනීම සහ විශ්ලේෂණය සහ අතින් සිදු කිරීම වෙනුවට විද්‍යුත් ලේඛන කළමනාකරණය ඇතුළත් වේ.

***තොරතුරු මත පදනම් වූ ගුවන් සමාගමක්***

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි කළමනාකරණ තොරතුරු වේදිකාව වන "එයාර්ලයින් ඉන්සයිට්" ("Airline Insight") වට්ස්ඇප් හරහා උපාය මාර්ගික මට්ටමේ තීරණ ගන්නන් වෙත දෛනික ගුවන් සේවා කාර්ය සාධනය ස්වයංක්‍රීයව ප්‍රකාශ කිරීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ආයතනික වට්ස්ඇප් නාලිකාව සමඟ මෑතකදී ඒකාබද්ධ කරන ලදි. තත්‍ය කාලීන තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ බොහෝ ව්‍යාපාර කේන්ද්‍රීය තීරණ ගැනීමට ප්‍රධාන තීරණ ගන්නන්ට සහය වෙමින් මෙම නවෝත්පාදනය බල ගන්වනු ලැබුණි.

ඊළඟ මූල්‍ය වර්ෂයේදී, එයාර්ලයින් ඉන්සයිට් විසින් අරමුණු කරනුයේ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් පූර්ණ තොරතුරු මත පදනම් වූ මඟී කේන්ද්‍රීය ගුවන් සමාගමක් බවට පත්කිරීමේ හැකියාව සමඟින් පුද්ගලාරෝපිත මඟී අත්දැකීම් හරහා මඟී කේන්ද්‍රීයත්වය වැඩිදියුණු කිරීමයි.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය තවදුරටත්.

**කණ්ඩායම් දත්ත ආරක්ෂණය, අනුකූලතාවය සහ පාලනය**

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති ISO/IEC 27001:2013 තොරතුරු ආරක්ෂණ කළමනාකරණය, ISO/IEC 20000:2018 සේවා කළමනාකරණය සහ ISO 9001:2015 මෘදුකාංග සංවර්ධනය සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතිය, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සහ ශ්‍රීලංකන් කේටරින් වෙත සපයන ලද පද්ධති සහ සේවාවන්ට අනුකූලව අඛණ්ඩව කටයුතු කළේය.

තවද, ශ්‍රී ලංකාවේ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ (PDPA) අවශ්‍යතා සහ යුරෝපා සංගමයේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ රෙගුලාසි (GDPR) සමඟ ඒකාබද්ධව නිර්දේශයන් සපුරාලීම සඳහා කණ්ඩායම අඛණ්ඩව මෙහෙයුම් වැඩිදියුණු කරන ලදි. එමෙන්ම ශුන්‍ය විශ්වාස රාමුවේ මූලධර්ම කෙරෙහි අවධානය යොමු කරමින්, අවදානම් කළමනාකරණය, චර්යා විශ්ලේෂණය, ඉහළ තර්ජන ආරක්ෂණය, දත්ත ආරක්ෂණය සහ අන්ත ලක්ෂ්‍ය ආරක්ෂණය සඳහා යාන්ත්‍රික අධ්‍යයනයේ සහ කෘත්‍රිම බුද්ධියේ නවතම තාක්ෂණයන් සමඟ ගුවන් සමාගම සිය සයිබර් ආරක්ෂණ පාලනයන් පුළුල් කරන ලදි.

## මානව සම්පත් කළමනාකරණය

**දළ විශ්ලේෂණය**

ශ්‍රීලංකන් මානව සම්පත් අංශය මගින් ද්‍රවශීලතා ගැටලු සමඟ මෙහෙයුම් සීමා වූ වසංගත තත්ත්වය පැවති අවධියේදී එයාර්ලයින්ස් වෙත සහය විය. ව්‍යාපාර ප්‍රමුඛතා සපුරාලීම සහතික කිරීම සඳහා නව මූල පිරිම් හඳුන්වාදීම සහ ප්‍රතිපත්ති / ක්‍රියාවලි සැකසීම සම්බන්ධයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.

එයාර්ලයින්ස් සහ එහි සේවකයින් සුරක්ෂිත කිරීම සඳහා, එම කාලය තුළ සීමිත මෙහෙයුම් යටතේ සේවක සංඛ්‍යාව නිවැරදි ප්‍රමාණයට සහ ප්‍රශස්ත කිරීමට මඟ පාදමින් සේවක පිරිවැය අඩු කිරීමේ මූලපිරිම් හඳුන්වා දෙන ලදි. මීට අමතරව, රැකියා භූමිකා වෙනස් කිරීමේදී රැකියා භ්‍රමණයන්හි විවිධ රැකියා කුසලතා භාවිත කිරීම දිරිමත් කරමින් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ පිරිවැය ඉතිරි කිරීමේ ක්‍රියාමාර්ග, 2021 වර්ෂයේදී තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. මෙහෙයුම් යළි ආරම්භ වන තෙක් මහජන පිරිවැය පාලනය කිරීම සඳහා ගත හැකි සෑම පුළුල් ක්‍රියාමාර්ගයක්ම ක්‍රියාත්මක කරන ලදි.

**උපායමාර්ගික අවධානය**

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ, ශ්‍රීලංකන් මානව සම්පත් අංශය, කාර්ය මණ්ඩල සංඛ්‍යාව ප්‍රශස්ත කිරීම සහ මෙහෙයුම් මට්ටම් ඉහළ නැංවීම සඳහා සම්පත් ලබා ගැනීම සහ ජනතාව සම්බන්ධ පිරිවැය ඉතුරු කිරීමේ මූලපිරිම් ඇතුළත් උපායමාර්ගික ප්‍රමුඛතාවයේ ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළේය. ව්‍යාපාරික සහ මෙහෙයුම් තීරණාත්මක ප්‍රධාන තනතුරු සඳහා පමණක් කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කරනු ලැබූ අතර, ඵලදායිතාව උපරිම කිරීම සඳහා රැකියා විස්තාරණය සහ රැකියා භූමිකා හුවමාරු කිරීම සඳහා කාර්ය මණ්ඩලය යොදා ගන්නා ලදි. සියලුම සේවකයින්ගේ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ මත සැලකිය යුතු පිරිවැය ඉතිරිකිරීමේ පියවරයන් සුරක්ෂිත කිරීමට ගුවන් සමාගම සමත් විය. ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම සහ දේශසීමා විවෘත කිරීම සඳහා ඇති වන්නා වූ ප්‍රවණතා සමඟින්, 2021 වසර අවසාන කාර්තුවේදී ගුවන් සේවා මෙහෙයුම් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, සේවක වේතන සඳහා කලින් පනවා තිබූ අවම කිරීම් සඳහා යම් යම් ලිහිල් කිරීම් ලබා දෙන ලදි.

ඉහළ යන ජීවන වියදම සැලකිල්ලට ගනිමින්, බොහෝ දුෂ්කරතා මධ්‍යයේ වසංගත කාලසීමාව පුරා සේවයට වාර්තා කිරීමට ඔවුන් දක්වන කැපවීම අගයමින් හඳුනාගත් අඩු ආදායම්ලාභී කාණ්ඩ සඳහා සීමා කිරීම් කිහිපයක් ලිහිල් කරන ලදි. තවද, අත්‍යවශ්‍ය රැකියා උසස්වීම්වලට අදාළ ගෙවීම් ඇතුළුව සියලුම කාර්ය මණ්ඩල කාණ්ඩවලට විවිධ සහන ලබාදීම සඳහා ඉතිරිකිරීම්වලින් කොටසක් යොදා ගන්නා ලදි.

එමෙන්ම, වැටුප් පැකේජ කාර්යක්ෂම කිරීමට සහ වැටුප් පරිමාණයන් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව තක්සේරු කිරීම සඳහා වේතන පැකේජවල කිසියම් නොගැළපීම් හඳුනා ගැනීම සඳහා වැටුප් සමීක්ෂණයක් ආරම්භ කරන ලදි. ගෝලීය වසංගතයේ උච්චතම අවස්ථාවන්හිදී පවා, අපගේ සේවකයින් ආයතනයේ කාර්යසාධන ප්‍රමිතීන් සපුරාලීම සඳහා අවශ්‍ය නිපුණතා ඇති බව සහතික කිරීමට පුහුණු සහ සංවර්ධන මූලපිරිම් ඇතුළුව ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම සඳහා කුසලතා ගොඩනැගීම සහ කුසලතා පෝෂණය කිරීම පවත්වා ගෙන ගියේය.

**කර්මාන්ත සබඳතා පවත්වාගෙන යාම**

සේවකයින් කාර්යයේ නිරතවීම වැඩිදියුණු කිරීම සඳහා කර්මාන්ත සබඳතා සඳහා පහසුකම් සැලසීම ශ්‍රීලංකන් මානව සම්පත් අංශයේ ප්‍රධාන කටයුත්තක් වන අතර, කාර්මික සමගිය සහතික කිරීම සඳහා සියලුම වෘත්තීය සමිති සමඟ අඛණ්ඩව සම්බන්ධ වීම සිදු කරන ලදි. උද්ධමනය දැඩි ලෙස ඉහළ යාමට තුඩු දෙන රටෙහි බරපතළ ආර්ථික තත්ත්වය සංවිධානය තුළ කාර්මික සබඳතා මත අමතර පීඩනයක් ඇති කර ඇති අතර, සියලුම වෘත්තීය සමිති තම අදාළ සේවක කාණ්ඩ සඳහා සහන අපේක්ෂාවෙන් ආයතනය වෙත යොමු වී ඇත. එබැවින් වෘත්තීය සමිති, තනි සේවකයින් සහ කණ්ඩායම් සමඟ සම්බන්ධ වීමේ මට්ටම සැලකිය යුතු ලෙස වැඩි කිරීමට සිදුවිය.

**සෞඛ්‍යය සහ ආරක්ෂාව**

අපගේ සේවකයින්ගේ සහ නියුක්ත ශ්‍රම බලකායේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුභසාධනය පවත්වා ගැනීම සංවිධානයේ වැදගත් ප්‍රමුඛතාවයක් වේ. මේ සම්බන්ධයෙන්, ශ්‍රීලංකන් මානව සම්පත් අංශය සිය වෛද්‍ය සේවා ඒකකය සහ කාර්ය මණ්ඩල සුබසාධන ඒකකය හරහා පශ්චාත් කොවිඩ් කාලපරිච්ඡේදය තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රීලංකන් මානව සම්පත් වෛද්‍ය සේවා (HRMS) සේවකයින්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් සැලකිය යුතු ලෙස දැඩි සහ අරමුණු සහගතව කටයුතු කර ඇති අතර, දේශීය හා ජාත්‍යන්තර සෞඛ්‍ය හා ආරක්ෂක රෙගුලාසිවලට අනුගතව සේවකයින්, ගනුදෙනුකරුවන් සහ පාර්ශ්වකරුවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත.

මානව සම්පත් වෛද්‍ය සේවා විසින් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් ආවරණය වන පරිදි කොවිඩ් වැළැක්වීමේ එන්නත් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි. සේවක කණ්ඩායම්වල සහ සම්බන්ධතාවල උපරිම ආරක්ෂාව සහතික කරමින්, මානව සම්පත් වෛද්‍ය සේවා විසින් දෛනිකව අවශ්‍ය පරිදි සමාගම පුරා කාර්ය මණ්ඩලය සඳහා අහඹු PCR සහ RAT පරීක්ෂණ සිදු කරන ලදී. තවද සනීපාරක්ෂක ක්‍රමවේදයන් එයාර්ලයින්ස් පරිශ්‍රය තුළ නිවැරදිව ලෙස පිළිපදින අතර, කොවිඩ් 19 වැළඳුණ සේවකයින්

සඳහා ඔවුන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් පිළිබඳ නිරන්තරව සොයා බලමින්, පරීක්ෂාවන් කරමින් අතරමැදි සත්කාර මධ්‍යස්ථාන (ICC) පහසුකම් අඛණ්ඩව ලබා දෙන ලදි. කොවිඩ් නිවාරණ කාර්ය සාධක බලකාය සුපරීක්ෂාව සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග මැන බැලීම සඳහා සහ දේශීය හා ජාත්‍යන්තර මාර්ගෙ ප්‍රදේශවලට අනුකූලව ක්ෂණිකව සහ කාර්යක්ෂමතාවයෙන් අදාළ ගැටලු විසඳීම සඳහා සමස්ත ආයතනය පුරා සිටින කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අඛණ්ඩව කටයුතු කරයි.

ශ්‍රීලංකන් මානව සම්පත්හි සේවක සන්නිවේදන සහ සබඳතා ඒකකය (ECEU) සියලුම ධුරාවලියන් හරහා සෞඛ්‍ය සම්පන්න සන්නිවේදනයක් සඳහා සදාකාලිකව කැපවී සිටින අතර එමඟින් කාර්ය මණ්ඩලය තුළ යහපැවැත්මේ විශ්වාසය සහ කණ්ඩායම් ක්‍රියාකාරිත්වයේ ජීවගුණය පවත්වා ගෙන යයි. නිතිපතා යාවත්කාලීන කරන ලද සෞඛ්‍ය සහ ආරක්ෂණ රෙගුලාසි සහ අදාළ වැදගත් තොරතුරු සමඟ සියලුම කාර්ය මණ්ඩලය මනාව දැනුවත් කොට ඇත.

## ප්‍රජා සහභාගීත්වය

### දළ විශ්ලේෂණය

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සෑම විටම පරිසර හිතකාමී ගුවන් සේවයක් වන අතර, ගුවන් තිරසාරභාවය සඳහා කලාපයේ පුරෝග ාමියෙකු ලෙස, එහි ගෝලීය මුලපිරීම වන NetZero2050 වෙත සිය ප්‍රයත්නයන් ඉදිරියට ගෙන යන අතරම, 'Planet friendly SriLankan' ආකල්පයක් ඇති කිරීම සඳහා සිය මෙහෙයුම් කැප කර ඇත. ජාතික ගුවන් සේවය ලෙස ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සෑම විටම දේශගුණික විපර්යාසවලට මුහුණ දීම සඳහා නව්‍ය සහ නව විසඳුම් අපේක්ෂා කරයි.

### 'මතක'

'මතක' යනු දේශීය නිර්මාණකරුවෙකු වන House of Lonali's සමඟ සහයෝගීතාවයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් විසින් 2021 දෙසැම්බර් මාසයේදී දියත් කරන ලද එවැනි නව්‍ය විසඳුමකි. 'මතක' මඟින් ඉවතලන නිල ඇඳුම් සහ ආසන ආවරණ, තිර රෙදි සහ තවත් බොහෝ වර්ගවල ප්‍රතික්ෂේප කළ දෑ වැනි ගුවන් යානා අභ්‍යන්තර දෑ සමන්විත, සම්පූර්ණයෙන්ම අපද්‍රව්‍ය කොටස්වලින් සාදන ලද, නිර්මාණකරුවන්ගේ ජීවන රටා නිපැයුම් සුවිශේෂී පරාසයක් ගෙන එනු ලබයි. සංචාරක බෑග්, මුදල් පසුම්බි, පොත්, යතුරු ටැග්, ස්වර්ණාභරණ, සහ තවත් බොහෝ ආකර්ෂණීය නිර්මාණ අයිතම ඉදිරි දිනවලදී ඉදිරිපත් කිරීමට නියමිතය. තිරසාර ඉලක්ක සම්බන්ධයෙන් ගත් කළ, 'මතක' ව්‍යාපෘතිය දිළිඳුකම අඩු කිරීම, වගකීම් සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය, දේශගුණික ක්‍රියාකාරකම්, භූමියේ සහ හවුල්කාරිත්වයේ භූමිකාව ඇතුළු තිරසාර සංවර්ධන ඉලක්ක 17 න් 5 ක් (SGDs) ඉටු කරයි.

### Upcycle ව්‍යාපෘතිය යටතේ රෝද පුටු පරිත්‍යාග කිරීම

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි පරිසර ඒකකය එහි ප්‍රධාන Upcycle ව්‍යාපෘතිය යටතේ තවත් උප ව්‍යාපෘතියක් වශයෙන් සරණ බෞද්ධ පදනමේ නිවසේ පදිංචිකරුවන්ට ප්‍රතිනිර්මාණය කරන ලද රෝද පුටු පරිත්‍යාග කරමින් සාර්ථකව නිම ලදි. පරිත්‍යාග කරන ලද රෝද පුටු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි රැම්ප් සේවා දෙපාර්තමේන්තුවේ ස්වේච්ඡා කාර්ය මණ්ඩල සාමාජිකයින් කණ්ඩායමක් විසින් සම්පූර්ණයෙන්ම එකලස් කරන ලදී. රෝද පුටු තැනීමට සහ නැවත සකස් කිරීමට භාවිත කරන ද්‍රව්‍යද අභ්‍යන්තරව එයාර්ලයින්ස් හි සුන්බුන් අංගණය, දේපළ සහ රැම්ප් වැඩමුළුවලින් ලබා ගන්නා ලදි.

### කාබන් පියසටහන අවම කිරීම

අපි රටක් වශයෙන් 2020 වසර සිට ජාත්‍යන්තර ගුවන් සේවාවන් හි කාබන් ශුන්‍ය වර්ධනයක් සහතික කිරීම සඳහා අරමුණු කර ගත් මිනුම් කිහිපයක කොටසක් ලෙස 2016 ICAO මහා සභාව විසින් සම්මත කරගන්නා ලද ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා වන කාබන් පිරිමැසීමේ සහ අවම කිරීමේ ක්‍රියාපටිපාටිය (CORSIA) අනුගමනය කරනු ලබන්නෙමු. CORSIA වෙත අනුකූල වෙමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් CORSIA හි විමෝචන වාර්තාව සාර්ථකව යාවත්කාලීන කිරීමට සහ විගණන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට සහ එහි පාරිසරික ප්‍රයත්නයන් ඉටු කිරීමට සමත් විය.

### ශ්‍රීලංකන් කෙයා(ර්)ස්

කොවිඩ් -19 වසංගතයට එරෙහිව සටන් කිරීමේ ප්‍රයත්නයන්හිදී ශ්‍රී ලංකා ජාතික රෝහලට සංවාතක (Ventilators) වැනි අත්‍යවශ්‍ය වෛද්‍ය ආධාර සහ නැගෙනහිර කොළඹ මූලික රෝහල වෙත අධි ප්‍රවාහ ඔක්සිජන් යන්ත්‍ර පරිත්‍යාග කිරීමෙන් ශ්‍රීලංකන් කෙයාර්ස්, ගුවන් සමාගමේ ආයතනික සමාජ වගකීම් අංශයට අඛණ්ඩව සහය විය. හෘද රෝග සහිත දරුවන් සඳහා වන දිවයිනේ එකම තෘතීයික සත්කාර යොමු මධ්‍යස්ථානය වන රිජ්වේ ආර්යා රෝහලේ ළමා හෘද රෝග ඒකකයට ආවිලයන පොම්ප කිහිපයක්ද ගුවන් සමාගම විසින් පරිත්‍යාග කරන ලදි.

ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් නත්තල් සමයේ සැබෑ අරුත හා සතුට බෙදා ගනිමින් මහරගම CCC Home හි පදිංචිකරුවන් වෙත අත්‍යවශ්‍ය ද්‍රව්‍ය 540 ක් පරිත්‍යාග කරන ලදී. CCC Home යනු බාහිර නවාතැන් වල නැවතී සිටීමට හෝ ප්‍රතිකාර සඳහා තම ග්‍රාමීය නිවෙස් සිට යාම්වීම් සිදු කිරීමට අපහසු බාහිර පිළිකා රෝගීන් සහ ඔවුන් රැකබලා ගන්නන් සඳහා වන ස්ථානයකි.

ශ්‍රීලංකන් කෙයාර්ස් විසින් සීදුව, ශ්‍රී ලංකා අන්ධ කාන්තා සුබසාධන සංගමයේ ප්‍රතිලාභ දරන දරුවන් හට සපත්තු වවුචර ප්‍රදානය කිරීමේ වැඩසටහනක් සංවිධානය කරමින් 2022 ජාත්‍යන්තර කාන්තා දිනය සමරනු ලැබුණි.

එයාර්ලයින්ස් විසින් මුහුණ දුන් අසීරු කාල සහ සියලු දෙනා මුහුණ දුන් ආර්ථික අභියෝග නොතකා ජාතික මෙහෙවරක් ඉටු කරලීමට අත්වැල් බැඳගත් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දායකත්වයෙන් එම සියලුම පරිත්‍යාග සිදු කරන ලදි.



## මූල්‍ය ප්‍රකාශ


අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 44
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 48
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 49
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 50
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 54
ලාභ අලාභ ප්‍රකාශය 55
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 56
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 57
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 58
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 59


English
日本語

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2022 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා වාර්ෂික වාර්තාව සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉතා සතුටින් ඉදිරිපත් කර සිටී.

## මූලික ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික කටයුතු සමාලෝචනය

ශ්‍රී ලංකාවේ නිල ගුවන් සේවය වශයෙන් සමාගමේ මූලික ක්‍රියාකාරකම් වනුයේ, මගී ප්‍රවාහනය, භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සඳහා කාර්ය සටහන් සහිතව සහ රහිතව ජාත්‍යන්තර ගුවන් සේවා මෙහෙයුම් සම්පාදනයයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ("BIA") සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ("MRIA") හරහා ගුවන් පර්යන්ත සේවාවන් සැපයීම, ගුවන් මගීන් වෙත තීරු බදු රහිත භාණ්ඩ අලෙවි කිරීම, අභ්‍යන්තර සහ බාහිර නිවාඩු ගත කිරීමේ සැලසුම් අලෙවි කිරීම සමාග මෙහි අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. තෙවන පාර්ශව ගුවන්යානා නඩත්තු සේවා, ගුවන්යානා මෙහෙයුම් සේවා ප්‍රතිපාදනය කරමින් සමාගමේ ගුවන් ආශ්‍රිත පුහුණු සමන්විත අතිරේක ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. මූල්‍ය වර්ෂය තුළ සමාගමේ ක්‍රියාකාරකම්වල ස්වාභාවයේ සැලකිය යුතු වෙනසක් දැකගත නොහැකි විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ("BIA") සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ("MRIA") හරහා මෙහෙයුම් කටයුතුවල යෙදෙන ගුවන්යානා සඳහා ආහාරපාන සේවා සැපයීම මූලික කාර්යය ලෙස සිදුකරනු ලබන, සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම වන පරිපාලිතයෙන් සහ සමාග මෙන්, සමූහය සමන්විත වේ. අනෙකුත් අතිරේක සේවාවන් සඳහා පොදු සහ සංක්‍රමණික අවන්හල්, ලොන්ඩරි සේවා සහ සංක්‍රමණික හෝටල් කළමනාකරණය අන්තර්ගත වේ.

## මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව

මූල්‍ය කළමනාකරණ ප්‍රධානී සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් තබන ලද සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ සහ ඒ පිළිබඳ 2022 මාර්තු 31 දිනට අවසන් වන වසර සඳහා වන විගණන වාර්තාව මෙම වාර්තාව සමඟ අමුණා ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශය සැකසීමේදී භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් 59 සිට 71 පිටුවල ඉදිරිපත් කර ඇත.

## සමූහයේ පිරිවැටුම

සමූහයේ පිරිවැටුම රුපියල් මිලියන 134,301(2020/21: රුපියල් මිලියන 50,929) කි. මූල්‍ය ප්‍රකාශය සඳහා සමූහයේ පිරිවැටුමෙහි සවිස්තර ඇගයීම සටහන් 20 හි දක්වා ඇත. සමාගම සහ එහි පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත ආයතනය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම අතර ගනුදෙනු සාධාරණ වෙළඳපොළ මිල ගණන් අනුව සිදුකරනු ලබයි.

ප්‍රතිඵල

සමූහයෙහි වසර සඳහා බදු වලට පසු ශුද්ධ අලාභය රුපියල් මිලියන 163,583 කි (2020/21: රුපියල් මිලියන 49,705). සමූහය විසින් රුපියල් මිලියන 426 ක (2020/21 – වියදම් ප්‍රතිවර්තන රුපියල් මිලියන 57) බදුකරණ වියදමක් දරන ලදී. වසර සඳහා වන ලාභ අලාභ ප්‍රකාශය 55 පිටුවෙහි දක්වා ඇත.

වසර තුළ දේපළ, පිරියත, සහ උපකරණ මත සමූහයේ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 474 ක් වශයෙන් දැක්විණි (2020/21: රුපියල් මිලියන 362).

## දේපළ, පිරියත, සහ උපකරණ

වාර්තා කරනු ලබන දින වන විට සමූහයේ දේපළ පිරියත සහ උපකරණ වල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 6,251 ක් වශයෙන් දැක්විණි (2020/21: රුපියල් මිලියන 7,229).

දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සංචලනය සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශයන් සඳහා වන සටහන් 4 හි දක්වා ඇත.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 96, 361ක් වශයෙන් දැක්විණි. 2021 ජූලි 16 දින පැවති අතිවිශේෂ මහසභා රැස්වීමේදී ශ්‍රී ලංකා රජය වෙත කරන ලද කොටසක් රුපියල් 100 බැගින් වූ සාමාන්‍ය කොටස් 447,432,300 ක වෙන්කිරීම මගින් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් 51,617,435,500 සිට රුපියල් 96,360,665,500 දක්වා ඉහළ ගොස් ඇත.

## සංචිත

2022 මාර්තු 31 දින වන විට සමස්ත සමූහ සංචිත රුපියල් මිලියන 522,785 ක සෘණාත්මක අගයක් දක්වන ලදී (2020/21: රුපියල් මිලියන 366,285 සෘණාත්මක අගයකි). මෙය රුපියල් මිලියන 529,213 ක සමුච්චිත අලාභයක් ලෙස සලකනු ලැබේ (2020/21: රුපියල් මිලියන 366,285).

ප්‍රාග්ධන සංචිත රුපියල් මිලියන 6,428 කි (2020/21: රුපියල් මිලියන 5,441). මෙකී සංචිතයන්හි සංචලනය මූල්‍ය ප්‍රකාශයන්හි ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයෙහි දැක්වේ.

## ආයතනික ප්‍රදානයන්

සමූහය මගින් වසර තුළදී කිසිදු පරිත්‍යාග යක් නොකරන ලදී (2020/21: නැත).

## අයබදු

2011 අංක 22 දරන (සංශෝධිත) දේශීය ආදායම් පනත මඟින් සංශෝධිත 2006 අංක 10 දරන ආදායම් පනතේ විධිවිධාන අනුව සමාගම 2022 මාර්තු 31 වැනි දින තෙක් සිදුකරනු ලබන සියලුම ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සියලුම බදු වලින් නිදහස් කෙරිණි.

කෙසේවුවද, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීමත් සමග සමාගම 2018 අප්‍රේල් 1 වැනි දින සිට සියලුම ස්වකීය ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සියලුම ආදායම් බදු ගෙවීමේ වගකීමෙන් බැඳී සිටී. මේ වන විට ද්විත්ව බදුකරණ ගිවිසුම් නොපවතින රටවල සිදුකරනු ලබන විදේශ මෙහෙයුම් සම්බන්ධයෙන් බදු මුදල් ගෙවීමට සමාගම බැඳී සිටී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ වූ ගිවිසුම අනුව පරිපාලිත ආයතනය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම වෙත 2021 මැයි 30 දින දක්වා බදු විරාමයක් හිමි විය. යානාස්ථ මුලුතැන් ගෙවල් වලින් (Flight Kitchen), සංක්‍රමණික අවන්හල්වලින්, සංක්‍රමණික හෝටල්, යානාස්ථ ලොන්ඩරි කටයුතු සහ EK පරිශ්‍රය ආශ්‍රිත මෙහෙයුම් මගින් උපයනු ලබන ශුද්ධ ලාභය 2021 මැයි 30 වැනි දින තෙක් සම්පූර්ණයෙන් ආදායම් බදු වලින් නිදහස් කොට ඇත. ඉන් අනතුරුව ශුද්ධ ලාභය 2029 මැයි 30 වැනි දින දක්වා තවදුරටත් වසර 8 සඳහා 15% ක සහන බදු අනුපාතයක් යටතේ වගකීමෙන් බැඳේ. පොදු අවන්හල, "වැනිලා පොඩ්" ආහාර වෙළඳසැල්" සෙමොන්ඩු" අවන්හල සහ දේශීය ලොන්ඩරි සේවා හා වෙනත් ආදායම් වලින් උපයන ශුද්ධ ලාභය දැනට පවතින බදු අනුපාතය වන 24% ක ආදායම් බද්දකට යටත් වේ.

## කොටස් පිළිබඳ විස්තර

2022 මාර්තු 31 දින වන විට කොටස් පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ:

| කොටස් හිමිකාරීත්වය | කොටස් සංඛ්‍යාව | හිමිකාරීත්ව % |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය | 959,006,469 | 99.52% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 0.19% |
| වෙනත් | 2,736,510 | 0.28% |

## නීතිරීති සහ රෙගුලාසීන්ට අනුකූලත්වය

සමාගම සෑමවිටකම අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කොට ඇත. අනුකූලතාවය සම්බන්ධයෙන් වගකිව යුතු කළමනාකරණ නිලධාරීන් විසින් විගණන කමිටුවේ කාර්තුමය රැස්වීම්වලදී අනුකූලතාවය සම්බන්ධ වාර්තාවක් සභාගත කරනු ලබයි.

## සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ මූල්‍ය ප්‍රකාශයෙහි සටහන 30 හි දක්වා ඇත.

## අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්

2021 මාර්තු 31 වැනි දිනට අසම්භාව්‍ය වගකීම් සහ එම දිනට ප්‍රාග්ධන වියදම් මත දරන ලද බැඳීම් මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 25 හි ඉදිරිපත් කොට ඇත.

## වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන්හි සටහන 27 හි දක්වා ඇති කරුණු හැරුණු විට, වෙනස්කිරීමක් හෝ අනාවරණය කිරීමක් අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්වයක් වාර්තාකරණ දින සිට උද්ගතව නැත.

## මානව සම්පත්/සේවා නියුක්ති ප්‍රතිපත්ති

සමාගම මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජන නිරන්තරයෙන් සිදු කළ අතර, නව ව්‍යාපාරික ප්‍රමුඛතාවන්ට සරිලන පරිදි එලදායී ශ්‍රම බලකායක් සේවයේ යොදවනු ලබයි. එමඟින් සමූහයේ පුද්ගලයින්ට අදාළ සමාගමේ රැකියා ප්‍රතිපත්තිවල ඉදිරි සාර්ථකත්වය උදෙසා අවශ්‍ය නිපුණතා සහ දැනුම වර්ධනය කරවමින් සිය සේවකයින් කටයුතු කරන බවට තහවුරු කරයි. වෘත්තීයට අදාළ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රමිතීන්ට සැලකිය යුතු අවධානයක් යොමු කරනු ලබයි. සමාගම මගින් සේවයේ යොදවනු ලැබ ඇති පුද්ගලයින් සංඛ්‍යාව වසර අවසානයේදී 5,833 (2020/21: 5,965) වූ අතර පරිපාලිතයෙහි සේවක සංඛ්‍යාව 819 (2020/21 – 853) ක් විය.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂකවරුන්ගේ පරම දැනුම සහ විශ්වාසය අනුව, සේවකයින් සහ ශ්‍රී ලංකා රජය සම්බන්ධ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කරනු ලැබ ඇති බවට සෑහීමකට පත් වේ.

## පරිසර සංරක්ෂණය

සමූහයේ ව්‍යාපාරික කටයුතු මගින් පරිසරය වෙත සෘජු සහ වක්‍ර බලපෑම් ඇති කළ හැකි වේ. පරිසරය කෙරෙහි ඇති වන අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගනිමින්, අනුකූලතාවය ඉහළ නැංවීම සහ අදාළ අධිකාරීන් සහ රෙගුලාසි වෙත සහයෝගය දැක්වීම සමූහයේ ප්‍රතිපත්තිය වේ.

## අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් ප්‍රකාශයෙහි දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශයන් සැකසීමේදී අවශ්‍ය අවස්ථාවක ශ්‍රී ලංකා රජය විසින් මූල්‍ය ආධාර ලබා දෙනු ලබන භාණ්ඩාගාර/මුදල් අමාත්‍යාංශ ලේකම්, ආර්ථික ස්ථායිකරණය සහ ජාතික ප්‍රතිපත්ති අනුමැතිය මත පදනම්ව, ආයතනය ප්‍රතිව්‍යුහගත කෙරෙන තෙක් අඛණ්ඩ පැවැත්මක් ලෙස පැවතීමට 2021/22 වසර සඳහා සමාගම වෙත අඛණ්ඩ පැවැත්ම පදනම ආදේශ කර ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවේ 79 වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් ශ්‍රී ලංකා රජය විසින් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ කෙටි හඳුන්වාදීමක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 14 සහ 15 හි ඉදිරිපත් කර ඇත.

මූල්‍ය වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොළහක් කැඳවූ අතර, අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පහත පරිදිය.

| 2021/22 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ ධූරය දැරූ කාලසීමාව තුළ සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| අසෝක පතිරගේ මහතා (සභාපති) | 12/12 |
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා | 12/12 |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා (2022 අගෝස්තු 18 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී) | 11/12 |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා (2022 අගෝස්තු 18 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී) | 12/12 |
| සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්වන ලදී) | 11/12 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා | 12/12 |
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා | 12/12 |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව තවදුරටත්.

* වීරසිංහ ආච්චිගේ සරත් කුමාර මහතා (2022 අගෝස්තු 18 දින බලපැවැත්වෙන පරිදි භාණ්ඩාගාර නියෝජිත ලෙස පත් වන ලදී.
2023 පෙබරවාරි 3 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.)
* ආනන්ද විජේතිලක අතුකෝරල මහතා (2023 පෙබරවාරි 3 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී).
* ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා (2023 මාර්තු 16 දින බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී).
ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා (2023 අප්‍රේල් 10 දින බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී).

### විගණන කමිටු සාමාජිකයින්

සංජය මොහොට්ටාල මහතා මූල්‍ය වර්ෂය තුළ, මෙම කාලයට අදාළ විගණන කමිටුවේ සභාපතිවරයා විය. විගණන කමිටුව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සැදුම්ලත් වේ.

| කමිටු සාමාජිකයින් 2021/22 මූල්‍ය වර්ෂය | සහභාගී වී ඇති රැස්වීම් ගණන |
|---|---|
| සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.) | 4/4 |
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා | 1/4 |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.) | 4/4 |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා | 4/4 |
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා - 2021 අප්‍රේල් මස 23 දින කමිටුවට තේරී පත් වන ලදී (තාවකාලික සභාපති) | 4/4 |

*ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා - 2021 අප්‍රේල් මස 23 දින කමිටුවෙන් ඉල්ලා අස්වන ලදී.
*වීරසිංහ ආරච්චිගේ සරත් කුමාර මහතා - භාණ්ඩාගාර නියෝජිත - සභාපති විගණන කමිටු (2022 අගෝස්තු 26 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත් විය/2023 පෙබරවාරි 3 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.)
*ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා - (2023 මාර්තු 31 දින කාරක සභාවට පත් කරන ලදී).

විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 48 හි දක්වා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව

මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුවෙහි ප්‍රධාන අරමුණු වනුයේ, පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් දියුණු කිරීම උදෙසා විධිමත් සහ විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කිරීම සඳහා මඟ පෙන්වීමත්, පාරිශ්‍රමික ව්‍යුහයක් ස්ථාපනය කිරීමත්ය.

වෙළඳපොළ ක්ෂේත්‍ර සාධක සහ සමූහයේ සියලු සමාගම්වල පුද්ගල කාර්යසාධනය මත පදනම්ව පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සකස් කර ඇත. මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව අවශ්‍යතාව පරිදි රැස්වේ.

මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව, පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

| කමිටු සාමාජිකයින් 2021/22 මූල්‍ය වර්ෂය | සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා - සභාපති | 6/6 |
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා | 5/6 |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා (2022 අගෝස්තු 18 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී) | 4/6 |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා (2022 අගෝස්තු 18 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වන ලදී) | 6/6 |

*ජයන්ත් පෙරේරා මහතා (2023 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී).

### අධ්‍යක්ෂ මණ්ඩල ආයතනික අවදානම් කමිටුව (BERC)

ආයතනයේ ව්‍යාපාරික මෙහෙයුම් කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, එවැනි අවදානම් මූල්‍ය හා මූල්‍ය නොවන දෙඅංශය කෙරෙහි බලපෑම ගණනය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල ආයතනික අවදානම් කමිටුව විසින් සිදු කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල ආයතනික අවදානම් කමිටුවෙහි සාකච්ඡා මගින් ආයතනයේ ක්‍රියාකාරිත්වයට බලපානු ලබන අවදානම් වල බලපෑම වාර්තා කිරීමට සහ කිසියම් අහිතකර බලපෑමක් අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සැලසිය යුතුය.

| කමිටු සාමාජිකයින් |
|---|
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා - සභාපති |
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා |
| ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා |
| සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.) |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා (2022 අප්‍රේල් 18 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.) |
| ආනන්ද විජේතිලක අතුකෝරල මහතා (නිරීක්ෂක) (2023 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී). |
| ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා - (2023 මාර්තු 31 දින බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී). |

දැනට අධ්‍යක්ෂ මණ්ඩල ආයතනික අවදානම් කමිටුව හි ක්‍රියාකාරිත්වය විගණන කමිටුව විසින් නිරීක්ෂණය කරනු ලබයි.

### සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය

සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ;

| |
|---|
| අසෝක පතිරගේ මහතා (සභාපති) |
| මලික් ජේ. ප්‍රනාන්දු මහතා |
| ජනාධිපති නීතිඥ මනෝහර රත්න විභූෂණ ද සිල්වා මහතා (2022 ජූලි 11 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.) |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා (2022 ජූලි 11 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.) |
| සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.) |
| ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා |
| වීරසිංහ ආච්චිගේ සරත් කුමාර මහතා (භාණ්ඩාගාර නියෝජිත ලෙස 2022 සැප්තැම්බර් 30 දින බලපැවැත්වෙන පරිදි පත් වන ලදී/2023 පෙබරවාරි 3 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.) |
| ආනන්ද විජේතිලක අතුකෝරල මහතා (2023 මාර්තු 13 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී). |
| ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා - (භාණ්ඩාගාර නියෝජිත ලෙස 2023 මාර්තු 31 දින බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී). |

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

2007 අංක 7 දරන සමාගම් පනතෙහි 168 (1) (ඊ) වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වෙත ගෙවන ලද සමුච්චිත වේතන මෙම වාර්තාවේ 100 පිටුවෙහි සටහන 30 යටතේ දැක්වේ.

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය කාර්යාලයේ බලතල අනුව, ශ්‍රී ලංකා රජය (GOSL) නාමයෝජක අධ්‍යක්ෂ ඒ. කේ. පතිරගේ මහතා/සභාපති, සමාගමෙහි සාමාන්‍ය කොටස් 3 ක හිමිකාරීත්වය දරයි.

## සබඳතා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානය අනුව සමාගම මඟින් සබඳතා ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. සියලුම අධ්‍යක්ෂවරුන් තමන් වෙනත් සමාගම් වල පවත්වාගෙන යන සබඳතා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කොට ඇති අතර 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අංක 192 (1) සහ 192 (2) යන වගන්ති ප්‍රකාරව අදාළ සබඳතා පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ සබඳතා ලේඛනයෙහි වාර්තා කොට ඇත.

## අධ්‍යක්ෂකවරුන්ගේ ගිවිසුම් සබඳතා

සමාගමෙහි ව්‍යාපාරික කටයුතු වලට අදාළ කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 29 හි අනාවරණය කොට ඇති දෑට අමතරව අධ්‍යක්ෂකවරුන්ට කිසිදු සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් නොතිබුණි.

## වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමේ හතළිස් හතරවන වාර්ෂික මහා සභා රැස්වීම, 2023 ජූනි 2 සිකුරාදා දින ප.ව. 3.00 ට බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව, ලිපිනයේ පිහිටි 'මිහිලක මැදුර' බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්වේ.

## විගණකවරුන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විගණකවරුන්, විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. විගණක ගාස්තු පිළිබඳ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 23 හි දක්වා ඇත. සමාගම හෝ එහි පරිපාලිත ආයතනය සමඟ (විගණකවරයකු වශයෙන් පවතින සම්බන්ධය හැරුණු විට) විගණකවරුන්ගේ කිසිදු සබඳතාවයක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී,

**අසෝක පතිරගේ මහතා**
*සභාපති*

**ජයන්ත් පෙරේරා**
*අධ්‍යක්ෂ*

**ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය**
*ආයතනික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

2023 අප්‍රේල් 18
කටුනායක

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

### කාර්යභාරය සහ වගකීම්

ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (BAC) විෂය පථය සහ වගකීම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර සම්මත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව පාලනය කරනු ලැබේ. අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ස්වාධීන සමාලෝචනය, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාපටිපාටි, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි, පාලන ක්‍රියාපටිපාටි, අභ්‍යන්තර සහ බාහිර විගණන ක්‍රියාපටිපාටි, සහ නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාවය නිරීක්ෂණය කරමින් එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීම කරමින් සීමාසහිත ශ්‍රීලංකන් එයාලයින්ස් සමාග මේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහයවීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අරමුණයි.

### කමිටුවෙහි සංයුතිය

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි සේවය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වූයේ, සංජය මොහොට්ටාල මහතා (සභාපති), මලික් ජේ. ප්‍රනාන්දු මහතා (සාමාජික), මනෝහර ද සිල්වා මහතා (සාමාජික), සමන්ත රත්වත්ත මහතා (සාමාජික, 2021 අප්‍රේල් 23 ඉල්ලා අස්වන ලදී) සහ ජයන්ත් පෙරේරා (සාමාජික, 2021 අප්‍රේල් 23 දින පත් වන ලදී).

වසර අවසානයේදී, සංජය මොහොට්ටාල මහතා (සභාපති) සහ මනෝහර ද සිල්වා මහතා (සාමාජික) පිළිවෙලින් 2022 අප්‍රේල් 29 දින සහ 2022 අප්‍රේල් 18 දින විගණන කමිටුවෙන් ඉල්ලා අස්වන ලදී.

සරත් කුමාර මහතා විගණන කමිටුවෙහි සභාපති ලෙස 2022 අගෝස්තු 26 දින පත් වන ලදී.

වී.ඩී. දිල්රුක්ෂි මහත්මිය ජාතික විගණන කාර්යාලය නියෝජනය කරමින් විගණන කමිටුවේ රැස්වීම් වලට සහභාගී වූවාය.

### රැස්වීම්

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් හතරක් (4) පැවැත්විණි. නිශ්චිත ගැටලු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට පැහැදිලි කිරීම සඳහා ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ කළමනාකරණ සාමාජිකයින් ආරාධනා මත රැස්වීම්වලට සහාභාගී විය.

### සමූහ සහතිකකරණ සහ උපදේශක සේවා අංශය

ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ සමූහ සහතිකකරණ සහ උපදේශක සේවා අංශය (GAAS) විසින් අභ්‍යන්තර විගණනයන් පවත්වන ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සෘජුවම වාර්තා කරයි.

### මූල්‍ය වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- වසර අවසාන විගණනය කළ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය සහ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.
- බාහිර විගණක විසින් නිකුත් කළ කළමනාකරණ ලිපිය සහ ඉස්මතු කරන ලද කරුණු වෙත කළමනාකරණයේ ප්‍රතිචාර සමාලෝචනය කරන ලදී.
- එහි වාර්තා කිරීමේ වගකීම්වල ස්වාධීනත්වය සහ බලතල සහතික කිරීමට අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය සහ අනුමත කිරීම සිදු කරන ලදී.
- IS/IT පාලන ඇතුළු අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ අභ්‍යන්තර විගණන වර්තා සමාලෝචනය කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කාලානුරූපීව පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා බව නිරීක්ෂණය කරන ලදී.
- SLA ආයතනික අවදානම් ලේඛනය සහ ප්‍රධාන ව්‍යාපාරික අවදානම් අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාපටිපාටි සමාලෝචනය කරන ලදී.
- සංශෝධිත ආයතනික තොරතුරු ආරක්ෂණ අත්පොත සහ ආදයම් උත්පාදන ගිවිසුම් අත්පොත සමාලෝචනය කර අනුමැතිය සඳහා මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.
- අදාළ සියලුම නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කර ඇති බවට සහතික කරලීමට කාර්තුමය අනුකූලතා පාලන රාමුව සමාලෝචනය කරන ලදී.
- කාර්තු පදනම යටතේ නිකුත් කළ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු විස්තර සමාලෝචනය කරන ලදී.
- කාර්තු පදනම යටතේ වඩාත් ප්‍රමුඛ ණයගැතියන් පිළිබඳ සමාලෝචනය ලදී.

**සරත් කුමාර මහතා**
*සභාපති*
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2022 නොවැම්බර් 22

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් විගණකවරුන්ගේ වගකීම්වලට වඩා වෙනස් වේ. ඒ පිළිබඳ ඔවුන්ගේ වාර්තාවේ 51 පිටුවේ දක්වා ඇත.

2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතා ප්‍රකාරව අධ්‍යක්ෂකවරුන් විසින් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශය, මූල්‍ය වර්ෂය අවසානය සඳහා සමාගම සහ සමූහයේ ක්‍රියාකාරකම් පිළිබඳ නිවැරදිවුත්, සාධාරණවුත් විනිශ්චයක් ලබා දෙමින්, මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ ලාභ හෝ අලාභ දක්වමින් සැකසිය යුතුය. මූල්‍ය ප්‍රකාශය සැකසීමේදී උචිත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගත් අතර අවශ්‍ය පරිදි යොදාගැනීම, සාධාරණ සහ විචක්ෂණශීලි විනිශ්චයන් සහ තක්සේරුවන් සිදුකර ඇති අතර අදාළ වන්නා වූ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන පනතේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සහ ඉදිරිපත් කිරීම සිදුකර ඇති බවට සහතික කිරීමට, සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්වයන්වල නිවැරදි බව සමඟ අනාවරණය කිරීමට ප්‍රමාණවත් ගිණුම්කරණ වාර්තා සමාගම සහ සමූහය පවත්වා ගෙන යන බවට සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමකි. එමෙන්ම ඔවුන්, සමූහයේ වත්කම් සුරක්ෂිතභාවයට මනා ක්‍රියාමාර්ග ගැනීම සහ ඒ සම්බන්ධව වංචා සහ අක්‍රමිකතා සිදුවීම හඳුනාගැනීමට සහ වැලැක්වීම සඳහා ගැළපෙන අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම වෙනුවෙන් නිසි සැලකිල්ලක් දැක්වීමට වගකියනු ලබයි.

බැංකු ණය පහසුකම් ලබාගැනීම සඳහා සහනශීලී ලිපි/රජයේ සහතිකවීම මාර්ග යෙන් ශ්‍රී ලංකා රජය (GOSL) විසින් ලබාදෙන අඛණ්ඩ සහයෝගය සහ ශ්‍රී ලංකා රජය විසින් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට ගත් ප්‍රයත්නයන් සහ සමාග මේ මෙහෙයුම් සහ මූල්‍ය තත්වයන් නඟා සිටුවීම පිළිබඳ සැලකීමෙන් අනතුරුව අධ්‍යක්ෂවරුන් විසින් 'අඛණ්ඩ පැවැත්ම' යන සංකල්පය මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී තවදුරටත් පවත්වා ගෙන යන ලදී. තවද, මූල්‍ය සටහන් වල 3 වන සටහන යටතේ විස්තර කර ඇති පරිදි, යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන තෙක් "අඛණ්ඩ පැවැත්ම" පදනම යටතේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය තවදුරටත් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන බවට 2022 ඔක්තෝම්බර් 25 වන දිනැති කැබිනට් මණ්ඩල අනුමැතියක් හරහා ශ්‍රී ලංකා රජය විසින් තහවුරු කර ඇත (2022 නොවැම්බර් 8 දින භාණ්ඩාගාරික ලේකම් විසින් ලිපිය නිකුත් කර ඇත).

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ඔවුන්ගේ මතය ගොඩනැගීම සඳහා සුදුසු යැයි සලකනු ලබන කවර හෝ පරීක්ෂාවක් සිදු කිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා ඇති බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

ගිණුම් වාර්තා කරනු ලබන දිනට සමාගමට සහ එහි පරිපාලිත සමාගමට අදාළ සියලු බදු, අයකිරීම් සහ මූල්‍ය බැඳීම් ගෙවා හෝ ඊට අදාළ ප්‍රමාණවත් ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය දැනුම අනුව තහවුරු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**ඩෑල්රීන් තිරුකුමාර් මහත්මිය**
*සාංගමික ලේකම් සේවා ප්‍රධානී/*
*සමාගම් ලේකම්*

2023 අප්‍රේල් 18

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

## ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. AAV/B/SLAL/01/21/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 18 April 2023

**සභාපති**

**සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ සහ එහි පරිපාලිත සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### *1.1 මතය*

2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශනයේ විගණනය සහ සමාගමේ (සමාගම") සහ එහි පරිපාලිතයේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියෙහි සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට මා විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ නියුතු වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් මට සහය විය.

මූල්‍ය ප්‍රකාශන වලින් 2022 මාර්තු 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### *1.2 මතය සඳහා පදනම*

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණනය ප්‍රමිතීන්ට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිති යටතේ මගේ වගකීම් මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

#### *1.3 කාරණා අවධාරණය කිරීම*

**(අ) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව**

මූල්‍ය වාර්තාවේ සටහන 2.1 සහ සටහන 3 වෙත මම අවධානය යොමු කරමි. එය පිළිවෙලින් කොවිඩ් 19 වසංගත තත්ත්වයේ පවතින බලපෑම සහ අඛණ්ඩ පැවැත්මට අදාළ සිදුවීම්/ කොන්දේසි පැහැදිලි කරනු ලබයි.

සමූහයේ/ සමාගමේ කාර්යසාධනය සහ මූල්‍ය ප්‍රවාහය සඳහා කොවිඩ් 19 වසංගත තත්ත්වයේ පවතින බලපෑම මූල්‍ය ප්‍රකාශනයේ සටහන 2.1 මඟින් පැහැදිලි කරනු ලබයි.

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී සමූහය රුපියල් මිලියන 163,583.08 ක ශුද්ධ අලාභයක් දැරූ බවත්, ඒ වන විට රුපියල් මිලියන 529,212.70 ක සමුච්චිත අලාභයක් ඇති බවත්, සමූහයේ ජංගම වගකීම්, එහි ජංගම වත්කම් රුපියල් මිලියන 292,420.17 කින් ඉක්මවා ඇති බවත්, මුළු වගකීම් රුපියල් මිලියන 426,423.85 කින් එහි මුළු වත්කම් ඉක්මවා ඇති බවත් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 3 මඟින් අනාවරණය කරනු ලබයි. තවද 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී සමාගම රුපියල් මිලියන 537,505.15 ක සමුච්චිත අලාභයක් සමඟින් රුපියල් මිලියන 166,369.68 ශුද්ධ අලාභයක් දරා ඇති අතර, සමාගමේ ජංගම වත්කම් රුපියල් මිලියන 302,702.51 කින් ජංගම වත්කම් ඉක්මවූ අතර, මුළු වගකීම් රුපියල් මිලියන 437,036.93 කින් මුළු වත්කම ඉක්මවනු ලැබුණි.

2022 ඔක්තෝම්බර් 25 දින කැබිනට් අනුමැතිය සමඟ සටහන අංක 3 හි දක්වා ඇති අවම කිරීමේ සාධක සහ ආයතනය ප්‍රතිව්‍යුහගත කරන තෙක්, ශ්‍රී ලංකා රජය (GOSL) සමාගම වෙත "අඛණ්ඩ පැවැත්ම" සහිත සමාගමක් වශයෙන් සිය මෙහෙයුම් පවත්වා ගෙන යාම සඳහා සහයෝගය තහවුරු කරන ලද භාණ්ඩාගාර ලේකම් විසින් 2022 නොවැම්බර් 08 දින නිකුත් කරන ලද ලිපිය සැලකිල්ලට ගනිමින්, මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කරමින් පිළියෙල කොට ඇත. ශ්‍රී ලංකා රජය 2022 නොවැම්බර් 28 දිනැති කැබිනට් තීරණය මගින් ගුවන් යානා ප්‍රතිස්ථාපනය, පවතින ගුවන් යානාවල කල්බදු දීර්ඝ කිරීම හෝ දෙකෙහිම එකතුවක් යොදා ගනිමින් දහයකට නොවැඩි ගුවන් යානා සඳහා ප්‍රතිස්ථාපන අනුමැතිය ලබා දී ඇත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කෙසේ වෙතත්, මෙම වාර්තාවේ පවතින උපරිම තොරතුරු මත පදනම්ව, සටහන 3 හි දක්වා ඇති අනෙකුත් කාරණා සමඟ එවැනි අවස්ථාවක් හෝ කොන්දේසියක පැවැත්ම දක්වනුයේ ද්‍රව්‍යාත්මක අනපේක්ෂිතතාවක් පැවතීමෙන් සමාග මේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මේ උපකල්පන පවත්වා ගැනීමට සැලකිය යුතු බාධාවක් ඇති කරන බවයි.

**(ආ) ගුවන් යානා පූර්ව ලබාගැනීමේ ගෙවීම්**

2022 මාර්තු 31 දිනට රුපියල් මිලියන 5,649.09 (ඇ.ඩො. මිලියන 19.21) ක් වූ ගුවන් යානා පූර්ව ලබාගැනීමේ ගෙවීම් වලට අදාළ මූල්‍ය ප්‍රකාශන හි සටහන 11 වෙත මාගේ අවධානය යොමු වන ලදී. මෙම අවස්ථාවේදී සමාගමේ කළමනාකාරීත්වයට පූර්ව ලබාගැනීමේ ගෙවීම් ආපසු අයකර ගැනීමේ ප්‍රතිඵලය සමාගමට අහිතකර විය හැකි බවට විශ්වාස කිරීමට කිසිදු තොරතුරක් නොමැත.

කෙසේ වෙතත්, නිරාකරණයක් නොමැති අවස්ථාවක, නෛතික ක්‍රියාමාර්ගයක ප්‍රතිඵල මත වන ප්‍රතිසාධනය රඳා පවතින අතර, මෙම වාර්තාවේ දිනය දක්වා වූ පූර්ව ලබාගැනීමේ ගෙවීම්වල ප්‍රතිසාධනය පිළිබඳ සමාගමේ උපකල්පනයට විරුද්ධ කිසිදු අමතර තොරතුරක් පිළිබඳ මා දැනුවත් කර නොමැත.

මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මා හට කිසිදු කරුණක් නොමැත.

**(ඇ) වාර්තා කරන දිනට පසුව සිදුවන සිදුවීම්**

ජාත්‍යන්තර බැඳුම්කර කඩ කිරීම් සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශන සටහන් 27.3 වෙත අවධානය යොමු කරමි.

මෙම කරුණු සම්බන්ධයෙන් මගේ මතය වෙනස් කර නැත.

### *1.4 සමූහයේ 2021/22 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු*

වෙනත් තොරතුරු සඳහා වාර්ෂික වාර්තාවේ තොරතුරු ඇතුළත් වන අතර, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන සහ මෙම විගණකගේ වාර්තාවේ දිනයට පෙර ලබාගත් මාගේ විගණකගේ වාර්තාව ඇතුළත් නොවේ. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වගකීමෙන් බැඳේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ මාගේ මතය මගින් වෙනත් තොරතුරු ආවරණය නොවන අතර, ඒ සම්බන්ධයෙන් මවිසින් කිසිදු ආකාරයක තහවුරුවක් හෝ නිගමනයක් සපයනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම වනුයේ, ඉහත සඳහන් කරන ලද වෙනත් තොරතුරු කියවා බැලීම වන අතර, එහිදී වෙනත් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශන අතර ප්‍රමාණාත්මක නොගැලපීමක් පවතීද, විගණනයේදී මා ලද දැනුම අනුව හෝ වෙනත් ආකාරයකින් කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් සිදුවී ඇතිද යන්න සොයා බලනු ලබයි.

එසේ නම්, මා විසින් සිදුකරන ලද කාර්යය මත පදනම්ව, මෙම විගණන වාර්තාවේ දිනයට පෙර ලබාගත් වෙනත් තොරතුරු මත, මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇතැයි මා විසින් නිගමනය කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මා හට කිසිදු කරුණක් නොමැත.

### *1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකාරීත්වයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්*

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම මෙන්ම වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරීත්වයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම සහ සමූහය අඛණ්ඩ පැවැත්මේ පදනම තීරණය කිරීම කළමනාරීත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විසින් සමාගම හෝ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, සමාගමේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනයේ වගකීම ඇති අය වගකිව යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික සහ වාරාන්තරව සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා, සමාගම සහ සමූහය විසින් සිය ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව තවදුරටත්.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද මවිසින්,

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ මාගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක් හඳුනා නොගැනීමේ අවදානම, වැරැද්දක ප්‍රතිඵලයක් ලෙස එසේ හඳුනානොගැනීමට වඩා වැඩි ය, මන්ද වංචාවක් තුළ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා ඌනතා ඇතිකිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැකි බැවිනි.
- අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි, නමුත් එසේ සිදුකරන්නේ සමාගමේ ඵලදායීතාවය සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.
- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ කළමනාකාරිත්වය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ ඊට සම්බන්ධ අනාවරණය කිරීම්වල සාධාරණත්වය ඇගයීම සිදු කරමි.
- කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමූහයට අඛණ්ඩ පැවැත්මක් ඇතිවීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හො කොන්දේසි වලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල අදාළ අනාවරණයන් පිළිබඳ මවිසින් මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්වයන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හේතු විය හැකිය.
- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන මගින් එහි ඇතුළත් ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරමි.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතනවල හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. කණ්ඩායම් විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මම වගකිව යුතුය. මගේ විගණන මතයට මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව, අනෙකුත් කරුණු අතර සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමග මම සන්නිවේදනය කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2. වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

***2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධව නිශ්චිත විධිවිධාන ඇතුළත් කර ඇත.***

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, මගේ විභාගයෙන් පෙනී යන පරිදි, සමූහය විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියට අනුව නිසි පරිදි විගණන වාර්තා තබා ඇත.

2.1.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියට අනුකූල වේ.

2.1.3 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ නියමයන්ට අනුව පෙර වසරට අනුකූල වේ.

2.1.4 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව පෙර වසරේ මා විසින් කරන ලද සියලුම නිර්දේශ ඇතුළත් වේ.

***2.2*** සිදු කරන ලද ක්‍රියාපටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව, ද්‍රව්‍යමය කරුණු වලට සීමා වූ කිසිවක් මගේ අවධානයට ලක්ව නැත;

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තිය අනුව, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් බැහැරව, සමූහය විසින් ඇති කරගන්නා ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සමූහයේ පාලන මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, සමූහයේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීති, සාමාන්‍ය සහ විශේෂ විධානවලට සමූහය අනුකූල වී නොමැති බව ප්‍රකාශ කිරීම.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව, සමූහය එහි බලතල, කාර්යයන් සහ රාජකාරි අනුව කටයුතු කර නොමැති බව ප්‍රකාශ කිරීම.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයට අනුව අදාළ නීතිවලට අනුකූලව සහ නිසි කාල රාමු තුළ සමූහයේ සම්පත් ආර්ථිකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ලබාගෙන ඒවා භාවිත කර නොමැති බව ප්‍රකාශ කිරීම.

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
*විගණකාධිපති*

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| මාර්තු 31 දිනට | සටහන | සමූහය 2022 රු. මිලියන | සමූහය 2021 රු. මිලියන | සමාගම 2022 රු. මිලියන | සමාගම 2021 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 4 | 6,250.74 | 7,228.51 | 4,206.28 | 4,903.20 |
| භාවිත හිමිකම් වත්කම් | 5. | 82,808.36 | 92,455.88 | 82,539.30 | 92,171.07 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 6. | 30,391.33 | 21,246.37 | 30,391.33 | 21,246.37 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | 7. | 5,439.55 | 4,038.79 | 5,439.55 | 4,038.79 |
| අස්පෘශ්‍ය වත්කම් | 8. | 78.78 | 92.14 | 66.63 | 69.55 |
| ආයෝජන | 9.1 | 0.40 | 0.40 | 42.44 | 42.44 |
| | | 124,969.16 | 125,062.09 | 122,685.53 | 122,471.42 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 10. | 4,268.37 | 4,655.76 | 4,015.64 | 4,483.03 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 11. | 27,807.64 | 11,111.45 | 27,052.31 | 10,810.64 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 6. | 16,966.56 | 13,635.10 | 16,966.56 | 13,635.10 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | 7. | 937.40 | 602.76 | 937.40 | 602.76 |
| ආයෝජන | 9.2 | 1,937.38 | 1,367.82 | 1,681.78 | 1,114.66 |
| මුදල් සහ බැංකු ශේෂයන් | 12. | 5,376.82 | 1,447.82 | 4,804.95 | 1,263.81 |
| | | 57,294.17 | 32,820.71 | 55,458.64 | 31,910.00 |
| **මුළු වත්කම්** | | 182,263.33 | 157,882.80 | 178,144.17 | 154,381.42 |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| හිමිකම් | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 13. | 96,360.67 | 79,352.43 | 96,360.67 | 79,352.43 |
| සංචිත | 14. | 6,428.21 | 5,441.27 | 4,107.56 | 3,115.82 |
| සමුච්චිත අලාභ | | (529,212.71) | (366,284.57) | (537,505.15) | (371,733.52) |
| | | (426,423.83) | (281,490.87) | (437,036.92) | (289,265.27) |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පොලී දරන වගකීම් | 15. | 215,585.08 | 163,417.25 | 214,699.18 | 162,644.32 |
| වෙනත් වගකීම් | 16. | 43,387.76 | 28,499.76 | 42,320.77 | 27,783.38 |
| | | 258,972.84 | 191,917.01 | 257,019.95 | 190,427.70 |
| **ජංගම වගකීම්** | | | | | |
| ගුවන් ප්‍රවාහන පූර්ව විකුණුම් | 17. | 28,704.31 | 11,196.76 | 28,704.31 | 11,196.76 |
| වෙනත් වගකීම් | 16. | 23,653.30 | 17,349.86 | 23,653.30 | 17,349.86 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 18. | 132,862.79 | 83,011.81 | 141,522.63 | 88,837.45 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 216.54 | 175.45 | 175.45 | 175.45 |
| පොලී දරන වගකීම් | 15. | 164,277.38 | 135,722.78 | 164,105.45 | 135,659.47 |
| | | 349,714.32 | 247,456.66 | 358,161.14 | 253,218.99 |
| **මුළු වගකීම්** | | 608,687.16 | 439,373.67 | 615,181.09 | 443,646.69 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 182,263.33 | 157,882.80 | 178,144.17 | 154,381.42 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කරන ලදී.

**යසන්ත දිසානායක**
*මූල්‍ය කළමනාකරණ ප්‍රධානී*

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් තබන ලද්දේ,

**අසෝක පතිරගේ**
*අධ්‍යක්ෂ*

**ජයන්ත් පෙරේරා**
*අධ්‍යක්ෂ*

පිටු අංක 59 සිට 107 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ කොටසකි.

2023 මාර්තු 31
කොළඹ

# ලාභ අලාභ ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සමූහය 2022 රු. මිලියන | සමූහය 2021 රු. මිලියන | සමාගම 2022 රු. මිලියන | සමාගම 2021 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **ආදායම** | 20. | 134,301.36 | 50,928.92 | 132,936.23 | 50,693.85 |
| **වියදම** | | | | | |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | | (42,759.12) | (10,569.38) | (42,759.12) | (10,569.38) |
| සේවක පිරිවැය | | (17,415.80) | (17,111.81) | (15,969.51) | (16,206.23) |
| ගුවන්තොටුපළ, ගමන් සහ මගී වියදම් | | (17,752.91) | (7,308.38) | (19,272.39) | (7,440.31) |
| ගුවන් යානා නඩත්තු සහ අලුත්වැඩියා පිරිවැය | | (23,088.11) | (13,695.34) | (23,088.11) | (13,695.34) |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය | | (14,655.59) | (16,745.32) | (14,188.27) | (16,295.62) |
| කෙටිකාලීන බදු ගුවන් යානා සහ එන්ජින් කොටස් සඳහා බදු කුලිය | | (43.66) | (2,265.02) | (43.66) | (2,265.02) |
| විකුණුම්, අලෙවි සහ ප්‍රචාරණ වියදම් | | (7,249.61) | (2,064.99) | (7,180.41) | (2,033.93) |
| ගුවන් කාර්ය මණ්ඩල වියදම් | | (3,230.96) | (1,680.18) | (3,230.96) | (1,680.18) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (7,026.34) | (4,670.86) | (6,665.43) | (4,325.38) |
| | | 1,079.26 | (25,182.36) | 538.37 | (23,817.54) |
| වෙනත් ආදායම් සහ ලැබීම් | 21. | 613.40 | 17,062.15 | 698.96 | 20,628.65 |
| **විනිමය අලාභයට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 1,692.66 | (8,120.21) | 1,237.33 | (3,188.89) |
| පොලී දරන වගකීම් පරිවර්තනය කිරීම හැර විනිමය අලාභය | | (34,729.60) | (6,339.22) | (37,812.00) | (6,894.60) |
| විනිමය අලාභයට පසු මෙහෙයුම් අලාභය | | (33,036.94) | (14,459.43) | (36,574.67) | (10,083.49) |
| **ශුද්ධ මූල්‍ය පිරිවැය** | | | | | |
| මූල්‍ය ආදායම | 23.1 | 664.17 | 561.51 | 639.25 | 524.86 |
| මූල්‍ය පිරිවැය | 23.2 | (22,903.90) | (22,529.43) | (22,813.07) | (22,338.61) |
| පොලී දරන වගකීම් මත විනිමය අලාභය | 23.3 | (107,880.72) | (13,334.22) | (107,621.19) | (13,334.22) |
| | | (130,120.45) | (35,302.14) | (129,795.01) | (35,147.97) |
| **බදු පෙර අලාභය** | | (163,157.39) | (49,761.57) | (166,369.68) | (45,231.46) |
| ආදායම් බදු (වියදම)/ප්‍රතිවර්තනය | 24. | (425.69) | 57.06 | - | - |
| **වසර සඳහා අලාභය** | | (163,583.08) | (49,704.51) | (166,369.68) | (45,231.46) |

පිටු අංක 59 සිට 107 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කොටසකි.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සමූහය 2022 රු. මිලියන | සමූහය 2021 රු. මිලියන | සමාගම 2022 රු. මිලියන | සමාගම 2021 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වසර සඳහා අලාභය** | | (163,583.08) | (49,704.51) | (166,369.68) | (45,231.46) |
| **වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය)** | | | | | |
| **පසු කාලපරිච්ඡේදයන්හිදී ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභ):** | | | | | |
| පාරිතෝෂිකය මත ආයුගණන ලැබීම්/(අලාභය) | 16.3 | 636.51 | (92.13) | 598.05 | (160.58) |
| නිවාඩු මුදල් කිරීම මත ආයුගණන ලැබීම්/(අලාභය) | 16.3 | 22.83 | (7.38) | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායමෙ හි හඳුනාගත් අයිතමයන් හි විලම්බිත බදු බලපෑම | 24.2 | (9.19) | (9.16) | - | - |
| | | 650.15 | (108.67) | 598.05 | (160.58) |
| **පසු කාලපරිච්ඡේදයන්හිදී ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභ) (බදුවලට පසු):** | | | | | |
| ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ මත ශුද්ධ සංචලනය | | - | 1,760.86 | - | 1,760.86 |
| | | - | 1,760.86 | - | 1,760.86 |
| **වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය), ශුද්ධ බදු** | | 650.15 | 1,652.19 | 598.05 | 1,600.28 |
| **වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය), ශුද්ධ බදු** | | (162,932.93) | (48,052.32) | (165,771.63) | (43,631.18) |

පිටු අංක 59 සිට 107 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කොටසකි.

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| **සමූහය මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන** | **ප්‍රත්‍යාගණන සංචිතය රු. මිලියන** | **මුදල් ප්‍රවාහ සීමා සංචිත රු. මිලියන** | **ප්‍රාග්ධන සංචිතය රු. මිලියන** | **සමුච්චිත අලාභ රු. මිලියන** | **එකතුව රු. මිලියන** |
|---|---|---|---|---|---|---|
| **2020 අප්‍රේල් 01 දිනට ශේෂය** | 51,617.44 | 5,447.53 | (1,760.86) | - | (316,477.65) | (261,173.54) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | 27,734.99 | - | - | - | - | 27,734.99 |
| වසර තුළ බැහැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය පැවරුම | - | (6.26) | - | - | 6.26 | - |
| වසර සඳහා අලාභය | - | - | - | - | (49,704.51) | (49,704.51) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | 1,760.86 | - | (108.67) | 1,652.19 |
| මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | 1,760.86 | - | (49,813.18) | (48,052.32) |
| **2021 මාර්තු 31 දිනට ශේෂය** | 79,352.43 | 5,441.27 | - | - | (366,284.57) | (281,490.87) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | (27,734.99) | - | - | - | - | (27,734.99) |
| කොටස් නිකුතුව (සටහන 13) | 44,743.23 | - | - | 991.74 | - | 45,734.96 |
| වසර තුළ බැහැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය පැවරුම | - | (4.80) | - | - | 4.80 | - |
| වසර සඳහා අලාභය | - | - | - | - | (163,583.08) | (163,583.08) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | - | - | 650.15 | 650.15 |
| මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | - | - | (162,932.93) | (162,932.93) |
| **2022 මාර්තු 31 දිනට ශේෂය** | 96,360.67 | 5,436.47 | - | 991.74 | (529,212.71) | (426,423.83) |

| **සමාගම මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා** | **ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන** | **ප්‍රත්‍යාගණන සංචිතය රු. මිලියන** | **මුදල් ප්‍රවාහ සීමා සංචිත රු. මිලියන** | **ප්‍රාග්ධන සංචිතය රු. මිලියන** | **සමුච්චිත අලාභ රු. මිලියන** | **එකතුව රු. මිලියන** |
|---|---|---|---|---|---|---|
| **2020 අප්‍රේල් 01 දිනට ශේෂය** | 51,617.44 | 3,115.82 | (1,760.86) | - | (326,341.48) | (273,369.08) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | 27,734.99 | - | - | - | - | 27,734.99 |
| වසර සඳහා අලාභය | - | - | - | - | (45,231.46) | (45,231.46) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | 1,760.86 | | (160.58) | 1,600.28 |
| මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | 1,760.86 | - | (45,392.04) | (43,631.18) |
| 2021 මාර්තු 31 දිනට ශේෂය | 79,352.43 | 3,115.82 | - | - | (371,733.52) | (289,265.27) |
| ප්‍රකාශිත ප්‍රාග්ධනයට අත්තිකාරම් (සටහන 13) | (27,734.99) | - | - | - | - | (27,734.99) |
| කොටස් නිකුතුව (සටහන 13) | 44,743.23 | - | - | 991.74 | - | 45,734.96 |
| වසර සඳහා අලාභය | - | - | - | - | (166,369.68) | (166,369.68) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | - | - | 598.05 | 598.05 |
| මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) | - | - | - | - | (165,771.63) | (165,771.63) |
| 2022 මාර්තු 31 දිනට ශේෂය | 96,360.67 | 3,115.82 | - | 991.74 | (537,505.15) | (437,036.92) |

පිටු අංක 59 සිට 107 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සමූහය 2022 රු. මිලියන | සමූහය 2021 රු. මිලියන | සමාගම 2022 රු. මිලියන | සමාගම 2021 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කළ) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදමට පෙර අලාභය | | (163,157.39) | (49,761.57) | (166,369.68) | (45,231.46) |
| ගැළපුම් : | | | | | |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය/හානිකරණය | | 14,655.59 | 16,745.32 | 14,188.27 | 16,295.62 |
| මූල්‍ය පිරිවැය | 23.2 | 22,903.90 | 22,529.43 | 22,813.07 | 22,338.61 |
| දේපළ, පිරියත සහ උපකරණ, අස්පෘශ්‍ය වත්කම් සහ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම බැහැර කිරීමෙන් ලද අලාභය/(ලැබීම්) | | 24.89 | (7.57) | 4.61 | (4.94) |
| මූල්‍ය ආදායම | 23.1 | (664.17) | (561.51) | (639.25) | (524.86) |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 11.4 | 125.63 | 62.29 | 88.38 | 44.22 |
| මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදනය | 10.1 | 349.35 | 385.28 | 405.29 | 282.74 |
| නඩත්තු සංචිතය හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 6.2 | 3,836.65 | 1,181.44 | 3,836.65 | 1,181.44 |
| අත්හිටවූ බදු ප්‍රතිවර්තනය | 21 | - | (16,433.45) | - | (16,433.45) |
| බදු සහන | 15.3 | (339.91) | (444.93) | (191.99) | (278.63) |
| උපලබ්ධි නොවන ලද විනිමය අලාභයෙහි බලපෑම | | 143,139.73 | 17,303.87 | 145,580.83 | 17,885.29 |
| අත්තිකාරම්වල විකුණුම් ආපසු ලිවීම | | (2,506.13) | (1,931.97) | (2,506.13) | (1,931.97) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන | 16.3 | 1,241.51 | 997.45 | 1,159.11 | 903.81 |
| **කාර්ය ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)** | | 19,609.65 | (9,935.92) | 18,369.16 | (5,473.58) |
| තොගවල පහළයාම/(ඉහළයාම) | | 38.03 | 87.60 | 62.11 | 47.66 |
| පූර්ව ප්‍රවාහන විකුණුම්වල (පහළයාම)/ඉහළයාම | | 20,013.68 | (4,706.44) | 20,013.68 | (4,706.44) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ හි (ඉහළයාම) / පහළයාම | | (12,666.72) | 279.03 | (12,174.95) | (538.83) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හි ඉහළයාම / (පහළයාම) | | 8,052.86 | 1,153.78 | 8,186.48 | (3,346.54) |
| නඩත්තු සංචිතවල (ඉහළයාම) / පහළයාම | | (4,613.74) | 246.53 | (4,613.74) | 246.53 |
| ගුවන්යානා සුරැකුම් තැන්පතුවල පහළයාම / (ඉහළයාම) | | 471.80 | 633.22 | 471.80 | 633.22 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කරන ලද) උත්පාදිත මුදල්** | | 30,905.59 | (12,242.20) | 30,314.53 | (13,137.98) |
| ගෙවන ලද මූල්‍ය පිරිවැය | | (15,859.69) | (17,531.09) | (15,768.86) | (17,340.28) |
| ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ | 16.3 | (456.36) | (988.41) | (438.69) | (941.21) |
| ගෙවන ලද ආදායම් බදු | | (46.58) | (37.51) | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද /(භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 14,542.96 | (30,799.21) | 14,106.98 | (31,419.47) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලද පොලිය | | 419.22 | 300.90 | 396.73 | 267.40 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | | (490.55) | (319.95) | (365.11) | (282.82) |
| (ආයෝජන) / කෙටි කාලීන ආයෝජන තැන්පතු උපලබ්ධි වීම | | (329.13) | (271.21) | (329.13) | (446.81) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම | | (32.15) | (38.60) | (31.68) | (30.00) |
| වත්කම පාවිච්චි කිරීමේ හිමිකම් අත්පත් කරගැනීම | | (19.46) | - | (19.46) | - |
| දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීමෙන් ලද මුදල් | | 12.62 | 10.52 | 10.86 | 4.94 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලදී භාවිත කරන ලද ශුද්ධ මුදල්** | | (439.45) | (318.34) | (337.79) | (487.29) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර විකුණුම් වෙතින් උත්පාදන | | 17,317.57 | 27,463.82 | 17,317.57 | 27,463.82 |
| පොලී දරන වගකීම් ආපසු ගෙවීම | | (7,475.82) | (3,189.70) | (7,474.82) | (3,078.78) |
| කල්බදු වගකීම් ආපසු ගෙවීම | 15.3 | (18,623.57) | (6,562.84) | (18,678.12) | (6,684.77) |
| වරණීය කොටස් නිදහස් කිරීම | | - | (1,000.00) | - | - |
| පොලී දරන ණය හා ණය ලබාගැනීම් වෙතින් ලද මුදල් | | 200.75 | 2,821.40 | 200.75 | 2,801.40 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත කරන ලද) ශුද්ධ මුදල්** | | (8,581.07) | 19,532.67 | (8,634.62) | 20,501.67 |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ ඉහළයාම/(පහළයාම)** | | 5,522.44 | (11,584.88) | 5,134.57 | (11,405.09) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 12 | (21,669.31) | (10,084.43) | (21,853.32) | (10,448.23) |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 12 | (16,146.88) | (21,669.31) | (16,718.75) | (21,853.32) |

පිටු අංක 59 සිට 107 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට අදාළ කොටසකි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. සාංගමික තොරතුරු

### *1.1 සාමාන්‍ය තොරතුරු*

**සමාගම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් (සමාගම) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සීමාසහිත වගකීම් සහිත සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි, ගුවන් සේවා මධ්‍යස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් යනු සමූහයේ සමස්ත පරිපාලක සමාගම වේ.

**පරිපාලිතය සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම**
ශ්‍රීලංකන් කේටරින් සමාගම (පරිපාලිතය) යනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි පූර්ණ පරිපාලිත සමාගමක් වන අතර එය ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ නේවාසික සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගම මෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලෙහි, ගුවන් සේවා මධ්‍යස්ථානයේ පිහිටා ඇත.

### *1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය*

**සමාගම**
සමාගමේ මූලික ක්‍රියාකාරකම් සමන්විත වන්නේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහකයා වශයෙන් මගීන් ප්‍රවාහනය කිරීම සඳහා නිශ්චිත සහ නිශ්චිත නොවන කාලසටහනකට අනුව ගුවන් සේවා පවත්වාගෙන යාම සහ, භාණ්ඩ සහ තැපැල් ප්‍රවාහනය කිරීමය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (“BIA”) සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපළේ (“MRIA”) ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන් යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීම, අභ්‍යන්තර සහ බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීම අනෙකුත් ප්‍රධාන කටයුතු අතර වේ. තෙවන පාර්ශවවලට නඩත්තු සේවා සැපයීම, ගුවන්යානා මෙහෙයුම් සේවා සහ ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීම යනාදිය සමාගමේ උපකාරී සේවා කටයුතු වේ.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපළ හරහා ක්‍රියාත්මක වනු ලබන ගුවන් සේවා සඳහා ආහාරපාන සේවාවන් සැපයීම සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි (පරිපාලිතය) මූලික ක්‍රියාකාරකමකි. අනෙකුත් සහායක කටයුතු අතරට මහජන සහ අතරමැදි මගී සංක්‍රමණ අවන්හල් පවත්වාගෙන යාම, ලොන්ඩරි සේවා ලබාදීම සහ අතරමැදි මගී සංක්‍රමණ හෝටලය කළමනාකරණය කිරීම ඇතුළත් වේ.

### *1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය*

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, 2022 මාර්තු 31 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීමට අවසර දෙන ලදී.

## 2. පොදු ගිණුම්කරණ ප්‍රමිතීන්

### *2.1. පිළියෙල කිරීමේ පදනම*

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇති අතර ඉඩම් සහ ගොඩනැගිලි සහ ගුවන්යානයේ මුළුතැන්ගෙයි උපකරණ සාධාරණ අගය මත ගණනය කර ඇත.

වෙනත් අයුරකින් සඳහන් කර ඇති විටක හැර, සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත්කොට ආසන්නතම රුපියල් මිලියනයට වටයා ඇත.

2020 දී කොවිඩ්-19 පැතිරීම, වත්මන් මූල්‍ය වසර තුළ සමාගමේ සහ සමූහයේ මෙහෙයුම් කටයුතුවලට අඛණ්ඩව බලපෑවේය.

සටහන 3 හි අනාවරණය අනුව අඛණ්ඩ පැවැත්මේ පදනම, මෙම පවතින අර්බුදය මත ව්‍යාපාරය කළමනාකරණය කිරීම සඳහා සමූහය විසින් නව ආදායම් උත්පාදන අවස්ථා ආරම්භ කිරීම (කාලසටහන්ගත භාණ්ඩ ගුවන් ගමන් සහ මගී ගුවන් යානයක් භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානයක් බවට පත් කිරීම) වියදම් ඉතිරි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම ඇතුළුව විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, අභිමත ප්‍රාග්ධන වියදම් සඳහා අඩු කිරීම් සහ අතිරේක කාරක ප්‍රාග්ධන පහසුකම් සාකච්ඡා කිරීම, නව කොටස් ප්‍රාග්ධනය ඇතුළු කිරීම ඇතුළුව ශ්‍රී ලංකා රජයෙන් සහයෝගය ලබා ගැනීම ද මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා යොදාගන්න අඛණ්ඩ පැවැත්මේ පදනම සටහන 3 හි අනාවරණය කර ඇත.

#### 2.1.1. අනුකූලතා ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම, 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සිදු කරනු ලබයි.

#### 2.1.2. සංසන්දනාත්මක තොරතුරු

නිසි ඉදිරිපත් කිරීම සහ වර්තමාන වසර සමග සංසන්දනයට අදාළ වූ විටක, පසුගිය වසරේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

#### 2.1.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

සමූහයේ මූල්‍ය ප්‍රකාශවල ක්‍රියාකාරී සහ ඉදිරිපත් කරනු ලබන විනිමය ශ්‍රී ලංකා රුපියල් (LKR) මඟින් දක්වනු ලබයි. මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත්කිරීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් LKAS 01 මඟින් අවසරදී ඇති පරිදි සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත්කොට ඇති අතර සියලුම මූල්‍ය තොරතුරු සඳහන් කොට ඇතිවිටෙක හැර ආසන්නතම රුපියල් මිලියනයට වටයා ඇත.

### *2.2 ඒකාබද්ධකරණයෙහි පදනම*

මූල්‍ය ප්‍රකාශවල සමාගමේ සහ එහි අනුබද්ධිත සමාගම්වල 2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසරට මූල්‍ය ප්‍රකාශ අඩංගු වේ. සමාගමේ පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශයන් ස්ථාවර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් භාවිත කරමින් එම වාර්තාකරණ වසර සඳහා සකස් කරනු ලැබේ.

#### 2.2.1 ව්‍යාපාර සංයෝජනය

අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහයක් ව්‍යාපාරයක හා ව්‍යාපාර පාලනයේ අර්ථ දැක්වීම සපුරාලන විට අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිත කරමින් සමූහය, ව්‍යාපාර සංයෝජනයන් ගිණුම්ගත කරයි. අත්පත් කරගත් කිසියම් ක්‍රියාකාරකමක් හෝ වත්කමක්

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

ව්‍යාපාරයක්ද නැද්ද යන්න හඳුනා ගැනීමේදී අවම ලෙස එය ආදානයක් සහ ස්වාධීන ක්‍රියාවලියක් මෙන්ම එයට නිපැයුමක් කිරීමේ හැකියාවක් තිබේද යන්න සමූහය තක්සේරු කරනු ලබයි.

අත්පත් කරගත් ක්‍රියාකාරකම් සහ වත්කම් ව්‍යාපාරයක් නොවන්නේද යන්න සරල ලෙස තක්සේරු කිරීමට ඉඩ දෙන 'ඒකාග්‍රතා පරීක්ෂණයක්' කිරීමට සමූහයට විකල්පයක් ඇත. අත්පත් කරගත් දළ වත්කම්වල සාධාරණ අගය සැළකිය යුතු ලෙස හඳුනාගත හැකි වත්කම් හෝ සමානව හඳුනාගත හැකි වත්කම් සමූහයක් තුළ සංකේන්ද්‍රණය වී ඇත්නම් විකල්ප ඒකාග්‍රතා පරීක්ෂණය සපුරාලනු ඇත.

අත්කරගැනීම්වල හරවන ලද වටිනාකම් මෙන්ම හඳුනාගත් ශුද්ධ දළ වත්කම්ද සාමාන්‍යයෙන් සාධාරණ අගය මත මිනිනු ලබයි. ඇතිවන්නාවූ ඕනෑම කීර්තිනාමක්, හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි. ඕනෑම ලාභයක් හෝ කේවල් කිරීමක් ලාභ සහ අලාභවල කඩිනමින් හඳුනා ගනු ලබයි. ණය හෝ අවශිෂ්ට සුරැකුම්පතකට සම්බන්ධ වීමකදී හැර ගනුදෙනු පිරිවැය දැරූ වියදම් ලෙස සලකනු ලබයි.

පූර්ව පවත්නා සම්බන්ධතා පියවීමේ වටිනාකම් පැවරීම්වල අන්තර්ගත නොවේ. එවැනි අගයන් සාමාන්‍යයෙන් ලාභ සහ අලාභවල හඳුනාගත හැකිය.

ඕනෑම අවිනිශ්චිත වටිනාකමක් අත්පත් කර ගැනීමේ දිනට එහි සාධාරණ අගයට හඳුනාගනු ලැබේ. අවිනිශ්චිත ගෙවීමට ඇති බැඳීම මූල්‍ය උපකරණයක නිර්වචන සමග සැසඳේ නම් සහ එය හිමිකම් වර්ගීකරණය යටතට වැටේ නම්, එවිට නැවත ගණනය නොකරන අතර ගාස්තු ගෙවීම හිමිකම් සමග ගිණුම්ගත කරනු ලබයි. ඒ හැරුණු කොට අනෙකුත් ප්‍රතිලාභ හඳුනාගැනීම සෑම වාර්තාකරණ දිනකම සාධාරණ අගය මත නැවත ගණනය කරනු ලබන අතර, අවිනිශ්චිත ප්‍රතිලාභ හඳුනාගැනීමේ සාධාරණ අගයන්වල සමාගම් වෙනස්කම් ලාභ හෝ අලාභවල හඳුනා ගැනේ.

### 2.2.2 පරිපාලිතයන්

පරිපාලිතයන් යනු සමූහය විසින් පාලනය කරනු ලබන ආයතන වේ. සමූහය ආයතනයන් 'පාලනය' කරනු ලබන්නේ, එයට නිරාවරණය වූ විටක හෝ, එහි සම්බන්ධවීම තුළින් පරිපාලිතයේ විචල්‍ය ප්‍රතිලාභ සඳහා අයිතියක් ඇති විටක සහ, සිය බලය යොදවමින්, එවැනි ප්‍රතිලාභ පරිපාලිතයකට බලපෑමක් ඇති කිරීමට හැකි අවස්ථාවකය. පාලනය ආරම්භ කරන දිනයේ සිට අවසන් දිනය තෙක් පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ මූල්‍ය වාර්තාවේ අන්තර්ගත වේ.

### 2.2.3 පාලනයට නතු නොවන අයිතීන්

සෑම ව්‍යාපාර සංයෝජනයකදීම සමූහය විසින් අත්කර ගැනීමට අදාළ පාලනය නතු නොවන අයිතීන් ගණනය කරනු ලබන අතර, එය සාධාරණ අගය මත හෝ සමානුපාතික කොටස්වල හඳුනාගත් ශුද්ධ වත්කම්වල අගය මත ගණනය වේ. කෙසේවෙතත් මෙය සාමාන්‍යයෙන් සාධාරණ අගය මත ගණනය වේ.

පාලනයට නතු නොවන අයිතීන් අත්පත් කර ගැනීම, හිමිකරුවන් සමග හිමිකරුගේ ධාරිතාවය මත සිදුවූ ගනුදෙනුවක් ලෙස සලකා ගණනය කරනු ලබයි. එවැනි ගනුදෙනු නිසාවෙන් කීර්තිනාමයක් හඳුනා ගත නොහැකිය. පාලනයට නතු නොවන අයිතීන්වල වෙනස්කම්, පරිපාලිතයේ ශුද්ධ වත්කම්වල සමානුපාතික අගය මත පදනම්ව ගණනය කරනු ලබයි.

සමූහයට පරිපාලිතයේ තිබෙන අයිතියේ අහිමිවීමක් ගෙන නොදෙන වෙනස්කම්, හිමිකම් ගනුදෙනුවක් ලෙස ගණනය කරනු ලබයි.

### 2.2.4 පාලනය අහිමි වීම

පරිපාලිතයේ පාලනය සමූහයෙන් ගිලිහී යන විටක, එය පරිපාලිතයේ වත්කම් සහ වගකීම් සහ එයට අදාළ NCI හා අනෙකුත් හිමිකම්වල අංග ලෙස හඳුනා නොගනී. ප්‍රතිඵලයක් ලෙස ලාභ හෝ අලාභයක් වෙතොත් එය ලාභ සහ අලාභ යටතේ හඳුනාගනු ලබයි. පෙර පරිපාලිතයේ ඕනෑම රඳවා ගන්නා ලද අයිතියක්, සාධාරණ අගය මත ගණනය කරනු ලබයි.

### 2.2.5 ඒකාබද්ධ කිරීම මත ඉවත් කළ ගනුදෙනු

අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනුවලින් ඇතිවන උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඉවත් කෙරේ. හිමිකම් ගිණුම්ගත ආයෝජිතයන් සමග ගනුදෙනුවලදී උපලබ්ධි නොවූ ලාභ එම ආයෝජනවලට එරෙහිව එම හිමිකම් මත ඉවත්කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ, උපලබ්ධි නොවූ ප්‍රතිලාභ ආකාරයටම ඉවත් කළද, එය හානිය පිළිබඳ සාක්ෂියක් නොමැති තෙක් පමණි.

## *2.3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන්*

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන් මෙම මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන සියලුම කාල පරිච්ඡේදයන්ට අදාළව අඛණ්ඩව යොදා ගෙන ඇත.

### 2.3.1 ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම්

සමූහය විසින් 2021 ජනවාරි 1 හෝ ඉන් පසුව ඇරඹෙන වාර්ෂික කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන ඇතැම් ප්‍රමිති සහ සංශෝධන සඳහා ප්‍රථම වරට ඉල්ලුම් කරන ලදී.

**කොවිඩ්-19 ට අදාළව 2021 ජූනි 30 සිට ඉදිරියට සිදු කරන ලද SLFRS 16 ආශ්‍රිත කුලී සහන සඳහා සංශෝධන**

සමූහය විසින් කොවිඩ්-19 ට අදාළ කුලී සහන සඳහා යොදාගත් ප්‍රායෝගික ක්‍රියාමාර්ග 2022 ජූනි දක්වා දීර්ඝ කර ඇත. කල්බදු සඳහා විකල්ප ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් සංශෝධනයන් මඟින් හඳුන්වාදෙනු ලබන අතර සමූහය බදු ගැනුම්කරුවෙකු වේ. එනම් සමූහය විසින් ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් යොදා ගනිමින් අය කර ගන්නා කල්බදු සඳහා සුදුසුකම්ලත් ණය සහනයන් කොවිඩ්-19 වසංගතයේ සෘජු ප්‍රතිඵලයක් නිසා ඇතිවූ වෙනස්කිරීමක්ද යන්න තක්සේරු කිරීමට සමූහයට අවශ්‍ය නොවේ.

පහත සඳහන් සංශෝධන සහ වැඩිදියුණු කිරීම් සමාගමේ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

SLFRS 9, LKAS 39, SLFRS 7, SLFRS 4 සහ SLFRS 16 සඳහා සංශෝධන : අදියර 2 හි පොලී අනුපාත මිණුම් ලකුණ ප්‍රතිසංස්කරණ.

### 2.3.2 සැලකියයුතු ගිණුම්කරණ ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන්

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි හා අදාළ වාර්තා කරන දිනයට සිදුකරන හෙළිදරව් කිරීම් කෙරෙහි බලපෑම් කළ හැකි විනිශ්චයන්ට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීමට කළමනාකරණයට සිදුවේ. ප්‍රධාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා ඒ හා බැඳුණු උපකල්පනයන් නිරන්තරව ක්‍රියාත්මක වන පදනමක් මත ඇගයීමට ලක් කෙරෙන අතර ඒවා ඓතිහාසික අත්දැකීම් මතද, අවස්ථානුකූලව සාධාරණ යැයි විශ්වාස කරන අනාගත සිදුවීම්

පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් වෙනත් සාධක මතද පදනම් වේ.

විෂයානුබද්ධ මෙන්ම මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගැනෙන අගයන් මත වැදගත් බලපෑමක් ඇති කරන්නාවූ අනෙකුත් දෑ අතර පහත දැක්වෙන ප්‍රධාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගනු ලැබේ.

(අ) විනිශ්චයන්

**(i) අඛණ්ඩ පැවැත්ම**

3 වන සටහනෙහි අනාවරණය කර ඇති පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර සහ ඉදිරිපත් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනම මතය.

**(ii) අසම්භාව්‍ය වගකීම් - නඩු කටයුතු**

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානය වන විට විවිධ පාර්ශ්වකරුවන් සමග සමූහය නඩු කටයුතු ගණනාවකට එළඹ ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ නීතිඥයන්ගේ උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කටයුතුවල තත්ත්වය ඇගයුමට ලක් කරන අතර අනාගතයේදී සම්පත් ගලායෑමක් පවතී යයි නිශ්චය කළහොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සිදු කරනු ලබයි.

ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ සේවකයින් විසින් සමූහයට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග, වෙනත් හිමිකම් ඉල්ලීමක් සහ විභව හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන්, සමාගමේ ව්‍යාපාර කටයුතුවලට සැලකිය යුතු බලපෑමක් අධ්‍යක්ෂවරුන් අපේක්ෂා නොකරන කාරණා සඳහා, අදාළ මුදල් ප්‍රමාණයන් සටහන 25ග2 හි හෙළිදරව් කර ඇත.

**(iii) කල්බදු**

කොන්ත්‍රාත්තුවක් තක්සේරු කරනු ලබන්නේ කොන්ත්‍රාත්තුවක් හෝ කල්බදු ක්‍රමයක් ද යන්න බැලීම සඳහාය. හඳුනාගත් වත්කම් කිසියම් කාල සීමාවකට යම් වටිනාකමක් වෙනුවෙන් භාවිතය සහ පාලනය කිරීමට අයිතියක් ප්‍රකාශ කරන්නේ නම් එය කොන්ත්‍රාත්තුවක් හෝ කල්බදු වේ. කොන්ත්‍රාත්තුවක් හඳුනාගත් වත්කමක් පාලනයට අයිතිය ප්‍රකාශ කරන්නේද යන්න තීරණය කිරීමට සැලකිය යුතු සාධකයන් වන්නේද කොන්ත්‍රාත් පදනම අනුව හඳුනාගත් වත්කම් භාවිතයට ගැනීමට, භාවිත කාලය පුරාම තක්සේරුව භාවිත කරමින් සියලු ආර්ථික වාසි ලබා ගැනීමට මෙන්ම තක්සේරුවන් සෘජුව භාවිත කිරීමට සමූහයට අයිතියක් ඇත.

(ආ) ඇස්තමේන්තු

(i) **දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය වීම/ක්‍රමක්ෂය**

දේපළ, පිරියත හා උපකරණ යන වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම් කර ගනිමින් ඒවාට යම් ඵලදායී ජීවකාලයක් හා අවශේෂ වටිනාකමක් කළමනාකරණය විසින් පවරනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ඵලදායී ජීවකාලයද එක් එක් වාර්තා කරන දිනට ඒවායේ ක්ෂයවීම්/ක්‍රමක්ෂය ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම් සඳහා පෙර සිදුකළ ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභවල පරිභෝජන රටාව සමග එය අනුගත වන බවටද සහතික කරනු ලබයි. මෙම වත්කම්වල ඵලදායී ජීවකාලය හා අවශේෂ වටිනාකම්වල වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සංශෝධනවලට හේතුවිය හැකිය. (2.4.3 (ආ) සහ 2.4.4 ප්‍රතිපත්ති විමසා බලන්න)

**(ii) නිරන්තර පියාසර වැඩසටහන "Frequent Flyer Programme"**

ලකුණු ප්‍රදානයන් (Award Credits) ආදායමෙහි වෙනම හඳුනාගැනෙන සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ. ලකුණු ප්‍රදාන සඳහා වෙන්කළ අදාළ ප්‍රතිෂ්ඨාව ඒවායේ සාධාරණ අගය මත පදනම්ව වෙන්කරනු ලබන අතර ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වගකීමක් (විලම්බිත ආදායමක්) ලෙස ගිණුම්ගත කෙරේ.

සැතපුම් ලකුණු ප්‍රදානවල (Mile Credits) සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා ඇස්තමේන්තුකරණ ශිල්ප ක්‍රම භාවිත කරන අතර අංශයක් (Sector) සඳහා ගාස්තුව, ඉහළ පංතියක ආසනයක් ලබාගැනීම හා හවුල්කාර ප්‍රදාන වැනි සාධක ගණනාවක් සඳහා බර තැබූ සාමාන්‍යයක් පෙන්නුම් කෙරේ. සාධාරණ අගය ගණනයට අදාළ පදනම වශයෙන් ඓතිහාසික ප්‍රවණතාවන් යොදා ගැනේ. සාමාජික සාමාජිකාවන් විසින් නිදහස් කරගනු ලැබෙතැයි අපේක්ෂා නොකරන සැතපුම් සඳහා සහ කල් ඉකුත් සැතපුම් සඳහා, සැතපුම්වල සාධාරණ අගය වෙනුවෙන් ගැලපුම් සිදු කෙරේ. සැතපුම්වල සාධාරණ අගය නිශ්චය කිරීමෙහිලා යොදාගැනෙන යෙදවුම්වල විවිධත්වය නිසා කළමනාකරණ විනිශ්චයන් ක්‍රියාවට නංවනු ලැබේ.

**(iii) නඩත්තු සංචිතය**

නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් කල්බදු යටතේ පවත්නා ගුවන් යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම විසින් මාසික ගෙවීම් සිදු කරයි. මෙම මාසික ගෙවීම් පදනම් වනුයේ පියාසර කරන ලද පැය සහ චක්‍ර ගණන අනුවය. ආපසු අයකර හැකි වටිනාකම්වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම්වල ආපසු අයකර ගැනීමේ හැකියාව පිළිබඳව කළමනාකරණය කලින් කල ඇගයීම් සිදු කරයි. කිසියම් වත්කමක ධාරණ අගය එහි ආපසු අයකර ගතහැකි මුදල ඉක්මවන විට එම වත්කම හානිකරණය වූ වත්කමක් සේ සලකා එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා පහත දමයි (සටහන 6 විමසා බලන්න).

**(iv) ගුවන් යානා නඩත්තු සහ අළුත්වැඩියා පිරිවැය සඳහා වෙන්කිරීම**

නඩත්තු කටයුතු සදහා එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසිවලට අනුව ගුවන්යානා බඳ, ගුවන්යානා එන්ජින් හා ඒවායේ ගොඩබැසුම් උපකරණ සම්බන්ධ විශාල නඩත්තු කටයුතු ඉටු කිරීමට සමාගම බැඳී සිටී. පිරික්සුමේ ස්වාභාවය මත කාලය යෙදවීම හා භාවිතය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශ තුළ විශාල නඩත්තු කටයුතු ආශ්‍රිත පිරිවැය සඳහා වන ප්‍රතිපාදන සිදුකරයි. මෙම ප්‍රතිපාදන තීරණය කිරීමෙහිදී, අදාළ පරීක්ෂා කිරීම සිදු කිරීමේ අවස්ථාවේදී පවත්නා වත්කම්වල ඇස්තමේන්තුගත තත්ත්වය මත, යෙදවිය යුතු අමුද්‍රව්‍ය හා දැරිය යුතු පොදුකාර්ය පිරිවැය මත සහ අදාළ පරීක්ෂා කිරීම් සිදු කළ යුතු වන්නාවූ අවස්ථාව මත සුදුසු උපකල්පනවලට එළඹේ. මෙම උපකල්පනවලට එළඹෙනුයේ අතීත අත්දැකීම් මත වන අතර ඒවා සත්‍ය මට්ටමට ආසන්න බව තහවුරු කරගැනීම සඳහා නිරන්තර සමාලෝචනයට ලක්කරනු ලැබේ. ප්‍රතිපාදන කෙරෙහි සැලකිය යුතු අයුරින් බලපෑම් ඇතිකරන උපකල්පන හා ඇස්තමේන්තු කිරීම් තුළ සිදුවන යම් සංශෝධන වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශ තුළ ගැළපීම් සිදුකරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

**(iv) ගුවන් යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා වෙන්කිරීම්**
කල්බදු ගිවිසුම්වල නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසියක් යටතේ කල්බදු ගුවන් යානා නැවත ලබා දීමට සමාගම බැඳී සිටී. ගුවන් යානා ආපසු ලබා දීමේ කොන්දේසිවලට අපේක්ෂිත පිරිවැය, තීව්‍ර කිරීමේ අනුපාත, අපේක්ෂිත වගකීම් කල් පිරීම හා සරිලන වට්ටම් අනුපාත සම්බන්ධ උපකල්පන ඇතුළත් වේ. ප්‍රතිපාදනය පිළිබඳ තීරණය කිරීමේදී, නැවත භාරදීමේ කාලසීමාව වන විට වත්කමේ ඇස්තමේන්තුගත තත්ත්වය, දැරීමට සිදුවන ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැය සහ නැවත භාරදීම සිදු කරන වේලාව මත උපකල්පන කරනු ලැබේ. මෙම උපකල්පන අතීත අත්දැකීම් මත පදනම්ව පිහිටුවා ඇති අතර ඒවා සත්‍ය තත්ත්වයට ආසන්න බව සහතික කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කෙරේ. ප්‍රතිපාදනයට ද්‍රව්‍යමය බලපෑමක් ඇති කරනු ලබන, උපකල්පනවල සහ ඇස්තමේන්තුවල පවතින කිසියම් සංශෝධනයක් වේ නම් එය ඉදිරි මූල්‍ය ප්‍රකාශවල සකස් කරනු ලැබේ.

**(v) ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත සෘජු මෙහෙයුම් වියදම් සඳහා වෙන්කිරීම**
ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් කාර්යවලදී ඉන්ධන ගාස්තු, ගොඩබිම් මෙහෙයුම් සේවා සඳහා ගාස්තු, ගොඩබෑම් හා නවතා තැබීමේ ගාස්තු, ගුවන්යානා තුළ ආහාර පාන, ප්‍රවේශපත් වෙන්කරවා ගැනීමේ පද්ධති ගාස්තු සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගාස්තු වැනි සෘජු වියදම් සම්බන්ධයෙන් වූ විවිධ ප්‍රතිපාදන වෙන්කිරීමට අනිවාර්යයෙන්ම සිදුවේ. ඊට අදාළ ඇස්තමේන්තු හා ඒ ආශ්‍රිතව යොදා ගැනෙන උපකල්පන අතීත අත්දැකීම් මතද, අවස්ථානුකූල පරිදි සාධාරණ වේයැයි විශ්වාස කෙරෙන බොහෝ අනිකුත් සාධක මතද පදනම් වන අතර ඉන් උද්ගත වන ප්‍රතිඵල වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වගකීම්වල ධාරණ අගය මත ප්‍රතිපාදන වෙන් කිරීම සිදුවේ.

**(vi) තොග**
සමාගම විසින් අඛණ්ඩ තොග ගණනය සිදුකිරීම මඟින් තොගවල පැවැත්ම හා ප්‍රයෝජනවත්භාවය, සමාලෝචනය කරයි. කල් ඉකුත් වූ තොග සහ/හෝ තොගවල ආපසු අයකරගත හැකි වටිනාකමෙහි අඩුවීමක් සම්බන්ධයෙන් කළමනාකරණය තීරණය කළ විට ඒ සඳහා ප්‍රතිපාදන සිදුකරයි.

**(vii) මූල්‍ය නොවන වත්කම් හානිකරණය**
යම් වත්කමක් හානිකරණයට පත්වී ඇති බවට යම් සාක්ෂි තිබේදැයි සොයා බැලීමට එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කරයි. නොගෙවා ඇති කාල සීමාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට සිය විනිසුම කළමනාකරණය විසින් භාවිතා කරනු ලබයි.

**(viii) මූල්‍ය වත්කම් හානිකරණය**
යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයට පත්වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේදැයි එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කරයි. නොගෙවා ඇති කාල සීමාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට කළමනාකරණය විසින් සිය විනිසුම භාවිත කරනු ලබයි.

(ඈ) උපකල්පන

**(i) නිර්වචනිත ප්‍රතිලාභ සැලැස්ම**
ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය තීරණය කෙරෙනුයේ ආයුගණන තක්සේරුවක් ආශ්‍රයෙනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොලී අනුපාතය, වැටුප් වර්ධන අනුපාතය, විශේෂ වාරික, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම යන කරුණුවලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවලට යටත් වේ. (2.4.16 (අ) සටහන විමසා බලන්න.)

**(ii) දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය**
ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ඉඩම් සහ ගොඩනැගිලිවල සහ ගුවන් යානා මුළුතැන්ගෙයි උපකරණ ප්‍රත්‍යාගණන අගය මත මිනිනු ලැබේ. සාධාරණ අගය තීරණය කිරීම පිණිස එකී තක්සේරුකරු විසින් උපකල්පන සහ තක්සේරු ශිල්ප ක්‍රම භාවිතා කරනු ලැබේ. අදාළ තක්සේරු කිරීමේ පදනම සටහන 4 හි හෙළිදරව් කර ඇත.

### 2.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් ආශ්‍රිත සාරාංශය

2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය
සමූහයේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙනු ඒවා සිදුවන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදලින් ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැයට ගණනය කෙරෙන මූල්‍යමය නොවන අයිතම අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

2.4.2 බදුකරණය
ආදායම් බදුවල ප්‍රවර්තන සහ විලම්බිත බදු අඩංගු වේ. එය ව්‍යාපාර සංයෝජනයකට සම්බන්ධවන ප්‍රමාණයට හෝ හිමිකම් හෝ OCI හි සෘජුවම හඳුනාගත් අයිතමයක් නොවන අවස්ථාවක ලාභ හෝ අලාභයේ හඳුනාගනු ලැබේ. අවිනිශ්චිත බදු පිරියම් ඇතුළුව අදායම් බදුවලට සම්බන්ධ පොලී සහ දඩ මුදල්, ආදායම් බදුවල අර්ථකථනයට නොග ළපෙන බව සමූහය තීරණය කර ඇති හෙයින් එය LKAS 37 ප්‍රතිපාදනයෙහි අවිනිශ්චිත වගකීම් සහ වත්කම් යටතේ ගිණුම්ගත කර ඇත.

**(i) ප්‍රවර්තන ආදායම් බදු**
ප්‍රවර්තන බදුවල අපේක්ෂිත බදු ගෙවීම් හෝ ආදායම් බදුවල ලැබිය යුතු හෝ වසර සඳහා අලාභ හෝ පෙර වසරට අනුව ගෙවිය යුතු බදු හෝ ලැබිය යුතු බදු සඳහා ඕනෑම වෙනස් කිරීමක් අඩංගු වේ. ප්‍රවර්තන බදු ගෙවිය යුතු හෝ ලැබිය යුතු ප්‍රමාණයන් යනු අදායම් බදුවලට අදාළව දක්වනු ලබන ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂිත බදු ප්‍රමාණයන්වල සුදුසුතම තක්සේරුවයි. එය ආදායම් බදු සම්බන්ධ අවිනිශ්චිතතාවයක් පවතී නම් පිළිබිඹු කරයි. වාර්තාකළ දිනයට පැනවූ බදු

අනුපාතික හෝ නිත්‍ය ලෙස පැනවීම් පාදක කරගනිමින් එය මනිනු ලැබේ. එමෙන්ම ලාභාංශයෙන් ඇතිවන ඕනෑම බදු, ප්‍රවර්තන බදුවල අන්තර්ගතය.

කිසියම් නිර්ණායකයක් තිබේ නම් පමණක්, ප්‍රවර්තන බදු වත්කම් හෝ වගකීම්වලට හිලව් කරගනු ලැබේ.

**සමාගම**

(අ) දේශීය බදුකරණය
2017 අංක 24 දරන දේශීය ආදායම් පනත බලාත්මක වීම සමඟ 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම ව්‍යාපාර කටයුතු සඳහා ආදායම් බදු ගෙවීමේ වගකීමක් සමාගම සතු වේ.

(ආ) විදේශීය බදුකරණය
ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුළ තම මෙහෙයුම් කටයුතු මත බදු ගෙවීමේ වගකීමට සමාගම යටත් වේ. කෙසේවෙතත්, සමාගමට ඇති ඉදිරියට ගෙන ගිය බදු අලාභ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය තුළ බදු සම්බන්ධ කිසිදු වගකීමක් සමාගමට නොමැත.

**පරිපාලිත සමාගම - ශ්‍රීලංකන් කේටරින් සමාගම**
ආදායම් බදු වියදම් තුළ ප්‍රවර්තන සහ විලම්බිත බදු අඩංගු වේ. හිමිකම් තුළ සෘජුවම හඳුනා ගැනෙන අයිතමයන් ලෙස සැලකෙන තෙක් හැර, ආදායම් බදු වියදම, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගැනේ.

ආයෝජන මණ්ඩලය (BOI) සමග ඇතිකරගත් ගිවිසුම අනුව, ගුවන් යානාස්ථ ආහාර සැපයුම සහ ගුවන් මඟී මාර්ග ස්ථ අවන්හලෙන් උපයන ආදායම 2021 මැයි මස 31 දින දක්වා ආදායම් බද්දෙන් නිදහස් වන අතර ඉන් පසු 2029 මැයි 29 දිනෙන් අවසන් වන වසර 8 ක් සඳහා 15% ක සහනදායී අනුපාතයට බදු ගෙවිය යුතුය. වෙනත් මූලයන් වෙතින් උපයන ආදායම සාමාන්‍ය බදු අනුපාත යටතේ බදු වගකීමට බැඳේ.

**(ii) විලම්බිත ආදායම් බදු**
වත්කම් සහ වගකීම්වල බදු පදනමේ සහ ඒවායේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා වූ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිළිබඳ වගකීම් ක්‍රමවේදය භාවිත කරමින් විලම්බිත ආදායම් බදු වෙන්කිරීම් කෙරේ.

විලම්බිත බදු, වාර්තාකරණ දිනයට පනවන ලද හෝ නිත්‍ය ලෙස පනවන ලද නීතී මත පදනම්ව, ප්‍රතිවර්තනය කරන අවස්ථාවක තාවකාලිකව වෙනස් කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතික අනුව ගණනය කරනු ලබයි.

භාවිත නොකළ බදු අලාභයන් සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වත්කම් පිළිගනු ලබන අතර, ඒවා ප්‍රයෝජනට ගත හැකි අනාගත බදු ආදායම් වලට එදිරිව භාවිත කළ හැකිය. විලම්බිත බදු වත්කම් වාර්තා කරන දිනයට විමර්ශනය කරන අතර අදාළ බදු ප්‍රතිලාභයන් තැබිය හැකි, තවදුරටත් සම්භාවි විය නොහැකි වන තෙක් අඩුකරනු ලබයි.

**2.4.3 දේපළ, පිරියත සහ උපකරණ**

(අ) පිරිවැය සහ තක්සේරු කිරීම
දේපළ, පිරියත සහ උපකරණ සියලුම අයිතම මූලික වශයෙන් පිරිවැයට වාර්තා කරනු ලබයි. අත්පත්කර ගැනීම් හෝ ඉදිකිරීම සඳහා සෘජුව ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ. ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ යනාදිය පසුකාලීනව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර එම ප්‍රත්‍යාගණිත දේපළ, පිරියත සහ උපකරණ යම් ක්ෂයවීම් සහ හානිකරණයන් අඩුකළ ප්‍රත්‍යාගත අගයට ඉදිරියට ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම් සහ/හෝ සමුච්චිත හානිකරණ අලාභ ඇතොත් ඒවාද අඩුකළ ඓතිහාසික පිරිවැය මත වාර්තා කරයි.

සමාන වත්කමකට අයත් මීට පෙර ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති ප්‍රත්‍යාගණන අඩුවීමක් කරා එය ප්‍රතිවර්තනය වන තෙක් හැරුණුවිට, ඉඩම්, ගොඩනැගිලි සහ ගුවන් යනාස්ථ මුළුතැන්ගෙහි උපකරණ ප්‍රත්‍යාගණන අගයට ගණනය කරන අතර ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙනත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගන්නා අතර හිමිකම තුළ වූ ප්‍රත්‍යාගණන සංචිතය තුළ සමුච්චිත කරනු ලැබේ. ප්‍රත්‍යාගණන ඌනතාවයක් ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනෙනුයේ, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත තුළ හඳුනාගෙන ඇති එම වත්කමට අදාළ දැනටමත් පවත්නා අතිරික්තයක් හිලව් කළ පසු ඉතිරියටය.

ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයට විශාල වෙනසක් සිදුනොකරනු ලබන බවට සහතිකවනු පිණිස වත්කම් තක්සේරු කටයුතු ප්‍රමාණවත් වාර ගණනක් සිදු කෙරේ. අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒ නම් හෝ අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් ගණනය කල හැකි නම් පසුව ඇතිවන පිරිවැය අදාළ වත්කමෙහි ධාරණ අගය තුළ අන්තර්ගත කිරීම හෝ වෙනම වත්කමක් ලෙස හඳුනාගැනීම සිදුකෙරේ.

අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද කාලපරිච්ඡේදය තුළ ලාභ අලාභ ප්‍රකාශයට අය කෙරේ.

දේපළ, පිරියත සහ උපකරණ තුළ පහත සඳහන් වෙනත් දෑ ඇතුළත් වේ.

**(i) ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස්**
ස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස් මූලික වශයෙන් පිරිවැය මත වාර්තා කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය "ගුවන්යානා ආශ්‍රිත උපකරණ" යටතේ වර්ග කර ඇත.

**(ii) නොනිමි ප්‍රාග්ධනය**
නොනිමි ප්‍රාග්ධනය ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපිත දිනය දක්වා දරන ලද සියලු වියදම් ඇතුළත් පිරිවැයට වාර්තා කරනු ලබයි. වැඩ ස්ථාපනය කළ විට නොනිමි ප්‍රාග්ධනය දේපළ, පිරියත සහ උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි.

(ආ) ක්ෂයවීම
සින්නක්කර ඉඩම් හැරුණු විට, සියලුම දේපළ, පිරියත සහ උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමවේදය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා සමාන වාරිකවලින් කපා හරිමින් ක්ෂයවීම් සඳහා වූ වෙන්කිරීම් ගණනය කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

| | |
|---|---|
| ගුවන් යානා ආශ්‍රිත උපකරණ | වසර 08 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා |
| පිරියත සහ උපකරණ | උපකරණයේ වර්ගීකරණය/ ස්වභාවය මත පදනම්ව වසර 3-10 දක්වා කාලපරිච්ඡේදය පුරා |
| ගොඩනැගිලි | වසර 15 සිට 50 දක්වා වූ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීවකාලය පුරා |
| මෙහෙයුම් කල්බදු මත වූ ගුවන්යානා වැඩිදියුණු කිරීම් | වසර 10 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව තුළ |

අවශේෂ වටිනාකම/සුන්බුන් අගය, ඵලදායී ජීවකාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තාකරණ දිනට සමාලෝචනය කෙරෙන අතර සුදුසු පරිදි අදාළ ගැළපීම් සිදුකෙරේ.

ඉහත සඳහන් ක්ෂයවීමේ අනුපාත ඉදිරිපත් කළ සියලුම කාලපරිච්ඡේදවලට අදාළ වේ.

### (ඇ) හඳුනාගැනීමෙන් බැහැර කිරීම

කිසියම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් එහි භාවිතයෙන් ඉවත් කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ඇති නොවන විට හෝ එය මූල්‍ය ප්‍රකාශනවලදී හඳුනාගැනීමෙන් බැහැර කරනු ලැබේ. යම් වත්කමක් එසේ බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (බැහැර කිරීමෙන් ලද ශුද්ධ මුදල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) අදාළ වත්කම බැහැර කරනු ලබන වර්ෂයේ ලාභ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

### 2.4.4 අස්පෘශ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා ඇතිවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සහ එවැනි වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කල හැකි නම් ඒවා අස්පෘශ්‍ය වත්කම් වශයෙන් හඳුනාගනු ලැබේ. ඒ අනුව සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැය මත මෙම වත්කම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කෙරේ.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන් කරගත හැකි පරිගණක මෘදුකාංගයක් අත්පත්කර ගැනීමේ හෝ සැකසීමේ පිරිවැය වෙන් වෙන් වශයෙන් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර, එය සරල රේඛීය පදනම මත වසර 05 කට නොවැඩි කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තා කරන දිනට විමර්ශනයට ලක් කරනු ලබයි. මෙම වත්කමේ ධාරණ අගය ආපසු අයකර ගත නොහැකි බව යම් අවස්ථානුකූල සිදුවීම් සහ වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් හානිකරණය සඳහා එම වත්කමේ ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ.

### 2.4.5 කල්බදු

කොන්ත්‍රාත්තුවක් ආරම්භ කිරීමේදී, එය කල්බදු වේද නැතහොත් එහි කල්බදු ඇතුළත් වේද යන්න සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුවක් ඇගයුමට ලක් කෙරේ. කොන්ත්‍රාත්තුව මඟින් හිලව් කිරීමකට හුවමාරු වශයෙන් කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේ නම්, එම කොන්ත්‍රාත්තුව කල්බදු හෝ එහි කල්බදු ඇතුළත් වේ. කිසියම් කොන්ත්‍රාත්තුවක් මඟින් හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේද යන්න ඇගයුමට ලක් කිරීමේදී සමූහය මඟින් පහත දැක්වෙන කරුණු සලකා බලනු ලබයි.

- කොන්ත්‍රාත්තුව තුළ හඳුනාගත් වත්කමක් පවතීද යන්න - මෙය පැහැදිලිව හෝ වක්‍රව විශේෂ කොට දැක්විය යුතු වන අතර, එහිදී අදාළ වත්කම භෞතිකව අනන්‍ය ස්වභාවයෙන් යුතු වීම හෝ එහි සම්පූර්ණ ධාරිතාව ප්‍රමාණවත් අයුරින් නියෝජනය විය යුතු වීම අවශ්‍ය වේ. සැපයුම්කරුට සැලකිය යුතු ආදේශක අයිතියක් තිබේ නම්, වත්කම හඳුනා ගනු නොලැබේ.
- භාවිත කරනු ලබන කාල පරිච්ඡේදය පුරා අදාළ වත්කම භාවිතයෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණවත් ආකාරයෙන් ලබාගැනීමේ හිමිකම, සමූහය සතු වේද යන්න සහ;
- වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේද යන්න. අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳ වෙනස් කිරීමට වඩාත්ම අදාළව තීරණ ගැනීමේ අයිතිය පවතින විටකදී මෙම හිමිකම සමූහය සතු වේ. වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳව තීරණය පූර්ව නිශ්චිත වූ දුර්ලභ අවස්ථාවන්හිදී, පහත සඳහන් තත්ත්ව යටතේ වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේ:
  - වත්කම මෙහෙයවීමේ හිමිකම සමූහය සතු වේ නම්; හෝ
  - සමූහය මඟින් අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පූර්ව නිශ්චය කළ හැකි ආකාරයෙන් සකසා ඇති නම්

ආරම්භයේදී හෝ කල්බදු සංරචකයක් සහිත කොන්ත්‍රාත්තුවක නැවත තක්සේරුවකදී, සමූහය විසින් එක් එක් කල්බදු සංරචකය සඳහා එහි අදාළ සාපේක්ෂ තනි අගයන්වල පදනම මත කොන්ත්‍රාත්තුවල ප්‍රතිෂ්ඨාව වෙන් කරනු ලැබේ.

කෙසේවුවද, එය බදුකරු වන ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධ කල්බදුවලදී, සමූහය මඟින් කල්බදු නොවන සංරචකයන් වෙන් කිරීමට අදහස් නොකරන අතර කල්බදු සහ කල්බදු නොවන සංරචකයන් තනි කල්බදු සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ.

### 2.4.5.1 භාවිත හිමිකම් වත්කම් (ROU)

සමූහය මඟින් කල්බදු ඇරඹෙන දිනයේදී භාවිත හිමිකම් වත්කමක් සහ කල්බදු වගකීම හඳුනාගනී. භාවිත හිමිකම් වත්කම මූලිකව පිරිවැයට ගණනය කෙරෙන අතර, එය ලද කවර හෝ කල්බදු දීමනා අඩු කොට, ආරම්භක දිනයේදී හෝ එයට පෙර සිදුකරන ලද කවර හෝ කල්බදු ගෙවීම් වෙත ගලපන ලද වගකීමෙහි මූලික වටිනාකම සහ දරන ලද කවර හෝ මූලික සෘජු පිරිවැයක් සහ පාදක වන වත්කම ඉවත් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ පාදක වන වත්කම හෝ අදාළ වත්කම පිහිටා ඇති පරිශ්‍රය ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධ පිරිවැය ආශ්‍රිත ඇස්තමේන්තුවකින් සමන්විත වේ.

### (අ) ගුවන්යානා සහ අමතර එන්ජින් කල්බදු ගැනීම

සමාගම මඟින් සිය යානා සමූහය සඳහා ගුවන්යානා සහ එන්ජින් කල්බදු ගැනීම සිදුකරයි. ගුවන්යානා සහ එන්ජින් කල්බදු වල කාලසීමාව සාමාන්‍යයෙන් වසර 4 සිට 12 දක්වා වේ.

ගුවන්යානා කල්බදුවල ගුවන්යානාවේ ආපසු ලබාදෙන තත්වය සඳහා වෙන්කිරීමක් ඇතුළත් වේ; එය වගකීම

නිර්මාණය කරනු ලබන අවස්ථාවේදී, භාවිත කරන වත්කම ROU වෙත කල්බදු ආශ්‍රිත නීතිරීති හා කොන්දේසි මඟින් ඉල්ලා සිටින පරිදි පාදක වන වත්කම යථා තත්වයට ප්‍රතිස්ථාපනය කිරීම සඳහා බදුකරු විසින් දරනු ලබන පිරිවැය පිළිබඳ ඇස්තමේන්තුවකි. සෙසු ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම් (ගුවන්යානා බරපතල නඩත්තු, එන්ජින් අළුත්වැඩියා සහ ගියර් අළුත්වැඩියා හැර) දරන ලද පදනමක් මත සිදුකෙරෙන අතර, අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන අංක 2.4.15. හි දක්වා ඇත.

කල්බදු ඇරඹුමේදී තැන්පතු ගෙවීම සහ සෙසු කල්බදු ගෙවීම් සියල්ල එකම ගනුදෙනුවකින් ආරම්භ වේ. එමනිසා, ප්‍රවර්තන වටිනාකම සහ ආරම්භයේදී ගෙවනු ලබන මූලික මුදල අතර වෙනස බදුකරු විසින් ගෙවිය යුතු අමතර මුදලක් වශයෙන් සැළකේ.

තැන්පතුව SLFRS 9 හි විෂය පථය තුළ පවතින අතර මූලික සාධාරණ අගයට ගිණුම්ගත කළයුතු වන අතර, මූලික මුදල හා තැන්පතුව අතර අතිරික්තය එහි සාධාරණ අගය මත SLFRS 16 - කල්බදු හි විෂය පථයට ඇතුළත් වේ. තැන්පතු සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන 2.4.9. හි දැක්වේ.

මාස 12 ක් ඇතුළත අවසන් වන කල්බදු කාලසීමාවන් සහිත ගුවන්යානාවන්හි කල්බදු සැලකිල්ලට නොගැනුණු අතර, ඒවා කෙටි කාලීන කල්බදු ආකාරයෙන්ම ගිණුම්ගත කොට ලාභ අලාභ ප්‍රකාශයෙහි කල්බදු ගුවන්යානා මත කුලිය යටතේ ඇතුළත් කොට අනාවරණය කර ඇත.

(ආ) ඉඩම් හා ගොඩනැගිලි ආශ්‍රිත කල්බදු

සමූහය මඟින් ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි ඉඩම් සහ ගොඩනැගිලි කල්බදු පදනමට ගනු ලැබේ. ඉඩම් සහ ගොඩනැගිලි කල්බදුවල කාලසීමාව සාමාන්‍යයෙන් වසර 2 සිට 8 දක්වා වේ. ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ඇතැම් කල්බදුවල, අවලංගු කළ නොහැකි ගිවිසුම් කාලසීමාව අවසන් වීමට පෙරාතුව සමූහයට සිදුකළ හැකි කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් වේ. අදාළ අවස්ථාවන්හිදී, සමූහය මඟින් මෙහෙයුම් නම්‍යශීලීත්වය ලබාගැනීමේ අරමුණින් යුතුව නව කල්බදු ගිවිසුම් තුළ කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. පවතින කාලසීමා දිගු කිරීම් වරණයන් භාවිත කළ හැකි වන්නේ සමූහයට පමණක් වන අතර බදු හිමියන්ට නොවේ.

සමූහය මඟින් කල්බදු ආරම්භයේදී කාලසීමා දිගු කිරීමේ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳ ඇගයීමක් සිදු කෙරේ. සැලකියයුතු සිදුවීමක් හෝ තත්ත්වවල සැලකිය යුතු වෙනසක් සිය පාලනය තුළ පවතී නම්, අදාළ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳ සමූහය මඟින් ප්‍රතිඇගයුමක් සිදු කරනු ලැබේ.

(ඇ) රථවාහන ආශ්‍රිත කල්බදු

සමූහය මඟින් වසර 2 සිට 5 දක්වා කාලසීමා යටතේ රථවාහන කල්බදු පදනමට ලබා ගැනේ.

(ඈ) තොරතුරු තාක්ෂණ සහ වෙනත් උපකරණ ආශ්‍රිත කල්බදු

සමූහය මඟින් වසර එකේ සිට තුන දක්වා කොන්ත්‍රාත් කොන්දේසි සහිතව තොරතුරු තාක්ෂණ උපකරණ සහ සෙසු යන්ත්‍ර කල්බදු පදනමට ලබාගැනේ. මෙම කල්බදු කෙටි කාලීන වන සහ/හෝ අඩු වටිනාකමකින් යුතු කල්බදු අයිතම වේ. සමාගම මඟින් මෙම කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් සහ කල්බදු වගකීම් හඳුනානොගැනීමට තීරණය කෙරිණි. අදාළ කල්බදු ගෙවීම් ලාභ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කර ඇත.

**භාවිත හිමිකම් වත්කම් ක්ෂයවීම**

භාවිත කරන වත්කම්, සරල රේඛීය ක්‍රමවේදයට අනුව පසුව ක්ෂය කෙරෙනුයේ ආරම්භක දිනයේ සිට භාවිත හිමිකම් වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය අවසන් වීම හෝ කල්බදු කාලසීමාව අවසන් වීම යන දෙකෙන් වඩාත් කලින් එළඹෙන දිනය දක්වාය. භාවිත හිමිකම් වත්කම්වල ඵලදායී ජීව කාලය නිර්ණය කිරීමේදී දේපළ හා උපකරණ සම්බන්ධයෙන් යොදාගත් පදනම භාවිත කෙරේ. ඊට අමතරව, භාවිත හිමිකම් වත්කම් සම්බන්ධ හානිකරණ අලාභයන් වෙතොත් ඒ සඳහා අඩු කෙරෙන අතර, කල්බදු වගකීමෙහි ඇතැම් ප්‍රතිමිනුම්ගත කිරීම් සඳහා ගළපනු ලැබේ.

*2.4.5.2 කල්බදු වගකීම*

කල්බදු වගකීම මූලිකව ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල ප්‍රවර්තන වටිනාකමට ගණනය කෙරෙන අතර, කල්බදුවල පැහැදිලි පොලී අනුපාතය භාවිත කරමින් හෝ එම අගය නිසි පරිදි නිර්ණය කළ නොහැකි වේ නම්, සමූහයේ වර්ධනීය ණය ලබාගැනීමේ අනුපාතය යොදා ගනිමින් වට්ටම් කෙරේ. සාමාන්‍යයෙන් සමූහය එහි වර්ධක ණය ගැනීම් අනුපාතය, වට්ටම් අනුපාතය ලෙස භාවිත කරනු ලබයි.

කල්බදු වගකීම් ගණනය කිරීමේදී ඇතුළත් කරන ලද කල්බදු ගෙවීම් පහත දැක්වේ.

- ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම්ද ඇතුළු ස්ථාවර ගෙවීම්;
- ආරම්භක දිනයේදී අදාළ දර්ශකය හෝ අනුපාතය යොදාගනිමින් ගණනය කරන ලද, දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වූ විචල්‍ය කල්බදු ගෙවීම්;
- අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවිය යුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණයන්; සහ
- ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොටගත් මිල, කාලසීමා දිගු කිරීමේ වරණයක් ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට ගත්තේ නම් වෛකල්පිත නැවත අලුත්කිරීමේ කාලසීමාවක කල්බදු ගෙවීම්, සහ කලින් අවසන් කිරීමට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට නොගත්තේ නැතිනම් කල්බදු ගිවිසුමක් කලින් අවසන් කිරීම සඳහා වන දඩ මුදල්

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමවේදය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කෙරේ. කිසියම් දර්ශකයක හෝ අනුපාතයක වෙනස්වීමක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් උද්ගත වන විටකදී, අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවියයුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණය සම්බන්ධ සමූහයේ ඇස්තමේන්තුවේ වෙනසක් පවතින විටකදී, හෝ සමූහය මඟින් මිලදී ගැනීමක්, කාලසීමා දිගු කිරීමක් හෝ අවසන් කිරීමේ වරණයක් තෝරාගන්නේද යන්න පිළිබඳ ස්වකීය ඇගයුම වෙනස් කරන ලද විටකදී එය ප්‍රතිගණනය කෙරේ.

මේ අයුරින් කල්බදු වගකීම ගණනය කල විටකදී, භාවිත හිමිකම් වත්කමෙහි ධාරණ අගය වෙත අනුරූපී ගැලපුමක් සිදු කරනු ලබන අතර, භාවිත හිමිකම් වත්කමෙහි ධාරණ අගය ශූන්‍ය දක්වා පහත වැටී ඇත්නම් එය ලාභ අලාභ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

*2.4.5.3 කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු*

තොරතුරු තාක්ෂණ උපකරණ ඇතුළු මාස 12ට අඩු කල්බදු කාලසීමාවන් සහිත කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් හෝ කල්බදු වගකීම් හඳුනා නොගැනීමට සමූහය තීරණය කරන ලදී. සමූහය මඟින් මෙකී කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

*2.4.5.4 කොවිඩ්-19 ට අදාළ බදු කුලී සහන*

කොවිඩ්-19 ට අදාළ බදු කුලී සහන - IFRS 16 සඳහා සංශෝධන සමූහය විසින් යොදා ගන්නා ලදී. කොවිඩ්-19 වසංගතයේ සෘජු ප්‍රතිඵලයන් වන කල්බදු වෙනස් කිරීම්වල සුදුසුකම්ලත් බදු සහන පිළිබඳ තක්සේරු නොකිරීමට ඉඩ සලසන ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන්, සමූහය යොදා ගනු ලබයි. සමාන අවස්ථාවන්හි සමාන ලක්ෂණ ඇති ගිවිසුම් සඳහා සමූහය ප්‍රායෝගික ක්‍රියාමාර්ග අඛණ්ඩව යොදාගෙන ඇත. සමූහය විසින් ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන් නොයෙදීමට තෝරා ගනු ලබන හෝ ප්‍රායෝගික ක්‍රියාමාර්ගයන් සඳහා සුදුසුකම් නොලබන කල්බදුවල සහනයන්ට කල්බදු නව්‍යකරණයකට යොමු විය හැකි දැයි තක්සේරු කරනු ලබයි.

2.4.6 තොග

ගුවන් යානා හා ගුවන් පර්යන්ත සේවා ආශ්‍රිත තොග, අමුද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් තොග සමන්විත වේ.

තොග වාර්තා කරනුයේ පිරිවැය අගය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගය යන දෙකෙන් අඩු අගය මතය. තොගවල පිරිවැය යනු සියලු ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය සහ එම තොග වර්තමාන තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්ය.

තොගවල පිරිවැය ගණනය කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය යොදා ගැනේ. සියලුම ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකුණුමක් සිදුකිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පිරිවැය අඩුකරන ලද ඇස්තමේන්තුගත විකුණුම් මිල ශුද්ධ උපලබ්ධි අගය නියෝජනය කරයි.

2.4.7 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය

කිසියම් වත්කමක් හානිකරණය වූ බවට පෙන්නුම් කිරීමක් ඇත්දැයි පරීක්‍ෂා කිරීමට සමූහය විසින් එක් එක් වාර්තා කරන දිනට තක්සේරුවක් සිදුකරයි. එබඳු යම් පෙන්නුම් කිරීමක් වුවහොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්‍ෂණයක් අවශ්‍ය වන විට හෝ වත්කමෙහි ආපසු අයකරගත මුදල පිළිබඳ සමූහය විසින් තක්සේරුවක් සිදුකෙරේ. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගයෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණයට පත්ව ඇතැයි සලකන අතර එය ආපසු අයකරගත හැකි අගය දක්වා කපා හැරේ.

කොවිඩ්-19 වසංගතය පැතිරීමෙන් අනතුරුව, සමූහය මඟින් වාර්තාකරණ දිනය වන විට මූල්‍යමය නොවන වත්කම්වල (භාවිත හිමිකම් වත්කම්ද ඇතුළුව) කවර හෝ ප්‍රමාණාත්මක හානිකරණයක් පවතීද යන්න සලකා බැලීම සඳහා විශ්ලේෂණයක් සිදු කර ඇත. අදාළ විශ්ලේෂණය මත පදනම්ව, 2022 මාර්තු 31 දිනට කිසිදු හානිකරණයක් හඳුනා නොගැනුණි.

2.4.8 සාධාරණ අගයට ගණනය කිරීම

සමූහය මඟින් ඉඩම් හා ගොඩනැගිලි, සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ සාධාරණ අගය මත ගණනය කරයි. සාධාරණ අගය ආශ්‍රිත අනාවරණය කිරීම සටහන 04 හි සිදුකර ඇත.

සාධාරණ අගය යනු එය ගණනය කරනු ලබන දිනකදී වෙළෙඳපොළේ සහභාගීවන්නන් අතර විධිමත් ගනුදෙනුවක් තුළින් වත්කමක් විකිණීම සඳහා ලැබිය හැකි හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීමේ පදනම වනුයේ යම් වත්කමක් විකිණීම හෝ යම් වගකීමක් පැවරීම:

- වත්කම් හෝ වගකීම් සඳහා මූලික වෙළෙඳපොළේ හෝ
- මූලික වෙළෙඳපොළක් නොමැති විට, වත්කම හෝ වගකීම සඳහා වන වඩාත් වාසි සහගතම වෙළෙඳපොළේදී

සමූහයට මූලික වෙළෙඳපොළ හෝ වඩාත් වාසි සහගතම වෙළෙඳපොළ වෙත ප්‍රවේශය සලසා ගත හැකි විය යුතු බවයි.

එබඳු වත්කම්වල සාධාරණ අගය ගණනය කරනුයේ, වෙළෙඳපොළ සහභාගීවන්නන් අදාළ වත්කම හෝ වගකීම මිල කිරීමේදී සිය ප්‍රශස්ත ආර්ථික අපේක්ෂාවන් ඔස්සේ ක්‍රියා කරනු ඇතැයි උපකල්පනය කරමිනි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීම, වත්කම එහි ඉහළ සහ හොඳම භාවිතය හෝ වත්කම එහි ඉහළම හෝ හොඳම භාවිතය සඳහා යොදා ගන්නා වෙනත් වෙළඳපොළ සහභාගීවන්නෙකුට විකිණීමෙන්, ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමෙන් වෙළඳපොළ සහභාගීවන්නන්ගේ හැකියාව සැලකිල්ලට ගනී.

අදාළ තත්ත්වයට ගැලපෙන සහ සාධාරණ අගය මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදීම් උපරිම කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රම සමූහය විසින් භාවිත කරනු ලබයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිනුම්කරණයේදී වැදගත්වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව සාධාරණ අගය මනිනු ලබන සියලු වත්කම් සාධාරණ අගය ආශ්‍රිත ධුරාවලිය තුළ පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කෙරේ.

- 01 වන මට්ටම - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපොළේ ලැයිස්තුගත මිල ගණන් (නොගළපන ලද)
- 02 වන මට්ටම - සෘජුව හෝ වක්‍රව නිරීක්‍ෂණය කළ හැකි සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම
- 03 වන මට්ටම - නිරීක්‍ෂණය කළ නොහැකි සාධාරණ අගයට මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ක්‍රම

පුනරාවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනෙන වත්කම් සහ වගකීම් සඳහා එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේද අවසානයේ වර්ගීකරණය නැවත තක්සේරුවක් (සමස්තයක් වශයෙන් සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) මඟින් ධුරාවලියෙහි මට්ටම අතර මාරුවීම් සිදුවී ඇත්ද යන්න සමූහය තීරණය කරනු ලබයි.

දේපළ, පිරියත සහ උපකරණ වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ වේ. බාහිර තක්සේරුකරුවන් තෝරාගැනීමේ නිර්ණායකවල වෙළෙඳපොළ දැනුම, කීර්තිනාමය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන්ට අනුව කටයුතු ඉටු කරන්නේද යන දෑ ඇතුළත් වේ. බාහිර තක්සේරුකරුවන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව එක් එක් කාරණය සම්බන්ධයෙන් කුමන ක්‍රමය සහ යෙදවුම භාවිතයට ගන්නේද යන්න පිළිබඳ සමූහය මඟින් තීරණය කරනු ලැබේ.

සාධාරණ අගය අනාවරණය කිරීමේ අරමුණ සඳහා, වත්කමට හෝ වගකීමට අදාළ ස්වභාවය, ගති ලක්ෂණ සහ අවදානම් මෙන්ම ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගය පිළිබඳ ධුරාවලියේ මට්ටම යන කරුණු මත පදනම්ව සමූහය විසින් වත්කම් සහ වගකීම්වල කාණ්ඩය තීරණය කරනු ලැබේ.

### 2.4.9 මූල්‍ය උපකරණ

#### *2.4.9.1 මූල්‍ය වත්කම්*

**මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම**
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම (FVOCI) සහ ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) වශයෙන් වර්ගීකරණය කර ඇත.

මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද වත්කම් ඇතුළුව) මුලින් හඳුනාගනු ලබන්නේ සමූහය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු සමග වෙළඳාම සිදුවන දිනයේදීය.

මූල්‍ය වත්කම් සාධරණ අගය අනුව මුලින් ගණනය කරනු ලබයි. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයක් නොමැති අයිතමයක් සඳහා එය අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු ගණනය කිරීම**
මූල්‍ය වත්කම් වර්ගීකරණය සාමාන්‍යයෙන් පදනම් වන්නේ මූල්‍ය වත්කමක් කළමනාකරණය කරනු ලබන ව්‍යාපාර ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මතය.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ FVTPL වශයෙන් නම් කර නොමැති නම් එය ක්‍රමක්ෂය පිරිවැයකින් ගණනය කරනු ලැබේ:

- වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති අතර, එහි අරමුණ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබා ගැනීම; සහ
- මූල්‍ය වත්කම්වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය මුල් ගෙවීම සහ හිඟ මුදලෙහි පොලී මත පමණක් සිදු වේ.

වෙළඳාම සඳහා නොපවතින කොටස් ආයෝජනයක් මුලින් පිළිගැනීමෙන් පසු, OCI සාධාරණ වටිනාකමෙහි පසුකාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීමට සමූහය ආපසු හැරවිය නොහැකි ලෙස තෝරා ගත හැකිය. උපකරණයක් - උපකරණයක් පාසා මෙම තෝරාගැනීම සිදු කරනු ලබයි.

වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ, ගුවන් යානා නඩත්තු සංචිතය, ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මුදල් සහ බැංකු සමූහය මඟින් මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය මත ගණනය කරනු ලැබේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
මූල්‍ය වත්කම්වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට සමූහය මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කරයි, නැතහොත් ගනුදෙනුවකදී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය මාරු කරන අතර, එමඟින් සැලකිය යුතු ලෙස මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයෙහි සියලු අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම හෝ සමූහය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන අතර එය මූල්‍ය වත්කම්වල පාලනයේ රඳවා නොගනී.

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී, වත්කමෙහි ධාරණ අගය සහ අගයේ වෙනස (හෝ හඳුනාගැනීමෙන් බැහැර කරන ලද වත්කම් කොටසට අදාළ ධාරණ අගය) සහ:

(i) ලද ප්‍රතිශ්ඨාව (අත් කරගත් නව වත්කම්වලින් අඩු කළ ඕනෑම උපකල්පිත නව වගකීම් ඇතුළත්ව) සහ
(ii) වෙනත් විස්තීර්ණ ආදායම්වලින් හඳුනාගෙන ඇති කවර හෝ සමුච්චිත ලාභ හෝ අලාභ යන ඒවායේ එකතුව ලාභ සහ අලාභවල හඳුනාගෙන ඇත.

මූල්‍ය වත්කම් හානිකරණය
ක්‍රමක්ෂය පිරිවැයකින් හෝ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් ගණනය කරනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් සමූහය විසින් හඳුනාගනු ලැබේ.

සියලුම වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ සඳහා ජීවිත කාලය පුරාම අපේක්ෂිත අලාභ දීමනාවක් භාවිත කරන අපේක්ෂිත ණය පාඩු ගණනය සඳහා සමූහය මඟින් සරල ප්‍රවේශයක් භාවිතා කරනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන අලාභ දීමනා රැගෙන යන දළ වත්කම් ප්‍රමාණයේ ධාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

ගෝලීය ආර්ථිකය වෙත කොවිඩ්-19 හි බලපෑම හමුවේ රජයන්, ව්‍යාපාරයන් සහ පාරිභෝගිකයින් ඒ සඳහා ප්‍රතිචාර දක්වන ආකාරය අවිනිශ්චිත වේ. කළමනාකරණ තීන්දු සහ ඇස්තමේන්තු ගණනාවකට යටත්ව සිය ණය කළඹ තුළින් අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීමේදී මෙම අවිනිශ්චිතතාව පිළිබිඹු වේ.

මෙම විනිශ්චයන් සහ ආශ්‍රිත උපකල්පනයන් කොවිඩ්-19 හි බලපෑම් අවස්ථා තුළ සිදුකරන ලද අතර, ඒවා මඟින් පවතින තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි අනාගත සිදුවීම් සම්බන්ධ අපේක්ෂාවන්ද ඇතුළුව, අදාළ යැයි සැලකෙන ඓතිහාසික අත්දැකීම් සහ සෙසු සාධක පිළිබිඹු වේ.

#### *2.4.9.2 මූල්‍ය වගකීම්*

**මූලික හඳුනාගැනීම සහ ගණනය**
සියලුම මූල්‍ය වගකීම් (ලාභයෙන් හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකමින් නියම කර ඇති වගකීම් ඇතුළුව) මුලින් හඳුනාග නු ලබන්නේ වෙළඳ දිනයේදී සමූහය, උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානයන්හි පාර්ශ්වකරුවෙකු වන විටය.

වගකීම අත්පත් කර ගත් අරමුණ මත පදනම්ව සමාගම සිය මූල්‍ය වගකීම් පහත කාණ්ඩ දෙකෙන් එකකට වර්ග කරයි; ලාභ

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) හෝ වෙනත් මූල්‍ය වගකීම් වන කාණ්ඩ දෙක වේ.

මූල්‍ය වගකීමක් පළමුව ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය අනුවය. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොමැති භාණ්ඩයක් සඳහා, එය අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු ගණනය කිරීම**
සමූහයට මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද පොලී දරන ණය සහ ණය ගැනීම්, ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීමේ පිරිවැය, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පවතී.

මූලික පිළිගැනීමෙන් අනතුරුව, මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට මනිනු ලැබේ.

මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වගකීම ගණනය කරනු ලබන ප්‍රමාණයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර හඳුනාගත් ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ඇති කිසියම් වෙනසක් සඳහා සඵල පොලී අනුපාතික ක්‍රමයක් භාවිත කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කර හෝ අඩු කර ඉන් හානිකරණය අඩු කිරීමෙන් ලැබෙන අගයයි.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
වගකීම් යටතේ ඇති බැඳීම මුදා හැරීමේදී හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

එකම ණය දෙන්නාගෙන් පවත්නා මූල්‍ය වගකීමක් වෙනත් වගකීමක් විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනාගැනීමෙන් බැහැර කිරීමක් ලෙස සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයයන්හි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

*2.4.9.3 මූල්‍ය උපකරණ හිලව්කිරීම*
මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව්කර, ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගනුයේ:

- හඳුනාගත් මුදල් පියවා ගැනීම සඳහා දැනට බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතී නම් සහ
- ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කර වගකීම් එකවර පියවා ගැනීමට අභිලාෂයක් පවතී නම් පමණි.

*2.4.9.4 මුදල් ප්‍රවාහ සුරැකුම් සංචිතය*
විදේශ විනිමය අනුපාත තුළ සිදුවන උච්චාවචන හේතුවෙන්, සමාගම හඳුනාගත් විදේශ ව්‍යවහාර මුදල් ණය අගයන් වෙනස්වීමෙහි අවදානම හරහා සුරැකුම් සිදු කළද, හඳුනාගන්නා ලද ස්වකීය විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රමාණයන්, ඉහළ සම්භාවිතාවක් සහිතව විශේෂයෙන් හඳුනාගත් ස්වකීය විදේශ ව්‍යවහාර මුදල් ආශ්‍රිතව ඉපැයුම් අනාගත ආදායම්වලට එරෙහිව සුරැකුම් උපකරණයක් ලෙස සමාගම විසින් නම් කරනු ලබයි.

සුරැකුම් උපකරණය මත සිදුවන ලාභය හෝ අලාභයේ ඵලදායී කොටස් අයත් වෙනත් විස්තීර්ණ ආදායමෙහි මුදල් ප්‍රවාහ සුරක්ෂාකරණ සංචිතයෙහි සෘජුවම හඳුනාගැනෙන අතර, යම් ඵලදායී නොවන කොටසක් වේතොත් එය වෙනත් මෙහෙයුම් ලෙස ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගැනේ. වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනාගත් අගයන් මුදල් ප්‍රවාහ සුරැකුම් ගනුදෙනුව සිදුවන විට (පුරෝකථනය කරන ලද ආදායම උපලබ්ධි වන විට) ලාභ අලාභ ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

පුරෝකථනය කරන ලද ගනුදෙනුව සිදුවනු ඇතැයි තවදුරටත් අපේක්ෂා නොකරන්නේ නම්, වෙනත් විස්තීර්ණ ආදායම තුළ කලින් හඳුනා ගත් සමුච්චිත ලාභය හෝ අලාභය/ලාභ අලාභ ප්‍රකාශය වෙත මාරු කරයි. සුරැකුම් උපකරණ කල්ඉකුත් වුවහොත් හෝ විකුණනු ලැබුවහොත් හෝ අවසන් කළහොත් හෝ ප්‍රතිසම්පාදනයකින් හෝ නැවත දීර්ඝ කිරීමකින් තොරව ක්‍රියාත්මක කරනු ලැබුවහොත් හෝ අවලංගු කළ සුරැකුමක් වශයෙන් නම් කරයි නම්, වෙනත් විස්තීර්ණ ආදායම තුළ කලින් හඳුනාගත් යම් සමුච්චිත ලාභ හෝ අලාභ අදාළ සුරැකුම් ගිවිසුමට අනුව පුරෝකථනය කරන ලද ගනුදෙනුව සිදුවන තෙක් හිමිකම තුළ රඳවා ගනී.

කොවිඩ්-19 හි බලපෑම මත අඩාල වූ මෙහෙයුම් හේතුවෙන් විදේශ මුදල්වලින් ලැබෙන අනාගත ආදායම සහ ප්‍රතිසැකසුම් සිදුකරන ලද විදේශ විනිමය ණය යන කරුණු දෙක කෙරෙහි බලපෑ අතර ඒ අනුව සුරැකුමෙහි බලාත්මක නොවන කොටස ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබ ඇත.

*2.4.1.0 ගුවන්යානා නඩත්තු සංචිතය*
මෙහෙයුම් කල්බදු ගිවිසුම් අනුව ගුවන් යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි අළුත්වැඩියාවන් සඳහා මාසික පදනමක් මත කල්බදුහිමිකරුවන් වෙත කරනු ලබන ගෙවීම්වලින් ගුවන්යානා නඩත්තු සංචිතය සමන්විත වේ. ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග අළුත්වැඩියා සඳහා දරන ලද වියදම (මෙතෙක් සංචිතයට ගෙවූ ප්‍රමාණයන් දක්වා) අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදුකරුවන් වෙතින් සමාගම ආපසු අය කර ගනී.

එහි ස්වභාවය මත පදනම්ව ගුවන්යානා නඩත්තු සංචිතය ණය සහ ලැබිය යුතු දෑ යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇති අතර, මෙම මූල්‍යමය වත්කම් කාණ්ඩය සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1. හි දැක්වේ.

2.4.11 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

2.4.12 ආයෝජන

**පරිපාලිත සමාගමෙහි ආයෝජන**
සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ පරිපාලිත සමාගම ආශ්‍රිතව සිදුකෙරෙන ආයෝජන තාවකාලිකව අගය අවප්‍රමාණ වීම් නොවන හානිකරණයන් ගැළපීමෙන් අනතුරුව ශුද්ධ පිරිවැයට ගිණුම්ගත කරනු ලැබ ඇත.

2.4.13 කෙටි කාලීන ආයෝජන
මාස තුනට වැඩි කල්පිරීමක් සහිත බැංකුවල පවතින ස්ථාවර වත්කම් කෙටි කාලීන ආයෝජන වේ. ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය මත කෙටි කාලීන ආයෝජන ගණනය කරනු ලැබේ.

2.4.14 මුදල් සහ මුදල්වලට සමාන දෑ
මුදල් සහ මුදල්වලට සමාන දෑ, බැංකුවේ සහ අතේ ඇති මුදල් ලෙස අර්ථ දැක්වෙන අතර, කැඳවීම් තැන්පතු සහ කෙටි කාලීන අධි ද්‍රවශීල ආයෝජන පහසුවෙන් දන්නා මුදල් ප්‍රමාණයට පරිවර්තනය කළ හැකි අතර වටිනාකමේ සුළු වෙනස් වීමේ අවදානමකට යටත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් සහ මුදල් සමාන දෑවලට බැංකුවේ සහ අතැති මුදල්ද, ශුද්ධ ගෙවීමට ඇති බැංකු අයිරා, කැඳවීම් තැන්පතුද ඇතුළත් වේ. කෙටි කල් පිරීමේ කාලයක් සහිත අයෝජනද (එනම් අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක කාලයක් හෝ ඊට අඩු) මුදල් සමාන දෑ ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ පොලී දරන වගකීම් යටතේය.

### 2.4.15 වෙන්කිරීම්

**(i) සාමාන්‍ය තොරතුරු**

වෙන්කිරීම් හඳුනාගැනෙනුයේ, කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහය සතුව කිසියම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදී, එය බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභවල අන්තර්ගත යම් සම්පත් ගලායෑමක් අවශ්‍ය වන සහ එකී බැඳීමේ වටිනාකම මත විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදුකළ හැකි විටය. සමහර වෙන්කිරීම් හෝ සියල්ලම ප්‍රතිපූර්ණය කළ යුතු යැයි සමූහය අපේක්ෂා කරන්නේ නම්, වෙනම වත්කමක් ලෙස එකී ප්‍රතිපූර්ණය හඳුනා ගැනෙනමුත්, එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූර්ණය සැබවින්ම නිශ්චිත වූ විට පමණි. ප්‍රතිපූර්ණයන්ට ශුද්ධව මොනයම් හෝ වෙන්කිරීමක් ඇතොත්, අදාළ වියදම් ලාභ අලාභ ප්‍රකාශය තුළ ඉදිරිපත් කරනු ලැබේ.

**(ii) ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම්**

ගුවන්යානා නඩත්තු සහ අළුත්වැඩියා වියදම් (ගුවන්යානාවල විශාල නඩත්තු කිරීම්, එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් හැර) සමූහය විසින් හඳුනාගැනෙනුයේ ඒ සඳහා වියදම් දැරූ පදනමක් මතය. ගුවන්යානාවල විශාල නඩත්තු කිරීම්, එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් සටහන 2.3.2 (ආ) (iv) හි සඳහන් කර ඇති පරිදි ගිණුම්ගත කර ඇත. "පැය ගණනට අනුව කාර්යක්ෂමතාව" තෙවන පාර්ශ්ව නඩත්තු ගිවිසුම් මඟින් ආවරණය කළ එන්ජින් අළුත්වැඩියා පිරිවැය සඳහා අදාළ ගිවිසුම් කාලසීමාව මුළුල්ලේ පැය ගණනට අනුව ගණනය කර එකඟත්වයට පත් ස්ථිර මිල ප්‍රමාණයන් අනුව පිරිවැය, ලාභ හෝ අලාභ ප්‍රකාශයට ලියා හරියි.

**(iii) ගුවන්යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා ප්‍රතිපාදන**

ගුවන්යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා ප්‍රතිපාදන (ප්‍රතිසංස්කරණ වගකීම්) මඟින් නියෝජනය කරයි. නැවත බාරදීමේදී ඇතැම් ගුවන්යානා සහ එන්ජින් සඳහා ගිවිසුම්ගත කල්බදු අවසන් වගකීම සපුරාලීම සඳහා වන පිරිවැයේ ඇස්තමේන්තුව නියෝජනය කරයි. කල්බදු ආරම්භයේදී පවත්නා ගුවන්යානා සැලැස්ම සහ දිගු කාලීන නඩත්තු කාලසටහන් සැලකිල්ලට ගනිමින්, එක් එක් ප්‍රතිසංස්කරණ වගකීම් සඳහා අපේක්ෂිත පිරිවැයේ වර්තමාන වටිනාකම ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එය භාවිත හිමිකම් වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කර, කල්බදු සීමාව තුළ අගය අඩු කර ඇත. ආශ්‍රිත වට්ටම් ඉවත් කිරීම කල්බදු සීමාව තුළ මූල්‍ය පිරිවැයක් ලෙස පිළිගැනේ. එක් එක් ප්‍රතිස්ථාපන වගකීම් සඳහා ඇස්තමේන්තුගත පිරිවැයට පසුව සිදුවන වෙනස්වීම, පවතින්නේ නම්, අදාළ භාවිත හිමිකම් වත්කම් සඳහා අනුරූප බලපෑමක් ඇතිව ගුවන්යානා ආපසු ලබා දීමේ කොන්දේසි සඳහා ප්‍රතිපාදන නැවත මිනුම් කිරීමක් ලෙස ගණනය කරනු ලබන අතර ඉතිරි කල්බදු කාලය තුළ ක්ෂය කරනු ලැබේ. එසේ නොමැතිනම්, නැවත මිනුම් කිරීම ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ගිණුම් කරනු ලැබේ. සටහන 2.3.2 (ආ) (v) හි ඇස්තමේන්තු පදනම හි නිරූපණය කර ඇත.

### 2.4.16 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**(අ) නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂික**

පාරිතෝෂිකය යනු නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මකි; 1983 අංක 12 පාරිතෝෂික පනත සහ 2021 අංක 28 දරන සේවකයින්ගේ විශ්‍රාම යන අවම වයස පනත අනුව සමාගම සහ එහි පරිපාලිත ආයතනය ගෙවීමට බැඳී සිටී. සෑම වසරකම ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගී කරගනිමින් ආයුගණක උපදෙස් අනුව, සමූහය විසින් දේශීය සේවකයින්ගේ අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන වටිනාකම ගණනය කරනු ලබයි.

විදේශීය මධ්‍යස්ථානවල සේවකයින්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අදාළ නීති මත පදනම් ඇස්තමේන්තු කරනු ලබයි.

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම මඟින් ඇතිවන ආයුගණක ලාභ/අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගන්නා අතර, නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ වියදම් ලාභ අලාභ ප්‍රකාශය තුළ සමූහය විසින් හඳුනාගනු ලබයි.

පාරිතෝෂික වගකීම් සඳහා බාහිරව අරමුදල් සපයෙන්නේ නැත. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ " වෙනත් දිගු කාලීන වගකීම්" යටතේ දක්වයි. එතෙර රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි සත්කාරක රටවලට අදාළ සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම යටතේය.

**(ආ) නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම - නිවාඩු මුදල් බවට පත් කිරීම**

විශ්‍රාම යාමේදී දේශීය රැකියා මත පදනම්ව වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ සිට භාවිත නොකළ එකතු වූ නිවාඩු සඳහා සමූහය වගකිව යුතුය. භාවිත නොකළ එකතු වූ නිවාඩු සඳහා සමූහයේ ශුද්ධ බැඳීම, සෑම වසරකම ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගී කරගනිමින් ආයුග ණක උපදෙස් අනුව, දේශීය සේවකයින්ගේ නිර්වචනිත ප්‍රතිලාභ සැලැස්මේ වර්තමාන අගය මත මිනිනු ලැබේ.

ලාභ හෝ අලාභ ප්‍රකාශයේ නිවාඩු මුදල් බවට පත් කිරීමට අදාළ, නිවාඩු මුදල් බවට පත් කිරීම මඟින් ඇතිවන ආයුග ණන ලාභය හෝ අලාභ, වෙනත් විස්තීර්ණ ආදයම් සහ වියදම් සමූහය හඳුනාගනු ලබයි.

නිවාඩු මුදල් බවට පත් කිරීමේ වගකීම සඳහා බාහිරව අරමුදල් සැපයෙන්නේ නැත. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ "වෙනත් දිගු කාලීන වගකීම්" යටතේ දක්වයි.

**(ඇ) නිර්වචනය කර ඇති දායකත්ව සැලැසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිභාර අරමුදල**

ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු සේවා නියුක්තිකයන් අදාළ අණපනත් සහ රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක සහ සේවා නියුක්තිභාර අරමුදලේ දායකත්වයන්ට සුදුසුකම් ලබා සිටී. සමාගම විසින් සේවක දළ සංවේතන ප්‍රමාණයෙන් 15% ක් සහ 3% ක ප්‍රමාණයක්ද, පරිපාලිත සමාගම විසින් 12% ක් සහ 3% ක් පිළිවෙළින් සේවක

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිභාර අරමුදලටද දායක කරනු ලැබේ.

### 2.4.17 .Frequent Flyer' වැඩසටහන

වැඩසටහනේ සාමාජිකයින්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම් කරගනිමින් සංචාරක සම්මාන ප්‍රදානය කරනු ලබන 'FlySmiLes' යන frequent flyer වැඩසටහන සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම 'රෙදුමැබව් කෙහැරී වැඩසටහනේ ප්‍රතිලාභවලට අදාළ මගී ආදායමෙන් කොටසක් උපයෝජනයට ගනු ලබන තෙක් විලම්භනය කර තබයි. ආදායම කල් දැමීම තක්සේරු කරනු ලබන්නේ නිදහස් කරගැනීමේ ඓතිහාසික ප්‍රවණතාවයන් මත පදනම්ව වන අතර, පසුව එය එකී ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකතනය කිරීම පිණිස යොදා ගෙන ඇත. ප්‍රදානය කරනු ලබන බැරවල සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු ලබන බැර නිදහස් කරගත හැකි සේවාවල බර තැබූ සාමාන්‍ය අගය සලකමිනි. මෙම ඇස්තමේන්තු එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ වගකීම් ඒ අනුව ගලපනු ලැබේ. වැඩසටහන් හවුල්කරුවන්ගේ සේවා භාවිතය හරහා උපචිතවන්නා වූ සහ සහභාගී හවුල්කරුවන් විසින් ගෙවනු ලබන්නා වූ සැතපුම් ප්‍රමාණයන්ද, ඒවා භාවිතා කරන තෙක් විලම්බිත ආදායම ලෙස ගණනය කරයි. කල් ඉකුත්වීමට අපේක්ෂිත සැතපුම් ප්‍රමාණ සඳහා වගකීමක් හඳුනා නොගැනේ.

### 2.4.18 ආදායම් හඳුනාගැනීම

ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම, සමූහය විසින් පියවර පහක ආකෘතියක් පදනම් කරගනිමින් හඳුනාගනී.

ආදායම හඳුනාගනු ලබන්නේ, භාණ්ඩ හෝ සේවාවක් පාරිභෝගිකයෙකු වෙත මාරු කිරීම සඳහා යම් ආයතනයක් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිශ්ඨාව පිළිබිඹු වන වටිනාකම අනුවය.

#### (අ) ගුවන් සේවාවේ ආදායම

ආදායම ප්‍රධාන වශයෙන් උත්පාදනය වනුයේ මගී ප්‍රවාහනය, ගුවන් බඩු, අතිරික්ත ගමන්මලු සහ තැපැල් ප්‍රවාහන, ගුවන්තොටුපළ පර්යන්ත සේවා, ඉංජිනේරු සේවා, ගුවන්යානා කුලී පදනම මත සැපයීම සහ ආශ්‍රිත සේවා යනාදියෙනි.

i. මගී ප්‍රවාහනය, ගුවන් බඩු, අතිරික්ත ගමන් මලු සහ අනෙක් අදාළ ගාස්තු, ප්‍රවාහනය/පහසුකම් සපයාදෙන අවස්ථාවේදී ජනිත වන මෙහෙයුම් ආදායම මඟින් හඳුනාගනු ලබයි.
ii. භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර සහ ගුවන් මාර්ග බිල්පත්වල අගය ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම වගකීම්වල ඇතුළත් කෙරේ. භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර සහ මාර්ග බිල්පත් එක් වසරකට පසුව කල්ඉකුත් වී සහ භාවිතයට නොගෙන පවතින්නේ නම් ආදායම වශයෙන් හඳුනාගැනේ.
iii. ගුවන්තොටුපළ පර්යන්ත සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ අදාළ සේවා සැපයීමෙන් පසුවය.
iv. තෙවන පාර්ශ්ව නඩත්තු සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ එකී කටයුතු නිමවීමෙන් අනතුරුවය.
v. ගුවන් ගමන් මෙහෙයුම් සේවා මත උපයන ආදායම හඳුනාගැනෙනුයේ අදාළ සේවා සැපයීමෙන් පසුවය.

#### (ආ) ගුවන් සේවා ආහාරපාන සේවාවලින් ලද ආදායම

**භාණ්ඩ විකිණීම**

පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා ගැණුම්කරු වෙත පැවරීමෙන් ආයතනය කාර්යසාධන වගකීම් තෘප්තිමත් කරන පරිදි සහ එසේ කරන විට සමූහය විසින් ආදායම හඳුනාගැනේ. අගය එකතු කළ විකුණුම් බදු ආදායමට අන්තර්ගත නොවන අතර ආදායම වෙළඳ වට්ටම් අඩු කිරීමෙන් පසු අගයට තීරණය වේ. හිඟ මුදල් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් සහ භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමනාකරණය සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් ඇත්නම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

#### (ඇ) ලාභාංශ ආදායම

කොටස් හිමියන්ට අදාළ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කෙරේ.

#### (ඈ) කුලී ආදායම

කුලී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී.

#### (ඉ) පොලී ආදායම

ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කළ සියලුම මූල්‍ය උපකරණ සඳහා, පොලී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොලී අනුපාතය යටතේය.

#### (ඊ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 2.4.19 වියදම් හඳුනාගැනීම

දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයුම අතර සෘජු සම්බන්ධය මත පදනම්ව ලාභ අලාභ ප්‍රකාශය යටතේ වියදම් හඳුනා ගැනේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපළ, පිරියත සහ උපකරණ පවත්වාගෙන යාම සහ කාර්යක්ෂම මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා භාවිත හිමිකම් වත්කම සඳහා දරන ලද සියලු වියදම් ලාභ අලාභ ප්‍රකාශයේ දක්වා ඇත. ලාභ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට,"වියදම්වල ස්වාභාවය" නැමැති ක්‍රමය අනුගමනය කර ඇති අතර සමූහයේ කාර්යසාධනය සම්බන්ධව අංග සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමේ පදනම මත එය අනුගමනය කර ඇත.

### 2.4.20 ණය ගැනුම් පිරිවැය

අපේක්ෂිත භාවිතයට හෝ විකිණීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් වැයවන, කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් සඳහා සෘජුවම වෙන්කළ හැකි ණය ලබාගැනීමේ පිරිවැය සහ වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලබන ඒවා හැර, අනෙක් ණය ගැනුම් පිරිවැය ඒවා දරනු ලබන කාලසීමාව තුළ වියදමක් ලෙස හඳුනාගැනේ.

### 2.4.21 ඛණ්ඩ වාර්තාකරණය

ඛණ්ඩයක් යනු සමූහය සම්බන්ධයෙන් හඳුනාගනු ලැබිය හැකි එක්තරා අංශයක් වන අතර අනෙකුත් ඛණ්ඩ වඩා වෙනස් ස්වරූපයක් ගත් අවදානම් සහ ප්‍රතිලාභවලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ නිරත වේ.

සමූහයේ අවදානම සහ ප්‍රතිලාභ අනුපාතය කෙරෙහි විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටුකිරීම යන සාධකය ප්‍රධාන ලෙස බලපෑම් ඇතිකරන බැවින් මෙහෙයුම් කටයුතුවල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික ඛණ්ඩ තීරණය කරනු ලැබේ. විකුණුම් මඟින් සැකසෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනෙනුයේ විකුණුම් සිදුකළ කලාපය වෙත ආදායම වෙන්කිරීම මඟිනි. නිශ්චිත ඛණ්ඩයකට සෘජුවම හඳුනාගත නොහැකි වියදම් වෙන් කොට හෙළිදරවු නොකෙරේ.

භූගෝලීය බෙදීම වෙත වත්කම් සහ අදාළ වගකීම් වෙන්කිරීම සඳහා කිසිදු සුදුසු පදනමක් නොපවතින බවට

කළමනාකරණය අදහස් කරයි. ඒ අනුව බණ්ඩ වත්කම්, බණ්ඩ වගකීම් සහ භූගෝලීය බෙදීම ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් අනාවරණය කරනු නොලබයි.

ව්‍යාපාර ඛණ්ඩය අනුව දෙවන වාර්තාකරණය, සමූහය විසින් සපයන ලද සේවාව මත රඳා පවතී. ගුවන් ප්‍රවාහන කටයුතුවල සහ සිය පරිපාලිත සමාගම ඔස්සේ ගුවන්යානාස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතු ලෙස සමූහයේ ප්‍රධාන ව්‍යාපාර ඛණ්ඩ දෙකක් යටතේ සිදුවෙයි.

### 2.5 නව ගිණුම්කරණ ප්‍රමිති නිකුත් කළ නමුත් මේ දක්වා ක්‍රියාත්මක නොවන ගිණුම්කරණ ප්‍රමිති

පහත සංශෝධන සහ වැඩිදියුණු කිරීම් සමාගමේ මූල්‍ය ප්‍රකාශය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කරනු නොලබයි.

- SLFRS 17- රක්ෂණ කොන්ත්‍රාත්තු
- LKAS 37 ප්‍රතිපාදන සඳහා සංශෝධන, අසම්භාව්‍ය වගකීම සහ අසම්භාව්‍ය වත්කමඃ කොන්ත්‍රාත්තු සම්පූර්ණ කිරීමේ භාරදූර ගිවිසුම් පිරිවැය
- LKAS 16 දේපළ, පිරියත සහ උපකරණ සඳහා සංශෝධනඃ අපේක්ෂිත භාවිතයට පෙර උත්පාදන
- SLFRS 3 ව්‍යාපාර සංයෝජන සඳහා සංශෝධනඃ සංකල්පනාත්මක රාමුව සඳහා යොමුවක් යාවත්කාල කිරීම

## 3. අඛණ්ඩ පැවැත්ම

සමාලෝචිත වර්ෂය තුළ, 2022 මාර්තු 31 දින වන විට සමූහය විසින් රුපියල් මිලියන 163,583.08 ක (2021 - රුපියල් මිලියන 49,704.51) අලාභයක් සහ රුපියල් මිලියන 529,212.71 ක (2021 - රුපියල් මිලියන 366,284.57) සමුච්චිත අලාභයක් වාර්තා කරන ලදි. තවද, සමූහයේ ජංගම වගකීම් රුපියල් මිලියන 292,420.15 කින් (2021 - රුපියල් මිලියන 214,635.95) එහි ජංගම වත්කම් ඉක්මවූ අතර වාර්තා කරන දිනට සමූහයේ මුළු හිමිකම් රුපියල් මිලියන 426,423.83 ක (2021 - ඍණ රුපියල් මිලියන 281,490.87) ඍණ අගයක් දක්වා අඩු වී තිබේ.

2022 මාර්තු 31 දින වන විට සමාගම විසින් රුපියල් මිලියන 166,369.68 ක (2021 - රුපියල් මිලියන 45,231.46) අලාභයක් සහ රුපියල් මිලියන 537,505.15 ක (2021 - රුපියල් මිලියන 371,733.52) සමුච්චිත අලාභයක් වාර්තා කරන ලදි. තවද, සමාගමේ ජංගම වගකීම් රුපියල් මිලියන 302,702.50 කින් (2021 - රුපියල් මිලියන 221,309.99) එහි ජංගම වත්කම් ඉක්මවූ අතර වාර්තා කරන දිනට සමාගමේ මුළු හිමිකම් රුපියල් මිලියන 437,036.92 ක (2021 - ඍණ රුපියල් මිලියන 289,265.27) ඍණ අගයක් දක්වා අඩු වී තිබේ.

2020 මුල් භාගයේදී කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීමත් සමඟ ගුවන් සේවා කර්මාන්තයේ මෙහෙයුම් පරිසරයට දැඩි බලපෑමක් එල්ල විය. පසුගිය මූල්‍ය වර්ෂය තුළ ලොව පුරා දේශසීමා සංචාර සීමා කිරීම් හේතුවෙන් ගුවන් සේවයේ මූලික ව්‍යාපාරය වන මගී ප්‍රවාහනය බරපතළ අන්දමින් අඩාල විය. කෙසේ වෙතත්, වසංගතයේ උච්චතම අවස්ථාවේ පනවා තිබූ දැඩි දේශසීමා පාලනයන් ලිහිල් කිරීමට රටවල් කටයුතු කිරීමත් සමඟ සමාලෝචිත වසරේ අවසන් මාස හතර තුළ මගී ගමනාගමනය යථා තත්ත්වයට පත් විය. පසුගිය මූල්‍ය වර්ෂය තුළ ඇරඹි ප්‍රවණතාවය පවත්වාගෙන යමින් ගුවන් භාණ්ඩ මෙහෙයුම් ආදායම සඳහා ප්‍රධාන දායකත්වයක් සපයන්නෙකු බවට පත් විය.

අනාගත මුදල් ප්‍රවාහයට හිතකර ලෙස බලපානු ඇතැයි අපේක්ෂිත, ගුවන් යානා බදු දෙන්නන් ඇතුළු ප්‍රධාන සැපයුම්කරුවන් සමඟ විලම්බිත ගෙවීම් සැලසුම් සහ සහන පිළිබඳ සාකච්ඡා කිරීම සහ එහි පිරිවැය ව්‍යුහය ප්‍රශස්ත කිරීම මගින් මුදල් සම්පත් සුරැකීමට සමාගම පියවර කිහිපයක් ගෙන තිබේ.

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා රජය (GOSL) විසින් නව හිමිකරු ප්‍රාග්ධනය ලබා දීම මගින් සමාගමට අඛණ්ඩව සහය දක්වන ලදි. ඒ අනුව, වසංගතයෙන් පසු සමාගමට ලද ප්‍රාග්ධනයේ දෙවන වාරිකය වන රුපියල් බිලියන 18 ක මුදල 2021 අප්‍රේල් මස ලැබුණි (රුපියල් බිලියන 27.7 ක පළමු වාරිකය 2020 නොවැම්බර් මස ලැබුණි). තවද, එම කාලසීමාව තුළ කල් ඉකුත් වූ ඇමරිකානු ඩොලර් මිලියන 240.5 ක සහ ශ්‍රී ලංකා රුපියල් බිලියන 35.8 ක වටිනාකමකින් යුතු සියලු සහනදායී ලිපි සහ භාණ්ඩාගාර ඇපකර කෙටිකාලීන ණය පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කිරීමේ අරමුණ ඇතිව, රාජ්‍ය බැංකු දෙකක අනුග්‍රහය යටතේ නැවත නිකුත් කිරීමට ශ්‍රී ලංකා රජය විසින් මහා භාණ්ඩාගාරය හරහා අනුමැතිය ලබා දෙන ලදි.

තවද, 2022 ඔක්තෝම්බර් 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින්, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවය ප්‍රතිපත්තිමය වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් අනුමත කරන ලද අතර එයට පියවර කිහිපයක් අතුළත් වේ. අමාත්‍ය මණ්ඩලය විසින් එයම මුදල් අමාත්‍යාංශයේ SOE ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයේ නිරීක්ෂණ සහ නිර්දේශ සඳහාද යොමු කරනු ලැබ තිබේ.

2022 නොවැම්බර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතිස්ථාපන ගුවන්යානා හරහා ගුවන් යානා දහයකට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා පවත්වන ගුවන් යානා ප්‍රතිස්ථාපන අභ්‍යාසය හෝ පවතින ගුවන් යානා කල්බදු දීර්ඝ කිරීම හෝ ඒ දෙකේම එකතුවක් අනුමත කරනු ලැබ තිබේ.

තවද, 2022 ඔක්තෝම්බර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මඟින් සහ 2022 නොවැම්බර් 08 වන දින භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය මඟින් යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම අවසන් වන තුරු "අඛණ්ඩ පැවැත්මක්" වශයෙන් සමාගමට සිය මෙහෙයුම් කටයුතු කරගෙන යාමට අවශ්‍ය මූල්‍ය ආධාර අඛණ්ඩව ලබා දෙන බව ශ්‍රී ලංකා රජය විසින් තහවුරු කර තිබේ.

එමෙන්ම, රජය සතු ව්‍යාපාරයන්හි ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයේ අධ්‍යයනය පදනම් කරගනිමින්, ශ්‍රීලංකන් කේටරින් සමාගම ඇතුළුව ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ක්‍රමවත්ව පැවරීම ශ්‍රී ලංකා රජය විසින් 2023 මාර්තු 13 වැනි දින පැවති කැබිනට් රැස්වීමේදී අනුමත කර ඇත. එමෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ණය සහ ශේෂ පත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මූල්‍ය උපදේශකයෙකු පත් කිරීමට ද අවසර දී ඇත.

අපේක්ෂිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාකාරකම් ඇතුළුව ඉහත විස්තර කර ඇති ක්‍රියාමාර්ග අනාගතයේදී සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය වැඩිදියුණු කරනු ඇතැයි කළමණාකාරීත්වය විශ්වාස කරයි.

ඉහත කරුණු මත පදනම්ව, අඛණ්ඩ පැවැත්මක් ලෙස මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම යෝග්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 4. දේපළ, පිරියත සහ උපකරණ

### *4.1 සමූහය*

| | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | පිරියත සහ උපකරණ රු. මිලියන | බදු මත ගුවන්යානා වැඩිදියුණු කිරීම් රු. මිලියන | ගුවන්යානා ආශ්‍රිත උපකරණ රු. මිලියන | අත්තිකාරම් / ප්‍රාග්ධන නොනිමි වැඩ රු. මිලියන | එකතුව 2022 රු. මිලියන | එකතුව 2021 රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 4,568.60 | 9,852.43 | 1,911.92 | 9,719.47 | 23.24 | 26,075.66 | 26,017.05 |
| අත්පත් කරගැනීම්/නවීකරණයන්/ වැඩිදියුණු කිරීම් | 27.21 | 221.20 | 39.86 | 156.15 | 29.80 | 474.22 | 361.79 |
| කාර්ය ප්‍රාග්ධනයෙන් මාරු කරන ලද | 19.35 | 29.12 | - | - | (48.47) | - | - |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | (26.37) | - | (35.38) | - | (61.75) | (303.18) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 4,615.16 | 10,076.38 | 1,951.78 | 9,840.24 | 4.57 | 26,488.13 | 26,075.66 |
| සමුච්චිත ක්ෂයවීම | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 913.45 | 7,807.45 | 1,795.19 | 8,331.06 | - | 18,847.15 | 17,567.54 |
| වසර සඳහා අයකිරීම | 311.08 | 672.14 | 55.46 | 410.16 | - | 1,448.84 | 1,579.95 |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | (23.22) | - | (35.38) | - | (58.60) | (300.34) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 1,224.53 | 8,456.37 | 1,850.65 | 8,705.84 | - | 20,237.39 | 18,847.15 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 3,390.63 | 1,620.01 | 101.13 | 1,134.40 | 4.57 | 6,250.74 | 7,228.51 |

## 4. දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)

*4.2* *(අ)* සමාගමෙහි ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී රන්ජන් ජේ. සමරකෝන් මහතා (ඒ.අයි.වී. ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) විසින් සිදු කරන ලද ප්‍රත්‍යාගණනයක් ඔස්සේ වන අතර, 2019 මාර්තු 31 දිනට ඉඩම් සහ ගොඩනැගිලි හා පරිපාලිතයෙහි මුළුතැන්ගෙයි උපකරණවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයෙහි සංස්ථාපිත තක්සේරුකරු පී.එච්.ඒ.පී.කේ. ප්‍රනාන්දු මහතා විසිනි.

තක්සේරුකරණයේදී ප්‍රකාශිත සමූහයේ ඉඩම්, ගොඩනැගිලි සහ වෙනත් පිරියත හා උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ;

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරුකරණයේ බලාත්මක දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | ප්‍රත්‍යාගණනයන්වල වටිනාකම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධුරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | **විවෘත වෙළඳපොළ අගය** නැවත අගය කළ දේපළවල සාධාරණ අගය හඳුනාගැනීමේ දී සාධාරණීය මෑත කාල සීමාව තුළ සමාන දේපළවල විකුණුම් මිල ගණන් මෙම ක්‍රමය මගින් සලකා බලනු ලබයි. මෙය දේපළවල ප්‍රමාණයේ වෙනස, ස්වභාවය සහ පිහිටීම අනුව අවශ්‍ය වෙනස්කම් කරමින් වත්මන් සක්‍රීය වෙළඳපොළෙහි සමාන වත්කම් ඇගයීම පාදක කරගනී. | 18 මාර්තු 31 | පර්චස් 1 ක ඇස්තමේන්තුගත මිල රු. මිලියන 18 | 643.50 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| ගොඩනැගිලි - කොළඹ/කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන ක්‍රමවේදය** වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශනයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය මගින් සලකනු ලබයි. | 18 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 643.47 - රු. 8,092.50 | 2,083.98 | | |
| පරිපාලිතය | | | | | | |
| ගොඩනැගිලි - කටුනායක | **ආදායම් ක්‍රමවේදය** නිශ්චිත සාධක සමග සම්බන්ධකර, දේපළ මගින් උත්පාදනය කරන ශුද්ධ ආදායම්, එහි සාධරණ අගය ගණනයට භාවිත කරයි. | 19 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 4,000 - රු. 16,000 | 1,565.49 | | |
| පිරියත සහ උපකරණ යටතේ ඇතුළත් කළ ගුවන් සේවා මුළුතැන්ගෙයි උපකරණ - කටුනායක | **ක්ෂයවීම් ප්‍රතිස්ථාපන ක්‍රමවේදය** වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශනයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය මගින් සලකනු ලබයි. | 19 මාර්තු 31 | එක් එක් උපකරණය සඳහා ශුද්ධ ප්‍රතිස්ථාපන පිරිවැය ක්‍රමවේදය (NRC) යොදා ගනිමින් සාධාරණ අගය ගණනය කෙරිණි. | 1,099.82 | | |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 4. දේපළ, පිරියත සහ උපකරණ (සබැදේ)

වත්කම් පිරිවැය අඩුකිරීම ක්ෂයවීම් වශයෙන් ධාරණය කරනු ලැබුණි නම්, මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කළ හැකිව පැවති ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය පහත දැක්වෙන පරිදි වේ:

| වත්කමෙහි පන්තිය | පිරිවැය<br>රු. මිලියන | වත්කම පිරිවැය අනුව ධාරණය කරනු ලැබුනේ නම් සමුච්චිත ක්ෂය<br>රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2022<br>රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2021<br>රු. මිලියන |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 3,064.75 | 2,260.97 | 803.78 | 942.04 |
| පිරියත සහ උපකරණ | 2,492.74 | 2,206.55 | 286.19 | 359.34 |

*(අ)* වසර තුළ, සමූහය විසින් රුපියල් මිලියන 474.22 ක (2021 රුපියල් මිලියන 361.79) සමස්ත වටිනාකමකින් යුතු දේපළ පිරියත සහ උපකරණ අත්පත් කර ගැනිණි. වසර තුළ, දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම සඳහා රුපියල් මිලියන 490.55 ක (2021 රුපියල් මිලියන 319.95) වටිනාකමකින් යුතු මුදල් ගෙවීම සිදු කරන ලදී.

*(ආ)* සමූහයේ සහ සමාගමේ දේපළ පිරියත සහ උපකරණ අතරට රුපියල් මිලියන 13,230.51 ක ශුද්ධ ධාරණ වටිනාකමකින් යුතු (2021 රුපියල් මිලියන 12,434.05) පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ද ඇතුළත් වේ.

*(ඇ)* බැංකු පහසුකම් සඳහා උකස් කරන ලද දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් නොමැත.

### 4.3 සමාගම

| | ඉඩම් සහ ගොඩනැගිලි<br>රු. මිලියන | පිරියත සහ උපකරණ<br>රු. මිලියන | බදු මත ගුවන්යානා වැඩිදියුණු කිරීම්<br>රු. මිලියන | ගුවන්යානා ආශ්‍රිත උපකරණ<br>රු. මිලියන | අත්තිකාරම් /ප්‍රාග්ධන නොනිම් වැඩ<br>රු. මිලියන | එකතුව 2022<br>රු. මිලියන | එකතුව 2021<br>රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ප්‍රත්‍යාගණනය** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 2,970.34 | 8,400.73 | 1,911.92 | 9,719.47 | 7.55 | 23,010.01 | 22,981.87 |
| අත්පත් කරගැනීම්/ නවීකරණයන්/ වැඩිදියුණු කිරීම් | 12.55 | 110.42 | 39.86 | 156.15 | 29.80 | 348.78 | 324.77 |
| කාර්ය ප්‍රාග්ධනයෙන් මාරු කරන ලද | 3.66 | 29.12 | - | - | (32.78) | - | - |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | (19.26) | - | (35.38) | - | (54.64) | (296.63) |
| මාර්තු 31 දිනට ශේෂය | 2,986.55 | 8,521.01 | 1,951.78 | 9,840.24 | 4.57 | 23,304.15 | 23,010.01 |
| **සමුච්චිත ක්ෂයවීම** | | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 745.90 | 7,234.66 | 1,795.19 | 8,331.06 | - | 18,106.81 | 17,214.59 |
| වසර සඳහා අයකිරීම | 223.61 | 356.47 | 55.46 | 410.16 | - | 1,045.70 | 1,188.85 |
| බැහැර කිරීම්/විශ්‍රාම ගැනීම් | - | (19.26) | - | (35.38) | - | (54.64) | (296.63) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 969.51 | 7,571.87 | 1,850.65 | 8,705.84 | - | 19,097.87 | 18,106.81 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 2,017.04 | 949.14 | 101.13 | 1,134.40 | 4.57 | 4,206.28 | 4,903.20 |

## 4. දේපළ, පිරියත සහ උපකරණ (සබැදේ)

**4.4 අ)** සමාගමෙහි ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය තීරණය කරන ලද්දේ, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර තුළදී ස්වාධීන තක්සේරුකරුවෙකු වන රන්ජන් ජේ. සමරකෝන් මහතා (ඒ.අයි.වී. ශ්‍රී ලංකා - ආයතනික තක්සේරුකරු) විසින් සිදු කරන ලද ප්‍රත්‍යාගණනයක් ඔස්සේය. 2018 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය ප්‍රකාශයන්හි එම ප්‍රත්‍යාගණනයන්වල ප්‍රතිඵලයන් අන්තර්ගත කර ඇත.

තක්සේරුකරණයේ සඳහන් කරන ලද සමාගමේ ඉඩම් සහ ගොඩනැගිලිවල තොරතුරු පහත දැක්වේ.

| වත්කම | තක්සේරු ක්‍රමවේදය | තක්සේරුකරණයේ බලාත්මක දිනය | සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් | සාධාරණ අගයෙහි ධුරාවලි මට්ටම රු. මිලියන | නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙත සාධාරණ අගයෙහි සංවේදීතාව | සාධාරණ අගයෙහි ධුරාවලි මට්ටම |
|---|---|---|---|---|---|---|
| ඉඩම - කොළඹ | **විවෘත වෙළඳපොළ අගය** නැවත අගය කළ දේපළවල සාධාරණ අගය හඳුනාග ැනීමේ දී සාධාරණීය මෑත කාල සීමාව තුළ සමාන දේපළවල විකුණුම් මිල ගණන් මෙම ක්‍රමය මගින් සලකා බලනු ලබයි. මෙය දේපළවල ප්‍රමාණයේ වෙනස, ස්වභාවය සහ පිහිටීම අනුව අවශ්‍ය වෙනස්කම් කරමින් වත්මන් සක්‍රීය වෙළඳපොළෙහි සමාන වත්කම් ඇගයීම පාදක කරගනී. | 18 මාර්තු 31 | පර්චස් 1 ක ඇස්තමේන්තුගත මිල රුපියල් මිලියන 18 | 643.50 | ධනාත්මක ලෙස සහසම්බන්ධිත සංවේදීතාවය | මට්ටම 3 |
| ගොඩනැගිලි - කොළඹ / කටුනායක | ක්ෂයවීම් ප්‍රතිස්ථාපන ක්‍රමවේදය වත්කමක් එහි වර්තමානයේ වත්කමකට ආදේශනයෙන් සමාන වත්මන් පිරිවැය භෞතික ක්ෂයවීම් සඳහා අවම අඩුකිරීමකින් සහ අදාළ සියලු අවභාවිතයන් සහ ප්‍රශස්තකරණ ස්වරූප මෙම ක්‍රමය මගින් සලකනු ලබයි. | 18 මාර්තු 31 | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල රු. 643.47 - රු. 8,092.50 | 2,083.98 | | |

වත්කම් පිරිවැය අඩුකිරීම ක්ෂයවීම් වශයෙන් ධාරණය කරනු ලැබුණි නම්, මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කළ හැකිව පැවති ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය පහත දැක්වෙන පරිදි වේ:

| වත්කමෙහි පන්තිය | පිරිවැය රු. මිලියන | වත්කම පිරිවැය අනුව ධාරණය කරනු ලැබුවේ නම් සමුච්චිත ක්ෂය රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2022 රු. මිලියන | ශුද්ධ ධාරණ වටිනාකම 2021 රු. මිලියන |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 1,239.49 | 958.38 | 281.11 | 306.63 |

**ආ)** වසර තුළ, සමූහය විසින් රුපියල් මිලියන 348.78 ක (2021 රුපියල් මිලියන 324.77) සමස්ත වටිනාකමකින් යුතු දේපළ පිරියත සහ උපකරණ අත්පත් කර ගැනිණි. වසර තුළ, දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම සඳහා රුපියල් මිලියන 365.11 ක (2021 රුපියල් මිලියන 282.82) වටිනාකමකින් යුතු මුදල් ගෙවීම සිදු කරන ලදී.

**ඇ)** සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ අතරට රුපියල් මිලියන 13,230.51 ක ශුද්ධ ධාරණ වටිනාකමකින් යුතු (2021 රුපියල් මිලියන 12,434.05) පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ද ඇතුළත් වේ.

**ඈ)** බැංකු පහසුකම් සඳහා උකස් කරන ලද දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් නොමැත.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 5. භාවිත හිමිකම් වත්කම්

### 5.1 භාවිත හිමිකම් වත්කම් සංචලනය

| සමූහය | ගුවන්යානා සහ අමතර එන්ජින් රු. මිලියන | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | වාහන රු. මිලියන | ගුවන්යානා සමාකෘතිය රු. මිලියන | එකතුව 2022 රු. මිලියන | එකතුව 2021 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| අප්‍රේල් 01 දිනට ශේෂය | 122,880.85 | 1,804.08 | 69.16 | 2,500.45 | 127,254.54 | 138,754.60 |
| එකතු කිරීම් | 1,375.09 | 265.73 | 9.14 | 1,010.50 | 2,660.46 | 33.27 |
| බැහැර කිරීම් | - | (103.84) | (1.80) | - | (105.64) | (18.20) |
| ගැළපීම් | 898.83 | 44.82 | - | - | 943.65 | (11,515.11) |
| **මාර්තු 31 දිනට ශේෂය** | 125,154.77 | 2,010.79 | 76.50 | 3,510.95 | 130,753.01 | 127,254.56 |
| **ක්ෂයවීම්** | | | | | | |
| **අප්‍රේල් 01 දිනට ශේෂය** | 31,915.25 | 710.12 | 59.67 | 2,113.62 | 34,798.66 | 19,670.87 |
| ක්ෂයවීම | 12,645.69 | 277.78 | 8.95 | 236.95 | 13,169.37 | 15,129.23 |
| බැහැර කිරීම් | - | (42.21) | (1.70) | - | (43.91) | (1.42) |
| ගැළපීම් | - | 20.53 | - | - | 20.53 | - |
| **මාර්තු 31 දිනට ශේෂය** | 44,560.94 | 966.22 | 66.92 | 2,350.57 | 47,944.65 | 34,798.68 |
| **මාර්තු 31 දිනට ශුද්ධ පොත් අගය** | 80,593.83 | 1,044.57 | 9.58 | 1,160.38 | 82,808.36 | 92,455.88 |

| සමාගම | ගුවන්යානා සහ අමතර එන්ජින් රු. මිලියන | ඉඩම් සහ ගොඩනැගිලි රු. මිලියන | වාහන රු. මිලියන | ගුවන්යානා සමාකෘතිය රු. මිලියන | එකතුව 2022 රු. මිලියන | එකතුව 2021 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| **අප්‍රේල් 01 දිනට ශේෂය** | 122,880.85 | 1,186.33 | 69.16 | 2,500.45 | 126,636.79 | 138,136.84 |
| එකතු කිරීම් | 1,375.09 | 252.49 | 9.14 | 1,010.50 | 2,647.22 | 33.27 |
| බැහැර කිරීම් | - | (103.84) | (1.80) | - | (105.64) | (18.20) |
| ගැළපීම් | 898.83 | - | - | - | 898.83 | (11,515.11) |
| මාර්තු 31 දිනට ශේෂය | 125,154.77 | 1,334.98 | 76.50 | 3,510.95 | 130,077.20 | 126,636.80 |
| **ක්ෂයවීම** | | | | | | |
| **අප්‍රේල් 01 දිනට ශේෂය** | 31,915.25 | 377.18 | 59.67 | 2,113.62 | 34,465.72 | 19,385.10 |
| ක්ෂයවීම | 12,645.69 | 224.50 | 8.95 | 236.95 | 13,116.09 | 15,082.05 |
| බැහැර කිරීම් | - | (42.21) | (1.70) | - | (43.91) | (1.42) |
සමාගමෙහි ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන අතරතුර සමාගමට එරෙහිව ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් හෝ සේවකයින් විසින් නෛතික ක්‍රියාමාර්ග, වෙනත් හිමිකම්පෑම් හෝ අනාගත හිමිකම්පෑම් සිදුකිරීම හේතුවෙන් කවර හෝ අසම්භාව්‍ය වගකීමක් ආශ්‍රිත කිසිදු සැලකිය යුතු යුතු වගකීමක් උද්ගත වේ යැයි අධ්‍යක්ෂවරුන් විසින් අපේක්ෂා නොකෙරෙන බැවින්, මෙම මූල්‍ය ප්‍රකාශයන්හි කිසිදු ප්‍රතිපාදනයක් සිදුකොට නොමැත.

**පරිපාලිතය**

සමාගමෙහි නීතිඥවරුන්ගේ මතය අනුව, සමාගමෙහි අනාගත මෙහෙයුම්වල වාර්තා කරන ලද ප්‍රතිඵලයන් කෙරෙහි බලපෑමක් ඇති කරන්නා වූ කම්කරු උසාවි නඩු කටයුතු කිහිපයක් හැර සමාගමට එරෙහිව කිසිදු අසම්පූර්ණ නඩු කටයුත්තක් නොමැත. මෙම නඩු සඳහා රුපියල් මිලියන 5.28 ක් තැන්පත් කරනු ලැබ ඇත.

එසේම බදු අභියාචනාවකට අදාළව රුපියල් මිලියන .81 ක් තැන්පත් කරනු ලැබ ඇත.

## 26. ඇපයට තබන ලද වත්කම්

***සමූහය/සමාගම***

ලබාගත් පහසුකම්වලට, ඇපයට තබන ලද වත්කම් පිළිබඳ විස්තර සඳහා සටහන 15.2 බලන්න.

## 27. වාර්තා කරන දිනට පසු සිදුවීම්

***සමූහය/සමාගම***

වාර්තා කරන දිනට පහත සඳහන් සිද්ධීන්ට අමතරව මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපුම් හෝ හෙළිකිරීම් කළයුතු වෙනත් සැලකිය යුතු සිද්ධීන් නොමැත.

### 27.1 කෙටි කාලීන ණය නැවත සාකච්ඡා කිරීම

සටහන 15.2 හි අනාවරණය කර ඇති පරිදි, මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලැබීමට පෙර ගෙවිය යුතු රුපියල් මිලියන 92,556.79 ක කාලීන පහසුකම් ආපසු ගෙවීමේ දිනයන්, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කර ඇති අදාළ භාණ්ඩාගාර ඇපකර සහ සහනදායී ලිපිය සමඟ වාර්තා කරන දිනට අනතුරුව දීර්ඝ කර ඇත.

### 27.2 ගුවන් යානා ප්‍රතිස්ථාපන

2022 නොවැම්බර් 28 දිනැති කැබිනට් තීරණය අනුව, ශ්‍රී ලංකා රජය විසින් ගුවන් යානා ප්‍රතිස්ථාපනය හරහා ගුවන් යානා දහයකට නොවැඩි ප්‍රමාණයක් ප්‍රතිස්ථාපනය කිරීමට, පවතින ගුවන් යානා කල්බදු දීර්ඝ කිරීම හෝ ක්‍රියාවලි දෙකම අනුමත කර ඇත.

### 27.3 ජාත්‍යන්තර බැඳුම්කර පැහැර හැරීම

සමාගම විසින් 2022 දෙසැම්බර් 25 දිනට නියමිතව තිබූ කූපන් පොලී ගෙවීම සිදු නොකරන ලදී. මෙම බැඳුම්කර ජාත්‍යන්තර ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද විලම්භ කාලයන් යටතේ පවතී.

ඒ අනුව, සමාගම විසින් 2022 දෙසැම්බර් මස සහ 2023 ජුනි මස ගෙවිය යුතු පොලී 2023 දෙසැම්බර් දක්වා කල් දැමීමට සහ 2023 ජනවාරි 17 වැනි දින අවසන් කරන ලද පෙරනිමි සිදුවීම්වල මාස 12 ක තාවකාලික ප්‍රතික්ෂේප කිරීම සඳහා 2022 දෙසැම්බර් 22 දින බැඳුම්කර දරන්නන් සමඟ අනුමැති ලබා ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී.

2023 ජනවාරි 25 දිනට අදාළ සහන කාලය අවසන් වීමෙන් පසුව, ගෙවීම පැහැර හැරීමේ සිදුවීමක් සිදුවී ඇති අතර එය අඛණ්ඩව පවතී. පසුගිය කාලය තුළ ගෙවිය යුතු පොලී බැඳුම්කර හිමියන්ට සම්පූර්ණයෙන්ම ගෙවා ඇත. ඉදිරියේදී ස්ථාවර සහ සාධාරණ විසඳුමක් ගවේෂණය සඳහා බැඳුම්කර හිමියන් සමඟ සම්බන්ධ වීමට සමාගම සැලසුම් කරනු ලබයි.

## 28. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්

### 28.1 සමූහය සහ සමාගම

#### 28.1.1 ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් සමඟ ගනුදෙනු (KMP)

සම්බන්ධිත පාර්ශ්වයන් අතරට සමාගමෙහි සහ එහි පරිපාලිතයෙහි ක්‍රියාකාරකම් සැලසුම්කරණය නියම කිරීම සහ මෙහෙයවීමේ අධිකාරීත්වය හා වගකීම සහිත පුද්ගලයින් වශයෙන් නිර්වචනය කෙරෙන ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් ඇතුළත් වේ. එවැනි ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් අතරට සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී සහ ඉහත දක්වන ලද ක්‍රියාපටිපාටිය සපුරාලනු ලබන අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ විධායක නිලධාරීන් ඇතුළත් වේ.

සමූහය සහ සම්බන්ධිත පාර්ශ්වයක් අතර කවර හෝ ගනුදෙනුවක් සිදු කළ යුතු බවට නියම කර ඇති සමූහය/ සමාගම් ප්‍රතිපත්තියට අනුකූලව (සමාගමෙහි සම්බන්ධිතයන්, අධ්‍යක්ෂවරුන්, සේවකයින් හෝ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින්ට උනන්දුවක් ඇති විට) අනාවරණය කරන අතර ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයන් විසින් සිදුකරන ලද අදාළ ප්‍රකාශන සලකා බලා ඇත.

(අ) වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළදී ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයන් විසින් ව්‍යාපාරයෙහි සාමාන්‍ය ක්‍රියාකාරකම්වලදී සිදුකරන ලද කැපී පෙනෙන ගනුදෙනු පහත දැක්වේ;

| | 2022<br>රු. මිලියන | 2021<br>රු. මිලියන |
|---|---|---|
| කෙටි කාලීන ප්‍රතිලාභ | 208.62 | 215.73 |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ | 35.66 | 32.36 |
| සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ | 4.96 | 22.46 |

වසර තුළදී අධ්‍යක්ෂවරුන්ට වරප්‍රසාද සහ අනෙකුත් ස්ථිර ගුවන් ටිකට්පත් ලබාදී නොමැත. ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයෝ සහ ඔවුන්ගේ කාලත්‍රයෝ සහ යැපෙන දරුවෝද පවතින ආසන අනුව නොමිලේ ගුවන් ටිකට්පත් ලබාගැනීමේ සුදුසුකම් ලබති.

(ආ) සමූහයේ ප්‍රමුඛ කළමනාකාරණ වෘත්තිකයින් වසර තුළදී සමූහය සමඟ වෙළඳ ගනුදෙනු සිදුකරන ලද වෙනත් සමාගම්වල ධූරයන් දරන අතර ඒවා පහත දැක්වෙන පරිදි හඳුනාගැනේ;

- සමූහයෙහි සභාපති අශෝක පතිරගේ මහතා පිළිවෙළින් සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි, ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි, සහ ඔඩෙල් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ/අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරයි. වසර තුළදී සමූහය විසින් ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී සමඟ රුපියල් මිලියන 21.75 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදු කළ අතර, 2022 මාර්තු 31 දිනට හිඟ ශේෂය රුපියල් මිලියන 0.01 කි. සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී සමඟ රුපියල් මිලියන 10.75 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදු කළ අතර, 2022 මාර්තු 31 දිනට හිඟ ශේෂය රුපියල් මිලියන 0.08 කි. (2020/2021 - සමූහය සම්බන්ධිත සමාගම් සමඟ රුපියල් මිලියන 19.18 වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත)
- සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වන ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා, අධ්‍යක්ෂ/කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් ආසියාටා සමාගම් සමූහයේ සේවය කරන අතර, ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් පුද්ගලික සමාගම සහ ඩයලොග් ටෙලිවිෂන් පුද්ගලික සමාගම් අනුබද්ධිතයන්හි අධ්‍යක්ෂ ලෙස සේවය කරනු ලබයි. වසර තුළදී සමූහය ඩයලොග් ආසියාටා පීඑල්සී සමඟ රුපියල් මිලියන 4.56 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත. 2022 මාර්තු 31 දිනට හිඟ ශේෂය රුපියල් මිලියන 0.77 කි (2020/2021 - වසර තුළදී සමූහය සම්බන්ධිත සමාගම් සමඟ රුපියල් මිලියන 2.57 වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත).
- සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වන ජයන්ත් පෙරේරා මහතා, මැක්ලරන්ස් සමාගම් සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරනු ලබයි. වසර තුළදී සමූහය මැක්ලරන්ස් සමාගම් සමූහය සමඟ රුපියල් මිලියන 0.87 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇති අතර 2022 මාර්තු 31 දිනට හිඟ ශේෂයක් නැත.
- සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු වන සංජය මොහොට්ටාල මහතා, BOI හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරනු ලබයි. වසර තුළදී BOI සමඟ සමූහය රුපියල් මිලියන 5.94 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇති අතර 2022 මාර්තු 31 දිනට හිඟ ශේෂයක් නැත.

## 28. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් (සබැඳේ)

### 28.1 සමූහය සහ සමාගම (සබැඳේ)

### 28.2 සමූහය

සමාගමේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා රජය (GOSL) වෙත සමූහයේ පාලන කටයුතු සඳහා බලය ඇත.

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ශ්‍රී ලංකා රජය (GOSL) විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ පහත දැක්වෙන කරුණු ඇතුළුව සැලකිය යුතු ගනුදෙනු සිදු කර ඇත.

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනුවල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු / (ගෙවිය යුතු) ශේෂය | ලැබිය යුතු / (ගෙවිය යුතු) ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | 2022 රු. මිලියන | 2021 රු. මිලියන | 2022 රු. මිලියන | 2021 රු. මිලියන |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජයට අයත් | ඉන්ධන | (23,338.20) | (5,763.52) | (72,755.49) | (52,281.18) |
| | | විලම්බිත සැපයුම්කාර ගෙවීම් | - | - | (2,727.45) | (3,528.25) |
| | | ප්‍රමාද වූ මූලය පිරිවැය | (3,523.04) | (2,941.68) | (11,567.46) | (5,405.77) |
| ගුවන්තොටුපල හා ගුවන් සේවා (පුද්) සමාගම | රජයට අයත් | ගොඩබෑම්, ගුවන් පාලම්, මගී විවේකාගාර, කුලියට දීම, බලයලත් නියෝජිත ගාස්තු සහ කසළ නාශක ගාස්තු | (2,971.90) | (937.79) | (2,084.66) | (2,170.25) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජයෙන් පාලනය වන | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (4,657.97) | (466.60) | (1,607.33) | (150.72) |
| මිහින් ලංකා (පුද්) සමාගම | රජයට අයත් | ගබඩාව කුලියට දීම | 0.58 | 0.78 | 1,001.90 | 852.18 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (706.57) | (657.56) | - | - |
| ලංකා බැංකුව | රජයට අයත් | ණය | 200.75 | 1,413.90 | (45,077.51) | (34,402.50) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 2,443.58 | 362.76 |
| | | පොලිය | (3,490.51) | (3,349.14) | - | - |
| | | බැංකු අයිරා | - | - | (17,129.68) | (18,810.02) |
| මහජන බැංකුව | රජයට අයත් | ණය | - | 1,387.50 | (47,479.28) | (37,218.60) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 4.08 | 0.75 |
| | | බැංකු අයිරා | - | - | (4,394.01) | (4,307.11) |
| | | පොලිය | (2,871.61) | (2,903.90) | - | - |
| සේවක අර්ථසාධක අරමුදල | පරිපාලිතයේ කොටස් හිමිකරුවෙකි | වරණීය කොටස් ලාභාංශ | - | 16.40 | - | - |
| | | ණය පොල | - | 49.32 | - | - |
| | | 13.01% ඡන්ද බලය රහිත ආපසු ලබාගත හැකි සමුච්චිත (වසර 5) වරණීය කොටස් | - | (1,000.00) | - | - |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 28. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් (සබැඳේ)

### 28.1 සමූහය සහ සමාගම (සබැඳේ)

### 28.2 සමූහය (සබැඳේ)

වාර්තාකරණ දිනය වන විට, සමාගම ලංකා බැංකුවෙන් රුපියල් මිලියන 2,952.47 (2021 - රුපියල් මිලියන 2,090.09) බැංකු ඇපකර පහසුකම් භාවිත කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා රජය මඟින් පාලනය කරනු ලබන ආයතන වෙතින්/වෙත ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු/ගෙවිය යුතු සහ පොලී දරන වගකීම් යටතේ දක්වා ඇත.

වාර්තා කරන දිනට අදාළ පාර්ශ්වයන් හා සම්බන්ධ හානිකරණය සඳහා වූ ප්‍රතිපාදන සමූහය හා සමාගම සඳහා පිළිවෙළින් රුපියල් මිලියන 1,230.35 ක් සහ රුපියල් මිලියන 1,129.89 ක් (2021 - සමූහය සඳහා රුපියල් මිලියන 1062.82 ක් සහ සමාගම සඳහා රුපියල් මිලියන 994.31 ක්) විය.

සියලුම රජය මගින් පාලනය කෙරෙන/අදාළ ආයතනයන් සමග සිදුකරන ලද සියලු ගනුදෙනු සඳහා 'LKAS 24 - සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ' හි පවතින නිදහස් කිරීම් යොදා ගනිමින් සීමිත හෙළිදරවු කිරීම් සිදු කර ඇත.

### 28.3 සමාගම

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ශ්‍රී ලංකා රජය (GOSL) විසින් පාලනය කරනු ලබන පරිපාලිත සහ ආයතන සමඟ පහත දැක්වෙන කරුණු ඇතුළුව සැලකිය යුතු ගනුදෙනු සිදු කර ඇත.

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනුවල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු/(ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2022<br>රු. මිලියන | 2021<br>රු. මිලියන | 2022<br>රු. මිලියන | 2021<br>රු. මිලියන |
| සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම | පරිපාලිතය | භාණ්ඩ ප්‍රවාහන සේවා | 94.09 | 97.03 | - | - |
| | | යානාස්ථ ආහාරපාන සැපයීම සහ වෙනත් සේවා | (2,439.73) | (358.79) | (9,334.39) | (6,131.68) |
| | | ලාභාංශ | - | 3,659.63 | - | - |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජයට අයත් | ඉන්ධන | (23,266.45) | (5,784.17) | (72,755.49) | (52,281.18) |
| | | විලම්බිත සැපයුම්කාර ගෙවීම් | - | - | (2,727.45) | (3,528.25) |
| | | ප්‍රමාද වූ මූල්‍ය පිරිවැය | (3,523.04) | (2,941.68) | (11,567.46) | (5,405.77) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජයෙන් පාලනය වන | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (4,657.97) | (466.60) | (1,607.33) | (150.72) |
| මිහින් ලංකා (පුද්) සමාගම | රජයට අයත් | ගබඩාව කුලියට දීම | 0.58 | 0.78 | 1,001.90 | 852.18 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (706.57) | (657.56) | - | - |
| ලංකා බැංකුව | රජයට අයත් | ණය | 200.75 | 1,413.90 | (45,077.51) | (34,402.50) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 2,443.58 | 362.76 |
| | | පොලිය | (3,490.51) | (3,349.14) | - | - |
| | | බැංකු අයිරා | | | (17,129.68) | (18,810.02) |

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනුවල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු/(ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2022 රු. මිලියන | 2021 රු. මිලියන | 2022 රු. මිලියන | 2021 රු. මිලියන |
| මහජන බැංකුව | රජයට අයත් | ණය | - | 1,387.50 | (47,479.28) | (37,218.60) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 4.08 | 0.75 |
| | | බැංකු අයිරා | - | - | (4,394.01) | (4,307.11) |
| | | පොලිය | (2,871.61) | (2,903.90) | - | - |

වාර්තා කිරීමේ දිනය වන විට සමාගම විසින් බැංකුවේ රු. මිලියන 2,952.47 ක (2021 - රු. මිලියන 2,070.55) බැංකු ඇපකර පහසුකම භාවිත කර ඇත.

ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන ආයතනවල සිට/ දක්වා ඇති ශේෂයන් වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ/ ගෙවිය යුතු මුදල් සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පොලී දරන වගකීම් යටතේ දැක්වේ.

වාර්තාකරණ දින වන විට සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිත හානිකරණය සඳහා වෙන්කිරීම රුපියල් මිලියන 1,129.89 ක් (2021 - රුපියල් මිලියන 994.3) විය.

සියලුම රජය මගින් පාලනය කෙරෙන/අදාළ ආයතනයන් සමග සිදුකරන ලද සියලු ගනුදෙනු සඳහා 'LKAS 24- සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ' හි පවතින නිදහස් කිරීම් යොදා ගනිමින් සීමිත හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

## 29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

සමූහයේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වනුයේ ණය සහ ණය ගැනීම්, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම්වලිනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමූහයේ මෙහෙයුම් සඳහා මූල්‍ය සම්පාදනයයි. සමූහයේ මූල්‍ය වත්කම් සමන්විත වන්නේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ එහි මෙහෙයුම්වලින් සෘජුව ලබාගත් මුදල් සහ කෙටි කාලීන තැන්පතුවලිනි. සාංගමික කළමනාකරණය වරින් වර, පුළුල් අවදානම් කළමනාකරණ අනුකෘතිය විමර්ශනය කර යාවත්කාලීන කරන අතර, සැලකිය යුතු බලපෑමක් ඇති පහත සඳහන් මූල්‍ය අවදානම් හඳුනාගෙන ඇත.

(i) වෙළඳපොළ අවදානම
- පොලී අනුපාත අවදානම
- විනිමය අවදානම

(ii) ද්‍රවශීලතා අවදානම
(iii) ණය අවදානම

වෙළඳපොළ වෙනස්වීම් සහ අනෙකුත් මූල්‍යමය අවදානම් සහිත ක්‍රියාකාරකම්වල වෙනස්කම් පිළිබිඹු වන පරිදි සමූහය සිය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබන අතර, මේවා නියම ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අවදානම් හඳුනාගෙන මැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මගින් පාලනය වේ.

**(i) වෙළඳපොළ අවදානම**

**පොලී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළඳපළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොලී අනුපාතවල වෙනස් වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමග සමූහයේ දිගුකාලීන ණය බැඳීම් හා සම්බන්ධ වේ.

පොලී අනුපාත උච්චාවචනයන්හි බලපෑම අවම කිරීම සඳහා ගුවන් යානා කල්බදු ඇතුළු ස්ථාවර හා විචල්‍ය අනුපාත ණය ගැනීම් අතර ප්‍රශස්ත සමබරතාවයක් පවත්වා ගැනීම සමූහයේ ප්‍රතිපත්තියයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.

## 29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)

ණය සහ ණය ගැනීම් සඳහා පොලී අනුපාතවල සාධාරණ ලෙස වෙනස් විය හැකි සංවේදීතාව පහත වගුවේ ඉදිරිපත් කෙරේ. අනෙකුත් සියලුම විචල්‍යයන් නියතව පැවතුනහොත්, පහත සඳහන් පරිදි පාවෙන අනුපාත ණය ගැනීම් සඳහා වන බලපෑම මගින් බදුවලට පෙර සමූහ / සමාගම් අලාභයට බලපානු ඇත.

| | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | බදුවලට පෙර අලාභය මත බලපෑම | | බදුවලට පෙර අලාභය මත බලපෑම | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| පොලී අනුපාත ඉහළයාම/(පහළයාම) | | | | |
| +10% | 9,519.27 | 9,519.22 | 7,726.21 | 7,721.27 |
| -10% | (9,519.27) | (9,519.22) | (7,726.21) | (7,721.27) |

*පොලී අනුපාත ඉහළයාම, අලාභ ඉහළ යාම කෙරෙහි හේතු වේ.

**විදේශ විනිමය අනුපාත අවදානම**

විදේශ විනිමය අනුපාත අවදානම යනු විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. එහි විදේශ මුදල් ඒකක මගින් ආදායම, වියදම්, ණය ගැනීම් සහ වෙනත් මූල්‍ය උපකරණ නියම කර ඇති බැවින් සමූහය විදේශ විනිමය අනුපාතයේ උච්චාවචනයන්හි බලපෑමට නිරාවරණය වී ඇත

සමූහය සිය විදේශ විනිමය නිරාවරණය කළමනාකරණය කරනුයේ රිසිට්පත් තැබීම සහ ගෙවීම හැකිතාක් දුරට අදාළ මුදල් ඒකකවලින්ම ගැළපීමේ ප්‍රතිපත්තියක් මගිනි.

පහත දැක්වෙන වගුව මගින් සමූහයේ/ සමාගමේ බදුවලට පෙර අලාභයේ (වාර්තා කරන දිනය වන විට මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී වාර්තා වී ඇති හිඟ මුදල් වත්කම් සහ වගකීම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් හේතුවෙන්) එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රුපියල වෙනස් විය හැකි සංවේදීතාව පෙන්නුම් කරන අතර, සෙසු සියලුම විචල්‍යයන් නියතව පවතී. අනෙකුත් සියලුම මුදල් සඳහා සමූහය විදේශ මුදල් වෙනස්වීම්වලට නිරාවරණය වීම ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරයි.

| | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | බදුවලට පෙර අලාභය මත බලපෑම | | බදුවලට පෙර අලාභය මත බලපෑම | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| රුපියලට සාපේක්ෂව ඇ.ඩො. අගය ඉහළයාම/(පහළයාම) | | | | |
| +20% | 100,236.49 | 102,207.54 | 67,546.11 | 69,073.70 |
| -20% | (100,236.49) | (102,207.54) | (67,546.11) | (69,073.70) |

*ඇමරිකන් ඩොලරයේ අගය ඉහළයාම අලාභයන් ඉහළයාම කෙරෙහි හේතු වේ.

ඇමරිකන් ඩොලරයෙන් දක්වා ඇති වත්කම් සහ වගකීම් 2022 මාර්තු 31 දිනට වන ශ්‍රී ලංකා රුපියල් 294 (2020 රුපියල්. 200.5) වූ විනිමය අනුපාතයට පරිවර්තනය කරන ලදී.

## 29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)

### (ii) ද්‍රවශීලිතා අවදානම්

ද්‍රවශීලිතා අවදානම යනු සමූහය විසින් වර්තමාන හා අනාගත මුදල් බැඳීම්, එය ගෙවීමට නියමිත දිනයේදී සපුරාලීමට නොහැකි වීමේ අවදානමයි. දෛනික/සතිපතා/මාසික සහ වාර්ෂික මුදල් කළමනාකරණය සහ අයවැය ක්‍රියාවලියක් භාවිත කරමින් සමූහය එහි අරමුදල් හිඟවීමේ අවදානම නිරීක්ෂණය කරනු ලබයි. අවදානම අවම කිරීම සඳහා සමූහය විසින් දිගු කාලීන හා කෙටි කාලීන ණය, බැංකු අයිරා පහසුකම් සහ මූල්‍ය/මෙහෙයුම් කල්බදු ඇතුළු මූල්‍ය ආයතනවලින් විවිධ අරමුදල් ලබා ගනී.

ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම්ව සමූහයේ / සමාගමේ මූල්‍ය වගකීම්වල කල්පිරීමේ තොරතුරු පහත දැක්වෙන වගුවෙහි සාරාංශගත කොට දැක්වේ.

| 2022 | වට්ටම් නොකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඉල්ලීම මත<br>රු. මිලියන | මාස 3 ට අඩු<br>රු. මිලියන | මාස 3 සිට මාස 12 දක්වා<br>රු. මිලියන | වසර 2 සිට 5 දක්වා<br>රු. මිලියන | වසර 5 ට වැඩි<br>රු. මිලියන | එකතුව<br>රු. මිලියන | ධාරණ අගය<br>රු. මිලියන |
| **සමූහය** | | | | | | | |
| පොලී දරන වගකීම් | 21,523.70 | 33,038.27 | 65,847.47 | 56,852.25 | - | 177,261.69 | 168,134.95 |
| කල්බදු වගකීම | 0.17 | 10,768.36 | 32,305.09 | 155,528.06 | 40,776.09 | 239,377.77 | 211,727.51 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 5,424.85 | 4,039.89 | 12,046.30 | 25,758.16 | 3,783.25 | 51,052.45 | 51,052.45 |
| ගුවන් යානා නැවත භාරදීමේ පිරිවැය වගකීම | 355.76 | - | 1,795.08 | 2,405.84 | 4,303.62 | 8,860.30 | 8,860.30 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 127,379.17 | - | - | - | 127,379.17 | 127,379.17 |
| | 27,304.48 | 175,225.69 | 111,993.94 | 240,544.31 | 48,862.96 | 603,931.38 | 567,154.38 |
| **සමාගම** | | | | | | | |
| පොලී දරන වගකීම් | 21,523.70 | 33,038.27 | 65,847.47 | 56,852.25 | - | 177,261.69 | 168,134.95 |
| කල්බදු වගකීම | 0.17 | 10,725.38 | 32,176.14 | 154,977.44 | 40,440.83 | 238,319.97 | 210,669.68 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 5,424.85 | 4,039.89 | 12,046.30 | 25,758.16 | 3,783.27 | 51,052.47 | 51,052.45 |
| | 27,304.48 | 184,211.38 | 111,864.99 | 239,993.69 | 48,527.72 | 611,902.27 | 575,125.22 |

*මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තවදුරටත්.*

## 29. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)

| 2021 | වට්ටම් නොකළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඉල්ලීම මත රු. මිලියන | මාස 3 ට අඩු රු. මිලියන | මාස 3 සිට මාස 12 දක්වා රු. මිලියන | වසර 2 සිට 5 දක්වා රු. මිලියන | වසර 5 ට වැඩි රු. මිලියන | එකතුව රු. මිලියන | ධාරණ අගය රු. මිලියන |
| **සමූහය** | | | | | | | |
| පොලී දරන වගකීම් | 23,117.13 | 3,850.13 | 78,382.09 | 35,118.14 | - | 140,467.49 | 137,631.57 |
| කල්බදු වගකීම | 12,687.23 | 7,059.75 | 22,602.74 | 94,343.31 | 64,680.85 | 201,373.88 | 161,508.46 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 873.83 | 5,509.11 | 10,722.67 | 16,138.28 | 1,052.88 | 34,296.78 | 34,296.78 |
| ගුවන් යානා නැවත භාරදීමේ පිරිවැය සඳහා ප්‍රතිපාදන | 244.24 | - | - | 2,070.71 | 2,582.56 | 4,897.51 | 4,897.51 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 80,855.81 | - | - | - | 80,855.81 | 80,855.81 |
| | 36,922.43 | 97,274.80 | 111,707.50 | 147,670.44 | 68,316.29 | 461,891.47 | 419,190.13 |
| **සමාගම** | | | | | | | |
| පොලී දරන වගකීම් | 23,117.13 | 3,849.13 | 78,382.09 | 35,118.14 | - | 140,466.49 | 137,630.57 |
| කල්බදු වගකීම | 12,687.23 | 7,016.37 | 22,467.88 | 93,547.80 | 62,053.13 | 197,772.41 | 160,673.22 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 873.83 | 5,509.11 | 10,722.67 | 16,138.28 | 1,052.88 | 34,296.78 | 34,296.78 |
| ගුවන් යානා නැවත භාරදීමේ පිරිවැය සඳහා ප්‍රතිපාදන | 244.24 | - | - | 2,070.71 | 2,582.56 | 4,897.51 | 4,897.51 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 86,682.07 | - | - | - | 86,682.07 | 86,682.07 |
| | 36,922.43 | 103,056.68 | 111,572.64 | 146,874.93 | 65,688.57 | 464,115.26 | 424,180.15 |

**(iii) ණය අවදානම**

ණය අවදානම යනු මූල්‍ය අලාභයකට හේතුවන අයුරින් මූල්‍ය උපකරණයක් හෝ සේවාදායක ගිවිසුමක් යටතේ ප්‍රතිපාර්ශ්වයක් විසින් තමන්ගේ බැඳීම් ඉටු නොකිරීමේ අවදානමයි. සමූහය ප්‍රධාන වශයෙන් එහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (මූලික වශයෙන් වෙළඳ ලැබිය යුතු දේ) ණය අවදානමට නිරාවරණය වේ.

ගුවන් මඟී විකුණුම් සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහනය මූලික වශයෙන් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) බලයලත් අලෙවි නියෝජිතයන් හරහා සිදුකෙරේ. පුළුල් විවිධාංගීකරණය හේතුවෙන් එවැනි විකුණුම්වල ණය අවදානම සාපේක්ෂව සුළුය. මෙම නියෝජිතයින්ගෙන් පියවීම්, අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් සිය ගුවන් මඟී හා ගුවන් භාණ්ඩ බේරුම් කිරීමේ යෝජනා ක්‍රමය හරහා එකතු කරගනී. මෙම එක්රැස් කළ අරමුදල් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් සෘජුවම ගුවන් සමාගමට පියවන අතර එමගින් එකී නියෝජිතවරුන්ගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳව වැඩි සහතික කිරීමක් ලබා දෙනු ලැබේ.

ප්‍රධාන ගුවන් සමාගම් අතර ලැබිය යුතු දේ සහ ගෙවිය යුතු දේ මූලික වශයෙන් පියවනු ලබන්නේ අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමයේ නිෂ්කාශන මධ්‍යස්ථානය (IATA Clearing House) හරහාය. සාමාන්‍යයෙන් ලැබිය යුතු දෑ හා ගෙවිය යුතු දෑ හි ශුද්ධ අගය පියවනු ලබන්නේ සතියක කාල අන්තරයක් සහිතව වන අතර, එහිදී ගෙවීම් කඩ කිරීමේ අවදානමෙහි පැහැදිලි අඩුවීමක් සිදුවේ. වෙනත් සේවා සබඳතා සඳහා, සපයනු ලබන සේවාවන්හි ස්වභාවය සහ විෂය පථය අනුව ඇපකරයක් අවශ්‍ය වේ. ණය ගැතියන්ගේ එවැනි ඇපකරවලට බැංකු ඇපකර සහ සුරැකුම් තැන්පතු සහ වෙනත් යාන්ත්‍රණයන් ඇතුළත් වේ.

අවදානම් හඳුනාගත් විට ලැබිය යුතු දෑ අඩමාණ ගිණුම් සඳහා හානිකරණ ප්‍රතිපාදන සිදුකරයි.

**ප්‍රාග්ධන කළමනාකරණය**

මෙම මූල්‍ය ප්‍රකාශනවල සටහන 3 හි වඩාත් හොඳින් විස්තර කර ඇති ව්‍යාපාරික සැලැස්ම මත පදනම්ව, ණය මුදල් රැස් කිරීම සඳහා ස්වෛරී ඇපකර/ සහනදායී ලිපි මගින් අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටී.

## 30. සන්සන්දනාත්මක තොරතුරු

| | සමූහය | | | සමාගම | | |
|---|---|---|---|---|---|---|
| | 2021 | ප්‍රතිවර්ගීකරණයන් | 2021 ප්‍රතිවර්ගීකරණය කරන ලද | 2021 | ප්‍රතිවර්ගීකරණයන් | 2021 ප්‍රතිවර්ගීකරණය කරන ලද |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය** | | | | | | |
| **(අ) ආපසු ගෙවීම්වල ප්‍රතිවර්ගීකරණය සහ ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා පිරිවැය සඳහා වෙන්කිරීම** | | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| පොලී දරන වගකීම් | 168,070.52 | (4,653.27) | 163,417.25 | 167,297.59 | (4,653.27) | 162,644.32 |
| වෙනත් ජංගම නොවන වගකීම් | 23,846.49 | 4,653.27 | 28,499.76 | 23,130.11 | 4,653.27 | 27,783.38 |
| **ජංගම වගකීම්** | | | | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 100,350.89 | (17,339.08) | 83,011.81 | 106,176.53 | (17,339.08) | 88,837.45 |
| පොලී දරන වගකීම් | 135,733.56 | (10.78) | 135,722.78 | 135,670.25 | (10.78) | 135,659.47 |
| වෙනත් ජංගම වගකීම් | - | 17,349.86 | 17,349.86 | - | 17,349.86 | 17,349.86 |
| | | - | | | - | |
| **(ආ) පොලී දරන වගකීම් මත විනිමය අලාභය වර්ගීකරණය** | | | | | | |
| **ලාභ අලාභ ප්‍රකාශය** | | | | | | |
| මූල්‍ය පිරිවැය | (35,863.65) | 13,334.22 | (22,529.43) | (35,672.83) | 13,334.22 | (22,338.61) |
| විනිමය අලාභය | - | (13,334.22) | (13,334.22) | - | (13,334.22) | (13,334.22) |
| | | - | | | - | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | | | | | |
| මූල්‍ය පිරිවැය | 35,863.65 | (13,334.22) | 22,529.43 | 35,672.83 | (13,334.22) | 22,338.61 |
| විනිමය අලාභය | 3,969.65 | 13,334.22 | 17,303.87 | 4,551.07 | 13,334.22 | 17,885.29 |
| | | - | | | - | |

# පාරිභාෂික ශබ්ද මාලාව

### ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය (ASK)
අලෙවිය සඳහා පවතින ආසන ප්‍රමාණය සහ ඒවා ප්‍රවාහනය කරන දුර ප්‍රමාණයේ ගුණිත වේ.

### ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය (ATK)
මෙය ප්‍රවාහන නිෂ්පාදනයෙහි මිණුම වේ.ගුවන් යානාවක් විසින් නිපදවන ලබාගත හැකි ටොන් කිලෝමීටර ප්‍රමාණය වනුයේ, පියාසර කළ දුර ප්‍රමාණය, ටොන් ප්‍රමාණයෙන් ගුණ වීමෙන් ගණනය වන ගුවන් යානාවේ බර සඳහා ධාරිතාවයි.

### ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය (RPK)
ප්‍රවාහනය කළ මගීන් සහ ඔවුන් ප්‍රවාහනය කළ දුර ප්‍රමාණයේ ගුණිතය වේ.

### ආදායම් ටොන් කිලෝමීටර ප්‍රමාණ (RTK)
ටොන් වලින් ප්‍රවාහනය කල මගී සහ භාණ්ඩ නිෂ්පාදනය සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

### පැටවුම් සාධකය
සැපයන ලද ධාරිතාවයට පැටවුමේ සබඳතාවය අනුව ප්‍රතිශතය.

මගී පැටවුම් සාධකය කෙරෙහි ASK සහ RPK අදාළ වන අතර සමස්ත පැටවුම් සාධකය කෙරෙහි RTK සහ ATK අදාළ වේ.

### ආදායම් මගී කිලෝමීටර් (RPK) ප්‍රමාණයට ආදායම
ආදායම සහ ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය අතර සබඳතාවය වේ.

### ඒකක පිරිවැය
ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (ATK) මූල්‍ය පිරිවැය හා රඳවාගැනීමේ බදු අඩුකළ පසු ගුවන්සේවා මෙහෙයුම් වල මුළු මෙහෙයුම් පිරිවැය ගැලපීමෙන් ඒකක පිරිවැය ගණනය කෙරේ.

### සමස්ත එලදාව
ආදායම් ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (RTK) ශුද්ධ ප්‍රවාහන ආදායම ගැලපීමෙන් සමස්ත එලදාව ගණනය කෙරේ.

ශුද්ධ ප්‍රවාහන ආදායම යනු මගී, අතිරේක ගුවන් මළු, ගුවන් බඩු හා තැපැල් යන ඒවායේ, වැඩසටහන්ගත හා වැඩසටහන්ගත නොකළ සේවාවන් වල එකතුවයි.

### සමතුලන පැටවුම් සාධකය
ගුවන් සමාගමේ මෙහෙයුම්වලින් ලබන ආදායම මෙහෙයුම් පිරිවැය සමච්ඡේදනය වීමට අවශ්‍ය පැටවුම් සාධකය.



# දස අවුරුදු සමාලෝචනය

| | | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| **ආදයම් ප්‍රකාශය** | | | | | |
| ආදායම | රු.මිලියන | 119,570.90 | 121,585.83 | 131,922.13 | 129,480.41 |
| මෙහෙයුම් පිරිවැය | රු.මිලියන | 146,700.24 | 150,389.46 | 145,983.35 | 137,311.44 |
| ශුද්ධ ලාභ/(අලාභ) | රු.මිලියන | (26,088.57) | (32,408.34) | (16,494.66) | (12,621.69) |
| **ශේෂ පත්‍රය** | | | | | |
| කොටස් ප්‍රාග්ධනය/ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු.මිලියන | 32,032.75 | 51,617.44 | 51,617.44 | 51,617.44 |
| ජංගම නොවන වත්කම | රු.මිලියන | 23,338.28 | 25,212.47 | 22,836.77 | 23,548.01 |
| ජංගම වත්කම | රු.මිලියන | 54,905.22 | 37,154.23 | 49,721.49 | 26,901.02 |
| මුළු වත්කම | රු.මිලියන | 78,243.50 | 62,366.70 | 72,558.26 | 50,449.03 |
| ජංගම වගකීම් | රු.මිලියන | 71,346.64 | 88,609.07 | 103,414.31 | 100,334.44 |
| **ප්‍රතිලාභය/ඒකක පිරිවැය** | | | | | |
| සමස්ත ප්‍රතිලාභ | රු. tkm | 74.31 | 77.26 | 80.32 | 79.06 |
| ඒකක පිරිවැය (මූල්‍ය පිරිවැය සහ WHT හැර), | රු. tkm | 63.15 | 65.00 | 62.00 | 58.72 |
| සමතුලිත පැටවුම් සාධකය | % | 84.98 | 84.13 | 77.18 | 74.27 |
| මගී කි.මී. 1 ක ආදායම | රු./RPK | 7.6 | 7.8 | 8.2 | 8.2 |
| **නිෂ්පාදනය** | | | | | |
| මගී ධාරිතාවය | ASK මිලියන | 15,944.31 | 15,780.54 | 16,180.27 | 15,790.28 |
| සමස්ත ධාරිතාවය | ASK මිලියන | 2,186.96 | 2,187.18 | 2,224.87 | 2,165.21 |
| **ප්‍රවාහනය** | | | | | |
| ප්‍රවාහනය කළ මගීන් | සංඛ්‍යාව දහස | 4,255 | 4,175 | 4,348 | 4,328 |
| ප්‍රවාහනය කළ මගීන් | RPK මිලියන | 12,968.74 | 12,810.95 | 12,963.71 | 12,727.66 |
| මගී පැටවුම් සාධකය | % | 81.34 | 81.18 | 80.12 | 80.60 |
| ප්‍රවාහනය කළ භාණ්ඩ | ටොන් | 101,100 | 94,410 | 101,878 | 102,082 |
| ප්‍රවාහනය කරන ලද භාණ්ඩ | RPK මිලියන | 377.75 | 355.59 | 373.32 | 356.76 |
| ප්‍රවාහනය කරන ලද සමස්ත භාණ්ඩ | RPK මිලියන | 1,513.70 | 1,466.74 | 1,519.93 | 1,484.77 |
| සමස්ත භාණ්ඩ පැටවුම් සාධකය | % | 69.22 | 67.06 | 68.32 | 68.57 |
| **කාර්ය මණ්ඩලය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 6,359 | 6,578 | 6,987 | 6,959 |
| සේවකයෙකුගේ ආදායම | රු. | 18,803,412 | 18,483,708 | 18,881,084 | 18,606,181 |
| සේවකයෙකුගේ ධාරිතාව | ටොන් කි.මී. | 343,916 | 332,499 | 318,430 | 311,139 |
| සේවකයෙකු සඳහා ප්‍රවාහනය කළ පැටවුම | ටොන් කි.මී. | 238,041 | 222,976 | 217,537 | 213,359 |
| **සමස්ත ප්‍රවාහන යානා** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | 8 | 8 | 6 | 6 |
| A321-200 | සංඛ්‍යාව | - | - | 2 | 2 |
| A320 NEO | සංඛ්‍යාව | - | - | - | - |
| A321 NEO | සංඛ්‍යාව | - | - | - | - |
| A330-200 | සංඛ්‍යාව | 7 | 7 | 7 | 6 |
| A330-300 | සංඛ්‍යාව | - | - | 2 | 7 |
| A340-300 | සංඛ්‍යාව | 6 | 6 | 4 | - |
| Turbo Otter | සංඛ්‍යාව | 1 | - | - | - |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | 22 | 21 | 21 | 21 |
| ගුවන් යානා භාවිතය | | | | | |
| ගුවන් යානා | දිනකට පියාසර පැය | 12.82 | 12.76 | 12.90 | 12.02 |

| 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| 135,491.19 | 161,433.87 | 180,340.32 | 180,151.02 | 50,693.85 | 132,936.23 |
| 146,760.80 | 175,883.85 | 206,344.66 | 190,321.69 | 81,405.99 | 170,209.86 |
| (28,929.99) | (17,213.57) | (44,022.67) | (47,197.86) | (45,231.46) | (166,369.68) |
| 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 | 79,352.43 | 96,360.67 |
| 24,660.56 | 37,476.46 | 36,596.59 | 150,013.50 | 122,471.42 | 122,685.52 |
| 26,973.07 | 30,090.50 | 40,742.41 | 31,176.10 | 31,909.99 | 55,458.65 |
| 51,633.63 | 67,566.96 | 77,338.99 | 181,189.60 | 154,381.41 | 178,144.17 |
| 126,302.55 | 130,358.61 | 227,081.67 | 242,821.23 | 253,218.98 | 358,161.16 |
| 80.08 | 84.24 | 91.32 | 99.03 | 146.86 | 147.08 |
| 61.61 | 65.74 | 74.31 | 74.22 | 105.23 | 89.02 |
| 76.94 | 78.04 | 81.37 | 74.95 | 71.66 | 60.53 |
| 8.4 | 8.6 | 9.4 | 10.2 | 21.8 | 15.0 |
| 15,608.10 | 18,487.54 | 18,925.40 | 18,041.41 | 3,816.40 | 10,144.12 |
| 2,167.92 | 2,549.88 | 2,577.53 | 2,454.30 | 794.52 | 1,531.28 |
| 4,446 | 5,839 | 5,663 | 5,256 | 167 | 1,468 |
| 12,455.05 | 15,280.78 | 15,689.19 | 14,547.97 | 748.13 | 4,968.59 |
| 79.80 | 82.65 | 82.90 | 80.64 | 19.60 | 48.98 |
| 116,221 | 132,958 | 125,753 | 113,971 | 56,406 | 97,695 |
| 374.46 | 401.66 | 408.71 | 363.31 | 244.93 | 400.16 |
| 1,475.29 | 1,749.14 | 1,806.58 | 1,664.49 | 312.26 | 847.33 |
| 68.05 | 68.60 | 70.09 | 67.82 | 39.30 | 55.33 |
| 7,021 | 7,019 | 6,794 | 6,693 | 5,965 | 5,833 |
| 19,297,991 | 22,999,555 | 26,544,057 | 26,916,333 | 8,498,550 | 22,790,370 |
| 308,776 | 363,283 | 379,383 | 366,697 | 133,196 | 262,520 |
| 210,126 | 249,201 | 265,908 | 248,691 | 52,349 | 145,265 |
| 6 | 5 | 5 | 5 | 5 | 5 |
| 3 | 3 | 2 | 2 | 1 | 1 |
| 2 | 2 | 2 | 2 | 2 | 2 |
| - | 3 | 4 | 4 | 4 | 4 |
| 6 | 6 | 7 | 5 | 5 | 5 |
| 7 | 7 | 7 | 7 | 7 | 7 |
| - | - | - | - | | |
| - | - | - | - | | |
| 24 | 26 | 27 | 25 | 24 | 24 |
| 12.44 | 13.25 | 12.60 | 12.18 | 2.98 | 7.21 |

# ගුවන් මාර්ග සිතියම

දැනට ශ්‍රීලංකන් ගුවන් සමාගම යුරෝපය, මැද පෙරදිග, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, ඈත පෙරදිග, ඕස්ට්‍රේලියාව සහ උතුරු ඇමෙරිකාව වැනි කලාප වල රටවල් 58 ක් පුරා ගමනාන්ත 112 ක් සඳහා සේවා සපයයි.



# 112 Destinations in 58 Countries

SriLankan Airlines brings more of the world to you



# විශේෂ කඩඉම්

## 2011/2012

කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එයාර් බස් A320 ගුවන් යානා හතරක්, එයාර් බස් A330 පුළුල් බඳ ගුවන් යානා දෙකක් සහ එයාර් බස් A340 පුළුල් බඳ ගුවන් යානාවක් භාර ගත්තේය.

ගුවන් සේවය ප්‍රති ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 500 ක කොටස් ආයෝජනයක් සඳහා කැබිනට් අනුමැතිය හිමි විය.

## 2012/2013

එයාර් බස් A320 නියමුවන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පළමු A320 පියාසැර සිමියුලේටරය දියත් කිරීම.

මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එක් එයාර් බස් A320 ගුවන් යානයක් භාර ගත්තේය.

මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළෙන් ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කළේය.

2012 මැයි මාසයේ දී සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 175 ක මූල්‍යකරණයක් ලබා ගැනීම සඳහා විදේශීය බැංකු සමූහයක් සමග මූල්‍යකරණ ගිවිසුමකට එළඹුණි.

## 2013/2014

එයාර් බස් A330 නියමුවන් පුහුණු කිරීම සඳහා පියාසැර සිමියුලේටරය දියත් කිරීම 2013 දෙසැම්බරයේ දී සමාගම මගී සේවා පද්ධතිය ඇමඩියස් ඇල්ටියා (Amadeus Altea) වෙතට මාරු කරන ලදී.

2014 මාර්තු මාසයේදී සමාගම මධ්‍ය කාලීන මූල්‍යකරණය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් ලබා ගැනීම සඳහා බැංකු සමූහයක් සමග මූල්‍යකරණ ගිවිසුමකට එළැඹිනි.

## 2014/2015

සමාගම 2014 මැයි මාසයේ දී වන්වර්ල්ඩ් එකමුතුව සමග ගිවිසුම්වලට එළඹුණි.

2014 ජුනි මාසයේ දී සමාගම පළමු වරට පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කරයක් නිකුත් කළේය.

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනක කොටසක් ලෙස සමාගම විසින් පිළිවෙළින් 2014 ඔක්තෝබර් සහ 2015 මාර්තු මාසවලදී නවතම A330 - 300 ගුවන් යානා තුනක් ලබා ගැනුනි.

## 2015/2016

ගුවන් සේවාවන් හි කීර්තිමත් ගෞරව නාම හතරක් සඳහා ලැයිස්තුගත කර ලදී : එනම් ආසියානු සහ ඕස්ට්‍රේලියා හි කලාපීය හොඳම ගුවන් සේවය, හොඳම ගුවන් යානා තුළ ප්‍රකාශනය, 'හොඳම ගුවන් යානා තුළ (Inflight) වීඩියෝව' සහ ඇපෙක්ස් මගී තේරීම් සම්මාන 2015 හි හොඳම භූමි අත්දැකීම යනුවෙනි. ගුවන් සේවය කාණ්ඩ හතරක් සඳහා නම් කරන ලද පළමු අවස්ථාව මෙයයි. ආසියාවේ සහ ඕස්ට්‍රේලියාවේ හි මගී අත්දැකීම් සඳහා විශිෂ්ට ජයග්‍රහණ සම්මානය දිනා ගත්තේය. - 2015 සැප්තැම්බර් ඇපෙක්ස් පෝට්ලන්ඩ් ඔරේගන් සහ හොඳම පූර්ණ සේවා ගුවන් සේවා ත්‍යාගය, මධ්‍යම හා දකුණු ආසියාව - ආසියාවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන 2015, සිංගප්පූරුව.

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස සමාගම විසින් අගෝස්තු සහ නොවැම්බර් මාසවලදී අති නවීන A330-300 ගුවන් යානා හතරක් සහ 2015 දෙසැම්බර් මාසයේදී ගුවන් යානා දෙකක් ලබාගන්නා ලදී.

## 2016/2017

2017 පෙබරවාරි සහ 2017 මාර්තු මාසවලදී A320 නව ගුවන් යානා දෙකක් හඳුන්වා දීම - පළමු A320/A321 පවුලේ නව එන්ජින් විකල්ප ගුවන් යානා දෙක සමූහයට එක්විය.

ලාහෝර්, ජකර්තා, ඩකා, කල්කටා, මදුරෙයි, වරනාසි, බුද්ධගයා, මස්කට්, බහරේන්, සීෂෙල්ස් සහ ගාන් දූපත් යන ආකර්ෂණීය නව ගමනාන්ත එකොළහකට ශ්‍රීලංකන් මගින් සේවා අරඹන ලදී.

සමාගමට "දකුණු ආසියාවේ හොඳම ගුවන් සමාගම", ෆියුචර් ට්‍රැවල් එක්ස්පීරියන්ස් ඒෂියා 2016 හි අඛණ්ඩව දෙවන වරටත් "මධ්‍යම හා දකුණු ආසියාවේ හොඳම පූර්ණ සේවා ගුවන් සේවය" යන ඉහළම සංචාරක සම්මාන පිරිනමන ලදී. 7 වන ආසියා හාම්පුතුන්ගේ සන්නාම සම්මාන උළෙලේදී "පුහුණු විශිෂ්ටතා සම්මානය" සහ ව්‍යාපාරයට අනුකූලව හොඳම මානව සම්පත් ක්‍රමෝපාය සඳහා සම්මානයද ගුවන් සමාගම විසින් හිමිකර ගන්නා ලදී.

## 2017/2018

සමාගම විසින් ගුවන් යානා සමූහයේ කොටසක් ලෙස 2017 ජුනි, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී නවතම එයාර්බස් A321 -200 neo නව ගුවන් යානා තුනක් ලබා ගන්නා ලදී.

ශ්‍රීලංකන් මගින් මෙල්බර්න්, හයිද්‍රාබාද්, කොයිම්බතූර් සහ විශාකාපට්නම් යන නව ගමනාන්ත හතරකට සේවා අරඹන ලදී.

ගුවන්සේවා මගී අත්දැකීම් සංගමයෙන් (ඇපෙක්ස්) තරු හතරේ විශිෂ්ටතා ශ්‍රේණිගත කිරීමක් ලබාගත් අතර, 2017 සිංගප්පූරුවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන උළෙලේදී ගුවන් සේවය පිට පිට තෙවන වරටත් විශිෂ්ට සේවා සඳහා සම්මානය ලබා ගත්තේය.

සිංගප්පූරුවේ පැවති 2017 ආසියා පැසිෆික් සම්මාන උළෙලේදී "වාණිජ ගුවන් සේවා මැදිරිවල නවෝත්පාදන" සම්මානයද සමාගම දිනා ගත්තේය.

## 2018/2019

සමාගම විසින් 2018 ජුලි මාසයේදී තවත් නවතම එයාබස් A321neo ගුවන් යානයක් ලබා ගන්නා ලද අතර එමගින් නියෝ යානා සමූහයේ ආගමනය පූර්ණ විය.

පියාසැරි දත්ත විශ්ලේෂණ සමාගමක් වන ෆ්ලයිට්ස්ටැට්ස්.කොම් (Flightstats.com.) විසින් ශ්‍රේණිගත කරන ලද 'ගෝලීය ගුවන් සේවා' සහ 'ප්‍රධාන ගුවන් සේවා' යන ප්‍රධාන කාණ්ඩ යටතේ ශ්‍රීලංකන් ගුවන් සේවය 2018 සැප්තැම්බර් මාසයේ දී ලෝකයේ අතිශයින්ම නියමිත වේලාවට කටයුතු කරන්නා වූ ගුවන් සේවය බවට පත්විය.

ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් ගුවන් මගී අත්දැකීම් සංගමයේ (ඇපෙක්ස්) අඛණ්ඩව දෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් පවත්වා ගෙන ගිය අතර ජාත්‍යන්තර සම්මාන කිහිපයක් ද හිමි කර ගත්තේය. මේ අතර අඛණ්ඩව තෙවැනි වරටත් ඉන්දියානු සාගරයට ලොව ප්‍රමුඛ ගුවන් සේවය සම්මානය දිනා ගැනීම සහ අයි.ටී.බී බර්ලිනයේ ගෝල්ඩන් සිටි ගේට් සම්මාන තුනක් ඇතුළත් වේ.

## 2019/2020

ශ්‍රීලංකන් ගුවන් සේවය වසර 2019 දී සිය 40 වැනි සංවත්සරය සැමරීය.

ජාතික ගුවන් සේවය වෙත ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX) මගින් ''විශිෂ්ටතම අලෙවි නව හඳුන්වාදීම'' සම්මානය පිරිනැමිනි. ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් අඛණ්ඩව තෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් පවත්වා ගෙන යන ලදී.

2019 දී ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් 'Two Cities, One Spirit' ප්‍රචාරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ස්වර්ණ සම්මානය දිනා ගන්නා ලද අතර 2019 බර්ලින් ITB ගෝල්ඩ් සිටි සම්මාන උළෙලේදී සම්මාන ත්‍රිත්වයක් දිනා ගැනුනි.

2020 බර්ලින් ITB ගෝල්ඩ් සිටි සම්මාන උළෙලේදී සමාගම ප්‍රථම වරට කාණ්ඩ තුනකින් (“Airline International”, “Music International” සහ “Campaign”) තරු පහේ සම්මානයට පාත්‍ර විය.

ශ්‍රීලංකන් ගුවන් සේවය වර්ල්ඩ් ට්‍රැවල් අවෝර්ඩ්ස් ඒෂියා ඇන්ඩ් ඕෂනියා (ලෝක චාරිකා සම්මාන ආසියාව හා ඕෂනියාව) හිදී අග්‍රගන්‍ය 'ලොව විශිෂ්ටතම ගුවන් සේවය' සහ 'ඉන්දියන් සාගරය ආශ්‍රිත ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සේවය' යන සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

## 2020/21

පසු කෝවිඩ් ගුවන් ගමන් වලදී මගීන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු කිරීම හේතුවෙන් APEX Health Safety විසින් ප්ලැටිනම් ප්‍රමිති තත්වය පිරිනමන ලදී.

“Future Travel Experience (FTE) Virtual Expo” සම්මාන උළෙලේදී The Airline Passenger Experience Association (APEX) විසින් 2021 වසර සඳහා “ප්‍රධාන නිල ගුවන් සේවය සඳහා තරු හතරක් ශ්‍රේණිගත කිරීම” පිරිනමන ලදී.

ගෝලීය වසංගත තත්වය තුළ ශ්‍රී ලාංකේය අපනයනකරුවන් හට සහය දැක්වීම සඳහා සහ අඩුවන මගී සංචාර හමුවේ විකල්ප ආදායම් මාර්ග සොයා ගැනීමේ අරමුණින් ප්‍රථම වරට ගුවන් භාණ්ඩ යානා, ගමනාගමන කාලසටහනට ඇතුළත් කරන ලදී.

වසංගතය තත්වය හමුවේ දේශසීමා වසා දැමීම හේතුවෙන් විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකිකයින් ආපසු ගෙන්වා ගැනීම සඳහා විශේෂ මගී ගුවන් ගමන් ක්‍රියාත්මක කළ අතර, අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් ප්‍රවාහනය සඳහා විශේෂ භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් ක්‍රියාත්මක කරන ලදී.

## 2021/22

පශ්චාත් කොවිඩ් සමයේ ගුවන් සංචාරයේදී මගී ආරක්ෂාව සහ යහපැවැත්ම සඳහා Simplyflying මගින් අනුග්‍රහය දක්වන ලද දියමන්ති සම්මානය - ඇපෙක්ස් සෞඛ්‍ය සහ ආරක්ෂාව සහ “විශිෂ්ඨතම සෞඛ්‍ය කළමනාකරණය” ආසියාතික නායකත්ව සම්මානය 2021 ලබා ගන්නා ලදී.

දකුණු ආසියානු කලාපයේ ඒකාබද්ධ ඉදිරිපත් වීම වෙනුවෙන් ලෝක සංචාරක සම්මාන උළෙලේදී ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, ඉන්දියන් සාගරයේ ලොව ප්‍රමුඛ ගුවන් සේවය ලෙසත්, ඉන්දියන් සාගරය සඳහා ආසියාවේ ප්‍රමුඛ ගුවන් සේවය ලෙසත්, එමෙන්ම 'Say Bonjour to Paris' ව්‍යාපාරයේ, වෙළඳ ප්‍රවාහක - PATA රන් සම්මානය 2021 මගින් ගෞරවයට පාත්‍ර වන ලදී.

# සාංගමික තොරතුරු

**සමාගමේ නම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

**සමාගමේ ලියාපදිංචි අංකය**
පී බී 67

**නෛතිකභාවය**
සීමාසහිත පොදු සමාගමකි

**අධ්‍යක්ෂ මණ්ඩලය**
අසෝක පතිරගේ මහතා (සභාපති)
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා
ආනන්ද විජේතිලක අතුකෝරල මහතා
වී. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/ භාණ්ඩාගාර නියෝජිත
වී. එම්. වී. වී. ලක්මාල් රත්නායක මහතා
සංජය මොහොට්ටාල මහතා (2022 අප්‍රේල් 29 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.)
ජනාධිපති නීතිඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා (2022 අගෝස්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය.)
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා (2021 අප්‍රේල් මස 23 දින කමිටුවෙන් ඉල්ලා අස්වන ලදී)
වීරසිංහ ආරච්චිගේ සරත් කුමාර මහතා (2022 අගෝස්තු 26 දින සිට බලපැවැත්වෙන පරිදි තේරී පත් විය/2023 පෙබරවාරි 3 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.)

**විගණන කමිටුව**
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ජෝසප් මයිකල් ජයන්ත් පෙරේරා මහතා (තාවකාලික සභාපති)
වී. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව**
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා (සභාපති)
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කමිටුව**
ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා (සභාපති)
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ආනන්ද විජේතිලක අතුකෝරල මහතා (නිරීක්ෂක)
වී. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා

**සමාගම් ලේකම්/ සාංගමික ලේකම් සේවා ප්‍රධානී**
ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය (ACIS)

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
මහජන බැංකුව
ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව
සිටි බැංකුව
සම්පත් බැංකුව
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
හැටන් නැෂනල් බැංකුව
කොමර්ෂල් බැංකුව
අමානා බැංකුව පීඑල්සී
කාගිල්ස් බැංකුව

**විගණක**
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306/72
පොල්දුව පාර
බත්තරමුල්ල

**ලියාපදිංචි කාර්යාලය**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම
ගුවන් සේවා මධ්‍යස්ථානය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ
කටුනායක
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය**
www.srilankan.com

optima Designing Your Year! | Designed & Produced by Optima Designs (Pvt) Ltd. | A full service design and print company. www.optimadesigns.lk

# මහා සභා රැස්වීම් නිවේදනය

පහත දැක්වෙන අරමුණ පාදක කර ගනිමින්, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ හතළිස් හතරවන වාර්ෂික මහා සභා රැස්වීම, 2023 ජූනි 2, සිකුරාදා දින ප.ව. 3.00 ට බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව, ලිපිනයේ පිහිටි 'මිහිලක මැදුර' බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්වෙන බව මෙයින් දන්වා සිටියි.

1. 2022 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ සමඟ ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම.
2. 74 වැනි වියට පා තබන ලද ඩී.ඩබ්ලිව් අතුකෝරල මහතා පත් කිරීම සඳහා පහත යෝජනාව සාමාන්‍ය යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීම. "2007 අංක 7 දරන සමාගම් පනතේ, 210 වගන්තියේ සඳහන් කොට ඇති වයස් සීමාව ඩී ඩබ්ලිව් අතුකෝරල මහතාට අදාළ නොවන බව තහවුරු කර ඒ අනුව ඔහු පත් කරනු ඇත.
3. 70 වැනි වියට පා තබන ලද ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතා නැවත පත් කිරීම සඳහා පහත යෝජනාව සාමාන්‍ය යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීම. "2007 අංක 7 දරන සමාගම් පනතේ, 210 වගන්තියේ සඳහන් කොට ඇති වයස් සීමාව, ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතාට අදාළ නොවන මෙයින් තහවුරු කර ඇති අතර, ඒ අනුව ඔහු නැවත පත් කරනු ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

2021/22 සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි වාර්ෂික වාර්තාව,
(i) ආයතනික වෙබ් අඩවිය - https://www.srilankan.com/en_uk/corporate/annual-reports
(ii) කොටස් හිමියන්ගේ ප්‍රජා අඩවිය - www.srilankan.com/shareholdercommunitysite

පහත QR කේතය ස්කෑන් කිරීමෙන් සාමාජිකයින්ට ඔවුන්ගේ ජංගම දුරකථන හරහා ද වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ වෙත ප්‍රවේශ විය හැක.

සියලුම රජය සතු ව්‍යවසායන්ට විද්‍යුත් සන්නිවේදන මාධ්‍යයට මාරු වී කඩදාසි භාවිතය හැකිතාක් අඩු කරන ලෙස ඉල්ලා සිටිමින් නිකුත් කර ඇති, 2022 අගෝස්තු 8 දිනැති 04/2022 පොදු ව්‍යවසාය චක්‍රලේඛය ප්‍රකාරව මෙම වාර්තාව ලබා ගත හැක්කේ PDF ස්වරූපයෙන් පමණකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

**ඩැල්රින් තිරුකුමාර් මහත්මිය**
*සාංගමික ලේකම් සේවා ප්‍රධානී/සමාගම් ලේකම්*

2023 මැයි 12
කටුනායක

**සටහන්:**
1. සාමාජිකයෙකුට ඔහු/ඇය වෙනුවට සහභාගී වීමට සහ ඡන්දය දීමට පෙරකලාසිකරුවෙකු පත් කිරීමට හිමිකම් ඇත.
2. පෙරකලාසිකරු සමාගමේ සාමාජිකයෙකු විය යුතු නැත.
3. ඔවුන් වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු පත් කිරීම හරහා පෙරකලාසිකරුවෙකු මඟින් ඡන්දය ප්‍රකාශ කිරීමට සහ රැස්වීමේදී ඉදිරිපත් කිරීමට නියමිත යෝජනා පිළිබඳව ඔවුන්ගේ ඡන්ද මනාපයන් පෙරකලාසි පත්‍රයේ ඇතුළත් කිරීමට සමාජිකයන් දිරිමත් කරනු ලැබේ.
4. වලංගු වීමට නම්, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය රැස්වීමට පැය 48 කට පෙර සමාගමේ ලියාපදිංචි කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.
5. සංස්ථාපිත ආයතනයක් නියෝජනය කරන පුද්ගලයෙකු එම සංස්ථාවේ නියෝජිතයා ලෙස කටයුතු කිරීමට ඔහුට/ඇයට බලය පවරමින් එහි අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවේ සහතික කළ පිටපතක් රැගෙන යා යුතුය.
6. ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද කිසියම් සන්නිවේදනයක්, මාර්ගෝපදේශනයක්, විධානයක් හෝ නියෝගයක් හේතුවෙන් වාර්ෂික මහා සභා රැස්වීමට අදාළව යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාගමට අවශ්‍ය නම්, එම ක්‍රියාමාර්ගය පිළිබඳ නිවේදනය සමාගමේ වෙබ් අඩවිය - www.srilankan.com/AGM, කොටස් හිමියන්ගේ ප්‍රජා වෙබ් අඩවිය www.srilankan.com/shareholdercommunitysite සහ ජාතික පුවත්පත් හි ප්‍රකාශනයක් ආකාරයෙන් ලබා දෙනු ලැබේ.

# සටහන්

# පෙරකලාසි පත්‍රය

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

*සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි සාමාජිකයෙකු/සාමාජිකයින් වන,...................................................................................

.......................................................................................................... හි ...................................................................................

වන මම/අප.......................................................................................................................... හි

හෝ ඔහු/ඇය අපොහොසත් වන්නේ නම් පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙක්;

අසෝක පතිරගේ මහතා
මලික් ජේ. ප්‍රනාන්දු මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
ජෝසප් ජයන්ත් මයිකල් පෙරේරා මහතා
ආනන්ද විජේතිලක අතුකෝරල මහතා
ඩී. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා/ භාණ්ඩාගාර නියෝජිත
ඩී. එම්. ඩී. ඩී. ලක්මාල් රත්නායක මහතා

*මගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන්, 2023 ජූනි 2, සිකුරාදා දින ප.ව. 3.00 ට බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව, ලිපිනයේ පිහිටි 'මිහිලක මැදුර' බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්වීමට නියමිත සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි හතළිස් හතරවන වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ එහි කිසියම් කල්තැබීමකදී *මම/අපි වෙනුවෙන් ඡන්දය ලබා දීමට සහ *මම/අපි නියෝජනයට මෙහිලා පත්කරනු ලබයි.

| | පක්ෂව | විපක්ෂව |
|---|---|---|
| 1. 2022 මාර්තු 31 දිනට අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ සමඟ ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම. | ☐ | ☐ |
| 2. 74 වැනි වියට පා තබන ලද ඩී.ඩබ්ලිව් අතුකෝරල මහතා පත් කිරීම සඳහා පහත යෝජනාව සාමාන්‍ය යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීම. "2007 අංක 7 දරන සමාගම් පනතේ, 210 වගන්තියේ සඳහන් කොට ඇති වයස් සීමාව ඩී ඩබ්ලිව් අතුකෝරල මහතාට අදාළ නොවන බව තහවුරු කර ඒ අනුව ඔහු පත් කරනු ඇත. | ☐ | ☐ |
| 3. 70 වැනි වියට පා තබන ලද ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතා නැවත පත් කිරීම සඳහා පහත යෝජනාව සාමාන්‍ය යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීම. "2007 අංක 7 දරන සමාගම් පනතේ, 210 වගන්තියේ සඳහන් කොට ඇති වයස් සීමාව, ජේ. එම්. ජයන්ත් පෙරේරා මහතාට අදාළ නොවන මෙයින් තහවුරු කර ඇති අතර, ඒ අනුව ඔහු නැවත පත් කරනු ඇත. | ☐ | ☐ |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

දෙදහස් විසි තුනේ ........................................ මස .................................. දින මෙය අත්සන් කරන ලදී.

......................................................... අත්සන/අත්සන්

**සටහන:**

(අ) *අනවශ්‍ය වචනය කපා හරින්න.
වචන කිසිවක් ඉවත් කර නොමැති නම් හෝ පෙරකලාසිකරු ඡන්දය භාවිත කළ යුතු ආකාරය පිළිබඳ (පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීමේදී උපදෙස් ඇතුළත් කර ඇති ආකාරය සම්බන්ධව) පෙරකලාසිකරු හට සැකයක් පවතී නම්, පෙරකලාසිකරු යෝග්‍ය යැයි සිතන පරිදි ඡන්දය භාවිත කරනු ඇත.

**පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්:**

1. ඔබගේ සම්පූර්ණ නම සහ ලිපිනය පැහැදිලිව සටහන් කිරීමෙන් පසු සපයා ඇති ඉඩෙහි අත්සන් කර, අත්සන් කරන දිනයද සටහන් කර නිවැරදිව පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කරන්න.
2. සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය, ලියාපදිංචි කාර්යාලය, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම, 'ගුවන් සේවා මධ්‍යස්ථානය', බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක යන ලිපිනයට රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර, එනම් 2023 මැයි 31 වන දින ප.ව. 3.00 ට පෙර එවිය යුතුය.
3. නේවාසික/ අනේවාසික කොටස් හිමියන් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ කරන ලද පෙරකලාසි පත්‍රය සමාගමට ලැබුණු පසු මුද්‍රා කටයුතු සිදුකරනු ලබයි.

SriLankan Airlines oneworld

www.srilankan.com

ගුවන් සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව.